# සැම සුරැකි සාමකාමී දේශයක්
# பாதுகாப்பானதும், அமைதியானதுமான நாடொன்றுக்காக
# For a Secured & Peaceful Country

## 2016

## කාර්යසාධන වාර්තාව
## செயல்திறன் அறிக்கை
## Performance Report



ආරක්ෂක අමාත්‍යාංශය
பாதுகாப்பு அமைச்சு
MINISTRY OF DEFENCE

# පටුන


| | පිටු අංක |
|---|---|
| ගරු ආරක්ෂක අමාත්‍යතුමාගේ පණිවිඩය | |
| ගරු ආරක්ෂක රාජ්‍ය අමාත්‍යතුමාගේ පණිවිඩය | |
| ආරක්ෂක ලේකම්තුමාගේ පණිවිඩය | |
| ආරක්ෂක රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ පණිවිඩය | |
| අමාත්‍යාංශයේ දැක්ම හා මෙහෙවර | i |
| අමාත්‍යාංශයේ කාර්යය හා කර්තව්‍යයන් | ii |
| අමාත්‍යාංශයේ සංවිධාන ව්‍යුහය | iii |
| **අමාත්‍යාංශයේ අංශයන්හි ප්‍රගතිය** | |
| 1. ප්‍රතිපත්ති හා සැලසුම් අංශය | 1-2 |
| 2. ආරක්ෂක අංශය | 3-6 |
| 3. තාක්ෂණික අංශය | 7-12 |
| 4. පාර්ලිමේන්තු හා සිවිල් කටයුතු අංශය | 13-14 |
| 5. පරිපාලන අංශය | 15-21 |
| 6. සිවිල් ආරක්ෂක සහ සංවර්ධන අංශය | 22-25 |
| 7. මුදල් අංශය | 26-32 |
| 8. අභ්‍යන්තර විගණන අංශය | 33 |
| 9. ජාත්‍යන්තර සබඳතා අංශය | 34-39 |
| 10. මාධ්‍ය කේන්ද්‍රය | 40-43 |
| 11. හමුදා සම්බන්ධතා කාර්යාලය | 44-47 |
| 12. ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී කාර්යාලය | 48-58 |
| **අමාත්‍යාංශයට අනුබද්ධ ආයතනයන්හි ප්‍රගතිය** | |
| 13. වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව | 59-72 |
| 14. ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය | 73-77 |
| 15. රාජ්‍ය බුද්ධි සේවය | 78-80 |
| 16. පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය | 81-86 |
| 17. ඒකාබද්ධ සේවා භාෂා පුහුණු ආයතනය | 87 |
| 18. සීමාසහිත ලංකා ලොජිස්ටික් ඇන්ඩ් ටෙක්නොලජීස් සමාගම | 88-94 |
| 19. ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක අධ්‍යයන ආයතනය | 95-98 |
| 20. ජාතික ශිෂ්‍යභට බලකාය | 99-102 |
| 21. රණවිරු සේවා අධිකාරිය | 103-107 |
| 22. ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලය | 108-110 |
| 23. ආරක්ෂක සේවා විද්‍යාලය | 111-115 |

# ගරු ආරක්ෂක අමාත්‍යතුමන්ගේ පණිවිඩය



රටේ ස්වාධිපත්‍ය , භෞමික අඛණ්ඩතාව හා ජාතික ආරක්ෂාව සුරැකීමේ භාරධූර කර්තව්‍යය පැවරී තිබෙන්නේ ආරක්ෂක අමාත්‍යාංශයටයි. මෙම කාර්යභාරය ඉටුකිරීමට ඉහළ ප්‍රමිතීන්, ධෛර්යය, කැපවීම හා ආදර්ශවත් කුසලතා අමාත්‍යාංශයේ සියලුම සේනාංක තුළ තිබිය යුතුය. වාර්ෂික කාර්ය සාධන වාර්තාව අමාත්‍යාංශයේ සියලු අංශ වල සමස්ත ක්‍රියාකාරීත්වය විදහාපායි. ඒ අනුව ආරක්ෂක අමාත්‍යාංශයේ කාර්ය සාධන වාර්තාව අතිශයින්ම වැදගත් වේ.

ආරක්ෂක අමාත්‍යාංශයේ  වගකීම ජාතිය සුරැකීමට පමණක් සීමා නොවේ. එය සංහිඳියාව, තිරසාර සාමය, සමාජ ආර්ථික සංවර්ධනය , ආපදා සහන හා ගලවා ගැනීම් මෙන්ම ජාත්‍යන්තර සාමසාධක මෙහෙවර දක්වා පුළුල් වී ඇත.

ආරක්ෂක අමාත්‍යාංශය ඉතා සංයමයෙන් යුක්ත, අත්දැකීම් සහිත පරිණත, ඉතා හොඳින් සංවිධානය කෙරෙන ආයතන ව්‍යුහයකින්  සහිත වූවක් ලෙස කීර්තිමත් නාමයක් අත්කර ගැනීම පිළිබඳව ආරක්ෂක අමාත්‍යවරයා ලෙස මම ඉමහත් සතුටට පත්වෙමි.

රජයේ ප්‍රතිපත්තීන්ට අනුව යමින්, දූෂණය හා වංචාවන් පිළිබඳව නිරන්තර අවධානයෙන් හා පරීක්ෂාකාරීත්වයෙන් සිටීමට ආරක්ෂක අමාත්‍යාංශයට සිදුවෙයි. මෙම උත්සාහය පහතට වැටෙන්නට ඉඩ නොදී පවත්වාගෙන යාමට ආරක්ෂක අමාත්‍යාංශයේ සාමාජිකයින් විසින් කරන ලද කැපවීම් අතිශයින් ප්‍රශංසනීය ය.

අපේ මාතෘ භූමියේ  භෞමික අඛණ්ඩතාවය රැකගැනීමට තම ජීවිත හා ශරීරාංග පරිත්‍යාග කළ රණවිරුවන් සිහිකිරීමට මම මෙය අවස්ථාවක් කර ගනිමි. මෙම වගකීම ඉටුකිරීමට, කැපවූ හා කාර්යක්ෂම නිලධාරීන් අවශ්‍යය. එහෙයින්, ආරක්ෂක ලේකම්වරයා හා අමාත්‍යාංශයේ නිලධාරීන් විසින් ඉටුකරන ලද මෙහෙය සියලු දෙනා අගය කළ යුතුය.

මෛත්‍රීපාල සිරිසේන
ආරක්ෂක අමාත්‍ය

## ගරු ආරක්ෂක රාජ්‍ය අමාත්‍යතුමන්ගේ පණිවිඩය



රටතුළ සංහිදියාව මෙන්ම සංවර්ධනය ගොඩනගමින් දිගුකාලීන දැක්මක් සහිතව ඉදිරි ගමනක නිරත අප රජය නව ආර්ථික ක්‍රමෝපායන් පිළිබඳව විධිමත් සැලසුම් ඇතිව නිරතුරුව කටයුතු කළ යුතුය. විවිධ අභියෝගාත්මක අවස්ථාවන්හිදී ඊට සාර්ථකව මුහුණ දීමට එවැනි පසුබිමකදී හැකිවනු ඇත. ජාතික ආරක්ෂාව රටේ ප්‍රමුඛතම විෂය වන අතර, එහි හරය හා වටිනාකම තේරුම්ගෙන කටයුතු කරන ආරක්ෂක අමාත්‍යාංශයට නිරතුරුව නිවැරදි මගපෙන්වීම් සිදුකරන අතිගරු ජනාධිපතිතුමාට ගෞරවය පුද කළ යුතුය.

ආරක්ෂක අමාත්‍යවරයා ලෙස එතුමාගේ මඟපෙන්විම හා උපදෙස් ඇතිව අප ගෙවී ගිය දෙවසරක කාලය තුළ ආරක්ෂක අමාත්‍යාංශය සහ ආරක්ෂක රාජ්‍ය අමාත්‍යාංශය ලෙස දිවි දෙවැනි කොට රට සුරැකි රණවිරුවන් වෙත, රණක්ෂයට පත්වූ රණවිරුවන්ට මෙන්ම දිවිපිදූ රණවිරු පවුල්වල සාමාජිකයන් වෙත ද ඉටුකළ මෙහෙය පිළිබඳව මාගේ විශේෂ ඇගයීමට ලක්වන අතර, ඉදිරි වර්ෂයේදී තවදුරටත් එම සේවාව ශක්තිමත්ව ඉදිරියට පවත්වාගෙන යාම අප සියළු දෙනාම අධිෂ්ඨානය ඇතිව කැපවීමෙන් ක්‍රියාකළ යුතුව ඇත.

සහජීවනය පිරි සංවර්ධනය වූ රටක් නිර්මාණය කිරීමට මෙන්ම එම ඉලක්ක සපුරාගැනීමට ආරක්ෂක අමාත්‍යාංශය සහ ආරක්ෂක රාජ්‍ය අමාත්‍යාංශය ලෙස අප සියලු දෙනාගේ දායකත්වය ඉදිරියේදී තවදුරටත් ලැබෙනු ඇත. ජාතික ආරක්ෂාව ශක්තිමත් කරමින් ලස්සන රටක් ගොඩනැඟීම සඳහා කැපවන සියලු දෙනාටම මාගේ විශේෂ ස්තූතිය පුදකරමි.

රුවන් විජයවර්ධන
ආරක්ෂක රාජ්‍ය අමාත්‍ය

## ආරක්ෂක ලේකම් තුමාගේ පණිවිඩය



සියලු ප්‍රජාවන් අතර සුහදත්වය වර්ධනය කිරීම සඳහා සාමයෙන් කටයුතු කිරීමෙන් තිරසාර වුත් වර්තමාන අවශ්‍යතාවයන්ට අනුකූල වන්නා වුත් අයුරින් සංවර්ධන කටයුතු මෙහෙයවීම සඳහා රටේ ආරක්ෂාව මෙන්ම ඒකීය රටක භෞමික අඛණ්ඩතාවය තහවුරු කිරීම ඉතාමත් අත්‍යවශ්‍ය වන්නේය. මෙම තත්ත්වයන් හමුවේ පැමිණෙන ඕනෑම අභියෝගයකට මුහුණ දිම සඳහා ආරක්ෂක අමාත්‍යාංශය ඉතාමත් කැපවීමෙන් කටයුතු කිරීම තුළින් අවශ්‍ය ප්‍රතිඵලය කරා ළගා වීමට සමත්ව ඇත.

යුධ ජයග්‍රහණ අත් කර දුන් රණවිරුවන්ගේ ගෞරවය රැක ගනිමින් ඔවුන් සහ ඔවුන්ගේ පවුල් වල සුබ සාධනය මූලික කොට ගත් කාර්යයන් රැසක් ක්‍රියාවට නැංවීමට හැකි වීම තුළින් ඔවුන් වෙත කෘතවේදීතාවය දැක්වීමට හැකි වීම භාග්‍යක් කොට සළකමි. එමෙන්ම ඔවුන් සංවර්ධන ක්‍රියාවලීන්ට විධිමත් පරිදි යොමු කර ගැනීමටත්, යුද්ධය හේතුවෙන් අවතැන් වූ ජනතාව නැවත පදිංචි කිරීමේ කාර්යය අවසන් කරමින් ඔවුන්ගේ ජීවන තත්ත්වය උසස් කිරීම සඳහා ගත හැකි සෑම පියවරක්ම ගැනිමටත් රජය හැම විටම ක්‍රියා කරමින් සිටියි.

2016 වර්ෂය තුළ ආරක්ෂක අමාත්‍යාංශය, ත්‍රිවිධ හමුදාව හා අමාත්‍යාංශය යටතේ පාලනය වන අනෙකුත් ආයතන විසින් මව්බිමෙහි සුරක්ෂිතභාවය තහවුරු කර ගැනීම වෙනුවෙන් කරන ලද කාර්යභාරය තුළින් අමාත්‍යාංශ දැක්ම යථාර්ථයක් බවට පත් කර ගැනීම සඳහා සිදු කළ මෙහෙය සඳහා දායක වූ සියලු දෙන වෙනුවෙන් ස්තුතිය හා ප්‍රණාමය පුද කරමි.

රටට අනන්‍ය වූ දේශීයත්වයට මුල් තැන දෙමින් සකස් වු චින්තනයකින් හා දැක්මකින් වඩාත් සුබවාදී ජාත්‍යන්තර මත වාදයන් ගොඩ නඟා ගනිමින් සියලු ප්‍රජාවන්ගේ සහයෝගය ලබා ගැනීම සඳහා වඩාත් උද්යෝගයෙන් කටයුතු කිරීමට එළඹෙන වර්ෂය තුළ ද අදිටන් කර ගනිමින් පැවරෙන සියලුම කාර්යයන් මැනවින් සහ කාර්යක්ෂමව නිවැරදිව ඉටු කිරීමට ආරක්ෂක අමාත්‍යාංශය හා ඒ සමඟ සම්බන්ධ සියලු ආයතන වල කාර්ය මණ්ඩල වලට ධෛර්යය ශක්තිය සහ වාසනාව ලැබේවායි ප්‍රාර්ථනා කරමි.

ඉංජි. කරුණාසේන හෙට්ටිආරච්චි
ආරක්ෂක ලේකම්

# ආරක්ෂක රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ පණිවිඩය



අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ ආශිර්වාදයෙන් සහ ආරක්ෂක රාජ්‍ය අමාත්‍ය ගරු රුවන් විජයවර්ධන මැතිතුමාගේ මගපෙන්වීම යටතේ 2016 ගෙවුනු වසරක කාලය තුළ රණවිරු සුබ සාධනය ප්‍රමුඛ මෙහෙවර කරගනිමින් ආරක්ෂක අමාත්‍යාංශය සමඟ එක්ව ආරක්ෂක රාජ්‍ය අමාත්‍යාංශය සහ ඊට අනුබද්ධිත ආයතන වන ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලය, රණවිරු සේවා අධිකාරිය, ජාතික ශිෂ්‍ය භට බලකාය හා ආරක්ෂක සේවා පාසල විශිෂ්ඨ මෙහෙවරක් ඉටුකළ බව සතුටින් මතක් කර සිටිමි.

පසුගිය වසර දෙස ආපසු හැරී බැලීමේදී මෙම අමාත්‍යාංශය සහ ඉහත සඳහන් ආයතන වෙත අයවැය මඟින් වෙන්කරවන ලද ප්‍රතිපාදන සඳහා 80% ට අධික ප්‍රගතියක් ලබා තිබීම, විරුසර වරප්‍රසාද වැඩසටහන තවත් පියවරක් ඉදිරියට ගෙන යමින් 1983 – 2009 දක්වා විසි දෙවසරක් රණබිමේ සිටි රණවිරුවන්ය සහ ඔවුන්ට පසු පෙළක් වෙමින් දිරිය ශක්තිය දුන් ත්‍රිවිධ හමුදා, පොලිස්, සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ සිවිල් සේවකයන් සඳහා ද විරුසර වරප්‍රසාද හිමි ගැන්වීම, විශ්‍රාමික රණවිරුවන්ගේ ආර්ථික මට්ටම ඉහල නැංවීමේ අරමුණින් ඔවුන්ට රැකියා ලබාදීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම, විනය ගරුක සහ කායික්ෂම පුරවැසියන් රටට දායාද කිරීමේ අරමුණින් කණිෂ්ඨ ශිෂ්‍යභට වැඩ පිළිවෙල දීප ව්‍යාප්ත මට්ටමින් ආරම්භ කිරීම විශේෂයෙන් සඳහන් කළ යුතුය.

රණවිරුවාත්, රණවිරු පවුලත් සුරක්ෂිත කිරීමෙහිලා ආරක්ෂක රාජ්‍ය අමාත්‍යාංශය ප්‍රමුඛ මෙම ආයතන පසුගිය වසරේ ලබාගත් ජයග්‍රහණ මතින් හෙට දවසේ ද විශිෂ්ඨවූත්, පුළුල්වූත් සේවාවක් රණවිරුවන් වෙත ලබාදීමට අපේක්ෂා කරන අතර එමඟින් මියගිය, ආබාධිත රණවිරුවන් සහ ඔවුන්ගේ යැපෙන්නන්ගේ ජීවිත හෙට දවසේ වඩාත් සුරක්ෂිත වේවායි ප්‍රාර්ථනා කරමි.

ඒපීජී කිත්සිරි
ලේකම්
ආරක්ෂක රාජ්‍ය අමාත්‍යාංශය

# අමාත්‍යාංශයේ දැක්ම සහ මෙහෙවර

## දැක්ම

“සෑම සුරැකි සාමකාමී දේශයක්”

## මෙහෙවර

භෞමික අඛණ්ඩතාවයෙන් යුත්

සුරක්ෂිත ස්වෛරී රටක්

තහවුරු කිරීම උදෙසා

උපායමාර්ගික සැලසුම් හා ප්‍රතිපත්ති සකස් කිරීම

සහ

ක්‍රියාවට නැංවීම



# අමාත්‍යාංශයේ කාර්යයන් හා කර්තව්‍යයන්

2015 ජනවාරි 18 දිනැති අංක 1897/15 හා 2015 නොවැම්බර් 23 දිනැති අංක 1942/8 දරන අතිවිශේෂ ගැසට් පත්‍ර ද්විත්වය අනුව ආරක්ෂක අමාත්‍යාංශයේ හා ආරක්ෂක රාජ්‍ය අමාත්‍යාංශයේ කාර්යය හා කර්තව්‍යයන් පහත දැක්වේ.

| *කාර්යය හා කර්තව්‍යයන්* |
|---|
| • *රාජ්‍ය ආරක්ෂාව පිළිබඳ විෂයයන්ට සහ 11 වැනි තීරුවෙහි දැක්වෙන දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථාවන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම*<br>• *ආරක්ෂක සේවාවන්හි කාර්යයන් පහසුකරලීම තුළින් රටේ ආරක්ෂාව සැලසීම.*<br>• *අභ්‍යන්තර ආරක්ෂාව පවත්වා ගෙන යාම*<br>• *රාජ්‍ය හා අභ්‍යන්තර ආරක්ෂාව සම්බන්ධිත බුද්ධි සේවාවන්*<br>• *ආගන්තුක හමුදාවන් හා සබඳතා*<br>• *වෘද්ධ රණවිරුවන් හා ආබාධිත සොල්දාදුවන් පිළිබඳ කටයුතු*<br>• *පුපුරණ ද්‍රව්‍ය හා ගිනි අවි*<br>• *ප්‍රදීපාගාර නඩත්තුව (වරාය අධිකාරිය සතු ප්‍රදීපාගාරය හැර)*<br>• *ආරක්ෂක සේවයේ පුද්ගලයින් සඳහා ආරක්ෂක අධ්‍යාපනය හා පශ්චාත් සේවා අධ්‍යාපනය ලබාදීම*<br>• *ආරක්ෂක සේවා පිරිස් සඳහා උසස් අධ්‍යාපනය*<br>• *පුද්ගලික ආරක්ෂක සේවා සම්බන්ධ කටයුතු*<br>• *ගලවා ගැනීමේ මෙහෙයුම් සහ වෙරළ ආරක්ෂක සේවය පරිපාලනය කිරීම*<br>• *11 වැනි තීරුවෙහි දැක්වෙන ආයතන්ට පැවරී ඇති අනෙකුත් සියලුම විෂයයන්*<br>• *11 වැනි තීරුවෙහි දැක්වෙන ආයතනයන් අධීක්ෂණය කිරීම* |
| *11 වැනි තීරුව - අමාත්‍යාංශයට අයත් දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථාව*<br>1. *ශ්‍රී ලංකා යුධ හමුදාව*<br>2. *ශ්‍රී ලංකා නාවික හමුදාව*<br>3. *ශ්‍රී ලංකා ගුවන් හමුදාව*<br>4. *සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව*<br>5. *සර් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය*<br>6. *ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලය*<br>7. *රණවිරු සේවා අධිකාරිය*<br>8. *ආරක්ෂක සේවා විද්‍යාලය*<br>9. *ජාතික ශිෂ්‍යභට බලකාය*<br>10. *ජාතික ආරක්ෂක අරමුදල*<br>11. *රාජ්‍ය රහස් තොරතුරු සේවය*<br>12. *වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව*<br>13. *ලංකා ලොජිස්ටික්ස් ලිමිටඩ්*<br>14. *රක්නා ආරක්ෂක ලංකා ලිමිටඩ්* |

# අමාත්‍යාංශයේ සංවිධාන ව්‍යුහය



# අමාත්‍යාංශයේ අංශයන්හි කාර්යසාධනය

# 1. ප්‍රතිපත්ති හා සැලසුම් අංශය

## 1.1 සමාලෝචනය

ප්‍රතිපත්ති හා සැලසුම් අංශය වත්මන් හා ඉදිරි දශකය සඳහා යෝජිත ආරක්ෂිත විධි විධානයන් ශක්තිමත් කිරීම සඳහා ජාතික ආරක්ෂක ප්‍රතිපත්තියන් සකස් කිරීමේ කාර්යයෙහි නියැලී සිටි. එමෙන්ම අමාත්‍යාංශය හා රාජ්‍ය අමාත්‍යාංශය සඳහා වාර්ෂිකව වෙන් කරනු ලබන ප්‍රතිපාදනයන් උපයෝජනය කිරීමේ ප්‍රගතිය අධීක්ෂණය කරනු ලබන ඒකකය වශයෙන් ද කටයුතු කරනු ලබයි.

### 1.1.1 කාර්යභාර්යයන්

- රාජ්‍ය ආරක්ෂක ප්‍රතිපත්තිය සකස් කිරීමේ කටයුතු සම්බන්ධීකරණය
- කාර්ය සාධන වාර්තාව, ප්‍රගති වාර්තාව, සකස් කිරීම හා පාර්ලිමේන්තුවේ සභාගත කිරීම.
- වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම.
- ප්‍රතිපාදන වෙන් කරගැනීම සඳහා ව්‍යාපෘති යෝජනා සකස් කර ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.
- රුපියල් මිලියන 20ට වැඩි ව්‍යාපෘති සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගැනීම.
- ආරක්ෂක අමාත්‍යාංශය හා ඊට අනුබද්ධිත ආයතන මඟින් සිදු කරනු ලබන ව්‍යාපෘති අධීක්ෂණය හා එකී ව්‍යාපෘතිවල ප්‍රගතිය සමාලෝචනය කිරීම.
- ව්‍යාපෘති සම්බන්ධ තොරතුරු අනිකුත් රාජ්‍ය ආයතන වෙත ලබා දීම.
- රේඛීය අමාත්‍යාංශයන්ට අදාළව ක්‍රියාත්මක වන රජයේ විශේෂ ව්‍යාපෘති හා වැඩසටහන් වලට සඳහා අවශ්‍ය සහය ලබා දීම. උදා: ආපදා කළමණාකරණය
- ජනාධිපති ලේකම් කාර්යාලය මගින් ක්‍රියාත්මක කරනු ලබන විශේෂ ව්‍යාපෘති අධීක්ෂණය කිරීම.
- ව්‍යාපෘති/ වැඩසටහන් හි භෞතික ප්‍රගතිය අධීක්ෂණය

## 1.2 2016 වර්ෂයේ කාර්යසාධනය

- **ආරක්ෂක ප්‍රතිපත්තිය සකස් කිරීම**

  ජාතික ආරක්ෂක ප්‍රතිපත්තිය සකස් කෙරෙමින් පවතින අතර ප්‍රතිපත්ති සම්පාදනයේදී පැනනඟින ගැටළු විසඳීම සඳහා පාර්ශව අතර සම්බන්ධීකරණය සිදු කරන ලදි.

- **ජාතික ආරක්ෂක අධ්‍යයන ආයතනය (National Institute of Security Studies Sri Lanka INSSSL) පිහිටුවීම**

  ජාතික ආරක්ෂක අධ්‍යයන ආයතනය (National Institute of Security Studies Sri Lanka) පිහිටුවන ලද අතර අමාත්‍යාංශය හා INSSL අතර අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු සිදු කරන ලදි.

- **කාර්යසාධන වාර්තාව සකස් කිරීම**

  2015 වර්ෂයේ කාර්ය සාධන වාර්තාව පිළියෙළ කොට පාර්ලිමේන්තුවේ සභාගත කරන ලදි .ඊට අමතරව, ත්‍රිවිධ හමුදාවන්ට අයත් කාර්ය සාධන වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කරන ලදි.

- **ව්‍යාපෘති සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීම**

  රු.මි.20 ඉක්මවන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගන්නා ලදි.

- **ප්‍රගති සමාලෝචනය**

  කාර්තුමය වශයෙන් ප්‍රගතිය අධීක්ෂණය කිරීම සඳහා අමාත්‍යාංශයන්ට අනුබද්ධ සියලුම අයතනයන්හි සහභාගීත්වයෙන් ප්‍රගති සමාලෝචන රැස්වීම් පවත්වන ලදි.

- **වාර්ෂික ප්‍රගති වාර්තාව සකස්කිරීම**

  2016 අමාත්‍යාංශය හා ඊට අනුබද්ධ ආයතනයන්හි ප්‍රගතිය විශ්ලේෂණය කරමින් 2016 ජනවාරි 01 දින සිට 2016 අගෝස්තු 31 දින දක්වා වන කාල පරිච්ඡේදය ආවරණය වන ලෙස සකස් කරන ලද ප්‍රගති වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කරන ලදී.

- **වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම**

  2017 වර්ෂය සඳහා වන ක්‍රියාකාරී සැලැස්ම සකස් කරන ලද අතර එම සැලැස්ම ජනාධිපති ලේකම් කාර්යාලය, භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව, ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරන ලදී.

- **ව්‍යාපෘති ප්‍රගති සමාලෝචනය**

  අමාත්‍යාංශය හා ඊට අනුබද්ධ ආයතන හරහා ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති වල මාසික හා කාර්තුමය ප්‍රගතිය පිළිබඳ වාර්තා ජනාධිපති ලේකම් කාර්යාලය, ජාතික අයවැය දෙපාර්තමේන්තුව හා ව්‍යාපෘති අධීක්ෂණ හා කළමනාකරණ දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරන ලදි.

- **ආර්ථික කළමනාකරණය සඳහා වන අමාත්‍ය මණ්ඩල කමිටුව (Cabinet Committee on Economic Management-CCEM) මගින් ගන්නා ලද තීරණයන්හි ප්‍රගතිය වාර්තා කිරීම**

  CCEM මගින් අමාත්‍යාංශයට අදාළව ගන්නා ලද තීරණයන්හි ප්‍රගතිය අධීක්ෂණය සිදුකරන ලද අතර ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරන ලදී.

- **ජාතික ආරක්ෂාව පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව (Sectoral Oversight Committee on National Security- SOCNS)**

  අමාත්‍යාංශය හා ඊට අනුබද්ධ ආයතන හරහා ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘති / වැඩසටහන්හි ප්‍රගතිය හා ආයතනයන්හි කාර්යයන් සම්බන්ධ නීති පද්ධතිය පිළිබඳ වාර්තා සහ අමාත්‍යාංශ ව්‍යාපෘති හා වැඩසටහන් ජාතික ආරක්ෂාව පිළිබද ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත විධිමත් පරිදි නියමිත දිනට ඉදිරිපත් කරන ලදි.

- **මූල්‍ය හා භෞතික ප්‍රගති වාර්තා ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීම**

  අමාත්‍යාංශය හා අනුබද්ධිත ආයතනයන්හි 2016 වසරේ ප්‍රතිපාදන යෙදවීම පිළිබඳ මූල්‍යමය හා භෞතිකමය ප්‍රගතිය සති දෙකකට වරක් ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙත ලබා දී අමාත්‍යාංශ ප්‍රතිපාදන නිසි පරිදි ලබාගැනීමට අවශ්‍ය කටයුතු කරන ලදි.

- **මානුෂීය සොයාගැනීමේ හා මුදාගැනීම් කණ්ඩායම්හි ධාරිතා සංවර්ධනය**

  ආපදා කළමනාකරණය සම්බන්ධව ත්‍රිවිධ හමුදාවේ සෝදිසි කිරීමේ හා මුදා ගැනීමේ කණ්ඩායම්වල කුසලතා වර්ධනය සඳහා අවශ්‍ය උපකරණ මිලදී ගැනීම හා පුහුණු ලබාදීමේ කටයුතු සිදු කරන ලදි.

## 1.3 අනාගත අපේක්ෂා

- ආරක්ෂක අමාත්‍යාංශය හා ඊට අනුබද්ධ ආයතන මගින් ක්‍රියාත්මක කරන ව්‍යාපෘති තොරතුරු ඇතුළත් දත්ත පද්ධතියක් සැකසීම හා එය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.
- 2017 වර්ෂයේ ක්‍රියාකාරී සැළැස්ම අනුව ඉදිරි සැලසුම් ක්‍රියාත්මක කිරීම හා ඒ සඳහා වෙන්වී ඇති ප්‍රතිපාදන ඵලදායීව යෙදවීම හා අධීක්ෂණය
- 2018 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම, අදාළ රාජ්‍ය ආයතන වෙත යොමු කිරීම හා ප්‍රතිපාදන ඵලදායිව යෙදවිම.
- 2016 වර්ෂයට අයත් කාර්ය සාධන වාර්තාව සකස් කිරීම හා නියමිත දිනට ප්‍රථම පාර්ලිමේන්තුවේ සභාගත කිරීම.
- ප්‍රතිපත්ති සම්පාදනයට අදාළ කාර්යයන් සම්බන්ධීකරණය කිරීම.
- මානුෂීය සොයාගැනීමේ හා මුදාගැනීමේ කණ්ඩායම් හි ධාරිතා සංවර්ධනයට අදාළ ප්‍රගතිය අධීක්ෂණය

# 2. ආරක්ෂක අංශය

## 2.1 සමාලෝචනය

මෙම අමාත්‍යාංශයේ ආරක්ෂක අංශය ත්‍රිවිධ හමුදාවන්හි ආයතනික කටයුතු සම්බන්ධ රාජකාරි ඉටු කරනු ලබයි. මෙම රාජකාරි වලට අමතරව එක්සත් ජාතීන්ගේ සාමසාධක මෙහෙයුම් වල නිරත බලඇණි සම්බන්ධ කටයුතු මෙන්ම ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ ආයතනික කටයුතුද සිදු කරනු ලබයි.

## 2.2 2016 වර්ෂයේ කාර්යසාධනය

### 2.2.1 උසස් කිරීම්, විශ්‍රාම ගැන්වීම්, අධිකාරිගත කිරීම

ආරක්ෂක අංශය විසින් සිදු කරනු ලබන ත්‍රිවිධ හමුදාවන්හි ආයතනික කටයුතු පහත සඳහන් අයුරින් 2016-01-01 දින සිට 2016-12-31 දින දක්වා කාලය තුළ දී ඉටු කර ඇත.

| සේවය | උසස් කිරීම් | විශ්‍රාම ගැන්වීම් | අධිකාරිගත කිරීම් |
|---|---|---|---|
| යුද්ධ හමුදාව | 222 | 206 | 52 |
| නාවික හමුදාව | 333 | 35 | 187 |
| ගුවන් හමුදාව | 77 | 16 | 90 |
| එකතුව | **632** | **257** | **329** |

2.1 වගුව : උසස් කිරීම්, විශ්‍රාම ගැන්වීම්, අධිකාරිගත කිරීම්

### 2.2.2 පුද්ගලික / ක්‍රීඩා (විදේශ) නිවාඩු

| සේවය | පුද්ගලික නිවාඩු | ක්‍රීඩා නිවාඩු |
|---|---|---|
| නාවික හමුදාව | 347 | 408 |
| යුධ හමුදාව | 140 | 120 |
| ගුවන් හමුදාව | 95 | 60 |
| එකතුව | **582** | **588** |

2.2 වගුව : පුද්ගලික/ ක්‍රීඩා (විදේශ) නිවාඩු

ත්‍රිවිධ හමුදා පුද්ගලයන් වෙනුවෙන් ඉහත පරිදි පුද්ගලික නිවාඩු / ක්‍රීඩා නිවාඩු (විදේශ) සඳහා අනුමැතිය ලබා දී ඇත.

### 2.2.3 වන්දි

මියගිය හා ආබාධිත ත්‍රිවිධ හමුදා පුද්ගලයන්ට හා ඔවුන්ගේ පවුලේ සාමාජිකයින්ට වන්දි ලබාදීම සිදු කරන ලදී.

| විස්තරය | යුද්ධ හමුදාව | නාවික හමුදාව | ගුවන් හමුදාව |
|---|---|---|---|
| 1. මියගිය අයගේ යැපෙන්නන් සඳහා වන්දි මුදල් ගෙවීම | 63 | 3 | 3 |
| 2. ත්‍රස්තවාදී ක්‍රියා හේතුවෙන් ආබාධිත වූ අයට අවුරුදු 55 තෙක් වැටුප් හා දීමනා ගෙවීම | 2509 | 12 | 3 |
| 3. රාජකාරියේ යෙදී සිටියදී හදිසි අනතුරු වලට පත් අයට වන්දි මුදල් ගෙවීම | 225 | 407 | 07 |
| 4. අසාමාන්‍ය හේතූන් මත මියගිය අයගේ යැපෙන්නන් වෙත වැටුප් ගෙවීම | 38 | 06 | 03 |
| 5. වැන්දඹුවන් දෙවන විවාහ වීමෙන් පසු වන්දි (ත්‍රිවිධ හමුදාවන්හි) | 95 | - | - |
| 6. වයස අවුරුදු 26 තෙක් දරුවන්ට වැටුප් ගෙවීම (ත්‍රිවිධ හමුදාවන්හි) | 43 | - | - |
| එකතුව | **2973** | **428** | **16** |

2.3 වගුව : වන්දි ලැබූ පුද්ගලයන්

### 2.2.4 රණවිරු සුරකුම් දීමනාව

ක්‍රියාත්මක රාජකාරියේදී ත්‍රස්තවාදී ක්‍රියා හේතුවෙන් අබාධිත වූ අමප/1982/305(09) හා 1982.07.21 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව වයස අවු 55 දක්වා වැටුප් හා දීමනා ලබා ගන්නා රණවිරුවන්ට ද එලෙස වැටුප් හා දීමනා ලබා ගන්නා විවාහක රණවිරුවන්ගේ ඇවෑමෙන් ඔවුන්ගේ භාර්යාවන්ට ද, ත්‍රස්තවාදී ක්‍රියා හේතුවෙන් මියගිය රණවිරුවන්ගේ වැන්දඹු බිරින්දෑවරුන්ට ද ඔවුන් ජීවත්ව සිටින තෙක් පමණක් සියයට 85 විශ්‍රාම වැටුපට සියයට 15ක් රණවිරු සුරකුම් දීමනාව ලෙස එක්කර සියයට 100ක විශ්‍රාම වැටුපක් හිමිගැන්වීම.

## 2.2.5 හිඟ වැටුප්

ත්‍රස්තවාදී ක්‍රියා හේතුවෙන් දුබලතාවයට පත්ව දුබලතාවය 50 ට අඩු හා 20 වැඩි වීම හේතුවෙන් අමාත්‍ය මණ්ඩල තීරණ අංක අමප/1982/305(09) යටතේ ප්‍රතිලාභ නොලබා අදාල සේවා කාලය සම්පූර්ණ කර විශ්‍රාම ගොස් හෝ අස්ව ගොස් සිටින ත්‍රිවිධ හමුදා සේවයේ පුද්ගලයන් 1573 දෙනෙකු වෙත ඔවුන් විශ්‍රාම ගැන්වූ දින සිට 2014.03.01 දින දක්වා හිමිවිය යුතු හිඟ වැටුප වර්ෂයක් තුලදී එක් එක් පුද්ගලයාට අදාල හිඟ වැටුපෙන් 1/15 බැගින් වසර 15 ක් තුලදී ගෙවා නිම කිරීමට කටයුතු කිරීම සඳහා 2016.04.07 දින අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කරන ලදී. එම අමාත්‍ය මණ්ඩල සංදේශයට අංක අමප/16/0754/703/034 – I හා 2016.12.13 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මගින් අනුමැතිය ලැබී ඇත.

## 2.2.6 10/12 විශ්‍රාම වැටුප

ත්‍රස්තවාදී ක්‍රියා හේතුවෙන් ආබාධිතව හමුදා සේවයෙන් අස්ව ගොස් ගණනීය සක්‍රිය සේවා කාලය වසර 10 ක් සම්පූර්ණ කර නොමැති නිලධාරී සහ වසර 12 ක් සම්පූර්ණ කර නොමැති සෙසු නිලයන් සඳහා විශ්‍රාම වැටුප ලබා දීම සම්බන්ධව අතිගරු ජනාධිපතිතුමාගේ උපදෙස් පරිදි 1981 සන්නද්ධ හමුදා විශ්‍රාම වැටුප සහ පාරිතෝෂිත ව්‍යවස්ථා සංග්‍රහය සංශෝධනය කිරීම අංක 1992/76 හා 2016/11/11 ඇති විශේෂ ගැසට් පත්‍රය මගින් සිදු කර ඇත.

## 2.2.7 දුබලතා විශ්‍රාම වැටුප

දුබලතා විශ්‍රාම වැටුප ලබා දීම සම්බන්ධයෙන් 1981 සන්නද්ධ හමුදා විශ්‍රාම වැටුප් හා පාරිතෝෂිත ව්‍යවස්ථා සංග්‍රහයේ සංශෝධනයට අදාල ගැසට් නිවේදන සංශෝධනයට නීතිපති වෙත ඉදිරිපත් කර ඇත.

## 2.2.8 පදක්කම් හා සන්ධාර ප්‍රදානය

ත්‍රිවිධ හමුදාවේ සියලුම නිලයන් වෙනුවෙන් කළ සේවය අගය කරනු වස් පදක්කම් හා සන්ධාර ප්‍රදානය කිරීම සිදු කරන ලදී.

| පදක්කම් වර්ගය | යුද්ධ හමුදාව | නාවික හමුදාව | ගුවන් හමුදාව |
|---|---|---|---|
| විදේශ සේවා පදක්කම | 14938 | 57 | 104 |
| දීර්ඝ සේවා පදක්කම | 4041 | 2040 | 698 |
| දේශපුත්‍ර පදක්කම | - | 07 | - |
| ප්‍රශංසනීය සේවා පදක්කම | - | 50 | - |
| වීර ක්‍රියා පදක්කම | 7966 | 144 | 101 |
| **එකතුව** | **26945** | **2298** | **903** |

2.4. වගුව : පදක්කම් හා සන්ධාර ප්‍රදානය

## 2.2.9 පුහුණු පාඨමාලා

### 2.2.9.1 විදේශීය රාජ්‍යයන් මගින් ප්‍රදානය කළ පුහුණු පාඨමාලා

| රට | යුද්ධ හමුදාව | නාවික හමුදාව | ගුවන් හමුදාව | වෙරළාරක්ෂක දෙපාර්තමේන්තු | එකතුව |
|---|---|---|---|---|---|
| ඉන්දියාව | 102 | 134 | 49 | - | **285** |
| පකිස්තානය | 78 | 38 | 23 | - | **139** |
| බංගලාදේශය | 45 | 17 | 09 | - | **71** |
| නේපාලය | 02 | - | - | - | **02** |
| මැලේසියාව | 08 | - | - | - | **08** |
| චීනය | 42 | 19 | 09 | - | **70** |
| අනෙකුත් විදේශ රටවලින් | 295 | 481 | 127 | 02 | **905** |
| එකතුව | **572** | **689** | **217** | **02** | |

2.5 වගුව : හමුදා සේවාවන්හි පුහුණුව ලැබූ පුද්ගලයන්

### 2.2.9.2 ජාතික ආරක්ෂක පාඨමාලා

| පාඨමාලාව ලබා දෙනු ලබන රට | යුද්ධ හමුදාව | නාවික හමුදාව | ගුවන් හමුදාව |
|---|---|---|---|
| ඉන්දියාව | 1 | 1 | |
| පකිස්තානය | 2 | 2 | 1 |
| බංගලාදේශය | 2 | 1 | |
| චීනය | 4 | 2 | 1 |
| දකුණු කොරියාව | 1 | - | - |
| පිලිපීනය | 1 | - | - |
| ඉන්දුනීසියාව | 2 | - | - |
| **එකතුව** | **13** | **06** | **02** |

2.6 වගුව : පුහුණුව ලැබූ පුද්ගලයින්

### 2.2.9.3 ලැයිස්තුගත නොවන පාඨමාලා

| පාඨමාලා වර්ගය | යුද්ධ හමුදාව | නාවික හමුදාව | ගුවන් හමුදාව | වෙරළ ආරක්ෂක දෙ. |
|---|---|---|---|---|
| ඇමරිකානු එක්සත් ජනපදයෙන් ලද පාඨමාලා | 32 | 23 | 22 | 01 |
| ලැයිස්තුගත නොවන පාඨමාලා | 43 | 24 | 30 | 02 |

2.7. වගුව : ලැයිස්තුගත නොවන පාඨමාලාවන් සඳහා සහභාගි වූ පුද්ගලයින්

### 2.2.9.4 විදේශ සම්පත් දෙපාර්තමේන්තුවෙන් ලද පාඨමාලා සඳහා සහභාගි වූ පුද්ගලයින්

| පාඨමාලා ලබා දී ඇති පුද්ගලයින් | සංඛ්‍යාව |
|---|---|
| යුධ | 05 |
| නාවික | 11 |
| ගුවන් | 06 |
| වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව | 08 |
| සිවිල් නිලධාරින් | 06 |

2.8 වගුව : පාඨමාලා සඳහා සහභාගි වූ පුද්ගලයින්

## 2.2.10 සම්මන්ත්‍රණ, වැඩමුළු හා සංචාර

විදේශ රටවලින් විදේශ සංචාර / වැඩමුළු හා සම්මන්ත්‍රණ අවස්ථා 53 ක් යුධ හමුදාව වෙනුවෙන්ද, 55ක් නාවික හමුදාව වෙනුවෙන් ද 35ක් ගුවන් හමුදාව වෙනුවෙන් ද 11 ක් වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව වෙනුවෙන් ද ලබා දී ඇත.

## 2.2.11 විශ්ව විද්‍යාල ප්‍රවේශ

ත්‍රිවිධ හමුදාවෙ 2015 / 2016 අධ්‍යයන වර්ෂය වෙනුවෙන් ඇතුලත්ව විශේෂිත ක්‍රමය යටතේ ලබාදෙන විශ්ව විද්‍යාල ප්‍රවේශය වෙනුවෙන් ලද අයදුම්පත් පහත සඳහන් පරිදි ප්‍රතිපාදන කොමිෂන් සභාවට යොමුකර ඇත.

| සේවාව | ඉංජිනේරු විෂයධාරාව | ජීව විද්‍යා විෂයධාරාව | දන්ත වෛද්‍ය පාඨමාලා |
|---|---|---|---|
| යුධ හමුදාව | 07 | 03 | 01 |
| නාවික හමුදාව | 01 | 02 | - |
| ගුවන් හමුදාව | - | - | - |

2.9 වගුව : විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා අයදුම්පත් යොමු කළ සංඛ්‍යාව

## 2.2.12 විවිධ ඉල්ලීම්

සන්නද්ධ හමුදා පුද්ගලයන් හා ඔවුන්ගේ පවුල්වල අය විසින් සෘජුවම සහ ජනාධිපති ලේකම් කාර්යාලය, අගමැති කාර්යාලය, විවිධ මැති ඇමතිවරුන් හා විවිධ පුද්ගලයින් හා ආයතන ආරක්ෂක අංශය වෙත යොමු කරන ලද විවිධ ඉල්ලීම් සම්බන්ධ ලිපි 1510 වෙනුවෙන් කටයුතු කර ඇත.

## 2.2.13 වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවට අදාළ රාජකාරි

- වෙරළාරක්ෂක පනත සඳහා සංශෝධන සිදුකිරීම.
- ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ නිල ඇඳුම් රෙගුලාසි සඳහා අනුමැතිය ලබා දීම.
- ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව සඳහා තෙල් කාන්දු ප්‍රතිචාර කලමනාකරණ උපකරණ ප්‍රතිසම්පාදනය සඳහා වන ප්‍රතිපාදන 2017 වර්ෂයේ අයවැය මඟින් වෙන් කරවා ගැනීම.

## 2.2.14 කැබිනට් පත්‍රිකා

මෙම අංශයෙන් සිදුවන ත්‍රිවිධ හමුදා හා වෙරළාරක්ෂක දෙපාර්තමේන්තුවේ ආයතනික කටයුතු වලට අදාළ වන අමාත්‍ය මණ්ඩල සංදේශ පහත පරිදි සකස් කර ඇත.

- මගීන් ප්‍රවාහනය සඳහා සුදුසු ගුවන් යානා දෙකක් (02) අත්පත් කර ගැනීම.
- ශ්‍රී ලංකා ගුවන් හමුදාව සතු සැහැල්ලු ගුවන් යානා බලඝණය පුළුල් කිරීම සඳහා නව Y-12 IV සැහැල්ලු ප්‍රවාහන ගුවන් යානා දෙකක් මිලදී ගැනීම.
- ශ්‍රී ලංකා ගුවන් හමුදාව සතු කල් ඉකුත්ව යමින් පවත්නා සටන් ගුවන් යානා බලඝණය වෙනුවට නව බහුකාර්ය සටන් ගුවන් යානා 08ක් සහ අදාළ අවි ආයුධ මිලදී ගැනීම.
- ශ්‍රී ලංකා ගුවන් හමුදාව සතු පුහුණු ගුවන් යානා බලඝණය වර්ධනය කිරීම සඳහා නව පීටී-6 (PT-6) ප්‍රාථමික පුහුණු යානා 06ක් මිලදී ගැනීම.
- ශ්‍රී ලංකා යුද්ධ හමුදාව හා ශ්‍රී ලංකා පොලිසිය වෙතින් එක්සත් ජාතීන්ගේ සාමසාධක රාජකාරීන්
- සඳහා මාලි රාජ්‍යය තුල ස්ථාපිත කිරීමට නියමිත සංග්‍රාමික ප්‍රවාහන බලඇණිය වෙත අවශ්‍යතා මිල දී ගැනීම.
- කොන්ත්‍රාත් පදනම මත ශ්‍රී ලංකා යුද්ධ හමුදාව සඳහා ශල්‍ය වෛද්‍ය උපදේශකවරයෙකු බඳවා ගැනීම. (වෛද්‍ය ගාමිණී ගුණතිලක)
- 'කාර්යක්ෂම සේවා විභූෂණය / පදක්කම ' සහ 'ප්‍රශංසනීය සේවා විභූෂණය / පදක්කම' ප්‍රදානය කිරීම සඳහා පොදු ක්‍රමවේදයක් ස්ථාපනය කිරීම.
- 2002 වර්ෂයේ සිට 2010 වර්ෂය දක්වා වූ වාර්ෂික කාර්ය සාධන වාර්තා අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම- ශ්‍රී ලංකා ගුවන් හමුදාව.

- බෙලරුස් ජනරජය සමඟ යුද කටයුතු සඳහා තාක්ෂණික සහයෝගිතාව පිළිබඳ ගිවිසුම.
- ශ්‍රී ලංකා ගුවන් හමුදාව සඳහා නව PT-6 ප්‍රාථමික පුහුණු ගුවන් යානා 06 ක් මිලදී ගැනීම
- ඇමෙරිකානු රාජ්‍ය දෙපාර්තමේන්තු ලෝක ව්‍යාප්ත ව්‍යාපෘතීන්හි සේවයේ නියුක්ත කිරීම සඳහා නීත්‍යානුකූලව සේවයෙන් ඉවත් වූ ත්‍රිවිධ හමුදා පිරිස් පුහුණු කිරීමේ ආයතනයක් ශ්‍රී ලංකාවේ පිහිටුවීමට FSI SECURITAS මගින් ඉදිරිපත් කරන ලද යෝජනාව.
- ශ්‍රී ලංකා ගුවන් හමුදාව නව Y-12 IV සැහැල්ලු ප්‍රවාහන ගුවන් යානා 02 ක් මිලදී ගැනීම.
- ක්‍රියාන්විත රාජකාරියේදී ත්‍රස්තවාදී ක්‍රියා හේතුවෙන් තුවාල ලබා ආබාධිතව ත්‍රිවිධ හමුදා සේවයෙන් ඉවත්ව යන රණවිරුවන්ට වයස අවු. 55 සම්පූර්ණ වූ පසු මියයන තෙක්ම වැටුප් හා දීමනා ලබා දීම.
- ක්‍රියාන්විත රාජකාරියේදී ත්‍රස්තවාදී ක්‍රියා හේතුවෙන් ආබාධිත වූ අමප/1982/305(09) ලබා ගන්නා රණවිරුවන්ට ද එලෙස වැටුප් හා දීමනා ලබා ගන්නා විවාහක රණවිරුවන්ගේ ඇවෑමෙන් ඔවුන්ගේ භාර්යාවන්ට ද, ත්‍රස්තවාදී ක්‍රියා හේතුවෙන් මියගිය රණවිරුවන්ගේ වැන්දඹු බිරින්දෑවරුන්ට ද ඔවුන් ජීවත්ව සිටින තෙක් පමණක් සියයට 85 විශ්‍රාම වුපට සියයට 15 ක් රණවිරු සුරකුම් දීමනාව ලෙස එක්කර සියයට 100 ක විශ්‍රාම වැටුපක් හිමි ගැන්වීම.
- ත්‍රිකුණාමලය නාවික හා නාගරික අධ්‍යාපන සංකීර්ණයෙහි ශේෂ වූ ඉදි කිරීම.
- ශ්‍රී ලංකා වෙරළාරක්ෂක දෙපාර්තමේන්තුව සඳහා තෙල් කාන්දු ප්‍රතිචාර කළමනාකරණ උපකරණ ප්‍රසම්පාදනය සඳහා වන ප්‍රතිපාදන 2017 වර්ෂයේ අයවැය මඟින් වෙන් කරවා ගැනීම.
- රාජ්‍ය පුද්ගලික හවුල් ව්‍යාපාර සහයෝගීතාවයක් තුළින් අභ්‍යන්තර ගුවන් සේවයක් ස්ථාපිත කිරීම.
- ශ්‍රී ලංකා ගුවන් හමුදාව වෙත බෙල් හෙලිකොප්ටර් යානා සහ ඉහල ධාරිතාවයකින් යුත් ප්‍රහුන්ප්‍රවාහනය කිරීමේ හෙලිකොප්ටර් යානා මිලදී ගැනීම සඳහා තාක්ෂණික සහ මූල්‍ය යෝජනා ලබා ගැනීම.
- ශ්‍රී ලංකා ගුවන් හමුදාව වෙත මධ්‍යම ආරක්ෂක ප්‍රවාහන ගුවන් යානා මිලදී ගැනීම.

## 2.3 ඉදිරි වසර සඳහා කල් තබන ලද කාර්යයන්

- ඔයාමඩුව අවි ගබඩාව ඉදිකිරීම.

## 2.4 අනාගත අපේක්ෂා

- ශාඛාවේ කාර්ය මණ්ඩලයට ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්වරයෙක්, සහකාර ලේකම්වරයෙක්, කලමනාකරණ සහකාර නිලධාරින් තුන්දෙනෙකු හා කාර්යාල කාර්ය සහායකයෙකු ඇතුළත් කර ගැනීම.
- ශාඛාවේ එදිනෙදා වැඩ කටයුතු පහසුවෙන් හා කාර්යයක්ෂමව කර ගැනීම සඳහා පරිගණක පහසුකම් ලබා ගැනීම.
- නිමකළ ලිපිගොනු ගබඩා කර තැබීම සඳහා විධිමත් ලේඛනාගාර පහසුකම් ලබා ගැනීම.
- කාර්යාල කටයුතු පරිගණක ගත කිරීම.

# 3. තාක්ෂණික අංශය

## 3.1 සමාලෝචනය

ජාතික ආරක්ෂාව සම්බන්ධයෙන් වන සන්නිවේදන හා ඉංජිනේරු කටයුතු ද මහජනතාවට ඔවුන්ගේ උපයෝගයෙන් පරිහරණය කළ හැකි වන පරිදි උපයෝගී කර ගැනීම හා සංවර්ධනය කිරීම සඳහා ඉවහල් වන ක්‍රමෝපායන් සකස් කිරීම ද ආරක්ෂක අමාත්‍යාංශයේ තාක්ෂණ අංශය වෙත පැවරී ඇත. ගුවන් විදුලි සන්නිවේදනය, විදුලි සංදේශ සේවා, රූපවාහිනි විකාශන කටයුතු, දත්ත සන්නිවේදනය, නිරීක්ෂණ සැපයීම් සහ රටේ ජාතික ආරක්ෂාවට බලපාන සන්නිවේදන, නාවුක හා ආවේක්ෂණ උපකරණ ආනයනය, ස්ථාපනය සහ ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවෙන් අවශ්‍ය කරන අනුමැතිය ලබා දීම යන කටයුතු සන්නිවේදන විෂයපථයට අදාල වේ. ජාතික ආරක්ෂාව තහවුරු කරන අතර රජය විසින් උපදෙස් දුන් පරිදි දිවයින පුරා යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය සිවිල් සහ ක්ෂේත්‍ර ඉංජිනේරු සහාය ලබාදීම ඉංජිනේරු විෂයපථයට අදාල කාර්යභාරයන්ය.

තාක්ෂණ අංශය විසින් රේඛීය අමාත්‍යාංශය සහ ආයතන සමග ජාතික ආරක්ෂාව පිළිබඳ සන්නිවේදන සහ ඉංජිනේරු කටයුතු සම්බන්ධයෙන් සමායෝජනය සහ සම්බන්ධීකරණය කරනු ලබයි.

මේ වන විට තාක්ෂණ අංශය මගින් ක්‍රියාත්මක කරමින් පවතින ප්‍රධාන ව්‍යාපෘති වනුයේ ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය (DHQC) පිළිබඳ ව්‍යාපෘතිය හා උපායමාර්ගික සන්නිවේදන ජාල (SDCN) ව්‍යාපෘතියයි. මෙම ව්‍යාපෘති වලට අමතරව, පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය විසින් ක්‍රියාත්මක කරනු ලබන පර්යේෂණ ව්‍යාපෘති අධීක්ෂණය කිරීම ද තාක්ෂණ අංශය මගින් සිදු කෙරේ.

## 3.2 තාක්ෂණ අංශය විසින් ඉටු කරන ලද ක්‍රියාකාරකම් විශ්ලේෂණය

2016 වර්ෂයේදී තාක්ෂණ අංශය විසින් කුළුණු 197ක් ඉදිකිරීම සඳහා සන්නිවේදන සේවා සැපයුම්කරුවන් හට අවශ්‍ය ආරක්ෂණ නිෂ්කාශන ලබාදුන් අතර විදුලි/සන්නිවේදන උපයෝග 160 ක විකුණුම් බලපත්‍ර සඳහා ද ආරක්ෂණ නිෂ්කාශන ලබා දෙන ලදී.




3.1 ප්‍රස්ථාරය : සන්නිවේදන කුළුණු සඳහා ආරක්ෂක නිෂ්කාශන ලබාදීම - 2016
මූලාශ්‍රය: තාක්ෂණ අංශය

සන්නිවේදන සහ නාවුක උපකරණ , රථවාහන නිශ්චය කරගැනීමේ පද්ධති, බහුකාර්ය වර්ණ මුද්‍රණ යන්ත්‍ර, drone (Quad Copter, Airplane, USV) සහ ආධුනික ගුවන් විදුලි බලපත්‍ර හිමියන්ට ගුවන් විදුලි උපාංග (දේශිය/විදේශිය ) ආනයනය කිරීම සඳහා ආරක්ෂක නිෂ්කාශන ලබා දී ඇත.




3.2 ප්‍රස්ථාරය : ආරක්ෂක නිෂ්කාශන නිකුත් කිරීම

විදුලි සංදේශ නියාමන කොමිෂම සමග එක්ව ධීවර සහ ජලජ සම්පත් දෙපාර්තමේන්තුව යටතේ ලියාපදිංචි වී ඇති ධීවර ට්‍රෝලර් යාත්‍රා 629 ක් සඳහා ගුවන් විදුලි සංඥා /සංඛ්‍යාත භාවිතා කිරීමට ආරක්ෂක නිෂ්කාශන ලබාදෙන ලදී.

## 3.2.1. ආරක්ෂක මූලස්ථාන ප්‍රතිස්ථාපන ව්‍යාපෘතිය

1979 කොළඹ ප්‍රධාන සැලසුමට අනුව , වාණිජ සංවර්ධනය සඳහා ඉහළ වාණිජමය වටිනාකමකින් යුත් ඉඩම් විශාල සංඛ්‍යාවක් මුදාහැරීමට හැකි වන අයුරින් රජයේ කාර්යාල කොළඹ සිට නව පරිපාලන අගනුවර වන ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ වෙත රැගෙන යාමට සැලසුම් කරන ලදී. සියළු ආරක්ෂක අංශ එක් ආරක්ෂක මූලස්ථාන සංකිර්ණයක් යටතට ගෙනයාම තුළින් මූලිකවම බලාපොරොත්තු වනුයේ මේ වන විට ආයතන කිහිපයක් අතර බෙදී පවතින සම්පත් ඵලදායී අන්දමින් ප්‍රයෝජනයට ගැනීම, යටිතල පහසුකම් ද්වීකරණය වීම අවම කිරීම, ඔවුන්ගේ මෙහෙයුම් /පරිපාලන/ප්‍රවර්ධන කාර්යක්ෂමතාව තවදුරටත් වර්ධනය වන පරිදි ආරක්ෂක අංශ සාමාජිකයන් වෙත නවීන පහසුකම් වලින් යුත් කාර්යාල සංකීර්ණයක් ලබාදීම සහ සංකේන්ද්‍රගත සංවර්ධන කලාපය තුළ පිහිටි අධිආරක්ෂිත කලාප සංඛ්‍යාව අවම කිරීම තුළින් ආර්ථික ක්‍රියාකාරකම් සහ මහජනතාවට ඇතිවන අපහසුතාවන් අවම කිරීම යනාදිය වේ. 2011 වසරේදී ආරම්භ කරන ලද මෙහි ඉදිකිරීම් කටයුතු මේ වන විටත් සිදුවෙමින් පවතී. ඉදිකිරීම් කටයුතු කළමනාකරණය කිරීමේ පහසුව සහ මූල්‍යමය ශක්‍යතාව පිළිබඳ සළකා බැලීමෙන් අනතුරුව ඉදිකිරීම් කටයුතු අදියර 02 කට වෙන් කර ඇත.

### 3.2.1.1 ආරක්ෂක මූලස්ථාන සංකිර්ණය පිළිබඳ ව්‍යාපෘතිය - පළමු අදියර

නිලධාරින් 250 ක් සඳහා ස්ථිර නිවාස සහ සෙසු නිලයන් සඳහා තාවකාලික නවාතැන් පහසුකම් සළසමින් ප්‍රධාන ගොඩනැගිලි සංකිර්ණය (බිම් කැබලි 09ක්) , සන්නිවේදන ගොඩනැගිල්ල, ආරක්ෂක ගොඩනැගිල්ල සහ ජල පොම්පාගාරයක් ඉදිකිරීම මෙම ව්‍යාපෘතියේ පළමු අදියර වේ. ඉදිකිරීම් කටයුතු සිදු කෙරෙන අතරවාරයේ පැන නැගුණු මූල්‍යමය හේතූන් මත මෙය තවදුරටත් පහත සඳහන් අදියර වලට බෙදා ඇත.

**අදියර 01:** 2018 පෙබරවාරි 28 වන දිනට පෙර කින්නදෙණියේ පිහිටි ගොඩනැගිලි අංක 06,07,08 සන්නිවේදන ගොඩනැගිල්ල, ආරක්ෂක ගොඩනැගිල්ල,ජල පොම්පාගාරය සහ සෙසු නිලයන් සඳහා වන නිවාස ඉදිකර අවසන් කිරීම.

**අදියර 02** : පළමු අදියරේ අවසන් නොවූ ඉදිකිරීම් කටයුතු සම්පූර්ණ කිරීම.

### 3.2.1.2 ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය පිළිබඳ ව්‍යාපෘතිය - දෙවන අදියර

ත්‍රිවිධ සේවා නිලධාරින් 500ක් සහ නේවාසික සෙසු නිලයන් 6100 ක් සඳහා භෝජනාගාර සහ අනෙකුත් බාහිර අංගයන් ඇතුළු පහසුකම් සහිතව ස්ථිර වාසස්ථාන සැපයීම මෙම ව්‍යාපෘතියේ දෙවන අදියර වේ.

### 3.2.1.3 ව්‍යාපෘති කළමනාකරණය සහ ඉදිකිරීම් කටයුතු

ඉදිකිරීම් කටයුතු පහසුවෙන් කරගෙන යාම සඳහා ව්‍යාපෘතියට අදාලව විශේෂ ව්‍යුහයන් පිහිටුවන ලදි. ව්‍යාපෘති කළමනාකරණය සහ ප්‍රසම්පාදනය සඳහා ව්‍යාපෘති කළමනාකරණ ඒකකය ද ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු කරගෙන යාම සඳහා ඉදිකිරීම් කළමනාකරණ ඒකකයක් ද පිහිටුවන ලදී.

මෙම ව්‍යාපෘතියට අදාලව ව්‍යුහගත සැලැස්ම,යාන්ත්‍රික,ඉංජිනේරු,ජලනල සහ තොරතුරු තාක්ෂණ සහ ප්‍රමාණ සමීක්ෂණ කටයුතු සම්බන්ධයෙන් ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය කටයුතු සිදු කරයි.

## 3.2.2 උපායමාර්ගික ආරක්ෂක සන්නිවේදන ජාල ව්‍යාපෘතිය

දිවයින පුරා පිහිටි ත්‍රිවිධ හමුදාවේ , පොලීසියේ සහ විශේෂ කාර්ය බලකායේ කලින් තෝරාගත් ස්ථාන හා සම්බන්ධ විය හැකි ක්ෂුද්‍ර තරංග සබඳතා 37ක් හා ජාල කළමනාකරණ පද්ධතියකින් සමන්විත සුරක්ෂිත පොදු සන්නිවේදන මූලාධාරකයක් සැපයීම මෙම ව්‍යාපෘතිය මගින් ඉටුවේ.

2016 වන විට විදුලි උත්පාදක යන්ත්‍ර 22න් 10ක් ස්ථාපනය කර ඇති අතර ස්වයං ආධාරක කුළුණු 11ක් සහ ක්ෂුද්‍ර තරංග ගුවන්විදුලි සබඳතා 37ක් ඉදිකිරීම සඳහා ටෙන්ඩර් ඇගයීම් කටයුතු සිදුවෙමින් පවතී.



කොකාවිල්හි ස්ථාපනය කරන ලද විදුලි උත්පාදක යන්ත්‍රය

මෙම කාල පරිච්ඡේදය තුල (2016 ජනවාරි මස සිට දෙසැම්බර් දක්වා) භෞතික ප්‍රගතිය සියයට 10ක් වන අතර මූල්‍යමය ප්‍රගතිය වාර්ෂික වෙන්කිරීම් වලින් සියයට 3.3 ක් වූ සුළු ප්‍රමාණයකි.

## 3.2.3 පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය

පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය, වර්ෂ 2015 දී මොරගහහේන පාර, පිටිපන යන ස්ථානයේ ස්ථාපනය කරන ලද අතර පරිපාලනමය කටයුතු සහ සෙසු නිලයන් හට නවාතැන් පහසුකම් සැලසීම සඳහා දෙමහල් ගොඩනැගිල්ලක් ඉදිකරන ලදී. තෙවන අදියර යටතේ පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ සේවයේ නියුතු පර්යේෂණ නිලධාරීන් හට නවාතැන් පහසුකම් සැපයීමට නව දෙමහල් ගොඩනැගිල්ලක් ඉදිකර ගරු ආරක්ෂක ලේකම් තුමාගේ සුරතින් විවෘත කෙරුණි.



පිටිපන පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථාන සංකීර්ණය

| විස්තරය | පුනරාවර්තන වියදම්(රු.මි.) | ප්‍රාග්ධන වියදම් (රු.මි.) |
|---|---|---|
| ඇස්තමේන්තුගත වියදම | 10.5 | 36.5 |
| වියදම | 9.9 | 34.9 |
| ශේෂය | 0.6 | 1.6 |

3.1 වගුව : පුනරාවර්තන හා මූල්‍ය ප්‍රගතිය

## 3.3 2016 වර්ෂයේ කාර්යසාධනය

### 3.3.1. ආරක්ෂක මූලස්ථාන ප්‍රතිස්ථාපන ව්‍යාපෘතිය

#### 3.3.1.1 භෞතික ප්‍රගතිය

2016 ජනවාරි 01 දිනට පළමු අදියරේ ඉදිකිරීම් කටයුතු වල භෞතික ප්‍රගතිය සියයට 35.3 ක් වූ අතර 2016 දෙසැම්බර් 31 දිනට එහි සමස්ත ප්‍රගතිය සියයට 40.8 කි. සිවිලිම්,පොදු ස්ථාන සඳහා ටයිල්, තෙත් අවකාශ සඳහා ටයිල් සහ අනෙකුත් උපාංග, අලංකාරක දැව වහල යනාදී ප්‍රධාන ගණයේ ටෙන්ඩර් ප්‍රදානය කිරීමේ දී මුහුණපෑමට සිදුවූ ගැටළු හේතුවෙන් යාන්ත්‍රික , ඉංජිනේරු , ජලනල සහ තොරතුරු තාක්ෂණ වැඩකටයුතු වල ප්‍රගතිය සහ ව්‍යාපෘතියේ සමස්ත ප්‍රගතිය අඩපණවී ඇති අතර මේ හේතුවෙන් අමතර වියදම් දැරීමට සිදුවන අතර ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය ප්‍රතිස්ථාපනය කිරීමේ දින වකවානු වෙනස් විය හැකිය.



යෝජිත යුද්ධ හමුදාමූලස්ථාන කැබලි අංක 06



සන්නිවේදන ගොඩනැගිල්ල හා සංඥා



ආරක්ෂක ගොඩනැගිල්ල



ජල පොම්පාගාරය

#### 3.3.1.2 මූල්‍ය ප්‍රගතිය

| විස්තරය | ණයවර ලිපි ගෙවීම් | වෙනත් මුදල් ගෙවීම් | එකතුව |
|---|---|---|---|
| ප්‍රතිපාදන රු.මිලියන | 250 | 3,500 | 6,000 |
| දායකත්වය | 1,189 | 989 | 2,178 |
| ගෙවීම් | 1,127 | 1,767 | 2,894 |
| ශේෂය | 184 | 745 | 928 |

3.2: වගුව : DHQC ව්‍යාපෘතිය

#### 3.3.1.3 විශේෂ ගැටළු

කාලය දීර්ඝ කිරීමට ඉල්ලුම් කිරීම මෙහි ප්‍රධාන ගැටළුවක් ලෙස පෙන්වාදිය හැකි අතර දැනටමත් කොන්ත්‍රාත්කරුවන් 09 දෙනෙකු කාලය දීර්ඝ කර දෙන ලෙස ඉල්ලා ඇත.ඉදිකිරීම් කටයුතු කඩිනම් කිරීම සහ ප්‍රගතිය අධීක්ෂණය කිරීම සඳහා සියළු ඉදිකිරීම් ශිල්පීන් හට ඉලක්ක පදනම් කරගත් ඇගයුම් නිර්ණායක හඳුන්වා දුන් අතර පවතින අමතර වගකීම් ඉදිකිරීම් කළමනාකරණ ඒකකයේ අධ්‍යක්ෂ, නියෝජ්‍ය අධ්‍යක්ෂවරු සහ ව්‍යාපෘති කළමනාකරුවන් වෙත පවරන ලදී. මෙමගින් ව්‍යුහගත ඉදිකිරීම් සියල්ලේ සාර්ථක ප්‍රතිඵල අත්වූ අතර සේවා පුද්ගලයින්ට ලබාදී

තිබූ වැඩකොටස් සම්පූර්ණයෙන් පාහේ ඉටුකරගැනීමට හැකිවුණි.

2016 මැද භාගයේ සිට පසෙක දමා තිබූ යෝජිත සංවිධාන ව්‍යුහයට එකඟවන්නේ නම් මෙහි තත්ත්වය තවදුරටත් වැඩිදියුණු කළ හැකිය.කාර්යයන්හි නිරතවන අතරතුර ශිල්පීන්ගේ ශිල්පීය හැකියාවන් ඇගයීමට ලක්කිරීම සහ NVQ සහතිකය ලබාගැනීම සඳහා අවශ්‍ය වන පිළිගැනීම ඔවුනට ලබාදීමේ අරමුණින් ACTA ආයතනය සමග සම්බන්ධව වැඩපිළිවෙළක් දියත් කරන ලදී.ව්‍යාපෘතියට අදාල ශ්‍රවණාගාර, ජල පොම්පාගාර, ජල ප්‍රධානයන්, ශක්ති සැපයුම් වැනි පොදු පහසුකම්හි පවතින ගැටළු හේතුවෙන් හමුදා මූලස්ථානය, ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී කාර්යාලය, ආරක්ෂක අමාත්‍යාංශය නියමිත දින වකවානුවට ප්‍රතිස්ථාපනය කිරීමට නොහැකි විය.

යුධ හමුදා මූලස්ථානය, ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී කාර්යාලය සහ ආරක්ෂක අමාත්‍යාංශයට නියමිත ස්ථානගත වීමේ කාලසීමාව පිළිබද අවධානය යොමුකරමින් ශ්‍රවණාගාරය, ජල පොම්පාගාරය, ප්‍රධාන ජල සැපයුම් මාර්ගය සහ විදුලි බල සැපයුම වැනි පොදු පහසුකම් ගොඩනැගීම ආරම්භ කරන ලදී. ගොඩනැගිලි අංක 06,07 සහ 08 හි ඉදිකිරීම් කටයුතු සම්බන්ධ ප්‍රමුඛතාවයන්ට අමතරව , බාහිර පරිසරයට නිරාවරණය වීමෙන් දිරාපත් වූ ව්‍යුහයන් වලට සිදුවූ හානිය අවම කිරීම සඳහා ප්‍රධාන ගොඩනැගිලි වල ඉතිරි වැඩකටයුතු ශිල්පීන් යොදා නැවත ආරම්භ කරන ලද අතර මෙමගින් ව්‍යුහයන්හි ප්‍රතිස්ථාපනය සහ ස්ථාවරත්වය තහවුරු කිරීම අපේක්ෂා කෙරේ.

## 3.3.2 උපායමාර්ගික ආරක්ෂක සන්නිවේදන ජාල ව්‍යාපෘතිය

### 3.3.2.1 ගැටළු සහ අභියෝග

ස්වයං ආධාරිත සන්නිවේදන ඉදිකිරීම සඳහා ප්‍රමාණවත් ඉඩම් ලබා ගැනීමේදී පැන නැගුණු ගැටළු හේතුවෙන් ටෙන්ඩර් ක්‍රියාවලිය ද ප්‍රමාද විය. ලංසුකරුවන් බොහෝදෙනා අසම්පූර්ණ ලංසු ඉදිරිපත් කර ඇති හෙයින් කුළුණු සහ ක්ෂුද්‍රතරංග ගුවන්විදුලි සඳහා

ටෙන්ඩර් නැවත කැඳවීමට සිදුවිය හැක. වර්ෂ 2017 දී ස්වයං ආධාරික සන්නිවේදන කුළුණු 11 ඉදිකිරීමෙන් පසු ඉතිරි විදුලි ජනක යන්ත්‍ර 12 ස්ථාපනය කළ හැක.

## 3.3.3 : පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය

### 3.3.3.1 ව්‍යාපෘතීන්හි මූල්‍යමය සහ භෞතික ප්‍රගතිය

සීමිත පර්යේෂණ නිලධාරීන් පිරිසක් සහ සීමිත අයවැය ප්‍රතිපාදන ප්‍රමාණයක් මගින් සැළකිය යුතු ව්‍යාපෘති සංඛ්‍යාවක් අදාළ වසර තුළ නිම කිරීමට පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය සමත්වී ඇත.

| අ.අං. | ව්‍යාපෘති නාමය |
|---|---|
| 1 | Train Tracking System |
| 2 | Integration Effection Intelligence preparation of the Battlefield (IPB) and Development of Training Simulator for DSCSC |
| 3 | කැළණිවැලි දුම්රිය මාර්ගය පුනරුත්ථාපනය |
| 4 | සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව |
| 5 | නිර්මාණ හා සංවර්ධන 3D සිතියම් සංවර්ධන ව්‍යාපෘතිය ඩ්‍රෝන් යානා භාවිතා කරමින් |

3.3 වගුව : අනෙකුත් රජයේ ආයතන වෙත ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති

මෙම මධ්‍යස්ථානය මගින් අනෙකුත් රජයේ ආයතන වෙත ඉල්ලීම් පරිදි නිෂ්පාදනය කරන ලද උපකරණ සහ විසඳුම් ඔවුන්ගේ පැසසුමට පාත්‍ර විය.

ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය විසින් කරන ලද ඉල්ලීමකට අනුව,Colombo Suburban Railway Project (CSRP) යටතේ කැළණි නිම්න දුම්රිය මාර්ගය නවීකරණය කිරීම සඳහා මෙම මධ්‍යස්ථානය මගින් නිෂ්පාදනය කල Quad copter සහ සැහැල්ලු ගුවන් යානා යොදා ගනිමින් කැළණි නිම්න දුම්රිය මාර්ගය ගුවනින් ඡායාරූපගත කිරීම ආරම්භ කරන ලදී. පහත සඳහන් ව්‍යාපෘති සම්පූර්ණ කර ගරු ආරක්ෂක ලේකම්තුමාගේ සුරතින් 2016 අගෝස්තු මස 15 වන දින ත්‍රිවිධ හමුදාවන් වෙත නිළ වශයෙන් භාරදෙන ලදී.

| අ.අං | ව්‍යාපෘතියේ නම |
|---|---|
| 1 | Small Arms Firing Simulator |
| 2 | K-8 Simulator Project phase I |
| 3 | Field Artillery System Project |
| 4 | Quad Copter Project |
| 5 | Regimental Account Software |
| 6 | Hi-Tech soldier web application |

3.4. වගුව : පර්යේෂණ මධ්‍යස්ථානය මගින් නිෂ්පාදනය කරන ලද උපකරණ සහ විසඳුම්

| විස්තරය | ආදායම් / වියදම්(රු.) |
|---|---|
| GIS පාඨමාලා I ආදායම | 350,000.00 |
| පාඨමාලා සාමාජිකයින්ගේ ආහාර වෙනුවෙන් වියදම් | 50,000.00 |
| දේශකයින් හට ගෙවීම් | 90,000.00 |
| GIS පාඨමාලා I මුළු ආදායම | 210,000.00 |
| GIS පාඨමාලා II ආදායම | 350,000.00 |
| පාඨමාලා සාමාජිකයින්ගේ ආහාර වෙනුවෙන් වියදම් | 50,000.00 |
| දේශකයින් හට ගෙවීම් | 90,000.00 |
| GIS පාඨමාලා I මුළු ආදායම | 210,000.00 |
| මුළු ආදායම | 420,000.00 |

3.5 : වගුව ආදායම් උපයන ව්‍යාපෘති/කාර්යයන්

### 3.3.3.2 ගැටළු සහ අභියෝග

- පර්යේෂණ ව්‍යාපෘතීන් සඳහා අවශ්‍ය කරන අයිතමයන් සහ උපකරණ ආරක්ෂක අමාත්‍යාංශය යටතේ ලියාපදිංචි වී ඇති සැපයුම්කරුවන්ගෙන් පමණක් ලබාගැනීමට සිදුවන අවස්ථාවන්හිදී, ඉහළ මිල ගණන්, ඇතැම් අයිතමයන් සඳහා සැපයුම්කරුවන් නොමැති වීම සහ ඇණවුම් කළ අයිතමයන් සහ උපකරණ සැපයීමේදී සිදුවන ප්‍රමාදවීම වැනි හේතුන් මත, මෙම මධ්‍යස්ථානයට දුෂ්කරතාවන්ට මුහුණ පෑමට සිදුවූ අතර, එබැවින් එවැනි අයිතමයන් විවෘත පෙළෙදපලේ තරගකාරී සැපයුම්කරුවන්ගෙන් මිලදී ගැනීම සඳහා කිසියම් යාන්ත්‍රණයක් සකස් කර ගැනීමේ අවශ්‍යතාවය අවධාරණය කෙරේ.
- දේශීය වෙළෙඳපලේ නොමැති අයිතමයන් ඍජුවම ආනයනය කිරීමට සිදුවන අතර එවැනි ආනයන භාණ්ඩ සඳහා ගෙවීම් පියවීමේදී දුෂ්කරතාවන්ට මුහුණදීමට සිදුවේ.

## 3.4 ඉදිරි වසර සඳහා කල් තබන ලද කාර්යයන්

- **ආරක්ෂක මුලස්ථාන ප්‍රතිස්ථාපන ව්‍යාපෘතිය:** සිවිලිම්, පොදු ප්‍රදේශයන් ටයිල් කිරීම, තෙත් ප්‍රදේශ ටයිල් කිරීම සහ නාන කාමර උපකරණ මෝස්තර සහිත ලී වහලවල් ඉදිකිරීම වැනි ප්‍රධාන කරුණු සම්බන්ධයෙන් පිටස්තර ටෙන්ඩර් කැඳවීම සිදු වූ අතර එමඟින් මෙම ව්‍යාපෘතියේ යාන්ත්‍රික, ඉංජිනේරු, තොරතුරු තාක්ෂණ කටයුතු සියල්ල අඩපණ වූ අතර සමස්ථ ව්‍යාපෘති කටයුතු මේ හරහා අඩාල විය.
- **උපායමාර්ගික ආරක්ෂක සන්නිවේදන ජාල ව්‍යාපෘතිය:** ජාල කළමනාකරණ පද්ධතියත් සමඟ ස්වයං ආධාරික සන්නිවේදන කුළුණු 11, ක්ෂුද්‍ර තරංග ගුවන් විදුලි සබඳතා 37 ක් සහ විදුලිජනක යන්ත්‍ර 12 ක් ස්ථාපනය කිරීම.
- සංවර්ධන හා පර්යේෂණ මධ්‍යස්ථානය මඟින් ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘති

| අනු අංකය | ක්‍රියාකාරකම/ව්‍යාපෘතිය |
|---|---|
| 1 | Brain Controlled Interface for Artificial Limbs (BCI) |
| 2 | Development of Hexacopter |
| 3 | Ship Data Monitoring System (SDMS) |
| 4 | Development of Anti - Befouling and Anti corrosive paint using Nano Technology |
| 5 | Customizable Fire Control Solution With Stabilize Platform |
| 6 | Training Simulator for K-8 Aircraft - Phase II |
| 7 | Training Simulator for Air Traffic Controllers |
| 8 | Guided Rocket and Missile System Development Project |
| 9 | Development of Hydrogen Fuel Cell for Quod Copters and UAVS |
| 10 | Development and Renovation of Targets and Shoorte’s Evaluation |
| 11 | Armor Tank Simulator System Development |
| 12 | Development of virtual reality parachute jumper and skydiver training Simulatoer |
| 13 | Braille to Sinhala Converter |
| 14 | Under Water Surveillance & Detection System |
| 15 | Geo -information System for Chronic Kidney Disease |
| 16 | Design & Development of HF/VHF & UHF Radio Transceiver |
| 17 | Driving Simulator |
| 18 | Design and Developing 3D map Development Project Using DRONEs |
| 19 | K3 Jammer Man Pack Version |
| 20 | Development of a Solar Paint |
| 21 | Criminal Intelligence Database Management |
| 22 | Quad Copter Based LIDAR survey. |
| 23 | Vehicle tracking device development |
| 24 | Study and Develop of New Datum to National Grid Reference System |
| 25 | Vehicle Management System |

3.6. වගුව : වර්ෂ 2017 තුළ පවත්වාගෙන යා යුතු ව්‍යාපෘති

## 3.5 අනාගත අපේක්ෂා

- තාක්ෂණ අංශය තුළ ලිපි කළමණාකරණය සහ ලියකියවිලි කළමනාකරණ පද්ධති හඳුන්වාදීමෙන් අනුමැතිය ප්‍රදානය කිරීමේ ක්‍රියාවලිය කාර්යක්ෂම කිරීම.
- ශ්‍රී ලංකා යුධ හමුදාව සඳහා ගොඩනැඟිලි අංක 06 සහ 07 නිමකිරීම.
- සන්නිවේදන ගොඩනැගිල්ල සහ සංඥා කුළුණු (පොදු පහසුකම්) නිම කිරීම.
- ආරක්ෂක ගොඩනැගිල්ල (පොදු පහසුකම්) නිම කිරීම.
- ජල පොම්පාගාරය සහ ප්‍රධාන ජල සැපයුම් ඒකකය (පොදු පහසුකම්).
- මල අපවහන පද්ධතිය (පොදු පහසුකම්)
- විදුලි සැපයුම් පද්ධතිය (පොදු පහසුකම්).
- හමුදා මූලස්ථාන / ආරක්ෂක අමාත්‍යාංශයට අදාල මාර්ග ජාලය.
- හමුදා නිළධාරීන් 250 කට ස්ථිර නවාතැන් සහ තාවකාලික නවාතැන් - කිත්නදෙණිය.
- ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී කාර්යාලය සඳහා අංක 8 ගොඩනැඟිල්ල.
- ආරක්ෂක අමාත්‍යාංශය සඳහා අංක 01 ගොඩනැඟිල්ල.
- නාවික හමුදා මූලස්ථානය සඳහා අංක 3 ගොඩනැඟිල්ල.
- ගුවන් හමුදා මූලස්ථානය සඳහා අංක 3 ගොඩනැඟිල්ල.
- ප්‍රධාන ශ්‍රවණාගාරය සඳහා අංක 05 ගොඩනැඟිල්ල.
- නාවික හා ගුවන් හමුදා නිළධාරීන් 500ක් සඳහා ස්ථිර නවාතැන් සහ අනෙකුත් පහසුකම්.
- මුළුතැන්ගෙය සහ අනෙකුත් පිටස්තර කාර්යයන් සඳහා සිටින සෙසු නිලයන් 6100 ක් සඳහා ස්ථිර නවාතැන් පහසුකම්.
- ඉලෙක්ට්‍රොනික සහ සන්නිවේදන උපාංග ආනයනය කිරීමට අනුමැතිය ප්‍රදානය කිරීමේ ක්‍රියාවලිය කාර්යක්ෂම කිරීම සඳහා තාක්ෂණ අංශයට ස්වයංක්‍රීය ලිපි පද්ධතියක් සහ ලියකියවිලි කලමණාකරණ පද්ධතියක් හඳුන්වාදීම.
- ගොඩනැඟිලි අංක 06,07 සහ 08 , සන්නිවේදන ගොඩනැගිල්ල, ආරක්ෂක ගොඩනැගිල්ල, ජල පොම්පාගාරය සහ ප්‍රධාන ජල සැපයුම් ඒකකය, කින්නදෙණියේ සෙසු නිළ නවාතැන් 2017 දෙසැම්බර් 31 දිනට පෙර ඉදිකිරීම.
- 2016 වර්ෂයේ මැද භාගයේ සිට අඩපණව පසෙකලා තිබූ යෝජිත සංවිධාන සටහන් සඳහා අවශ්‍ය අනුමැතීන් අදාළ අධිකාරීන්ගෙන් ලබාගෙන ක්‍රියාත්මක වනු ඇත.
- 2018 මැද භාගය වන විට ක්ෂුද්‍ර තරංග ගුවන් විදුලි සබඳතා සහ ජාල කළමණාකරණ පද්ධති ස්ථාපනය කිරීමට අපේක්ෂිත අතර ජාලය වැඩිදියුණු කිරීම සඳහා පද්ධතීන්ගේ ප්‍රගතිය පරීක්ෂා කර අනාගත අවශ්‍යතා සමාලෝචනය කිරීම.
- පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය විශාල කාර්යභාරයක් ඉටුකරන ආයතනයක් බැවින් ඒ සඳහා අවශ්‍ය නවීන විද්‍යාගාර පහසුකම් වලින් සමන්විත මහල් 06 කින් ද සමන්විත විද්‍යාගාර ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා වැඩ ආරම්භ කිරීම. එමගින් දැනට පවතින පර්යේෂණාගාර අඩුපාඩුකම් මගහරවා ගෙන මෙම මධ්‍යස්ථානයේ තිබිය යුතු සියළුම අංශ ක්‍රියාවට නංවා පරිපූර්ණ පර්යේෂණ හා සංවර්ධන මධ්‍යසථානයක් පිහිටුවීම.
- පර්යේෂණ කටයුතු සඳහා අවශ්‍ය විශේෂ හැකියාවක් ඇති නිළධාරීන් ඉදුරාම පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය වෙත බඳවා ගැනීමට අවශ්‍ය ඉදිරි කටයුතු සිදුකිරීම.
- පර්යේෂණ කටයුතු වල නිරත වී සිටින නිළධාරීන් හට ව්‍යාපෘති අවසානයේ පර්යේෂණ දීමනා හිමිගැන්වීමට අවශ්‍ය කටයුතු කිරීම.
- අවට විශ්ව විද්‍යාල වල අවසන් වසරේ සිසුන් වෘත්තිමය පුහුණුවීම් යටතේ මෙම මධ්‍යස්ථානයේ ව්‍යාපෘති සඳහා යොදවා ගැනීම හා ඒ සඳහා ගෙවීම් සිදුකිරීමට අවශ්‍ය කටයුතු සිදුකිරීම.
- දැනට අවසන් කරන ලද ව්‍යාපෘති Lanka Logistic ආයතනය හරහා දේශීය හා විදේශීයව අළෙවි කිරීම සඳහා සුදුසු යාන්ත්‍රණයක් සැකසීම.
- ආරක්ෂක ලේකම් තුමාගේ උපදෙස් පරිදි ජාතික සයිබර් ආරක්ෂණ මධ්‍යස්ථානයක් මෙම මධ්‍යස්ථානය හා ජාතික බුද්ධි ප්‍රධානි සම්බන්ධතාවයෙන් ආරක්ෂක අමාත්‍යාංශය යටතේ මෙම මධ්‍යස්ථානය තුළ ස්ථාපනය කිරීමට කටයුතු කර ඇති අතර, 2017 වර්ෂයෙහි මුල් මාසයන් තුළ එය සම්පූර්ණයෙන් ක්‍රියාත්මක කිරීම.
- මධ්‍යම දුර නියමුවන් සහිත (UAV) ගුවන් යානය වැඩිදියුණු කර ව්‍යාපෘති කටයුතු අවසන් කිරීමෙන් පසු දිවයිනේ නොයෙකුත් අවශ්‍යතාවයන් සඳහා ක්‍රියාත්මක කිරීම උදා: ආරක්ෂක කටයුතු සහ ආපදා කළමණාකරණ කටයුතු.
- Train Tracking System තුළින් දුම්රිය ධාවනය පහසුකරවීම සඳහා හඳුන්වාදී ඇති මෘදුකාංගය ශ්‍රී ලංකාව තුළ දැනට ධාවනය වන සියලු දුම්රියන් ආවරණය වන පරිදි ස්ථාපන කිරීම.
- පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය ස්වාධීන ආයතනයක් වශයෙන් ස්ථාපනය කිරීම සඳහා අවශ්‍ය ඉදිරි කටයුතු සිදුකිරීම.

# 4. පාර්ලිමේන්තු හා සිවිල් කටයුතු අංශය

## 4.1 සමාලෝචනය

පාර්ලිමේන්තු කටයුතු අංශය විසින් පහත සඳහන් කාර්යයන් සිදු කරන ලදී.

- ත්‍රිවිධ හමුදා කඳවුරු සහ අනුබණ්ඩ ස්ථාපිත කිරීමට අවශ්‍ය ඉඩම් සම්බන්ධ රාජකාරී.
- අමාත්‍යාංශයේ කාර්යභාරයන් සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවට වාර්තා කිරීමට අදාල රාජකාරී.
- ත්‍රිවිධ හමුදාවන් සහ සිවිල් ආරක්ෂක බලකාය සඳහා නිල ඇඳුම් හා රෙදිපිළි ද්‍රව්‍ය සැපයීමට අදාල රාජකාරී.
- ඉඩම් අත්කර ගැනීම්වලට අදාලව මහජන ඉල්ලීම් හා දුක් ගැනවිලි පිළිබඳ කටයුතු.
- අංශයේ අභ්‍යන්තර පරිපාලන කටයුතු

## 4.2. 2016 වර්ෂයේ කාර්යසාධනය

### 4.2.1 ඉඩම් රාජකාරී

ඉඩම් අමාත්‍යාංශය, ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, පළාත් පාලන ආයතන ආදී ආයතන සමඟ සම්බන්ධීකරණයවී ත්‍රිවිධ හමුදාවේ පරිහරණය සඳහා අවශ්‍ය ඉඩම් පවරා ගැනීමේ හා අත්කර ගැනීමේ කටයුතු කිරීම මෙම අංශයෙන් සිදු කරනු ලබන ප්‍රධාන කාර්යයන් වේ. ඊට අදාලව 2016 වර්ෂයේදී පහත කාර්යභාරය ඉටු කරන ලදී.

- ත්‍රිවිධ හමුදාව මඟින් ඉඩම් පවරා ගැනීමේ/ අත්කර ගැනීමේ අයදුම්පත් ලබා ගැනීම.
- ප්‍රාදේශීය ලේකම්වරුන් සහ ඉඩම් හිමිකාරිත්වය පැවරී ඇති වෙනත් ආයතන මඟින් නිර්දේශ සහ නිරීක්ෂණ ලබා ගැනීම.
- අවශ්‍ය සියළු ලියකියවිලි සහිතව ඉඩම් අත්කර ගැනීමේ/ පවරා ගැනීමේ ඉල්ලීම් ඉඩම් අමාත්‍යාංශයේ ලේකම් වෙත සහ ඉඩම් කොමසාරිස් ජනරාල් වෙත ඉදිරිපත් කිරීම.
- ඉඩම්වල හිමිකාරිත්වය අවිනිශ්චිත අවස්ථාවලදී ක්ෂේත්‍ර පරීක්ෂණ සිදු කිරීම.
- ඉඩම් මැනීම් කටයුතු සම්බන්ධීකරණය කිරීම, ඉඩම් සඳහා තක්සේරු වාර්තා ලබා ගැනීමේ කටයුතු සම්බන්ධීකරණය කිරීම.
- අත්කර ගනු ලබන ඉඩම් වෙනුවෙන් වන්දි ගෙවීම සඳහා මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගැනීම.
- විශේෂිත ගැටළු සහිත ඉඩම් අත් කර ගැනීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීම.

ඊට අමතරව, සංහිඳියාව සහ නැවත පදිංචි කිරීමේ කටයුතුවලට සහාය දැක්වීමේ රජයේ වැඩ පිළිවෙලට සහාය දැක්වීමක් වශයෙන් මෙම අංශය ත්‍රිවිධ හමුදාව සමඟ එක්ව ත්‍රිවිධ හමුදාව භුක්ති විඳින ඉඩම්වලින් නිදහස් කළ හැකි ඉඩම් හඳුනාගෙන ඒවා යලි මුල් අයිතිකරුවන්ට ලබාදීමට කටයුතු සම්පාදනය කරනු ලබයි.

2016.01.01 දින සිට 2016.12.31 දින දක්වා උතුරු හා නැගෙනහිර පළාත්වල ඉඩම් නිදහස් කිරීමේ ප්‍රගතිය පහත දැක්වේ.

| සේවය | රජයේ ඉඩම් | පෞද්ගලික ඉඩම් | මුළු ප්‍රමාණය (අක්කර) |
|---|---|---|---|
| යුද්ධ හමුදාව | 1311.60 | 1926.67 | 3238.27 |
| නාවික හමුදාව | 1629.38 | 163.36 | 1792.74 |
| ගුවන් හමුදාව | 2575.00 | - | 2575.00 |
| මුළු එකතුව | 5515.98 | 2090.03 | 7606.01 |

4.1 වගුව: 2016 වර්ෂයේදී නිදහස් කරන ලද ඉඩම් ප්‍රමාණය (අක්කර)

### 4.2.2 පාර්ලිමේන්තුවට වාර්තා කිරීමට අදාළ රාජකාරී

#### 4.2.2.1 පාර්ලිමේන්තු මන්ත්‍රීවරු විසින් වාචික පිළිතුරු අපේක්ෂාවෙන් නඟනු ලබන ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීම.

අමාත්‍යාංශයේ අදාළ ආයතන සමඟ සම්බන්ධීකරණය වී පාර්ලිමේන්තු ප්‍රශ්න 28 ක් සඳහා ත්‍රෛ භාෂාවන්ගෙන් පිළිතුරු සකස් කර නියමිත වේලාවට පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර ඇත.

#### 4.2.2.2 මහජන පෙත්සම් කාරක සභාව

ත්‍රිවිධ හමුදාව ඇතුළු මෙම අමාත්‍යාංශය යටතට අයත් ආයතන සම්බන්ධව මහජනයා විසින් පාර්ලිමේන්තුවේ මහජන පෙත්සම් කාරක සභාවට ඉදිරිපත් කරනු ලබන පෙත්සම් සඳහා අවශ්‍ය විස්තර අදාල අංශ/ ආයතනවලින් ලබා ගෙන පිළිතුරු සකස් කොට මහජන පෙත්සම් කාරක සභාව වෙත යොමු කරනු ලැබේ. 2016 වසරේදී මෙම අංශය මඟින් සෘජුව මහජන පෙත්සම් කාරක සභාවට පෙත්සම් දෙකක් (02) සඳහා පිළිතුරු යවා ඇති අතර, අදාළ අනෙකුත් පෙත්සම් සඳහා අනෙකුත් අංශවලින් පිළිතුරු යැවීම පිණිස එම අංශවලට යොමු කර ඇත.

### 4.2.2.3. ආංශික අධීක්ෂණ කමිටු රැස්වීම්. (Sectoral Oversight Committees)

ආරක්ෂක අමාත්‍යාංශයට අදාල ආංශික අධීක්ෂණ කමිටුව 2016.08.23 දින පාර්ලිමේන්තුවේදී පවත්වන ලද අතර ආරක්ෂක ලේකම් හා ආරක්ෂක අමාත්‍යාංශය යටතේ ඇති සියළු ආයතන/අංශ වල ප්‍රධානීන් ඊට සහභාගී වූහ. ඊට අමතරව අනෙකුත් අමාත්‍යංශවල ආංශික අධීක්ෂණ කමිටු සඳහා කැඳවීම් කළ අවස්ථාවන්හි අදාල නිලධාරීන් සහභාගි කරවන ලද අතර, ඒවා සඳහා අවශ්‍ය තොරතුරු හා වාර්තා නියමිත පරිදි යවන ලදී.

### 4.2.2.4. ස්ථාවර නියෝග සහ පාර්ලිමේන්තුව කල් තබන අවස්ථාවලදී අසන ප්‍රශ්න

සමාලෝචිත කාලසීමාව තුළ පාර්ලිමේන්තුව කල්තබන අවස්ථාවලදී අසන ලද ප්‍රශ්න 05 ක් සඳහා සහ ස්ථාවර නියෝග යටතේ අසන ලද ප්‍රශ්න 08 ක් සඳහා පිළිතුරු සපයා ඇත.

### 4.2.2.5. අමාත්‍ය මණ්ඩල සංදේශ සකස් කිරීම හා අමාත්‍ය මණ්ඩල සංදේශ සඳහා නිරීක්ෂණ ලබාදීම.

අමාත්‍ය මණ්ඩල සංදේශ 09 ක් සකස් කර අමාත්‍ය මණ්ඩල අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත. එසේම, අමාත්‍ය මණ්ඩල සංදේශ 17 ක් සම්බන්ධයෙන් ආරක්ෂක අමාත්‍යතුමාගේ නිරීක්ෂණ සකස් කර යවන ලදී.

### 4.2.2.6. පාර්ලිමේන්තු කාරක සභා අවස්ථා විවාදය

2016.12.07 දින පැවති පාර්ලිමේන්තුවේ කාරක සභා අවස්ථා විවාදයේදී, ආරක්ෂක අමාත්‍යාංශයේ වැය ශීර්ෂය කියවන අවස්ථාව සඳහා මෙම අමාත්‍යාංශය නියෝජනය කරමින් අදාල ජ්‍යෙෂ්ඨ නිලධාරින් සහභාගි කරවීමට අවශ්‍ය සියළු ක්‍රියාමාර්ග ගන්නා ලදී.

### 4.2.2.7 ත්‍රිවිධ හමුදාවන් සඳහා නිල ඇඳුම් සහ රෙදිපිළි ද්‍රව්‍ය සැපයීම - DTAC

ත්‍රිවිධ හමුදාව හා සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව සඳහා රෙදිපිලි ද්‍රව්‍ය මිලදී ගැනීමට අදාළ කටයුතු කර්මාන්ත හා වාණිජ කටයුතු පිළිබඳ අමාත්‍යාංශය සමඟ සම්බන්ධීකරණය වී ටෙන්ඩර් පටිපාටියට අනුකූලව දේශීය නිෂ්පාදකයින්ගේ මිළ ගණන් කැඳවා ඉටු කරන ලදී. 2017 වර්ෂය වෙනුවෙන් ත්‍රිවිධ හමුදාවන් සහ සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව සඳහා රු. 1,872,215,000.00 (රුපියල් එක් බිලියන අටසිය හැත්තෑ දෙමිලියන දෙසිය පහලොස් දහස) ක මුදලක් සහ ඊට එකතු කළ අගය මත බදු (VAT) මුදල වැය කිරීමට 2016 වර්ෂයේ දී අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කර අනුමැතිය ලබා ගන්නා ලදී.

### 4.2.2.8. මහජන ඉල්ලීම් සහ දුක්ගැනවිලි පිළිබඳ කටයුතු

මහජනතාව විසින් මෙම අමාත්‍යාංශයට සෘජුවම එවන ලබන සහ ජනාධිපති කාර්යාලය, අග්‍රාමාත්‍ය කාර්යාලය පුනරුත්ථාපන හා නැවත පදිංචි කිරීමේ අමාත්‍යාංශය සහ වෙනත් රාජ්‍ය ආයතන මඟින් යොමු කරනු ලබන ඉල්ලීම් හා දුක් ගැනවිලි සම්බන්ධව සහන සැලසීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලදී

### 4.2.2.9. අභ්‍යන්තර පරිපාලන කටයුතු

මෙම අංශයේ නිළධාරීන්ගේ පරිපාලන කටයුතු, පුහුණුවීම් කටයුතු සහ සුභසාධක කටයුතු ඵලදායීව සහ කාර්යක්ෂමව ඉටු කරන ලදී. පරිපාලන අංශය මඟින් සලසන ලද අවස්ථාවන් මඟින් මෙම අංශයේ නිළධාරීන්ගේ පුහුණු කටයුතු සිදු කරනු ලැබිණි. මීට අමතරව කාර්ය මණ්ඩලයේ කණ්ඩායම් ක්‍රියාකාරිත්වය ශක්තිමත් කිරීම සහ ඔවුන්ගේ දැනුම හා කුසලතාවයන් වැඩි දියුණු කිරීමේ අරමුණින් යුතුව අරඹන ලද “ සතර දිගන්තේ හෝරාව” වැඩසටහන මේ වසරේදී ද ක්‍රියාත්මක කරන ලදී.

## 4.3 අනාගත අපේක්ෂා

- උතුරු නැගෙනහිර ප්‍රදේශයේ ත්‍රිවිධ හමුදාව විසින් පරිහරණය කරනු ලබන ඉඩම් වලින් හැකි උපරිම පෞද්ගලික ඉඩම් ප්‍රමාණයක් නිදහස් කර නීත්‍යානුකූල හිමිකරුවන් වෙත ලබා දීම සඳහා අවශ්‍ය කටයුතු කිරීම.

# 5 . පරිපාලන අංශය

## 5.1 සමාලෝචනය

පරිපාලන අංශයේ වගකීම් දරන ප්‍රධාන ක්ෂේත්‍රයන් පහත සඳහන් පරිදි වේ.

- අමාත්‍යාංශය හා ඒ යටතේ වූ පහත සඳහන් ආයතනයන්හි ආයතනික හා පරිපාලන කටයුතු
  - ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානි කාර්යාලය
  - මාධ්‍ය කේන්ද්‍රය
  - රාජ්‍ය බුද්ධි සේවාව
- අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති පහත සඳහන් ආයතනයන්හි සිවිල් නිලධාරින් හා සේවකයින් පිළිබඳ ආයතනික හා පරිපාලන කටයුතු
  - ශ්‍රී ලංකා යුද්ධ හමුදාව
  - ශ්‍රී ලංකා නාවික හමුදාව
  - ශ්‍රී ලංකා ගුවන් හමුදාව
  - වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව
  - ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය
  - පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය
- අමාත්‍යාංශය යටතේ වූ පහත සඳහන් ආයතනයන්හි පරිපාලන කටයුතු හා ප්‍රතිපත්ති තීරණ ගැනීම, මූල්‍යමය කටයුතු සම්බන්ධව ක්‍රියා කිරීම
  - අපි වෙනුවෙන් අපි නිවාස ව්‍යාපෘතිය
  - මිහිඳු සෙත් මැඳුර
  - රණවිරු අර්ධ නිවාස ව්‍යාපෘතිය
  - සන්නද්ධ හමුදා හා සුභසාධන අංශය
- අමාත්‍යාංශයේ සියලුම අභ්‍යන්තර අංශයන්හි පරිපාලන කටයුතු සිදු කරන අතර තැපැල් අංශය, ප්‍රවාහන අංශය, පරිපාලන අංශය යටතේ පාලනය වේ.

### 5.1.1 අපි වෙනුවෙන් අපි රණවිරු නිවාස ව්‍යාපෘතිය

2008 අංක 6 දරණ අපි වෙනුවෙන් අපි පාර්ලිමේන්තු පනත යටතේ පිහිටුවන ලද "අපි වෙනුවෙන් අපි අරමුදල්" ප්‍රතිපාදන යොදා ගනිමින් නිවාස නොමැති රණවිරුවන් හට නිවාස අවශ්‍යතා සපුරාදීම සඳහා අවශ්‍ය ප්‍රතිලාභ ප්‍රදානය කිරීම මූලික වශයෙන් සිදු වේ.මෙහිදී ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති ප්‍රධාන කොටස් 2 කි.

**1. සම්පූර්ණ නිවාස ව්‍යාපෘතිය**

නිවාස නොමැති රණවිරුවන් සඳහා සම්පූර්ණ නිවාස ඉදිකර ප්‍රදානය කිරීම.

**2. අර්ධ නිවාස ව්‍යාපෘතිය**

නිවාස අර්ධ වශයෙන් ඉදිකර ගෙන ඇති රණවිරුවන්ගේ නිවාස සම්පූර්ණකර ඉදිකර දීම.

### 5.1.2 සත්විරු සංහිඳ" රණවිරු අර්ධ නිවාස ව්‍යාපෘතිය

ඒකීය දේශයක් බිහිකරනු උදෙසා තම සොඳුරු යෞවනය කටුක යුද්ධයක් වෙනුවෙන් කැපකළ උදාරතර ලාංකේය ත්‍රිවිධ හමුදා රණවිරුවන් උදෙසා රජයේ අයවැය ප්‍රතිපාදන තුලින් මුළු දිවයිනම ආවරණය වන පරිදි රණවිරුවන් විසින් දැනට ඉදිකරමින් පවතින අර්ධ නිවාස ඔවුනට ජීවත්විය හැකි මට්ටමකට ඉදිකරදීම සඳහා මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබයි.

## 5.2 සන්නද්ධ හමුදා සුබසාධන අංශය

අප මව්බිමේ ඒකීයභාවය හා භෞමික අඛණ්ඩතාවය වෙනුවෙන් තම දිවි පරදුවට තබා සටන් කළ ත්‍රිවිධ හමුදා හා සිවිල් ආරක්ෂක සේවාවන්හි දැනට සේවයේ නියුතු හා විශ්‍රාමික රණවිරුවන් වෙනුවෙන් සුබසාධන කටයුතු සිදුකිරීම මෙම අංශය මඟින් සිදු කරනු ලබන අතර පහත සඳහන් කාර්ය භාරයන් ද ඉටුකරනු ලබයි.

- ඉඩම් නොමැති රණවිරුවන්ට නිවාස ඉදිකර ගැනීම සඳහා ඉඩම් කොටස් ලබාදීම.
- රණවිරුවන්ගේ දරුවන් රජයේ පාසල් වෙත ඇතුළත් කිරීමේදී පැන නගින ගැටළුකාරී තත්ත්වයන් වෙනුවෙන් කටයුතු කිරීම.
- රණවිරුවන්ගේ කලත්‍රයන් හට රාජ්‍ය සේවයේ ස්ථාන මාරු ලබා ගැනීමට සහන සැලසීම.
- රණවිරුවන්ගේ ඉඩම්වලට අදාල ගැටළුකාරී තත්ත්වයන් විසඳා ගැනීමට සහය වීම.
- රණවිරුවන් වෙනුවෙන් සුභසාධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

| වගකීම | ක්‍රියාකාරකම් | කාර්ය සාධනය | | |
|---|---|---|---|---|
| එලදායිතාවය වැඩි දියුණු කිරීම | පරිගණක මාර්ගයෙන් කාර්යක්ෂම ලිපි බෙදා හැරීම. | | ලැබෙන | යවන |
| | | ලි.ප.තැ. | 11,065 | 11,412 |
| | | අතින් | 32,162 | 36,948 |
| | | තැපැල් | 29,200 | 24,380 |
| | පුද්ගලික තොරතුරු යාවත්කාලීනව පවත්වාගෙන යාම. | සම්පූර්ණ කරන ලද තොරතුරු ඇතුලත් ලිපි ගොනු - 300 | | |
| | අප්‍රමාදීව ගෙවීම් පියවීම - බිල්පත් සඳහා අනුමැතින් ලබා දීම. | පරිපාලන අංශය | | |
| | | 3500 | | |
| නිවැරදි තීරණ සඳහා තොරතුරු කළමනාකරණ පද්ධතින් සකස් කිරීම හා යාවත්කාලීන කිරීම | 1. මානව සම්පත් කළමනාකරණ පද්ධතිය | 29 | | |
| | • නව පත්වීම් ලබා දීම් | | | |
| | • විශ්‍රාම ගැන්වීම් | 11 | | |
| | • උසස් කිරීම් | 07 | | |
| | • වැටුප් වර්ධක ලබාදීම් | 300 | | |
| | 2. වාහන කළමනාකරණ පද්ධතිය<br>වාහන අත්පත් කර ගැනීම්, අළුත්වැඩියාව, විකිණීම්, කුලියට ගැනීම්, | වාහන අළුත්වැඩියාවන් - 100<br>අළුතින් ගෙන්වන ලද වාහන - 02<br>වෙනත් ආයතන වෙත ලබා දී ඇති වාහන - 35 | | |
| මානව සම්පත්, දැනුම හා හැකියාවන්ගෙන් පෝෂණය කිරීම | පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා පහසුකම් සැලසීම | වැඩසටහන | සහභාගීත්වය | |
| | වැඩමුළු සංවිධානය | 05 | 300 | |
| | සුභසාධන ක්‍රියාකාරකම් සංවිධානය | 05 | 1035 | |
| | | | | |

5.1 වගුව: රණවිරුවන්ගේ ජීවන තත්ත්වය නංවාලීම සඳහා වූ ව්‍යාපෘතිය

| දිස්ත්‍රික්කය | යුද්ධ | නාවික | ගුවන් | ඉදිකිරීමට සැලසුම්කළ මුළු නිවාස සංඛ්‍යාව | 2016 වසර තුල ඉදිකර ප්‍රදානය කිරීමට හැකිවූ නිවාස ගණන |
|---|---|---|---|---|---|
| අම්පාර | 30 | 12 | 8 | 50 | 35 |
| කළුතර | 30 | 12 | 8 | 50 | ව්‍යාපෘතිය ආරම්භ කිරීමට නොහැකි වී ඇත. |
| පොළොන්නරුව | 30 | 12 | 8 | 50 | 41 |
| අනුරාධපුරය | 30 | 12 | 8 | 50 | ව්‍යාපෘතිය ආරම්භ කිරීමට නොහැකි වී ඇත. |
| මිහිඳු සෙත් මැදුර | 9 | _ | _ | 9 | 9 |
| **එකතුව** | 129 | 48 | 32 | 209 | 85 |

5.2 වගුව: අපි වෙනුවෙන් අපි "සත්විරු සංහිඳ" පූර්ණ නිවාස ව්‍යාපෘතියේ ප්‍රතිලාභීන් සංඛ්‍යාව - 2016

<table>
<tr><th>දිස්ත්‍රික්කය</th><th>යුද්ධ</th><th>නාවික</th><th>ගුවන්</th><th>සම්පූර්ණ කරදීමට සැලසුම්කළ මුළු නිවාස සංඛ්‍යාව</th><th>2016 වසර තුළ ඉදිකිරීම් සම්පූර්ණ කර ප්‍රදානය කිරීමට හැකිවූ නිවාස ගණන</th></tr>
<tr><td>පොළොන්නරුව</td><td>15</td><td>6</td><td>4</td><td>25</td><td>20</td></tr>
<tr><td>ගම්පහ</td><td>15</td><td>6</td><td>4</td><td>25</td><td rowspan="13">මෙම දිස්ත්‍රික්කයන්හි සැලසුම් කළ අර්ධ නිවාස ප්‍රතිලාභ ලබාදීමට නොහැකි වී ඇත.</td></tr>
<tr><td>නුවරඑළිය</td><td>15</td><td>4</td><td>4</td><td>24</td></tr>
<tr><td>මාතලේ</td><td>12</td><td>6</td><td>3</td><td>21</td></tr>
<tr><td>කොළඹ</td><td>15</td><td>6</td><td>4</td><td>25</td></tr>
<tr><td>කෑගල්ල</td><td>12</td><td>6</td><td>3</td><td>21</td></tr>
<tr><td>ගාල්ල</td><td>12</td><td>6</td><td>4</td><td>22</td></tr>
<tr><td>අනුරාධපුරය</td><td>15</td><td>6</td><td>4</td><td>25</td></tr>
<tr><td>රත්නපුරය</td><td>15</td><td>6</td><td>4</td><td>25</td></tr>
<tr><td>මහනුවර</td><td>12</td><td>6</td><td>4</td><td>22</td></tr>
<tr><td>කුරුණෑගල</td><td>15</td><td>6</td><td>4</td><td>25</td></tr>
<tr><td>මඩකළපුව</td><td>6</td><td>4</td><td>4</td><td>14</td></tr>
<tr><td>බදුල්ල</td><td>12</td><td>2</td><td>2</td><td>16</td></tr>
<tr><td>එකතුව</td><td>171</td><td>70</td><td>48</td><td>289</td><td>20</td></tr>
</table>

5.3 වගුව: අපි වෙනුවෙන් අපි "සත්විරු සංහිඳ" අර්ධ නිවාස ව්‍යාපෘතියේ ප්‍රතිලාභීන් සංඛ්‍යාව - 2016

අපි වෙනුවෙන් අපි "සත්විරු සංහිඳ" නිවාස ව්‍යාපෘතිය යටතේ 2016 වර්ෂය තුළ ක්‍රියාත්මක කළ පෙර වර්ෂයන්ගේ නොනිමි ව්‍යාපෘති කාර්යයන් පහත පරිදි වේ.

| **සම්පූර්ණ නිවාස** | | **අර්ධ නිවාස** | |
|---|---|---|---|
| දිස්ත්‍රික්කය | ඉදිකළ නිවාස ගණන | **දිස්ත්‍රික්කය** | ඉදිකිරීම් සම්පූර්ණ කරන ලද අර්ධ නිවාස ගණන |
| මාතර | 96 | මාතර | 25 |
| හම්බන්තොට | 12 | හම්බන්තොට | 27 |
| අනුරාධපුර | 19 | එකතුව | 52 |
| **එකතුව** | **127** | | **104** |

5.4 වගුව: ක්‍රියාත්මක වෙමින් පවතින ව්‍යාපෘති ( පූර්ණ නිවාස හා අර්ධ නිවාස)

අපි වෙනුවෙන් අපි අරමුදල මගින් රණවිරුවන් හට නිවාස ඉදිකර ප්‍රදානය කිරීමේ ව්‍යාපෘතීන්හි ප්‍රගතිය අඩුවීමට බලපෑ හඳුනාගත් හේතු.

- ප්‍රසම්පාදන ක්‍රියාවලියේදී ඇතිවන ප්‍රමාදයන්.
- මිලදී ගැනීමේ ක්‍රියාවලියේදී ඇතිවන ප්‍රමාදයන්.
- වැඩ කණ්ඩායම් හිඟ වීම හේතුවෙන් සිදුවන ඉදිකිරීම් ප්‍රමාදයන්.
- පෙර වර්ෂයන්ගේ ව්‍යාපෘති සැලසුම්හි නොනිමි කාර්යයන් පැවතීම.

### 5.2.1 රණවිරු අර්ධ නිවාස ව්‍යාපෘතිය

මෙම ව්‍යාපෘතිය සඳහා 2016 වර්ෂය සඳහා රජයේ අය වැය ප්‍රතිපාදනය රුපියල් මිලියන 200 කි.

| අනු අංකය | දිස්ත්‍රික්කය | තෝරාගෙනඇති මුලු ගණන | යුද්ධ හමුදාව | නාවික හමුදාව | ගුවන් හමුදාව |
|---|---|---|---|---|---|
| 1 | කොළඹ | 13 | 10 | 2 | 1 |
| 2 | පුත්තලම | 11 | 4 | 0 | 7 |
| 3 | ගම්පහ | 29 | 22 | 6 | 1 |
| 4 | කුරුණෑගල | 43 | 13 | 23 | 7 |
| 5 | කළුතර | 13 | 7 | 3 | 3 |
| 6 | හම්බන්තොට | 3 | 2 | 1 | 0 |
| 7 | බදුල්ල | 16 | 14 | 1 | 1 |
| 8 | මොණරාගල | 10 | 8 | 0 | 2 |
| 9 | කෑගල්ල | 30 | 17 | 12 | 1 |
| 10 | රත්නපුර | 7 | 4 | 0 | 3 |
| 11 | අම්පාර | 4 | 1 | 2 | 1 |
| 12 | ගාල්ල | 15 | 7 | 6 | 2 |
| 13 | නුවර | 23 | 18 | 3 | 2 |
| 14 | නුවර එළිය | 6 | 5 | 1 | 0 |
| 15 | අනුරාධපුර | 27 | 14 | 10 | 3 |
| 16 | මාතලේ | 13 | 11 | 2 | 0 |
| 17 | පොළොන්නරුව | 5 | 1 | 2 | 2 |
| 18 | වව්නියාව | 1 | 1 | 0 | 0 |
| 19 | මාතර | 8 | 4 | 0 | 4 |
| **එකතුව** | | **277** | **163** | **74** | **40** |

5.5 වගුව: 2016 වර්ෂය සඳහා තෝරාගෙන ඇති රණවිරු ප්‍රතිලාභීන් ගණන

### 5.2.2 සන්නද්ධ හමුදා සුභසාධන අංශය

| අනු අංකය | දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ඉඩමේ නම | බෙදාදෙන ලද ඉඩම් කොටස් ගණන |
|---|---|---|---|---|
| 01 | මාතලේ | දඹුල්ල | දිගම්පතහ ග්‍රාම නිලධාරි වසමේ ඉඩම | 216 |
| 02 | අම්පාර | උහන | පාලම්කඳවුර ග්‍රාම නිලධාරි වසමේ සමණබැද්ද ඉඩම | 50 |
| 03 | කුරුණෑගල | ගල්ගමුව | මහගල්ගමුව ග්‍රාම නිලධාරි වසමේ ගොජරාගම ඉඩම | 65 |

5.6 වගුව: රණවිරුවන්ට ඉඩම් ලබාදීමේ ව්‍යාපෘතිය යටතේ බෙදාදෙන ඉඩම් ප්‍රමාණය

## 5.3 අනාගත අපේක්ෂා

### 5.3.1 පරිපාලන අංශය

- අමාත්‍යාංශ කාර්යය මණ්ඩලය වෙත අවශ්‍ය පුහුණු වැඩසටහන් හඳුනාගෙන ඒ අනුව පාඨමාලාවන් සංවිධානය කිරීම.
- පුහුණු වැඩසටහන් සඳහා අමාත්‍යාංශ කාර්යය මණ්ඩලය සහභාගී කරවීමට උනන්දු කිරීම තුළින් ඔවුන්ගේ සේවය කාර්යක්ෂම කිරීම.
- අංශයෙන් කෙරෙන කාර්යයන් සඳහා මෙහෙයුම් අත්පොත් (Work Manuals) සකස් කිරීම.
- පුහුණු දත්ත පද්ධතියක් සැකසීම
- විධිමත් ලිපිගොනු කළමනාකරණය සඳහා අදාළ ක්‍රමවේද භාවිතය.උදා - චලන පත්‍ර භාවිතය
- මානව සම්පත ඵලදායී ලෙස යොදා ගැනීම සඳහා සුවිශේෂි දක්ෂතා හඳුනා ගැනීම.
- සුභ සාධන කටයුතු සංවර්ධනය කිරීම.
- ක්‍රියාවලි සරල කිරීම.

### 5.3.2 "අපි වෙනුවෙන් අපි" නිවාස ව්‍යාපෘතිය

"අපි වෙනුවෙන් අපි" අරමුදලෙහි අරමුණු හා පරමාර්ථයන් ඉටුකිරීම සඳහා පහත සඳහන් ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිතය.

#### ව්‍යාපෘති අංක 01

- සම්පූර්ණ නිවාස ඉදිකිරීම /අර්ධ නිවාස ඉදිකරදීම සඳහා ද්‍රව්‍යමය ආධාර සහ වැඩ කණ්ඩායම් ලබාදීම.
- සුදුසුකම් ලත් ප්‍රතිලාභීන් - "අපි වෙනුවෙන් අපි" ප්‍රතිලාභීන් තේරීම සඳහා පත්කරන ලද සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය මගින් තෝරාගන්නා ලද පහත රණවිරුවන්.
  - සියයට 100 ආබාධිත රණවිරුවන්
  - ශ්‍රම හැකියාවක් නොමැති සියයට 75 ට වැඩි ආබාධිත රණවිරුවන්.
  - ශ්‍රම හැකියාවක් නොමැති මියගිය/අතුරුදහන් රණවිරුවන්ගේ ළඟම ඥාතීන්.

#### ව්‍යාපෘති අංක 02

- අර්ධ වශයෙන් නිම කරන ලද නිවාසයන් පදිංචි වීමට සුදුසු අයුරින් නිම කිරීම සඳහා මූල්‍යමය ආධාර ලබාදීම.
- සුදුසුකම් ලත් ප්‍රතිලාභීන් - අපි වෙනුවෙන් අපි අරමුදලේ කළමණාකරණ මණ්ඩලය විසින් පත්කරන ලද සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් තෝරාගන්නා ලද රණවිරුවන්.

#### ව්‍යාපෘති අංක 03

- පදිංචි ඉඩම් මිලදීගැනීම/නිවාස තැනීම හෝ අළුත්වැඩියාව සඳහා රජයේ ලියාපදිංචි මූල්‍ය ආයතන වෙතින් ණය ලබාගත් රණවිරුවන් ණය බරින් මුදාලීම සඳහා ලබාදෙන මූල්‍යාධාරයෙන් සියයට 50 ක් වාරික 60 කින් ආපසු ගෙවීමේ පදනම මත මූල්‍යාධාර ලබාදීම.

### 5.3.3 ප්‍රතිලාභ සඳහා මුදල් වෙන්කිරීම

අපි වෙනුවෙන් අපි අරමුදලේ ස්ථාවර තැන්පත් හා භාණ්ඩාගාර බිල්පත්හි තැන්පතු වෙනුවෙන් වාර්ෂිකව ලැබෙන පොළී මුදල වන රු. මිලියන 225 පහත පරිදි ව්‍යාපෘතියෙහි යෙදවීමට අපේක්ෂිතය.

ව්‍යාපෘතීන් සඳහා යොදන සම්පූර්ණ මුදල ත්‍රිවිධ හමුදාවන්හි සේවක සංඛ්‍යාවට සමානුපාතික වන අයුරින් වෙන් කිරීමට අපේක්ෂිතය.

| සේවාව | යෙදීමට අපේක්ෂිත මුදල (රු. මිලියන) |
|---|---|
| යුධ හමුදාව 60% | 135.0 |
| නාවික හමුදාව 25% | 56.25 |
| ගුවන් හමුදාව 15% | 35.75 |
| එකතුව | 225.0 |

5.7 වගුව: සුදුසුකම් ලැබූ ප්‍රතිලාභීන් (සේවාව අනුව)

| ව්‍යාපෘතිය | යුධ | නාවික | ගුවන් | එකතුව |
|---|---|---|---|---|
| ව්‍යාපෘති අංක 01<br>අරමුදල් මගින් සම්පූර්ණ නිවාස ඉදිකරදීම සඳහා වැඩ කණ්ඩායම් සහිත ආධාර ලබාදීම. | 30 | 12 | 8 | 50 |
| ව්‍යාපෘති අංක 02<br>අර්ධ නිවාස සම්පූර්ණ කරගැනීම සඳහා රු.750,000.00 ක මූල්‍යාධාර ලබා දීම. | 60 | 25 | 15 | 100 |
| ව්‍යාපෘති අංක 03<br>නිවාස ණය වලින් නිදහස් වීමට රු.1,000,000.00 ක උපරිමයකට යටත්ව මුදල් ලබා දීම. | 45 | 20 | 10 | 75 |
| මුළු ප්‍රතිලාභීන් ගණන | | | | 225 |

5.8 වගුව: ඉහත ක්‍රමවේදයන් 3 යටතේ ප්‍රතිලාභ පිරිනැමීමට තෝරාගැනෙන ප්‍රතිලාභීන් ප්‍රමාණය.

### 5.3.4 රණවිරු අර්ධ නිවාස ව්‍යාපෘතිය

"සත්විරු සංහිඳ" රණවිරු අර්ධ නිවාස ව්‍යාපෘතිය - 7 වන අදියර

"සත්විරු සංහිඳ" රණවිරු අර්ධ නිවාස ව්‍යාපෘතිය 7 වන අදියර සඳහා රජයේ අයවැය ප්‍රතිපාදන මත රුපියල් මිලියන 400 ක ප්‍රතිපාදන මුදලක් වෙන්කර දී ඇත.

7 වන අදියර සඳහා ශ්‍රී ලංකා යුද්ධ හමුදාව, ශ්‍රී ලංකා නාවික හමුදාව, ශ්‍රී ලංකා ගුවන් හමුදාව මගින් පහත සඳහන් ප්‍රමාණයන්ගෙන් ප්‍රතිලාභීන් 510 ක් පමණ තෝරා ගෙන ඇත.

- යුද්ධ හමුදාව - 306
- නාවික හමුදාව - 127
- ගුවන් හමුදාව - 77

### 5.3.5 ක්‍රියාකාරී සැලැස්ම -2017

| කාර්යයන් | කාල සීමාව | වගකිව යුතු පාර්ශවය |
|---|---|---|
| නිවාස මූලික පරීක්ෂාව සහ ඇස්තමේන්තු සෑදුවම අමාත්‍යාංශයට සහ ප්‍රාදේශිය මිලදි ගැනිම් කදවුරු වලට ඉදිරිපත් කිරිම | 2017 මාර්තු 01 ට පෙර | දිස්ත්‍රික් සම්බන්ධීකරණ නිලධාරින් විසින් |
| අමාත්‍යාංශ සහ ප්‍රාදේශිය මිලදි ගැනිම් සිදු කිරිම | 2017 මැයි 01 ට පෙර | කදවුරු/ඒකක/විධානයන්හි ව්‍යාපෘතියෙහි ප්‍රාදේශිය මිලදි ගැනිම් සිදු කරන ප්‍රසම්පාදන අස්ථිත්ව |
| ප්‍රාදේශිය සහ අමාත්‍යාංශය මගින් මිලදි ගෙන ලබාදුන් භාණ්ඩ අදාල ප්‍රතිලාභින් වෙත බෙදා දීම | 2017 ජුනි 15 ට පෙර | භාණ්ඩ බෙදා හැරිම් සඳහා පත්කර ඇති එක් එක් දිස්ත්‍රික්කයන් හි පිහිටි කදවුරු වල නම් කරන ලද නිලධාරින් සහ දිස්ත්‍රික් සම්බන්ධීකරණ නිලධාරින් (අධීක්ෂණය) |
| සියලු මිලදි ගැනිම් ගිණුම්ගත කර අවසන් කිරිම | 2017 අගෝස්තු 15 ට පෙර | ත්‍රිවිධ හමුදා මුදල් අධ්‍යක්ෂකවරුන් |
| සියලු අවසන් වාර්තා ඉදිරිපත් කිරිම | 2017 සැප්තැම්බර් මස 01 ට පෙර | දිස්ත්‍රික් සම්බන්ධිකරණ නිලධාරි විසින්<br>රණවිරු සේවා අධ්‍යක්ෂක/සුභසාධක අධ්‍යක්ෂකවරුන් (අධීක්ෂණය) |

5.9 වගුව: ක්‍රියාකාරී සැලැස්ම

## 5.3.6 සන්නද්ධ හමුදා හා සුභසාධන අංශය

| අනු අංකය | දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ඉඩමේ නම | බෙදාදීමට නියමිත ඉඩම් ප්‍රමාණය |
|---|---|---|---|---|
| 01 | ගාල්ල | අක්මීමන | අමුකොටුව වසමේ ඉඩම සහ හල්ගස්මුල්ල වසමේ ඉඩමේ ඉඩම | අක්කර 05 |
| 02 | අනුරාධපුර | ගල්නෑව | අංක: 473 මුස්නව තුලානේ අංක: 956 කොටසේ ලොට් 15 ඉඩම (දෙවැනි අදියර) | කට්ටි 46 |
| | | පදවිය | අංක 14 බෝගහවැව තුලානේ කුඩා රත්මලේ අතුරු මාර්ගය දෙපස ඉඩම | කට්ටි 30 |
| 03 | පොළොන්නරුව | ඇළහැර | දියබෙදුම වසමේ පැරකුම්ගම ඉඩම | කට්ටි 152 |
| 04 | මාතලේ | දඹුල්ල | දිගම්පතහ වසමේ ඉඩම (දෙවැනි අදියර) | කට්ටි 126 |
| | | ලග්ගල - පල්ලෙගම | ඊ 402 සී වැලිවරණගොල්ල වසමේ මොරගහපෝටාව ඉඩම | කට්ටි 18 |
| 05 | කුරුණෑගල | ගල්ගමුව | අංක 60 මහගල්ගමුව පළාත වසමේ ගොජරාගම ඉඩම (දෙවැනි අදියර) | කට්ටි 48 |
| | | රස්නායකපුර | අංක 303 උඩහේනේගම වසමේ අ.ග.පි. 2405 හි ලොට් අංක 1 ඒ හි කොටසක් | කට්ටි 33 |
| | | නිකවැරටිය | බෝගොල්ලාගම වසමේ අ.ග.පි. 1986 හි ලොට් 11 න් කොටසක් | කට්ටි 55 |
| 06 | පුත්තලම | ආණමඩුව | අංක : 658 සී දිවුල්වැව වසමේ සියඹලාගහහේන ඉඩම | කට්ටි 57 |
| | | වනාතවිල්ලුව | අලුත් එළුවන්කුලම වසමේ අයිලිකාඩු ඉඩමෙන් කොටසක් | කට්ටි 65 |
| | | මුන්දලම | අංක 609 ඒ පුබුදුගම වසමේ ඉඩම | කට්ටි 85 |
| 07 | බදුල්ල | බණ්ඩාරවෙල | මකුල්ඇල්ල වසමේ වනසිරිගම ඉඩම | කට්ටි 20 |

5.10 වගුව: 2017 වසරේදී රණවිරුවන්ට බෙදාදීමට යෝජිත ඉඩම් ප්‍රමාණය









# 6. සිවිල් ආරක්ෂක සහ සංවර්ධන අංශය

## 6.1 සමාලෝචනය

සිවිල් ආරක්ෂක අංශය වෙත පැවරී ඇති කාර්යයන් ක්‍රියාවේ යෙදවීමේදී පහත දැක්වෙන මූලික පරමාර්ථයන් ඉටුකර ගැනීමේ අපේක්ෂාවෙන් කටයුතු කරනු ලැබේ.

- සුරක්ෂිත සිවිල් සමාජයක් ගොඩනැගීම.
- වාණිජ ක්ෂේත්‍රයේ පුපුරණ ද්‍රව්‍ය භාවිතයේදී සුරක්ෂිත බව තහවුරු කිරීම.
- නියාමනය කරන ලද පෞද්ගලික ආරක්ෂක සේවා පහසුකම් සැපයීම හා සමුද්‍ර ආරක්ෂක සේවා පහසුකම් සැපයීමේ ආයතන තහවුරු කිරීම.
- සන්නද්ධ සේවා පොලිස්, සිවිල් ආරක්ෂක බලකා සාමාජිකයින් වෙත හා ඔවුන්ගේ දරුවන් වෙත අධ්‍යාපනික හා වෘත්තීය සංවර්ධන අවස්ථා සැපයීම.
- සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවට අයත් ආයතනික, පරිපාලන හා සංවර්ධන ව්‍යාපෘතීන් ඉටු කිරීම සඳහා සහාය වීම.
- ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයට අදාළ කටයුතු
- කොත්මලේ ඒකාබද්ධ සේවා භාෂා පුහුණු ආයතනයට අදාළ කටයුතු
- ක්‍රියාන්විත පදනම මත ත්‍රිවිධ හමුදා හා පොලිස් නිළධාරීන්ගේ දරුවන් පළමු වසරට ඇතුළත් කර ගැනීම
- බිම්බෝම්බ නිෂ්ක්‍රිය කිරීමට අදාළ භාණ්ඩ ගෙන්වීම හා ඒ ආශ්‍රිත කටයුතු
- අංශයට අදාළ අභ්‍යන්තර පරිපාලන කටයුතු
- මානව හිමිකම් කටයුතු හා ජාතික මානව හොර ජාවාරම් වැළැක්වීමේ කාර්යය බලකායට අයත් කටයුතු

## 6.2 2016 වර්ෂයේ කාර්යසාධනය

ඉහත පරමාර්ථ ඉටුකර ගැනීමේ අරමුණින් මෙම අංශය විසින් 2016.01.01 දින සිට 2016.12.31 දින දක්වා කාලසීමාව තුළ පහත සඳහන් කටයුතු ඉටුකර ඇත.

- 2016 අප්‍රේල් හා ජූනි මාසවලදී ක්‍රියාත්මක කරන ලද අනවසර ගිනි අවි රජයට භාරදීමේ වැඩසටහන් දෙකක් යටතේ අනවසර ගිනි අවි 846 ක ප්‍රමාණයක් රජයට භාරගෙන විනාශ කිරීම සඳහා ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට ලබාදී ඇත.
- තුවක්කු ආඥා පනත කාලීන අවශ්‍යතා සඳහා ගැලපෙන පරිදි සංශෝධන කිරීම සඳහා වන කෙටුම්පත් සකස්කර නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත.
- වසර 15ක කාලයක් තුළ සංශෝධනය කර නොතිබූ පුපුරණ ද්‍රව්‍ය ආඥා පනත යටතේ අයකරන ලද ගාස්තු වර්තමාන ආර්ථික තත්ත්වයන් හා ගැළපෙන පරිදි සංශෝධනය කරමින් නව ගැසට් නිවේදනයන් නිකුත් කිරීම් කටයුතු අවසන් කර නව ගාස්තු 2016.10.01 දින සිට ක්‍රියාත්මක කරන ලදී. ඒ තුළින් පුපුරණ ද්‍රව්‍ය ක්ෂේත්‍රය තුළ ලද වාර්ෂික ආදායම අවම වශයෙන් සියයට 300 ක වර්ධනයක් ලබා ගත හැකිවනු ඇත.
- තුවක්කු බලපත්‍ර හා පුපුරණ ද්‍රව්‍ය බලපත්‍ර නිකුත් කිරීමේ වැඩපිළිවෙළ පරිගණක ගත කිරීම සඳහා පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය (CRD) සමග වැඩකටයුතු ආරම්භ කර ඇති අතර අදාළ පරිගණක වැඩසටහන් 2017 වසරේ සිට ක්‍රියාත්මක කිරීමට හැකිවනු ඇත.
- සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සඳහා උසස්වීම් ක්‍රමවේදයක් සකසා වැටුප් හා සේවක සංඛ්‍යා කොමිසම වෙත ඉදිරිපත් කර ඇත.

සිවිල් ආරක්ෂක අංශය -2016.01.01 දින සිට 2016.12.31 දින දක්වා ප්‍රගතිය

| ක්‍රියාකාරකම | 2016 | 2017 |
|---|---|---|
| | කළ | ඉතිරි |
| පුපුරන ද්‍රව්‍ය අවසරපත්‍ර නිකුත් කිරීම සඳහා අනුමැතිය ලබාදීම | 4088 | - |
| පුපුරන ද්‍රව්‍ය බලපත්‍ර නිකුත් කිරීම සඳහා අනුමැතිය ලබාදීම | 2209 | - |
| තොග වෙළෙඳුන්ට පුපුරන ද්‍රව්‍ය මිළදී ගැනීම සඳහා අනුමැතිය ලබාදීම | 642 | - |
| ගිනිකෙලි හා අලිවෙඩි නිෂ්පාදනය සඳහා පුපුරන ද්‍රව්‍ය ලබා ගැනීම | 80 | - |
| ගිනිපෙට්ටි නිෂ්පාදනය සඳහා පුපුරන ද්‍රව්‍ය ලබා ගැනීමට අනුමැතිය ලබා ගැනීම | 89 | - |
| විදේශීය නෞකාවල ආරක්ෂක කටයුතු සඳහා ශ්‍රී ලංකාවේ නේවාසිකව රැඳී සිටින විදේශිකයන් සඳහා වීසා නිකුත් කිරීම | 21 | - |
| විදේශීය පුහුන් සඳහා අවසර ලබාදීම | 18 | - |
| පෞද්ගලික ආරක්ෂක නියෝජිත ආයතන ලියාපදිංචිය අලුත් කිරීම් | 352 | 03 |
| අන්තරායකර බහලුම් සහිත නැව් මෙහෙයුම් සඳහා අනුමැතිය ලබා දීම | 1316 | - |
| අඳුරු වීදුරු සඳහා බලය ලබාදීම (වාහන) | 348 | 03 |
| සිවිල් ආරක්ෂක අංශයේ සේවකයින්ගේ- වාර්ෂික වැටුප් වර්ධක ගෙවීම සඳහා නිර්දේශය හා අනුමැතිය ලබා දීම | 43 | - |
| සිවිල් ආරක්ෂක අංශයේ සේවකයින්ගේ- ස්ථාන මාරුවීම් සම්බන්ධ රාජකාරි | - | 02 |
| වගා ආරක්ෂාව/ සත්ව පාලනය සඳහා නව ගිනිඅවි ඉල්ලීම / බලපත්‍ර ලබාදීම් | 07 | 125 |
| ජීවිත ආරක්ෂාව සඳහා -.38 හා මිමී 9 අවි ඉල්ලීම | 53 | 83 |
| .38 හා මිමී 9 අවි - බලපත්‍ර අලුත් කිරීම් | 1256 | 349 |
| රාජ්‍ය ආයතනවල ආරක්ෂාව සඳහා අවි ඉල්ලීම් | 157 | |
| පෞද්ගලික ආයතනවල ආරක්ෂාව සඳහා අවි ඉල්ලීම් | 102 | |
| රාජ්‍ය බැංකු ආරක්ෂාව සඳහා අවි ඉල්ලීම් | 425 | - |
| පෞද්ගලික බැංකු ආරක්ෂාව සඳහා අවි ඉල්ලීම් | 20 | - |
| ක්‍රීඩා කටයුතු සඳහා අවි ඉල්ලීම් | 08 | 29 |
| වායු රයිෆල් ආනයනය කිරීම් | 9229 | - |
| ක්‍රීඩා සංගම් සඳහා අවි නිකුත් කිරීම - නව | 08 | - |
| අබලන් ගිනි අවි වෙනුවෙන් නව ගිනි අවි නිකුත් කිරීම | 32 | 15 |
| අවුරුදු 65 වයස් සීමාව ඉක්ම වූ ගිනි අවි හිමි කරුවන්ගේ "පවුල" තුළ ගිනි අවි පැවරීම සඳහා ලද අයදුම්පත්‍ර/ බලපත්‍ර නිකුත් කිරීම | 167 | 101 |
| නිදහස් ගිනි අවි බලපත්‍ර නිකුත් කිරිඹ - මහජන නියෝජිතයින් (පාර්ලිමේන්තු මන්) | 35 | - |
| නිදහස් ගිනි අවි බලපත්‍ර මහජන නියෝජිතයින් (ප.සභා) | 58 | - |

6.1 වගුව: ජීවිත/ දේපළ ආරක්ෂාව සඳහා ලබා දී ඇති පිස්තෝල/ රිවෝල්වර

| අනු අංකය | කාර්ය / තුවක්කු අංශා පනතට අදාල රාජකාරි | ප්‍රගතිය | 2017 සඳහා ඉතිරි වූ කාර්යයන් හා අභියෝග |
|---|---|---|---|
| 01 | ආත්මාරක්ෂාව සඳහා පිස්තෝල හා රිවෝල්වර නිකුත් කිරීම | ගිනි අවි 1608 ක් මේ වන විට නිකුත් කර ඇත.<br>රජයට භාරදුන් ගිනි අවි ඉවත් කළ විට - 1394 | අයදුම්පත් 83 ප්‍රමාණයක් අඩුපාඩු සහිතව ලැබී ඇති අතර එම අඩුපාඩු ගෙන්වා ගැනීම සඳහා කටයුතු කරමින් සිටී.<br>බලපත්‍ර අලුත් කිරීම සඳහා 138 ක් ඇත ඒවායේ ද වැඩකටයුතු ආරම්භ කර ඇත. |
| 02 | වගා හා දේපළ ආරක්ෂාව සඳහා පතරොම් තුවක්කු නිකුත් කිරීම | 1. වගා ආරක්ෂාව සඳහා ගිනි අවි 07 ක් නිකුත් කර ඇත.<br>2. අබලන් ගිනිඅවි වෙනුවට නව ගිනිඅවි නිකුත් කිරීම් 32 යි<br>3. වයස 65 වැඩි අයගේ පවුල තුල ගිනිඅවි පැවරීම් 167 යි | වගා ආරක්ෂක අයදුම් පත් 125 ක් ලැබී ඇත අවශ්‍ය අඩුපාඩු ගෙන්වා ගැනීමට කටයුතු කරමින් පවතී.<br>පවුල තුල පැවරීම් යටතේ අයදුම් පත්‍ර 72 ක ප්‍රමාණයක් අඩුපාඩු සහිතව ඇත. එම අඩුපාඩු ගෙන්වීමට කටයුතු කල යුතුව ඇත. |
| 03 | ක්‍රීඩා කටයුතු සඳහා ලබා දී ඇති ගිනි අවි | ජාතික රයිෆල් සංගමය හා ජාතික වෙඩි තැබීමේ ක්‍රීඩා ෆෙඩරේෂනය යටතේ ඇති ක්‍රීඩා සංගම් ගණන 15කි. එම සංගම් සඳහා නව ගිනිඅවි 08 ක් නිකුත් කර ඇත. | අයදුම්පත්‍ර 29 ප්‍රමාණයක් ලැබී ඇති අතර අවශ්‍ය අඩුපාඩු ගෙන්වා ගැනීම සඳහා කටයුතු කරමින් පවතී. |
| 04 | වායු රයිෆල් නිකුත් කිරීම | 1. වායු රයිෆල් 9229 ක් නිකුත් කර ඇත.<br>2. ලියාපදිංචි සමාගම් 07 කි. | වායු රයිෆල් හා වායු පිස්තෝල මෙරට නිෂ්පාදනයක් නැත. මෙම අංශය වැඩි දියුණු කළ යුතුවේ. |
| 05 | රජයේ ගිනි අවි නිකුත් කිරීම | 1. මහජන නියෝජිතයන්(පාර්ලිමේන්තු) 35 දෙනෙකු සඳහා ගිනි අවි නිකුත් කර ඇත<br>2. පළාත් සභා මන්ත්‍රීවරුන් 58 දෙනෙකුගේ ගිනි අවි බලපත්‍ර අලුත් කර ඇත. | |
| | කාර්ය /පෞද්ගලික ආරක්ෂක නියෝජ්‍ය ආයතන පනත | | |
| 06 | පෞද්ගලික ආරක්ෂක නියෝජිත ආයතන | 1. ලියාපදිංචි මුළු ආයතන සංඛ්‍යාව 352 යි<br>2. රාජ්‍ය ආයතන සඳහා අවි නිකුත් කිරීම් 157<br>3. රාජ්‍ය බැංකු සඳහා අවි නිකුත් කිරීම් 425<br>4. පෞද්ගලික බැංකු සඳහා ගිනිඅවි 20 ක් නිකුත් කර ඇත<br>5. පෞද්ගලික ආයතන සඳහා ගිනිඅවි 102 ක් නිකුත් කර ඇත | පෞද්ගලික ආරක්ෂක සේවයේ නියුතු නිලධාරීන් සඳහා සුදුසු ක්‍රමවේදයක් සහිත ජාත්‍යන්තර මට්ටමේ වෘත්තීය භාවයක් ඇති කිරීමට NVQ පාඨමාලාවක් ආරම්භ කිරීමට කටයුතු කරමින් සිටී. |
| 07 | ආදායම් | ගිනි අවි / පතරොම් සහ පුපුරණ ද්‍රව්‍ය නිකුත් කිරීම සඳහා ආදායම වශයෙන් 2016 වර්ෂයේදී මිලියන20.5 ක පමණ මුදලක් උපයා ගෙන ඇත. | |

| අනු අංකය | කාර්ය / තුවක්කු අඥා පනතට අදාල රාජකාරි | ප්‍රගතිය | 2017 සඳහා ඉතිරි වූ කාර්යයන් හා අභියෝග |
|---|---|---|---|
| 08 | තුවක්කු ආඥා පනත | මෙම පනත වර්තමානයට ගැලපෙන පරිදි සංශෝධනය කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල සටහනක් 2017.01.04 දිනැතිව අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත | අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබුණ පසු කෙටුම්පත් සකස් කිරීමට අපේක්ෂා කෙරේ |
| 09 | පුපුරණ ද්‍රව්‍ය ආඥා පනත | ශාස්ත්‍ර සංශෝධනය කරන ලදී | පනත සංශෝධනය කිරීමට කටයුතු කරන අතර නීති කෙටුම්පත් සම්පාදක වෙත යොමු කර ඇත. |
| 10 | තුවක්කු බලපත්‍ර හා පුපුරණ ද්‍රව්‍ය බලපත්‍ර නිකුත් කිරීමේ වැඩපිළිවෙල පරිගනක ගත කිරීම | පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය (CRD) සමග වැඩකටයුතු ආරම්භ කර ඇත. | මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා පරිගණක 25 ක් ලබා ගැනීමට යෝජනා කර ඇත<br>දිස්ත්‍රික් ලේකම් කාර්යාල සමග ජාලගතව කටයුතු කිරීමට යෝජනා කර ඇත |
| 11 | සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ සේවය කරන සාමාජික/සාමාජිකාවන් සඳහා විශ්‍රාම වැටුප් ලබාදීම. | මේ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත වර්තමානයේදී ක්‍රියාකර ගෙන යනු ලබන අතර, 2015.04.23 දිනට සක්‍රිය සේවයේ නියුතුව සිටින/සිටි සිවිල් ආරක්ෂක සාමාජික/සමාජිකාවන් හට අදාළ විශ්‍රාම වැටුප් ලබාදීමට තීරණය කර ඇත. | එසේ වුවද 2015.04.23 දිනට පෙර විශ්‍රාම ගිය,මියගිය හා ආබාධිත සිවිල් ආරක්ෂක සාමාජිකයින් සඳහා විශ්‍රාම වැටුප් ලබාදීම සම්බන්ධයෙන් ගැටළු පවතී. ගැටළු අදාළ පාර්ශවයන් සමඟ සාකච්ඡා කොට අදාළ සහන ලබාදීමට නියමිතව ඇත. |
| 12 | සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය සඳහා වන බඳවා ගැනීමේ පටිපාටිය | මේ සම්බන්ධයෙන් වැටුප් හා සේවක සංඛ්‍යා කොමිසම වෙත අදාල උසස්වීමේ ක්‍රමවේද සකස් කර අනුමැතියට ඉදිරිපත් කර ඇත. | |
| 13 | රක්නා ලංකා සමාගම ඈවර කිරීම | 2016.12.15 දින ලද අමාත්‍ය මණ්ඩල තීරණය අනුව රක්නා ලංකා සමාගම ඈවර කිරිම සඳහා අනුමැතිය ලබාදී ඇත. | මෙම අවස්ථාවේදී රක්නාලංකා සමාගම ඈවර කිරීම සුදුසු නොවන බව නීතිපති තුමා විසින් උපදෙස් ලබාදුන් අතර, ඒ පිළිබඳව නැවත අමාත්‍ය මණ්ඩලය දැනුවත් කරන ලදී. |
| 14 | රක්නා ලංකා සමාගමේ කාර්ය මණ්ඩලය | 1300 කට ආසන්න ගොඩබිම් හා මුහුදු ආරක්ෂක නිළධාරීන් සේවය කල අතර මුහුදු ආරක්ෂකයින් ශ්‍රී ලංකා නාවික හමුදාව වෙත අනුයුක්ත කරන අතර, ගොඩබිම් ආරක්ෂකයින් සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවට හෝ SLRDC වෙත අනුයුක්ත කිරීමට සාකච්ඡා කරමින් පවතී. | |
| 15 | මුහුදු ආරක්ෂක නිළධාරීන් පුහුණු කිරීම | මුහුදු ආරක්ෂක නිළධාරීන් පුහුණු කිරීම සඳහා ආයතනයක් ස්ථාපිත කිරීමට කටයුතු කරමින් සිටී. | |

වගු අංක 6.2: කාර්යයන් හා අභියෝග

# 7. මුදල් අංශය

## 7.1 සමාලෝචනය

ආරක්ෂක අමාත්‍යාංශයේ ගිණුම් අංශය යටතේ පවතින උප අංශ 05 කි.

- ප්‍රසම්පාදන අංශය
- ගෙවීම් අංශය
- මුදල් අංශය
- ණය හා අත්තිකාරම් අංශය
- වැටුප් අංශය

ඒ අනුව පහත කාර්යයන් ගිණුම් අංශය මඟින් ක්‍රියාත්මක කරනු ලබයි.

- අමාත්‍යාංශය හා ඒ යටතේ පවත්නා දෙපාර්තමේන්තු වල මෙන්ම ව්‍යවස්ථාපිත මණ්ඩල හා ව්‍යාපෘති සඳහා ප්‍රසම්පාදන කටයුතු සැළසුම් කිරීම අධීක්ෂණය, ප්‍රසම්පාදන අනුමැතියන් හා කොන්ත්‍රාත් පරිපාලන කටයුතු.
- වාර්ෂික අයවැය ඇස්තමේන්තු සහ අතිරේක ඇස්තමේන්තු සකස් කිරීම.
- වාර්ෂික අග්‍රිම අවශ්‍යතා මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම, භාණ්ඩාගාරයෙන් මාසිකව අග්‍රිම ශාඛා ගිණුම් මහා භාණ්ඩාගාර ගිණුම් හා සැසඳීම
- මාසික සාරාංශ වාර්තා සකස් කිරීම හා මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම අමාත්‍යාංශයිය ගිණුම් මහා භාණ්ඩාගාර ගිණුම් සැසඳීම
- විසර්ජන ගිණුම් සැකසීම
- පුපුරණ ද්‍රව්‍ය හා ගිනි අවි බලපත්‍ර වල ආදායම් ගිණුම් සැකසීම (1003/07/05 ශිර්ෂය)
- අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තුවල නිල බැංකු ගිණුම් විවෘත කිරීම, වැසීම හා සංශෝධන සම්බන්ධයෙන් මහා භාණ්ඩාගාරය හා බැංකු සමග අදහස් හුවමාරුව
- ප්‍රාග්ධන මිළදී ගැනීම් සඳහා ගෙවීම් කිරීම
- ප්‍රතිපාදන මුදා හැරීම, අතිරේක ප්‍රතිපාදන ඉල්ලා සිටීම් හා මුදල් ප්‍රතිපාදන අමාත්‍යාංශයට හා ඒ යටතේ ඇති ආයතනවලට මාරු කිරීම
- ජාතික ආරක්ෂක අරමුදලට අදාළ කාර්යයන් සම්බන්ධයෙන් ක්‍රියා කිරීම
- අපි වෙනුවෙන් අපි අරමුදලට ලැබෙන පරිත්‍යාග හා වෙනත් ආදායම් රැස්කිරීම, ගිණුම් ගත කිරීම, නිවාස ව්‍යාපෘති සඳහා එලදායිව යෙදවීම
- අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති ව්‍යාපෘති වල කාර්ය මණ්ඩල සඳහා වැටුප් සැකසීම
- අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති ව්‍යාපෘති වල කාර්ය මණ්ඩල සහා අත්තිකාරම් බි ගිණුම් යටතේ ණය හා අත්තිකාරම් ගෙවීම් කටයුතු
- අමාත්‍යාංශය හා ඒ යටතේ පවත්නා දෙපාර්තමේන්තු ව්‍යවස්ථාපිත මණ්ඩල හා ව්‍යාපෘති වල සිදුවන අලාභහානි පිළිබඳව පරීක්ෂණ පැවැත්වීම, අලාභහානි කපාහැරීම් හා ගිණුම් තැබීම් කටයුතු
- අමාත්‍යාංශය යටතේ ඇති ආයතන වෙතින් ඉදිරිපත් වන වව්චර් පත් සඳහා ගෙවීම් කටයුතු සිදු කිරීම.

## 7.2 2016 වර්ෂයේ කාර්යසාධනය

2016 අයවැය ඇස්තමේන්තුව යටතේ ආරක්ෂක අමාත්‍යාංශය වෙත පුනරාවර්තන වියදම් සඳහා රු.මිලි.5,899.76 ක ප්‍රතිපාදන ප්‍රමාණයක් සහ මූලධන වියදම් සඳහා රු.මිලි.11,576.63 ක ප්‍රතිපාදන ප්‍රමාණයක් වෙන් කර දී ඇත. ඒ අනුව 2016.12.31 දිනට ආරක්ෂක අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රගතිය පහත පරිදි වේ.

7.1 වගුව : ආරක්ෂක අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රගතිය

### 7.2.1 ගෙවීම් අංශය

| වියදම | 2016 ප්‍රතිපාදන (රු) | 2016.12.31 දිනට වියදම (රු) | % |
|---|---|---|---|
| පුනරාවර්තන | 5,899,762,000 | 3,302,628,817 | 56 |
| මූලධන | 11,576,635,000 | 3,470,429,594 | 30 |
| එකතුව | 17,476,397,000 | 3,979,191.18 | 39 |

මෙම අමාත්‍යාංශය යටතේ ඇති පහත දැක්වෙන ආයතනවලට අදාල වවුචර්පත් ගෙවීම් අංශය වෙත ඉදිරිපත් කෙරේ.

- අමාත්‍ය කාර්ය මණ්ඩලය
- අමාත්‍යංශ පරිපාලනය හා කාර්ය මණ්ඩලය
- රාජ්‍ය බුද්ධි සේවය
- ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී කාර්යාලය
- සංවර්ධන හා පර්යේෂණ ආයතනය
- මාධ්‍ය කේන්ද්‍රය

2016.01.01 දින සිට 2016.12.31 දින දක්වා ගෙවීම් අංශයට වව්චර්පත් 11300 කට ආසන්න ප්‍රමාණයක් ලැබී ඇති අතර එම වව්චර් සියල්ල සඳහා ගෙවීම් කර ඇත. 2016 වර්ෂයේදී ගෙවීම් අංශයට ලැබී ඇති වවුචර්පත් සම්බන්ධව නියමිත කාල සීමාව තුළ පහත දැක්වෙන පරිදි ක්‍රියා කර ඇත.

- ගෙවීම් අංශයට ලැබෙන සියලුම වව්චර් පත් පරිගණක ගතකර ගෙවීම් කළ පසු අදාළ චෙක්පත් අංක ද පරිගණක ගත කර ඇත.
- අමාත්‍යාංශය විසින් බාහිර ආයතන වලට නිකුත් කරනු ලබන චෙක්පත් සියයට 100 මුද්‍රණය කර ලබා දීමට හැකිවීමෙන් වඩාත් පැහැදිලි බවත් හා ආයතන පිළිබඳව විශ්වාසනීයත්වය වඩාත් තහවුරු කිරීමට හැකි වී ඇත.
- බොහෝමයක් ආයතන ඔවුන්ගේ ගිණුම් හරහා Slip Payment ක්‍රමය මගින් ගෙවීම් සිදු කිරීම නිසා කාර්යයන් වඩාත් කාර්යක්ෂම වී ඇත.
- ප්‍රමාණවත් පරිදි ප්‍රතිපාදන නොමැති වීම නිසා 2016 වර්ෂයට අදාල ගෙවීම් රු.25,757,874.53 ක ප්‍රමාණයක් 2017 වර්ෂය තුළ ගෙවීමට සිදුවිය.

### 7.2.2 මුදල් අංශය

වාර්ෂික අයවැය ඇස්තමේන්තුව හා පරිපූරක ඇස්තමේන්තුව පිළියෙල කිරීම.

- වාර්ෂික අක්මුදල් අවශ්‍යතාව භාණ්ඩාගාරයට ඉදිරිපත් කර අනුමත කරවාගෙන මාසිකව භාණ්ඩාගාරයෙන් අක්මුදල් ලබා ගැනීම හා ගිණුම් ඒකක වෙත අක් මුදල් නිදහස් කිරිම.
- මාසිකව ඒකාබද්ධ ගිණුම් සාරාංශය පිළියෙල කර භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරිම හා අමාත්‍යාංශ ගිණුම්, භාණ්ඩාගාර ගිණුම් සමඟ සැසඳීම.
- විසර්ජන ගිණුම පිළියෙළ කිරිම.
- පුපුරන ද්‍රව්‍ය හා ගිණි අවි බලපත්‍ර (1003/07/05/ශීර්ෂය) ආදායම් ගිණුම පිළියෙළ කිරිම.
- අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති දෙපාර්තමේන්තු, ආයතන වලට අවශ්‍ය අමතර ප්‍රතිපාදන ලබා ගැනීම, ප්‍රතිපාදන නිදහස් කිරිම හා ප්‍රතිපාදන මාරු කිරිම.
- 2016 වසරේදි, පහත දැක්වෙන සංවර්ධන ක්‍රියාකාරකම්වල මූල්‍යමය කළමණාකරණයට අදාල කටයුතු සම්බන්ධයෙන් ක්‍රියා කිරිම
  - ආරක්ෂක මූලස්ථාන ඉදිකිරීම් ව්‍යාපෘතිය
  - උපායමාර්ගික ආරක්ෂක සන්නිවේදන ජාලකරණ ව්‍යාපෘතිය
  - පුද්ගල අනන්‍යතා මහලේකම් කාර්යාලය
- අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු වල නිල බැංකු ගිණුම් විවෘත කිරිම, වැසීම හා අවශ්‍ය සංශෝධනයන් සිදු කිරිම යනාදියට අදාළව බැංකු හා භාණ්ඩාගාරය සමඟ සන්නිවේදන කටයුතු සිදු කිරිම.
- ආරක්ෂක අරමුදලට අදාළ කටයුතු සිදු කිරිම.

| 2015 වර්ෂය ( රු.මි.) | | | 2016 වර්ෂය දෙසැම්බර් 31 දිනට රු.මි. | |
|---|---|---|---|---|
| ගිණුම | අනුමත වාර්ෂික අක් මුදල් සීමාව රු.මි | අක් මුදල් ලැබීම | අනුමත වාර්ෂික අක් මුදල් සීමාව | අක් මුදල් ලැබීම රු.මි |
| පුනරාවර්තන | 2073.32 | 1,567.53 | 4,589.09 | 1,974.39 |
| ප්‍රාග්ධන | 10,352.25 | 2,737.43 | 8,703.69 | 4,875.95 |
| ර නි අ බි ගිණුම | 47.48 | 5.16 | 50 | 32 |

7.2 වගුව : 2016 වර්ෂය තුල අක් මුදල් සීමාවන්

| වර්ෂය | ඇස්තමේන්තුව රු. (මිලියන) | සත්‍ය ආදායම රු.(මිලියන) |
|---|---|---|
| 2011 | 12 | 10.088 |
| 2012 | 12.25 | 10.08 |
| 2013 | 12.25 | 11.871 |
| 2014 | 12.5 | 12.88 |
| 2015 | 12.5 | 12.96 |
| 2016 | 12.75 | 13.73 |

7.3 වගුව : පුපුරණ ද්‍රව්‍ය හා ගිණි අවි බලපත්‍ර ආදායම් ගිණුම (1003/07/03/ශීර්ෂය)

### 7.2.3 ප්‍රසම්පාදන අංශය

ත්‍රිවිධ හමුදාව ඇතුළුව අමාත්‍යාංශය යටතේ ඇති සියළු දෙපාර්තමේන්තු හා ව්‍යාපෘතීන්ට අදාළ ප්‍රසම්පාදන කටයුතු මෙම අංශය විසින් සිදුකරනු ලබයි. මේ යටතේ ත්‍රිවිධ හමුදාවට අදාළව රු.මි.200 ඉක්මවන වටිනාකමින් යුත් ප්‍රසම්පාදන කටයුතු (අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරනු ලබන ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව - SCAPC) හා අමාත්‍යාංශ ප්‍රසම්පාදන කටයුතු (අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව - MPC) මෙම අංශය විසින් සිදුකරනු ලබයි. අදාළ ප්‍රසම්පාදනයන් සම්බන්ධයෙන් සියළු කටයුතු මෙම අංශය විසින් සිදු කරන අතර ඒ අනුව මෙම කාලසීමාව තුළ පහත ප්‍රසම්පාදන කටයුතු සිදුකර ඇත.

| අංකය | ආයතනය | ප්‍රසම්පාදන මට්ටම | ප්‍රසම්පාදන ප්‍රමාණය | වටිනාකම රු.මි. | වසර තුල ප්‍රදානය කළ ප්‍රමාණය |
|---|---|---|---|---|---|
| 01 | ශ්‍රී ලංකා යුද්ධ හමුදාව | SCAPC | 04 | 2,748 | 03 |
| 02. | ශ්‍රී ලංකා ගවන් හමුදාව | SCAPC | 03 | 388 | 01 |
| 03. | ආරක්ෂක මූලස්ථානය ඉදිකිරීම් ව්‍යාපෘතිය | SCAPC | 05 | 1,769 | 01 |
| 04. | රාජ්‍ය බුද්ධි සේවාව | SCAPC | 01 | 265 | 01 |
| 05. | ආරක්ෂක මූලස්ථාන ඉදිකිරීමේ ව්‍යාපෘතිය | MPC | 02 | 120 | 02 |
| 06. | ශ්‍රී ලංකා ගුවන් හමුදාව | MPC | 03 | 402 | 02 |
| 07. | ආරක්ෂක අමාත්‍යාංශය | MPC | 169 | 321.5 | 169 |

7.4 වගුව : ප්‍රසම්පාදන කටයුතු – දේශිය අරමුදල්

| අංකය | ආයතනය | ප්‍රසම්පාදන මට්ටම | ප්‍රසම්පාදන ප්‍රමාණය | වටිනාකම රු.මි. | වසර තුල ප්‍රදානය කළ ප්‍රමාණය |
|---|---|---|---|---|---|
| 01. | ශ්‍රී ලංකා යුද්ධ හමුදාව | SCAPC | 01 | 1,176 | - |
| 02. | ශ්‍රී ලංකා නාවික හමුදාව | SCAPC | 01 | 8,184 | - |
| 03. | ශ්‍රී ලංකා ගුවන් හමුදාව | SCAPC | 03 | 874 | 01 |
| 04. | ශ්‍රී ලංකා ගුවන් හමුදාව – එක්සත් ජාතින්ගේ සාම සාධක මෙහෙයුම් | SCAPC | 11 | 11,150 | 03 |

7.5 වගුව : ඉන්දියානු / වෙනත් ණය යෝජනා ක්‍රමය යටතේ ක්‍රියාත්මක කරනු ලබන ප්‍රසම්පාදනයන්

#### 7.2.3.1 මු.රෙ.අනුමැතිය ලබාදීම

මේ යටතේ මු.රෙ.136 අනුමැතිය පහත පරිදි ලබාදීම් සිදුකර ඇත.

| අංකය | ආයතනය | අනුමැතිය දුන් ප්‍රමාණය |
|---|---|---|
| 01. | ශ්‍රී ලංකා යුද්ධ හමුදාව | 103 |
| 02. | ශ්‍රී ලංකා නාවික හමුදාව | 26 |
| 03. | රාජ්‍ය බුද්ධි සේවාව | 22 |
| | | |

7.6 වගුව : මු.රෙ. අනුමැතිය ලබාදීම

#### 7.2.3.2 ණයවර ලිපි සඳහා අනුමැතිය ලබාදීම

| අංකය | ආයතනය | අනුමැතිය දුන් ප්‍රමාණය |
|---|---|---|
| 01. | ශ්‍රී ලංකා යුද්ධ හමුදාව | 34 |
| 02. | ශ්‍රී ලංකා නාවික හමුදාව | 98 |
| 03. | ශ්‍රී ලංකා ගුවන් හමුදාව | 55 |
| 04. | ආරක්ෂක මූලස්ථාන ඉදිකිරිමේ ව්‍යාපෘතිය | 16 |

7.7 වගුව : ණයවර ලිපි සඳහා අනුමැතිය ලබාදීම

මීට අමතරව, ත්‍රිවිධ හමුදාවට අදාල වාහන කුළි පදනම මත ලබාගැනීමට අනුමැතිය ලබාදීම හා CEPEC අනුමැතිය ලබාදීම යන කාර්යයන්ද සිදුකරනු ලබයි.

### 7.2.4 වැටුප් අංශය

අමාත්‍යාංශයේ සියලුම නිළධාරින් ,රාජ්‍ය බුද්ධි සේවාව ඇතුළු අමාත්‍යාංශයට අනුයුක්ත සියළුම ව්‍යාපෘති වල වැටුප් සැකසීම, අතිකාල දීමනා ගෙවීම, ගමන් වියදම්(දේශීය/විදේශීය)ගෙවීම.

- 2016 වර්ෂය තුළ දී විශ්‍රාම ගිය නිලධාරීන් 32 දෙනෙකුට විශ්‍රාම පාරිතෝශික මුදල් ලබා දීමට කටයුතු කිරීම සහ විශ්‍රාම වැටුප් සකස් කිරීමට අදාළ ලියවිලි විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත කඩිනමින් ඉදිරිපත් කිරීම.
- වැටුප් ප්‍රේෂණපත් යැවීම වෙනුවට Slip ක්‍රමය යටතේ අදාළ බැංකුවලට වැටුප් ප්‍රේෂණය කිරීම නිසා නියමිත දිනට වැටුප් ලබා ගැනීමට හැකි වීම.
- අමාත්‍යාංශය ඇතුළු ඊට අනුබද්ධිත ව්‍යාපෘතිවල නිලධාරීන්ගේ වැටුප් වර්ධක, රා.ප.ච.03/2016 අනුව වැටුප් පරිවර්තන සැකසීම, උසස් වීම් සහපෙරදාතම/පසුදාතම කිරීම අනුව හිඟ වැටුප් ගෙවීමට කටයුතු කිරීම.

### 7.2.5 ණය අත්තිකාරම් අංශය

- රාජ්‍ය සේවකයන්ගේ ශුභ සිද්ධිය සඳහා රජය මඟින් සහනදායී පොළී ක්‍රමයක් යටතේ මෙම අමාත්‍යාංශයේ මෙන්ම රාජ්‍ය බුද්ධි සේවයේ, ආරක්ෂක රාජ්‍ය අමාත්‍යාංශයේ, ජාතික ශිෂ්‍යභට බලකායේ සහ භාෂා පුහුණු මධ්‍යස්ථාන වල සේවයේ නියුතු නිලධාරීන් සඳහා ණය පහසුකම් ලබා දීම සහ ඒ සඳහා අවශ්‍ය පහසුකම් සැළසීම

.

- 2016 වර්ෂය සඳහා විසර්ජන පනතින් අත්තිකාරම් “බී” ගිණුම සඳහා පහත සීමාවන්ට බලය ලබා දීම.

| සීමාව / සත්‍ය ප්‍රතිපාදන අගය | වියදමෙහි උපරිම සීමාව (රු.මි.) | ලැබීම් වල අවම සීමාව (රු.මි.) | හර ශේෂ උපරිම සීමාව (රු.මි.) |
|---|---|---|---|
| විසර්ජන පනතින් බලය දුන් සීමාවන් 2016 | 50 | 35 | 275 |
| විසර්ජන පනතට අමතර බලය දුන් සීමාවන් 2017 | 60 | 45 | 275 |
| 2016.01.01 දින සිට 2016.08.31 දිනට සත්‍ය ප්‍රතිපාදන අගය | 40 | 30 | 150 |
| 2016.01.01 දින සිට 2016.12.31 දිනට සත්‍ය ප්‍රතිපාදන අගය | 56 | 47 | 139 |

7.8 වගුව: 2016 වර්ෂය සඳහා "බී" ගිණුමේ සීමාවන්

- රාජ්‍ය සේවකයන්ගේ ශුභ සිද්ධිය සඳහා 2016 වසර තුළ දී ඉහත සීමාවන්ට යටත්ව අදාළ නිලධාරීන් හා සේවකයන් සඳහා රජයේ ප්‍රතිපාදන යටතේ ණය ලබා දීම.

| ණය වර්ගය | රාජ්‍ය බුද්ධි සේවයේ නිලධාරීන් සඳහා (රු) | | අමාත්‍යංශයේ නිලධාරීන් සඳහා (රු) | | රාජ්‍ය අමාත්‍යංශයේ නිලධාරීන් සඳහා (රු) | | ජාතික ශිෂ්‍ය භට බලකාය සඳහා(රු) | |
|---|---|---|---|---|---|---|---|---|
| කාලය | 2016.01.01 – 2016.08.31 | 2016.09.01 – 2016.12.31 | 2016.01.01 – 2016.08.31 | 2016.09.01 – 2016.12.31 | 2016.01.01 – 2016.08.31 | .2016.09 – 01 2016.12.31 | 2016.01.01 – 2016.08.31 | 2016.09.01 – 2016.12.31 |
| විශේෂ අත්තිකාරම් | 2.5 | - | 0.32 | - | 0.012 | - | 0.012 | - |
| උත්සව අත්තිකාරම් | 12.0 | 0.25 | 2.0 | 0.091 | 0.25 | 0.02 | 0.8 | - |
| ආපදා ණය | 10.4 | 7.1 | 8.9 | 5.4 | 1.6 | 0.094 | 1.3 | 2.2 |
| පාපැදි ණය | - | - | 0.072 | 0.006 | - | - | - | - |
| ණය බරින් මිදීමේ ණය | - | 0.015 | 0.030 | - | - | - | - | - |
| **මුළු එකතුව** | 24.9 | 7.365 | 11.322 | 5.497 | 1.862 | 0.114 | 2.112 | 2.2 |

7.9 වගුව : රජයේ ප්‍රතිපාදන යටතේ ලබාදුන් ණය පිලිබඳ සාරාංශ ගත තොරතුරු

- 2016.01.01 දින සිට 2016.12.31 දක්වා වසර තුළ ඉහත නිලධාරීන්ගේ ශුභ සිද්ධිය සඳහා ණය වශයෙන් ලබා දුන් මුළු මුදල 56,230,313 කි.
- 2016.01.01 දින සිට 2016.12.31 දක්වා වාණිජ බැංකු වෙත දේපල ණය ලබා දීම සම්බන්ධයෙන් යොමු කෙරුණු අයදුම්පත් සම්බන්ධයෙන් අයදුම්පත් 30 කි.
- ඉහත කාලච්ඡේදය හා ර.නි.අ. ගිණුමේ අළුත් ණය දීම්, අවකරණ හා අයකර ගැනීම් යාවත්කාලීන කර පවත්වාගෙන ගොස් ඇත.
- මු. රෙ. 506 (ඩී) ප්‍රකාරව 2016.12.31 දිනට රජයේ අත්තිකාරම් “බී“ ගිණුම් සැසඳීම් ප්‍රකාශන 2017.03.31 දින විගණකාධිපති වෙත ඉදිරිපත් කර ඇත.

### 7.2.6 සැපයීම් හා අලාභහානි අංශය

ආරක්ෂක අමාත්‍යාංශයේ අරමුණු හා පරමාර්ථ සාක්ෂාත් කරගැනීම උදෙසා නීති රෙගුලාසි අණ පනත් වලට අනුකූලව ආර්ථික වශයෙන් ඵලදායී ලෙස භාණ්ඩ මිලදී ගැනීම හා ගබඩා කිරීම, අදාළ අංශ වෙත නිකුත් කිරීම හා ලේඛනගත කිරීම.

- වාර්ෂිකව සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම මගින් මෙම අමාත්‍යාංශයේ හා ඒ යටතේ පාලනය වන සියලුම දෙපාර්තමේන්තු සහ ආයතනවලට අවශ්‍ය භාණ්ඩ මිලදී ගැනීමට පහසුකම් සැළසීම හා මඟ පෙන්වීම.
- වාර්ෂික භාණ්ඩ සමීකරණ කටයුතු හා භාණ්ඩ අපහරණ කටයුතු සිදුකිරීම මගින් මෙම අමාත්‍යාංශයේ හා ඒ යටතේ පාලනය වන දෙපාර්තමේන්තු වලට හා ආයතනවලට අයත් භාණ්ඩවල සුරක්ෂිත භාවය ආරක්ෂා කිරීම, නිසි පරිදි අනවශ්‍ය භාණ්ඩ ඉවත් කිරීම.
- අමාත්‍යාංශයේ හා ඒ යටතේ පාලනය වන දෙපාර්තමේන්තු සහ ආයතන සතු දේපළ වලට හා භාරයට පත්කළ දේපළ වලට හානිවීම සම්බන්ධව මු.රෙ.102 හි විධිවිධාන අනුව කටයුතු කිරීම.
- මු.රෙ. 104(3) ප්‍රකාරව ප්‍රාරම්භක වාර්තාව ලද විගස මුරෙ 104 (4) අවසන වාර්තාව සහ පරීක්ෂණ මණ්ඩල වාර්තාව කැඳවා ඊට වගකිවයුත්තන් වේ නම් දෙපාර්තමේන්තු ගාස්තු ද ඇතුළත්ව ඔවුන්ගෙන් අලාභය අයකර ගැනීම තුළින් රජයේ පාඩුව අවම කරගැනීම වගකිවයුත්තෙකු නොවන අවස්ථාවන්හි මුරෙ 109 යටතේ අලාභය ලේඛනවලින් කපාහැරීම සිදු කෙරේ.
- ස්ථාවර වත්කම් කළමනාකරණ පද්ධතිය මගින් අමාත්‍යාංශ සතු ස්ථාවර වත්කම් කළමනාකරණය කිරීම.
- පාරිභෝගික භාණ්ඩ බෙදාහැරිම හා ලේඛනගත කිරීමට අදාළ කාර්යයන් ක්‍රමානුකූලව සිදුකිරීම.
- මු.රෙ.115 යටතේ මෙම අමාත්‍යාංශයේ හා ඒ යටතේ පාලනය වන දෙපාර්තමේන්තු සහ ආයතනවල කල් ඉකුත්වී ඇති ගෙවීම් පිළිබඳව පරීක්ෂා කර බලා එම ගෙවීම් නිරවුල් කිරීම තුළින් රජයේ බාහිර බැඳීම් අඩු කිරීම.
- මු.රෙ. 835 විධිවිධාන අනුව මෙම අමාත්‍යාංශයට හා ඊට අදාළ දෙපාර්තමේන්තු හා ආයතන වලට අවශ්‍ය ගෙවල් කුලී පදනම මත ලබා ගැනීමට අදාළ කටයුතු කිරීම හා කුලී ගෙවීම සඳහා අනුමැතිය ලබා දීම.
- මුරෙ. 855 යටතේ මෙම අමාත්‍යාංශයේ හා ඒ යටතේ පාලනය වන දෙපාර්තමේන්තු හා ආයතන වල අවශ්‍යතාවයන් හඳුනාගෙන ඊට ගැලපෙන ආකාරයට පුවත්පත් මිලදී ගැනීමට අවශ්‍ය අනුමැතිය ලබා දීම.
- 2016 වර්ෂය වෙනුවෙන් සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමෙන් රුපියල් මිලියන 35 කපමණ ආදායමක් උපයාගෙන රජයේ අරමුදලට බැර කිරීම.
- රුපියල් ලක්ෂ දෙකකට වඩා වැඩි ඇස්තමේන්තුගත වාහන හා යන්ත්‍රසූත්‍ර අළුත්වැඩියා සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 9.3.1 (ආ) යටතේ අනුමැතිය ලබාදීම.
- ආරක්ෂක අමාත්‍යංශයේ හා ඒ යටතේ පාලනය වන ආයතනවලට තම කාර්යභාර්ය ඉටුකර ගැනීම උදෙසා අවශ්‍ය භාණ්ඩ හා සේවා නිසි ප්‍රමිතියට අනුකූලව අවම පිරිවැය දරමින්, ප්‍රසම්පාදන සැලැස්මට අනුව විනිවිද භාවයකින් යුතුව ලබාදීම.
- වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ කටයුතු හා අපහරණ කටයුතු නිසි පරිදි ඉටුකිරීම තුළින් නාස්තිය, දූෂණය හා අක්‍රමිකතා අවම කරගනිමින් රජයේ දේපල ආරක්ෂා කර ගැනීම.
- මු.රෙ. 115 යටතේ අමාත්‍යංශයේ හා ඊට අයත් දෙපාර්තමේන්තුවල පසුගිය වර්ෂ වලට අයත් හිඟ ගෙවීම් වලට අනුමැතිය ලබාදීම.

## 7.3 අනාගත අපේක්ෂා

- නිලධාරීන්ගේ වැටුප් , අතිකාල දීමනා, ගමන් වියදම් දීමනා නියමිත දිනට සකස් කිරීම හා ලබා දීම.
- බාහිර ආයතනවලට චෙක්පත් යැවීමේ දී විද්‍යුත් ක්‍රමවේදය අනුගමනය කරමින් වඩා කාර්යක්ෂම හා ඵලදායී ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීම.
- පරිපාලන අංශය මඟින් දියත් කරනු ලබන ඵලදායීකා වැඩසටහන් මඟින් කාර්යමණ්ඩලය සඳහා ඵලදායී සේවාවක් ලබා දීම.

| අනු අංකය | ඉටුකිරීමට අපේක්ෂිත කාර්යයන් | අරමුණ | අපේක්ෂිත ඉලක්කය |
|---|---|---|---|
| 01 | සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම හා අසාධු ලේඛණගත කිරීම. | ආරක්ෂක අමාත්‍යාංශය යටතේ ඇති සියලුම ආයතනවල ප්‍රසම්පාදන කටයුතු වලට අවශ්‍ය පසුබිම සැකසීම. | රුපියල් මිලියන කට වැඩි 40 .ආදායමක් අපේක්ෂා කරයි |
| 02 | ප්‍රසම්පාදන කටයුතු. | කාර්යාල පරිශ්‍රය තුල හා ඉන් පිටත ආයතනයන්හි රාජකාරි කටයුතු නොපිරිහෙලා ඉටු කිරීමට අවශ්‍ය යටිතල පහසුකම් සැලසීම. | කාර්යක්ෂම ප්‍රසම්පාදනයක් ලබා දීම. |
| 03 | භාණ්ඩ සැපයීමගබඩා කිරීම සහ , .බෙදා හැරීම | කාර්යක්ෂම හා ඵලදායී අයුරින් භාණ්ඩ මිලදී ගැනීම හා බෙදා දීම ගබඩා කිරීම. | නාස්තිය හා දූෂණය අවම කර ගැනීම හා නිසි පරිදි වාර්තාකරණය. |
| 04 | භාණ්ඩ සමීක්ෂණය , කිරීමඅයෝග්‍ය , ,හා වෙන්දේසි කිරීම තක්සේරු කිරීම ග්ධන භාණ්ඩ පිළිබඳව අවශ්‍යප්‍රා දත්ත මහා භාණ්ඩාගාරය වෙත ලබා .දීම | රජයට අයත් භෞතික භාණ්ඩ ආරක්ෂා කිරීම පාවිච්චියෙන් ඉවත් කරන භාණ්ඩ අවශ්‍ය ආයතනවලට ලබා දීම හෝ වෙන්දේසි කිරීම , .පාවිච්චියට ගත නොහැකි භාණ්ඩ විනාශ කිරීම | රාජ්‍ය දේපල ආරක්ෂා කිරීම , ,අයථා භාවිතය වැලැක්වීම ලේඛණගත ,හඳුනා ගැනීම කිරීම හා රජයට ආදායමක් ලබා .දීම |
| 05 | නැතිවීම හා අලාභහානි සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි අනුව කටයුතු කිරීම. | රජයේ දේපලවලට සිදුවන අලාභහානිය සම්බන්ධව වගකිව යුතු පාර්ශවයන් සොයා බලා ඒ අනුව අලාභයන් අයකර ගැනීම හා එසේ නොවන අවස්ථාවල මූකාරව ප්‍ර .රෙ. . පියවර ගැනීමඅවශ්‍ය | රජයේ දේපලවලට සිදුවන අලාභහානි අවම කිරීම. |
| 06 | ස්ථාවර වත්කම් කළමණාකරණ පද්ධතිය ක්‍රියාත්මක කිරීම තුලින් ජංගම නොවන වත්කම් කළමනාකරණය කිරීම. | අමාත්‍යාංශය විසින් ලබාගන්නා ලද ජංගම නොවන වත්කම් අවශ්‍ය අවස්ථාවන්හි අවශ්‍ය ස්ථානවලට ලබාදීමඒවායේ චලනයන් . නිවරැදිව හඳුනා ගැනීම හා නිසි භාරකත්වය .තහවුරු කර ගැනීම | රජයේ දේපල සුරක්ෂිතව පරිහරණය කිරීමට පසුබිම සැකසීම. |
| 07 | පුවත්පත් මිලදී ගැනීම මු 855 .රෙ. යටතේ | නිලධාරීන්ට අවශ්‍ය තොරතුරු හා පුවත් දැන ගැනීමට සැලසීම. | නිසි කළමණාකාරිත්වයෙන් යුතුව පුවත්පත් ලබාගෙන බෙදාහැරීම. |
| 08 | රුපියල් ලක්ෂ දෙකකට වඩා වැඩි ඇස්තමේන්තුගත වාහන හා යන්ත්‍ර සූත්‍ර අළුත්වැඩියාව සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 9.3.1 .යටතේ අනුමැතිය ලබාදීම | වාහන යන්ත්‍ර සූත්‍ර උපකරණ වල නියම අලුත්වැඩියා කටයුතු ප්‍රමිතියෙන් යුතුව කර ගැනීමට ඉඩ සැලසීම. | අවම පිරිවැයකින් අදාළ කටයුතු සිදු කිරීම හා නාස්තිය අවම කිරීම. |

7.10 වගුව : 2017 වර්ෂයේ අපේක්ෂිත ඉලක්ක

# 8. අභ්‍යන්තර විගණන අංශය

## 8.1 සමාලෝචනය

2016 වර්ෂයේ පහත දැක්වෙන අභ්‍යන්තර විගණන පරීක්ෂණ සිදු කර ඇත.

| ආයතනය | විගණන විෂය පථය |
|---|---|
| ආරක්ෂක අමාත්‍යාංශය | මුදල් අංශය<br>ගබඩාව<br>ගෙවීම් අංශය<br>පාලන අංශය (නිවාඩු පරීක්ෂාව)<br>සේවා වනිතා ඒකකය (අරමුදල් පරීක්ෂාව)<br>පාලන අංශය (ජලබිල්පත්,විදුලිය බිල්පත් හා දුරකථන බිල්පත් ගෙවීම් පරීක්ෂාව)<br>ප්‍රවාහන අංශය<br>පාලන අංශය (නිවාඩු පරීක්ෂාව)<br>විශේෂ විගණන පරීක්ෂණ<br>රජයේ පුපුරණ ද්‍රව්‍ය ගබඩාව(වැලිසර)<br>සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව අම්පාර බලකා කාර්යාලය<br>සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව උහන බලකා කාර්යාලය |
| ජාතික ශිෂ්‍යභට බලකාය | ප්‍රධාන කාර්යාලය (ප්‍රසම්පාදන අංශය,ගබඩාව, ප්‍රවාහන අංශය) |
| ආරක්ෂක අමාත්‍යාංශය හා ත්‍රිවිධ හමුදා මූලස්ථාන ඉදි කිරීමේ ව්‍යාපෘතිය(අකුරේගොඩ) | ප්‍රසම්පාදන අංශය |
| රක්නා ආරක්ෂක ලංකා (පුද්) සමාගම | රක්නා ලංකා කේටරින් සර්විසස් |
| ශ්‍රී ලංකා නාවික හමුදාව | ආහාර ප්‍රසම්පාදන අංශය හා ආහාර ද්‍රව්‍ය ගබඩාව |
| සඳහිරුසෑය ඉදිකිරීමේ ව්‍යාපෘතිය | වාර්ෂික ගිණුම් |
| ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය | වාර්ෂික මූල්‍ය ප්‍රකාශන |
| ශ්‍රී ලංකා ගුවන් හමුදාව | සැපයුම් හා ප්‍රවාහන අංශය |
| ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලය | ප්‍රසම්පාදන අංශය |
| වෙරළාරක්ෂක දෙපාර්තමේන්තුව | ගෙවීම් වවුචර් පරීක්ෂාව |
| මිහිඳු සෙත් මැදුර | ගෙවීම් අංශය |
| රණවිරු සේවා අධිකාරිය | ප්‍රසම්පාදන අංශය |
| ආරක්ෂක සේවා විද්‍යාලය | ගිණුම් අංශය හා පාලන අංශය |

8.1 වගුව : අභ්‍යන්තර විගණන පරීක්ෂණ සිදුකිරීම්

## 8.2 .ගැටළු සහ අභියෝග

- අදාල ආයතනවලින් නියමිත වේලාවට තොරතුරු ලබා ගැනීමේ අපහසුතා
- අභ්‍යන්තර විගණන ක්‍රියාවලියේ ප්‍රමාණවත් පුහුණු අවස්ථා නොමැතිවීම
- අදාල අංශ සමග සම්බන්ධීකරණ හා සන්නිවේදන අපහසුතා
- පවතින නීති හා රෙගුලාසි යාවත්කාලීන නොවීම

## 8.3 අනාගත අපේක්ෂා

- 2016 වර්ෂයේ අවසාන කාර්තුවේ විගණන හා කළමණාකරණ කමිටු රැස්වීම 2017 ජනවාර් 24 දින පැවැත්වීමට සැලසුම් කර ඇත.

# 9. ජාත්‍යන්තර සබඳතා අංශය

## 9.1 සමාලෝචනය

ආරක්ෂක අමාත්‍යාංශයේ ජාත්‍යන්තර සබඳතා අංශය ආරක්ෂක අමාත්‍යාංශ ලේකම්තුමාගේ ඍජු අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වන අතර, ආරක්ෂක ලේකම්තුමාගේ විදේශ සබඳතාවලට සම්බන්ධ සියලු පැතිකඩයන් පිළිබඳව කටයුතු කරයි. රාජ්‍ය ආරක්ෂක අමාත්‍යංශයේ විදේශ සබඳතා කටයුතු සඳහා ද සහයෝගය ලබා දෙයි. මෙම අංශය ශ්‍රී ලංකා විදේශ සේවයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්වරයෙකුගේ යටතේ ක්‍රියාත්මක වේ.

ජාත්‍යන්තර සබඳතා අංශය , අන්තර්ජාතික පැතිකඩක් සහිත ජාතික ආරක්ෂාව සම්බන්ධ ගැටලු සඳහා ආරක්ෂක අමාත්‍යාංශයේ උපදෙස් වලට අනුකූලව ආරක්ෂක ප්‍රතිපත්ති ඉදිරිපත් කරයි.

ජාත්‍යන්තර සබඳතා අංශය ක්‍රමානුකූලව පහත සඳහන් කරුණු සම්බන්ධව කටයුතු කරයි.

ආරක්ෂාව සම්බන්ධ විදේශ රටවල් සහභාගී වන අභ්‍යන්තර හා බාහිර සංචාරයන් සම්බන්ධ ස්වාධීන අංශයන් සම්බන්ධීකරණය කිරීම; විදේශ නිලධාරීන් සමඟ ආරක්ෂක ලේකම්තුමාගේ සියලු පණිවිඩ හුවමාරු කිරීම් පාලනය කිරීම; විදේශ කටයුතු අමාත්‍යාංශය සමඟ එක්ව අවශ්‍ය ආරක්ෂක යෙදවුම් ලබා දීම; ආරක්ෂක ලේකම්තුමා සහභාගී වන විදේශ සංචාරයන් සඳහා අදාළ වන සංක්ෂිප්ත කරුණු, සාකච්ඡාවට බඳුන්වන කරුණු,දේශනයන්, වැඩසටහන් සකස් කිරීම සහ එම සංචාර වලින් අනතුරුව ලද තීරණ පිළිබඳව ඉදිරි කටයුතු සිදු කිරීම; ජනාධිපතිතුමා, විදේශ කටයුතු අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක අමාත්‍යතුමා සහභාගී වන සංචාර සඳහා ආරක්ෂක යෙදවුම් සකස් කිරීම; විදේශ රටවල් සමඟ අදාළ ගිවිසුම් හා අවබෝධතා ගිවිසුම් සම්බන්ධ කටයුතු සම්බන්ධීකරණය කිරීම; එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩල(UNGA) සැසිවාර සඳහා ආරක්ෂක යෙදවුම් ලබා දීම; එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලය මඟින් මතු කරන ආරක්ෂාව සම්බන්ධ ගැටලු සඳහා පිළිතුරු සම්බන්ධීකරණය කිරීම; මත්ද්‍රව්‍ය හා අපරාධ සම්බන්ධ එක්සත් ජාතීන්ගේ කාර්යාලය (UNODC) සරණාගතයන් සඳහා එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස් (UNHCR) සමඟ ආරක්ෂක අමාත්‍යාංශයේ අන්තර් ක්‍රියාකාරීත්වය සම්බන්ධීකරණය කිරීම; ත්‍රස්තවාදී මර්දන කටයුතු සඳහා ජාතික බුද්ධි ප්‍රධානී වෙත සහයෝගය ලබාදීම(1267, 1373, 1540 යන එක්සත් ජාතීන්ගේ ආරක්ෂක කවුන්සිල රෙගුලාසි) සහ එක්සත් ජාතීන්ගේ ත්‍රස්තවාදී මර්දන විධායක අධ්‍යක්ෂ මණ්ඩලය සමඟ එක්ව කටයුතු කිරීම; ආරක්ෂක අමාත්‍යාංශයේ ද්වි පාර්ශවික ආරක්ෂක සහයෝගීතාව ක්‍රමවත් කිරීම, සාර්ක්(SAARC), බිම්ස්ටෙක්(BIMSTEC),ෂැංග්‍රිලා සංවාදය(ASEAN) ප්‍රාන්තීය සමුළුව[ARF] බාලි ක්‍රියාදාමය යනාදී ප්‍රාන්තීය සංවිධාන සමඟ එක්ව ආරක්ෂක කටයුතු සම්බන්ධීකරණය කිරීම, චීනය හා ඉන්දියාව සමඟ වාර්ෂික ආරක්ෂක සමුළු සමායෝජනය කිරීම; ශ්‍රී ලංකාව ඉන්දියාව සහ මාලදිවයින අතර පවතින ත්‍රයි පාර්ශවික සමුද්‍රීය ආරක්ෂක සහයෝගීතාව සම්බන්ධීකරණය කිරීම; මිනිස් ජාවාරම් සහ අනෙකුත් අන්තර්ජාතික අපරාධයන් පිළිබඳ ශ්‍රී ලංකාව හා ඕස්ට්‍රේලියාව අතර පවතින පුළුල් සබඳතාව පිළිබඳ කටයුතු සමායෝජනය; ජාත්‍යන්තර ගිවිසුම් හා සම්මුතීන් සම්බන්ධ ආරක්ෂක යෙදවුම් සකස් කිරීම(උදා -: සිවිල් හා දේශපාලනික අයිතීන් සඳහා වන ජාත්‍යන්තර සම්මුතිය(ICCPR)) ; ආරක්ෂක ස්ථාපිතයන් තුළින් එක්සත් ජාතීන්ගේ විශේෂ නියෝග දරන්නන් මතුකරන කරුණු වෙත පිළිතුරු සම්බන්ධීකරණය කිරීම; ආරක්ෂක කටයුතු සම්බන්ධව විදේශ ප්‍රතිපත්ති සඳහා අමාත්‍ය මණ්ඩල නිරීක්ෂණයන් පිළියෙල කිරීම; ජාත්‍යන්තර පැතිකඩයන් සහිත ආරක්ෂාව සම්බන්ධ කටයුතු සඳහා අමාත්‍ය මණ්ඩල පත්‍රිකා හා සටහන් අමාත්‍ය මණ්ඩලය වෙත සකස් කිරීම; බලහත්කාරීව හා අකමැත්තෙන් අතුරුදන් කිරීම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ ක්‍රියාකාරී මණ්ඩලය (UNWGEID) සහ අත්තනෝමතික ලෙස රඳවාගැනීම් සම්බන්ධ එක්සත් ජාතීන්ගේ ක්‍රියාකාරී මණ්ඩලය වෙත පිළිතුරු සම්පාදනය කිරීම සඳහා ජාතික බුද්ධි ප්‍රධානී කාර්යාලය හට සහයෝගය ලබා දීම(UNWGEID); විදේශ රාජ්‍යයන් සමඟ ලංකා ලොජිස්ටික්ස් සහ ටෙක්නොලොජිස් සමාගම (LLTL) සිදුකරන කටයුතු පිළිබඳ ඉල්ලීම් සඳහා සහයෝගය ලබා දීම සහ බාහිර ආරක්ෂක පරිසරයන්, ද්වි පාර්ශවික ප්‍රාන්තීය සහ ගෝලීය උපායමාර්ගික සංවර්ධනයන් සම්බන්ධව කටයුතු කරන ආරක්ෂක අමාත්‍යාංශයේ ප්‍රතිපත්ති සැලසුම් අංශය වෙත ප්‍රතිපත්තිමය යෙදවුම් සැපයීම.

## 9.2 2016 වර්ෂයේ කාර්යසාධනය

### ඇමරිකාව - ශ්‍රී ලංකාව අතර හවුල් සබඳතා සංවාදය(PD) – 2016 පෙබරවාරි මස 26 වන දින, ඇමරිකා එක්සත් ජනපදයෙහි වොෂින්ටන් ඩී.සී.

ඇමරිකා එක්සත් ජනපදයේ වොෂින්ටන් ඩී.සී හි 2016 පෙබරවාරි මස 26 දින පැවැත් වූ ඇමරිකා - ශ්‍රී ලංකා අතර හවුල් සබඳතා සංවාදයේ සමාරම්භක උත්සවය සඳහා ඉංජි.කරුණාසේන හෙට්ටිආරච්චි මැතිතුමාගේ සහභාගීවීම අමාත්‍යාංශයේ ජාත්‍යන්තර සබඳතා අංශය විසින් සංවිධානය කරන ලදී.මෙම හවුල් සංවාදය තුළින් ඇමරිකා - ශ්‍රී ලංකා ද්වි රාජ්‍යයන් අතර පවතින සහයෝගීතාවයේ ශක්තිමත් බව පිළිබිඹු වූ අතර තවදුරටත් රාජ්‍යන් දෙක අතර ද්විපාර්ශවික සබඳතා ක්‍රමානුකූල ලෙස වර්ධනය කර ගැනීමට පිටුවහලක් විය.

ඉන්දියානු සාගර ප්‍රාන්තයේ පවතින සමුද්‍රීය ආරක්ෂක සහයෝගීතාව වැඩිදියුණු කිරීමට රටවල් ද්විත්වයම එකඟ විය. ආරක්ෂක ලේකම්වරයා විසින් මේ සම්බන්ධව ගුවන් හමුදා, නාවික හමුදා සහ වෙරළාරක්ෂක යන අංශයන් වෙත මේ සම්බන්ධව වැඩිදියුණු කරගත යුතු ශක්‍යතාවයන් පිළිබඳව අවධාරණය කරන ලදී. සමුළුව

අතරවාරයේ දී , එක්සත් ජාතීන්ගේ සාමසාධක මෙහෙයුම් සඳහා සහයෝගය ලබා දෙමින් ශ්‍රී ලංකාව සිදු කර ඇති විශේෂ කැපවීම ඇමරිකාව අගය කරන ලදී. ඇමරිකාව තවදුරටත් ශ්‍රී ලංකාවේ බිම්බෝම්බ නිශ්ක්‍රීය කිරීමේ කටයුතු සඳහා තම සහයෝගය නොකඩවා ලබා දෙන බවට ප්‍රතිඥා ලබාදුනි.

න්‍යෂ්ටික අවි ආයුධ ප්‍රවර්ධන වැළැක්වීමේ අරමුණ වෙත ලබා දෙන සහයෝගයක් ලෙස, අපනයන පාලන හා සම්බන්ධ දේශසීමා ආරක්ෂක වැඩසටහන් හරහා අපනයන පාලන සහයෝගීතාව පුළුල් කිරීමට මෙම නියෝජිත පිරිස අරමුණු කර ඇත. අන්තර්ජාතික තර්ජනයන් වර්ධනය වීම හේතුකරගෙන, රාජ්‍යයන් දෙකම සමුළුවේදී දැඩි ත්‍රස්තමර්දන , බුද්ධිමය සහයෝගය, තොරතුරු හුවමාරුව එමෙන්ම ශක්‍යතා ගොඩනැගීම යන අංශයන්හි අවශ්‍යතාවය හඳුනා ගත්තෝය. මුදල් විශුද්ධිකරණය, මූල්‍ය ත්‍රස්තවාදය හා ප්‍රචණ්ඩ ත්‍රස්තවාදය යන්නට විරුද්ධව ක්‍රියාත්මක වීමේ සහයෝගය අඛණ්ඩ පවත්වාගෙන යාම සඳහා වන කැපවීම රාජ්‍යයන් ද්විත්වයෙන් පිළිබිඹු විය. සයිබර් ආරක්ෂණය සහ සයිබර් අපරාධ මැඩලීම වෙනුවෙන් එක්ව සටන් කිරීම සඳහා එක්ව කිරීමට දෙපාර්ශවය එකඟ වූයේ, විවෘත හා ආරක්ෂක සයිබර් අවකාශය වර්ධනය කිරීමට ජාත්‍යන්තර සහයෝගීතාවයේ වැදගත්කම හා බුඩාපෙස්ට්(Budapest) ගිවිසුමෙහි ඇතුළත් එකම දකුණු ආසියානු රාජ්‍යය ලෙස ශ්‍රී ලංකාව නැඟී සිටීමේ වැදගත්කම හඳුනා ගනිමිනි.









### ඉන්දියාවේ ගෝවා නගරයේ දී 2016 මාර්තු මස 28 – 31 දිනයන්හි පැවැත්වූ DEFEXPO

2016 වර්ෂයේ මාර්තු 28-31 ඉන්දියාවේ පවත්වන ලද DEFEXPO සඳහා ගරු රාජ්‍ය අමාත්‍ය රුවන් විජේවර්ධන මැතිතුමා හා නියෝජිත පිරිස සහභාගී වූ සංචාරය සම්බන්ධීකරණය කරන ලද්දේ අමාත්‍යාංශයේ ජාත්‍යන්තර සබඳතා අංශයයි. රාජ්‍ය අමාත්‍යවරයා සමඟ මෙම සංචාරය සඳහා ආරක්ෂක ලේකම්, ඉංජි.කරුණාසේන හෙට්ටිආරච්චි මහතා ද සහභාගී විය. DEFEXPO ඉන්දියා ප්‍රදර්ශන මාලාවේ නව වැනි ද්විපාර්ශවික ගොඩබිම්, සමුද්‍රීය සහ මව්බිමෙහි අභ්‍යන්තර ආරක්ෂක පද්ධති ප්‍රදර්ශනයයි. රාජ්‍ය 32කින් 200කට අධික විදේශ සමාගම් රාජ්‍ය මණ්ඩප 15ක් සමඟ මෙම ප්‍රදර්ශනයට සහභාගී විය. මෙම අවස්ථාව ප්‍රදර්ශනකරුවන් හට තම නවතම තාක්ෂණයන් හා නිෂ්පාදනයන් ඉදිරිපත් කිරීමට, වෙළඳපොල තත්ත්වය හඳුනාගෙන අන්‍යෝන්‍ය වාසිදායක ව්‍යාපාරික ශක්‍යතාවක් විමසීමට මනා තෝතැන්නක් වේ. මෙම ප්‍රදර්ශනයේ තවත් සෙසු අංගයක් ලෙස රාජ්‍ය ආරක්ෂක අමාත්‍යතුමා, ආරක්ෂක ලේකම් ඇතුළු නියෝජිත පිරිස වෙනම අවස්ථාවන් දෙකකදී ඉන්දියානු ආරක්ෂක අමාත්‍ය, ගරු මනෝහර් පරික්කාර් සහ ඉන්දියානු රාජ්‍ය ආරක්ෂක අමාත්‍ය, ගරු රාඕ ඉන්ද්‍රජිත් සිං යන මහත්වරුන් හමුවිය. හමුව අතරවාරයේ ද්විපාර්ශවිකව වැදගත්වන අන්‍යෝන්‍ය අදාල කරුණු පිළිබඳ සාකච්ඡා කරන ලදී. එමෙන්ම, 2016 DEFEXPO ප්‍රදර්ශනයේ සෙසු අංගයක් ලෙස, රාජ්‍ය ආරක්ෂක අමාත්‍යතුමා, ආරක්ෂක ලේකම්තුමා කොරියානු ආරක්ෂක අමාත්‍ය චංග් මියොග් - ජික් මහතා හමුවිය. මෙම සංචාරය අතරතුර, ශ්‍රී ලංකා නාවික හමුදාව වෙත ලබා දීමට නිමැවෙමින් පවතින අධිබලැති ගැඹුරු මුහුදු මුරසංචාරක යාත්‍රා (AOPV) ප්‍රගතිය තහවුරු කර ගැනීමට රාජ්‍ය අමාත්‍යතුමා හා ආරක්ෂක ලේකම්තුමා ගෝවා නැව් තටාංගනය වෙත ද ගියෝය.

### 2016 අප්‍රේල් 18-21 මැලේසියාවේ දී පවත්වන ලද 15 වන ආරක්ෂක සේවා ආසියා ප්‍රදර්ශනය හා සමුළුව

2016 අප්‍රේල් 18-21 මැලේසියාවේ ක්වාලාලාම්පූර්හිදී පවත්වන ලද 15 වන ආරක්ෂක සේවා ආසියා(DSA) ප්‍රදර්ශනය හා සමුළුව වෙත රාජ්‍ය ආරක්ෂක අමාත්‍ය , ගරු රුවන් විජේවර්ධන මැතිතුමා ප්‍රධාන නියෝජිත කණ්ඩායමේ සහභාගී වීම ආරක්ෂක අමාත්‍යාංශ ජාත්‍යන්තර සබඳතා අංශය මඟින් සම්බන්ධීකරණය කරන ලදී.උත්සවය අතරතුර රාජ්‍ය අමාත්‍යතුමා මැලේසියානු ආරක්ෂක අමාත්‍ය ගරු දාටෝ සේරි හිෂම්මුදින් තුන් හුසේන් මහතා සමඟ සාකච්ඡා පැවැත්වීය.සාකච්ඡාවන් සිදු කරන ලද්දේ ද්වි රාජ්‍යයන්හි ආරක්ෂාව සම්බන්ධ කටයුතු පිළිබඳවය.මෙම සංචාරය සඳහා රාජ්‍ය අමාත්‍යතුමා සමඟ ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී එයාර් චීෆ් මාර්ෂල් කෝලිත ගුණතිලක මහතා සහභාගී විය.1988 ආරම්භ වූ DSA සමුළුව ලෝකයේ හොඳම ආරක්ෂක සමුව 05 අතරින් එකක් බවට ද ආසියාවේ විශාලම සමුළුව බවටද පත් වී ඇත.මෙම වසරේ දින 04කින් යුත් උත්සවය සඳහා ලෝකයේ රටවල් 30ක ඉහළ ගණයේ ක්ෂේත්‍රයන්ට අදාළ ක්‍රියාකරුවන් 60කට ආසන්න ප්‍රමාණයක් සහභාගී විය.

2016 DSA සමුළුවට සමගාමීව ප්‍රධාන යුද හමුදා සාකච්ඡා (CHART), පුත්‍රජය සමුළුව, සයිබර් ආරක්ෂක සමුළුව, මානුෂීය සහයෝගීතාව හා ආපදා සහන සමුළුව( HADR) සහ රසායනික ජීව විද්‍යාත්මක විකිරණශීලී න්‍යෂ්ටික පුපුරණසුළු ද්‍රව්‍ය පිළිබඳ සමුළුව CBRNE වැනි සමුළු හා සම්මන්ත්‍රණ ද පැවැත්වීය.

**15 වන IISS ෂැංග්‍රිලා සංවාදය -: සිංගප්පූරුවේදී 2016 ජූනි 03-05 දිනවල පවත්වන ලද ආසියානු ආරක්ෂක සමුළුව.**

15 වන IISS ෂැංග්‍රිලා සංවාදය -: 2016 වර්ෂයේ ජූනි මස 03-05 දිනවල සිංගප්පූරුවේදී ආසියා පැසිෆික් ප්‍රාන්තයන්හි ප්‍රමුඛ ආරක්ෂණ අන්තර් ක්‍රියාකාරී ආසියානු ආරක්ෂක සමුළුව පවත්වන ලදී.මෙම සංවාදය ප්‍රාන්ත ආරක්ෂක නිර්මාණකරණයෙහි ප්‍රධාන අංගයක් ලෙස පිහිටුවා ඇති අතර එමඟින් ආරක්ෂක අමාත්‍යවරුන්, ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානීන් ආරක්ෂක අමාත්‍යවරුන්ගේ නිල ප්‍රධානීන්, බුද්ධි ප්‍රධානීන්, ප්‍රතිපත්ති නිමැවුම්කරුවන්,ශාස්ත්‍රඥයින්, ප්‍රාන්ත හා ලොව පුරා බුද්ධි මණ්ඩලයේ නියෝජිතවරුන් එක් තැනකට එක් රැස් කරයි.තායිලන්ත අගමැති, ජෙනරාල්(විශ්‍රාමික) ප්‍රයුට්-චන්ග්-ඕ - චා විසින් මෙහි සමාරම්භක දේශනය පවත්වමින් ප්‍රාන්තීය සහයෝගීතාව හා සැමට එක්ව කටයුතු කළ හැකි නව සමතුලිත සංකල්පයක අවශ්‍යතාව සඳහාවන මාර්ගෝපදේශනයන් පිළිබඳව කරුණු ඉදිරිපත් කළේය.ඇමරිකානු රාජ්‍ය ආරක්ෂක ලේකම්, ආචාර්ය ඈෂ්ටන් කාටර් " ආසියාවේ සංකීර්ණ ආරක්ෂක අභියෝගයන් පිළිබඳ හමුව " වන සමාරම්භක හමුව අමතමින් පවසන ලද්දේ ඇමරිකාව විශ්වාස කරන අයුරින් ආසියා පැසිෆික් ප්‍රාන්තය " ප්‍රතිපත්තිමය ආරක්ෂක ජාලයක් " පිහිටුවීම තුළින් " නැඟුම, දියුණුව, දිනුම " කරා ළංවන බවයි.මෙම සංවාදයේදී ප්‍රධාන වශයෙන් සාකච්ඡාවට බඳුන් වූයේ දකුණු චීන මුහුද සම්බන්ධ ගැටලු පිළිබඳවන අතර බොහෝ නියෝජිතයන් සමඟ සාකච්ඡා කරන ලද්දේ මෙම ගැටලුවලට ලබා ගත හැකි අන්‍යෝන්‍ය විසඳුම් පිළිබඳවයි.

ආරක්ෂක ලේකම් ඉංජී.කරුණාසේන හෙට්ටිආරච්චි මැතිතුමා ශ්‍රී ලංකා දූත පිරිසෙහි මූලිකත්වය දරමින් සංවාදයට සහභාගී විය.සංවාදය අතරතුරදී ආරක්ෂක ලේකම්තුමා කැනේඩියානු ජාතික ආරක්ෂක අමාත්‍ය , ගරු හර්ජිත් සිංග් සජාන් බ්‍රිතාන්‍ය රාජ්‍ය ආරක්ෂක ලේකම්, ගරු මයිකල් ෆැල්ක් , රුසියානු නියෝජ්‍ය ආරක්ෂක අමාත්‍ය අතිගරු ඇනටොලි ඇන්ටනොව්, සිංගප්පූරු නිල ආරක්ෂක ලේකම් චන් යෙන් කිට් මහතා සහ ඇමරිකානු නාවික මෙහෙයුම් ප්‍රධානී අද්මිරාල් ජෝන් එම් රිචඩ්සන් යන මහත්වරුන් මුණගැසීය.සමුද්‍රීය ආරක්ෂණය , ආරක්ෂක හා බුද්ධිමය භූවමාරු, ආරක්ෂක සම්පාදනය, පුහුණු සහ ශක්‍යතා ගොඩනැගීම සඳහාවන සහයෝගය සහ ආරක්ෂක සමුළු සඳහා සහභාගීත්වය යන කරුණු අවධාරණය කරමින් ආරක්ෂණ සහයෝගීතාව වැඩිදියුණු කරවන ද්වි පාර්ශවික සාකච්ඡා සිදු කරන ලදී. 2015 ජනවාරි මස සිට උතුරු නැගෙනහිර ඉඩම් නිදහස් කිරීම සහ ආරක්ෂණ සීමාවන් ලිහිල් කිරීම සඳහා ගන්නා ලද පියවරයන් පිළිබඳව එහිදී කරුණු ඉදිරිපත් කළේය.

ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී එයාර් චීෆ් මාර්ෂල් කෝලිත ගුණතිලක මහතා තම මිත්‍ර සමකාලීන් වූ ඕස්ට්‍රේලියානු ආරක්ෂක හමුදා ප්‍රධානී එයාර් වයිස් මාර්ෂල් මාක් බින්ස්කින් සහ සිංගප්පූරු ආරක්ෂක හමුදා ප්‍රධානී මේජර් ජෙනරාල් පෙරී ලිම් චෙන්ග් යෙව් යන අය සංවාදය අතරතුර හමුවී අන්‍යෝන්‍ය අභිලාශයන් හා ගැටලු සම්බන්ධව සාකච්ඡා කරන ලද්දේය.

සිංගප්පූරුවේ ශ්‍රී ලංකා මහකොමසාරිස් එච්.ඊ. නිමල් වීරරත්න , ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී, එයාර් චීෆ් මාර්ෂල් කේ ඒ ගුණතිලක, මාණ්ඩලික ආරක්ෂක ප්‍රධානී රියර් අද්මිරාල් එස්.එස්.රණසිංහ, මාණ්ඩලික නාවික ප්‍රධානී මේජර් ජෙනරාල් බී.ඒ. පෙරේරා, මාණ්ඩලික හමුදා අධ්‍යක්ෂ ජෙනරාල් එයාර් වයිස් මාර්ෂල් ඩී.එල්.එස්.ඩයස්, ගුවන් හමුදා සැපයුම් අධ්‍යක්ෂ සහ ආරක්ෂක අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්(විදේශ කටයුතු) ශශිකලා ප්‍රේමවර්ධන මිය යන අයවළුන් ලේකම්තුමා සමඟ ශ්‍රී ලංකා නියෝජිත පිරිස වශයෙන් සහභාගී විය.

**2016 ජූනි 10 වන දින ඉන්දියාවේ ගෝවාහිදී, ශ්‍රී ලංකා නාවික යාත්‍රාව, 'සයුරළ' දියත් කිරීම.**

2016 ජූනි 10 වන දින ඉන්දියාවේ ගෝවා නැව් තටාංගණයේහිදී ශ්‍රී ලංකා නාවික යාත්‍රාව, 'සයුරළ' දියත් කිරීමේ උත්සවය සඳහා ආරක්ෂක ලේකම්, ඉංජී.කරුණාසේන හෙට්ටිආරච්චි මහතා සහභාගී විය.නාවික සම්ප්‍රදායට අනුකූලව , ආරක්ෂක අමාත්‍යාංශයේ සේවා වනිතා ඒකකයේ සභාපතිනි, වසන්තා ගුණවර්ධන මහත්මිය ශ්‍රී ලංකා නාවික හමුදා යාත්‍රා 'සයුරළ' දියත් කළාය. මෙම අවස්ථාව සඳහා නාවික හමුදාධිපති වයිස් අද්මිරාල් රවින්ද්‍ර විජේගුණරත්න මහතා ද සහභාගී විය. ඉහළ සනයේ ගැඹුරු මුහුදු මුර සංචාර යාත්‍රාව වන 'සයුරළ' හි පිළිසකර කිරීම් අවසන් වූ පසු මුළු වටිනාකම ඩොලර් මිලියන 74 ක් වෙයි. ඉහළ සනයේ ගැඹුරු මුහුදු මුර සංචාර යාත්‍රාව සතුව හෙලිකොප්ටර් තොටුපලක් සහ ටොන් 2350 ක විස්ථාපන ශක්‍යතාවක් පවතියි. නාවික සැතපුම් 4500ක ශක්‍යතාවක් සහිත මෙම යාත්‍රාව පරීක්ෂණ මෙහෙයුම් සඳහා යොදා ගන්නා අතර නාවිකයින් 100 ක් සහ නිලධාරින් 18 දෙනෙකු හට පහසුකම් ලබාදිය හැකි යාත්‍රාවකි.මෙහි දිග මීටර් 105 ක් වන අතර පලළ මීටර් 13.6 කි.

ඉන්දියානු ආරක්ෂක අමාත්‍යාංශ ගගනගාමී හා ආරක්ෂක නිෂ්පාදන පිළිබඳ සම ලේකම් ශ්‍රී සංජේ ප්‍රසාද් , ඉන්දියාවේ ශ්‍රී ලංකාවේ මහ කොමසාරිස් අතිගරු ඇසළ වීරකෝන් සහ එම මැතිණිය , ගුවන් තරණ ජ්‍යෙෂ්ඨ නිලධාරි හා ගෝවා හි අණ දෙන ජ්‍යෙෂ්ඨ නිලධාරි රියර් අද්මිරාල් ප්‍රනීත් කුමාර් බාල් මහත්මිය , පෙර ඉන්දියාන් නාවික හමුදාධිපතිවරු අද්මිරාල් (විශ්‍රාමික) අරුන් ප්‍රකාශ් සහ අද්මිරාල්(විශ්‍රාමික) සුරේෂ් මෙහෙතා,ගෝවා නැව් තටාංගනයේ කළමණාකරණ අධ්‍යක්ෂ රියර් අද්මිරාල් සහ ශේකර් මිතාල් මහත්මිය , ප්‍රභූවරුන් සහ ඉන්දියානු රජයේ විශේෂ ආරාධිතයන් සහ ඉන්දියන් හා ශ්‍රී ලංකා නාවික හමුදාවන් හි ජ්‍යෙෂ්ඨ නිලධාරින් ද මෙම අවස්ථාවට සහභාගී විය.

**ශ්‍රී ලංකාවේ තිරසාර සාමය පිළිබද සම්මන්ත්‍රණය : “සාමය පවත්වාගෙන යාම පිළිබදව වන අභියෝග පුනරාවර්ජනය සහ හමුදා කාර්යභාර්ය“ 2016 ජූනි 9-10 දිනවල, දකුණු මාකොළ පිහිටි ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලයේදී පැවැත්විණ.**

විදේශ කටයුතු අමාත්‍යාංශයේ නිර්දේශයන්ට අනුකූලව ආරක්ෂක අමාත්‍යාංශයේ ජාත්‍යන්තර සබදතා අංශය මූලිකත්වය ගෙන, ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලය(DSCSC) , විදේශ කටයුතු අමාත්‍යාංශය, නිව්යෝක් හි පිහිටි එක්සත් ජාතීන්ගේ දේශපාලන සබදතා දෙපාර්තමේන්තුව හා කොළඹ පිහිටි එක්සත් ජාතීන්ගේ කාර්යාලය එක්ව ඉහත තේමාව සම්බන්ධව සම්මන්ත්‍රණයක් සංවිධානය කළහ. සම්මන්ත්‍රණයේ අරමුණ වූයේ ශ්‍රී ලංකාවේ ජ්‍යේෂ්ඨ නිලධාරින් සමග ක්‍රියාකරමින් අර්බුද කාලසීමාව හා සාම සංක්‍රාන්තික සමයේ ලද අත්දැකීම් වෙනත් රාජ්‍යයන්හි හමුදා නිලධාරින් සමඟ හුවමාරු කරගැනීමයි.

එක්සත් ජාතීන්ගේ කණ්ඩායමට ඇතුලත් වූයේ සත්‍ය, අසාධාරණය , වන්දි හා නැවත ඇතිනොවීම පිළිබඳ සහතික කිරීමේ විශේෂ නියෝජිත පැබ්ලෝ ඩි ග්‍රීෆ් සහ ජර්මනියේ ගුයිඩෝ ඇන්ඩ්‍රිස් මැතිස් (ජර්මනියේ හමුදා ආයතනය ), එක්සත් ජාතීන්ගේ (පහසුකම්) දේශපාලන සබදතා දෙපාර්තමේන්තුවේ( DPA)ජ්‍යේෂ්ඨ උපදේශකවරුන්ගේ පොරොත්තු කණ්ඩායමේ බ්‍රිතාන්‍ය සාමාජික පිලිප් බානබාස් අෆාකෝ, එක්සත් ජාතීන්ගේ (පහසුකම්) දේශපාලන සබදතා දෙපාර්තමේන්තුවේ( DPA) ජ්‍යෙෂ්ඨ උපදේශකවරුන්ගේ පොරොත්තු කණ්ඩායමේ බ්‍රිතාන්‍ය සාමාජික බ්‍රෙන්ඩන් ඇක්ලිස්ටර්, බිනෝජ් බස්නියත් , නේපාල (පෙර- හමුදා) ,ජේවියර් මාටින් අර්බිනා පර්දේස් / චිලී (පෙර- හමුදා), ෆෙලික්ස් ඇලෙක්සැන්ඩර් මේයර් රික් / ඔස්ට්‍රියා (පෙර- හමුදා)සහ නිව්යෝක් හි දේශපාලන සබදතා දෙපාර්තමේන්තුවේ එලන් අල්රාඩි මහත්මිය යන පුද්ගලයන්ය.
ඊට අමතරව, රජය මගින් අපේක්ෂා කරන සංහිදියා ක්‍රියාපටිපාටිය සම්බන්ධ කරුණු සම්මන්ත්‍රණයට සහභාගිවන්නන් හට ලබාදී වෙනත් රටවල් සමග අත්දැකීම් හුවමාරු කරගැනීම මෙහිදී ක්‍රියාත්මක විය.

**2016 ජූනි 14 - මිනිස් ජාවාරම් හා අනෙකුත් අන්තර්ජාතික අපරාධ සම්බන්ධව ශ්‍රී ලංකා -ඕස්ට්‍රේලියා ඒකාබද්ධ ක්‍රියාකාරී කණ්ඩායමේ 3 වන හමුව**

මිනිස් ජාවාරම් හා අනෙකුත් අන්තර්ජාතික අපරාධ සම්බන්ධව ශ්‍රී ලංකා -ඕස්ට්‍රේලියා ඒකාබද්ධ ක්‍රියාකාරී කණ්ඩායම (JWG) 2016 ජූනි 14 වන දින ආරක්ෂක අමාත්‍යාංශයේදී හමුවිය.එවකට ශ්‍රී ලංකා -ඕස්ට්‍රේලියා විදේශ කටයුතු අමාත්‍යවරු විසින් 2012 දී දියත් කළ, මිනිස් ජාවාරම් හා අනෙකුත් අන්තර්ජාතික අපරාධවලට විරුද්ධව සටන් කිරීම අරමුණු කරගත් සංවාදය තුළින් ද්වි රාජ්‍යයන් අතර සහයෝගීතාවයේ නව පරිච්ඡේදයක් ඇරඹිණි.

ජාවාරම්කරුවන් ඕස්ට්‍රේලියාව වෙත යවමින් සිදුකරන ලද මිනිස් ජාවාරම් සාර්ථකව බිඳදැමීමට ශ්‍රී ලංකා බලධාරින් හට හැකිවූයේ අඛණ්ඩ තොරතුරු හා බුද්ධිමය හුවමාරු කිරීම්, සම්බන්ධීකරණ ප්‍රයත්නයන් නිසා බවත් ආරක්ෂක ලේකම් ,ඉංජි.කරුණාසේන හෙට්ටිආරච්චි මැතිතුමා ඔහුගේ ආරම්භක දේශනයේදී ප්‍රකාශ කරන ලදී. ඒකාබද්ධ ක්‍රියාකාරී කණ්ඩායම් යටතේ වන දේශපාලන කැපකිරීම් තහවුරු කරන්නාවූ සහයෝගීතාව ශක්තිමත්ව පවතින බව ඔහු පැවසුවේය.රාජ්‍යයන් ද්විත්වය අතර පවතින සබදතාවය පිළිබද පුළුල් ලෙස සාකච්ඡා කල ශ්‍රී ලංකාවේ ඕස්ට්‍රේලියානු මහ කොමසාරිස් , අතිගරු බ්‍රයිස් හච්ටසන් විසින් පවත්නා ශක්තිමත් ආයෝජන හා වෙළඳ සබදතා මෙන්ම රාජ්‍යයන් ද්විත්වය අතර පුද්ගල සබදතාව සදහා මැදිහත් වන පොහොසත් පැලැන්තිය පිළිබදව සදහන් කළේය.රාජ්‍යයන් ද්විත්වය අතර වන ආරක්ෂිත හා උපායජිත සබදතාව අඛණ්ඩව පවත්වා ගැනීම පිළිබදව මහ කොමසාරිස්තුමා සදහන් කළේය.

ඕස්ට්‍රේලියාවේ ආගමන හා දේශසීමා ආරක්ෂණ දෙපාර්තමේන්තු නියෝජ්‍ය ලේකම් (ප්‍රතිපත්ති) රේචල් නොබල් මහත්මිය, ආරක්ෂක අමාත්‍යාංශ අතිරේක ලේකම් (ආරක්ෂක) එස් හෙට්ටිආරච්චි මහතා යන අය ඒකාබද්ධ ක්‍රියාකාරී කණ්ඩායමේ සම සභාපතිත්වය දැරීය. ඕස්ට්‍රේලියාවේ ශක්තිමත් හවුල්කරුවෙක් ලෙස ශ්‍රී ලංකාව වසර ගණනාවක් පුරා මිනිස් ජාවාරම් මැඩලීම සදහා ලබාදුන් අතිවිශේෂ දායකත්වය වෙනුවෙන් ඕස්ට්‍රේලියානු නියෝජ්‍ය ලේකම් ශ්‍රී ලංකාව වෙත තම ස්තූතිය ප්‍රකාශ කළාය. තවදුරටත් ඇය ප්‍රකාශ කලේ රාජ්‍යයන් ද්විත්වය අතර සිදුවන මිනිස් ජාවාරම් , අපරාධ හා ත්‍රස්තවාදය මැඩලීම පිළිබද සෑහීමකට පත්නොවන බවත්,ඉදිරියටත් මේ පිළිබදව අවධානයෙන් සිටිය යුතු බවත්ය. මිනිස් ජාවාරම් මැඩලීම ඇතුලුව හමුවේදී සාකච්ඡාවට බදුන් වූ ගැටලු වන්නේ බුද්ධිමය,ප්‍රතිපත්තිමය, අනාවරණය කරගැනීම , කඩාකප්පල් කිරීම සහ නැවත කැදවීම ,ක්‍රමානුකූල සන්නිවේදනයන් (මහජන දැනුවත්භාවය) සහ ඕස්ට්‍රේලියාවෙන් ඉවත්කරන්නන් සදහා යෝජිත කඩිනම් ක්‍රියාපිළිවෙළ , අන්නර්ජාතික සමුද්‍රීය මර්දනය ඇතුලු සමුද්‍රීය සහයෝගීතාව (මංකොල්ලකෑම් ඇතුලුව) , මුහුදේදී පිරික්සුම් හා බේරාගැනීමේ කටයුතු සහ ආරක්ෂණය , මිනිස් ජාවාරම් මැඩලීම සදහා වන නීති පද්ධතිය එක්සත්කිරීම හා සවිබල ගැන්වීම සහ මිනිස් ජාවාරම්කරුවන් පිළිබද විමර්ශනය කර චෝදනා පැමිණවීම වැනි නීතිමය සහයෝගීතාව , කොළඹ RILON ( ප්‍රාන්තිය ආගමන සම්බන්ධීකරණ නිලධාරි ජාලය) වර්ධනය ඇතුලුව ප්‍රාන්තිය සහයෝගීතාව හා බාලි ක්‍රියාවලිය සහ ඉදිරි සහයෝගීතාවන් සදහා දේශසීමා කළමනාකරණ ගැටලු යනාදියයි. මිනිස් ජාවාරම් හා අනෙකුත් අන්තර්ජාතික අපරාධ පිළිබදව සකස් කරන ලද යෝජිත අවබෝධතා ගිවිසුම පිළිබදව ද සාකච්ඡා පැවතුණි.

ඒකාබද්ධ ක්‍රියාකාරී කණ්ඩායම යටතේ සිදුවී ඇති පුළුල් වර්ධනය පාර්ශවයන් දෙක විසින්ම පිළිගත් අතර ඉදිරියේදී ද මෙම සහයෝගීතාව සවිබල ගැන්වීමට එකගත්වය පළ කරන ලදී.

## 2016 ඔක්තෝම්බර් 11-12 චීනයේ බීජිං නුවර , 7 වන ෂියැංෂන් සමුළුව

බීජිං නුවර පැවති 7 වන ෂියැංෂන් සමුළුවට සහභාගි වූ ආරක්ෂක ලේකම් ඉංජි.කරුණාසේන හෙට්ටිආරච්චි මැතිතුමා සමුළුවේ දෙවන සැසිවාරයේදී " ගෝලීය පාලනයක් සඳහා හමුදාවන්හි කාර්ය භාරය" යන්න පිළිබඳව දේශනයක් ඉදිරිපත් කරන ලදී.

2006 වර්ෂයේ හමුදා විද්‍යාව සඳහා වන චීන සංගමය ආරම්භ කළ ෂියැංෂන් සමුළුව ආසියානු ආරක්ෂාව හා සුරක්ෂිතභාවය පිළිබඳ ගැටලු සඳහා වන නිල, රාජ්‍ය නිලධාරීන් මෙන්ම නිල නොවන හා රාජ්‍ය නොවන නිලධාරීන් එක්ව සිදු කරන ඉහළ මට්ටමේසමුළුවකි. මෙම වසරේ තේමාව "ආරක්ෂක සමුළුව හා සහයෝගීතාව හරහා නව තාලයේ අන්තර් ජාතික සබඳතාව ගොඩනැගීම" වන අතර සෙසු සැසිවාරයන්හිදී සාකච්ඡා කළ අනෙකුත් මාතෘකා 4 වන්නේ , "ගෝලීය පාලනයක් සඳහා හමුදාවන්හි කාර්ය භාරය", "සහයෝගීතාව හරහා ආසියා පැසිපික් නව ආරක්ෂක අභියෝග සඳහා ප්‍රතිචාර දැක්වීම", සමුද්‍රීය ආරක්ෂණ සහයෝගීතාව" සහ "අන්තර්ජාතික ත්‍රස්ත බලපෑම් හා එය මැඩලීමට ගන්නා පියවරයන්" යන මාතෘකාවන්ය.මෙම ආරක්ෂණ පර්ෂදයට අනුග්‍රහය දක්වන ලද්දේ හමුදා විද්‍යා සඳහා චීන සංගමය හා අන්තර්ජාතික ක්‍රමානුකූල අධ්‍යන සඳහා වන චීන ආයතනයන්ය.

ලේකම්තුමා සමුළුවෙහි සෙසු අංගයක් ලෙස මහජන චීන සමූහාණ්ඩුවේ ජාතික ආරක්ෂක අමාත්‍ය හා රාජ්‍ය මන්ත්‍රණ සභික , ජෙනරාල් චැන්ග් වන්ක්වන් මැතිතුමා දුරකථන ඇමතුමකින් සම්බන්ධ කරගත්තේය.ජනාධිපතිතුමා හා ආරක්ෂක අමාත්‍යතුමා වෙනුවෙන්, ආරක්ෂක ලේකම්වරයා චීන අමාත්‍යතුමා හට ආරක්ෂක ක්ෂේත්‍රයේ සහයෝගීතාව වැඩිදියුණු කරගැනීම සඳහා ශ්‍රී ලංකාවේ සංචාරයකට සහභාගි වන ලෙසට ඇරයුම් කළේය.



## 2016 ඔක්තෝම්බර් 12-15 දිනයන්හි දෙවන චීන-ලංකා ආරක්ෂක සහයෝගීතා සමුළුව හා ආරක්ෂක අමාත්‍යාංශ ලේකම්තුමාගේ නිල සංචාරය

චීන රජයේ ආරාධනාවකට අනුව ආරක්ෂක ලේකම් ඉංජි.කරුණාසේන හෙට්ටිආරච්චි මැතිතුමා චීනයේ නිල සංචාරයකට සහභාගි විය. සංචාරය අතරතුරදී චීන මධ්‍ය හමුදා කොමිසම් දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය ඒකාබද්ධ මාණ්ඩලික ප්‍රධානී ,අද්මිරාල් සුන් ජිඇන්ගුඕ දෙවන චීන-ලංකා ආරක්ෂක සහයෝගීතා සමුළුවේ (2016 ඔක්තෝම්බර් 13 දින පැවැත්වූ ) සම සභාපතිත්වය ඉසිලුවේය. හමුවේදී, දෙරට අතර ආරක්ෂක සහයෝගීතාව පිළිබඳ කරුණු සියල්ල පුනරීක්ෂණය කරන ලදී.

උසස් තලයේ හුවමාරු කිරීම් , හමුදා සහයෝගය , පුහුණු අවස්ථාවන් , ආරක්ෂක බුද්ධි මණ්ඩල අතර එකමුතුව , බුද්ධිමය සහයෝගීතාව, ඒකාබද්ධ හමුදා ප්‍රයත්නය හා ආරක්ෂක සම්මන්ත්‍රණ සඳහා සහභාගි වීම ,වැඩමුළු හා සම්භාෂණ ඇතුලු සියලු ආරක්ෂණ සහයෝගීතා කරුණු, දෙපාර්ශවය විසින් විචාරණය සිදුකරන ලදී. සමස්ත ද්විපාර්ශවික සබඳතාව, ආරක්ෂාව සඳහා පවතින වැදගත් සහයෝගීතා කුළුණක් ලෙස නියෝජිත පිරිස අවධාරණය කල අතර තවදුරටත් එම ක්ෂේත්‍රයේ සබඳතා වැඩිදියුණු කිරීම අඛණ්ඩව පවත්වාගෙන යාමට එකගතාවය පළ කරන ලදී.

හමුව අතරතුරදී, ගැඹුරු මුහුදු මුර සංචාර යාත්‍රා(ආරක්ෂක නෞකාවකින් සකස් කරන ලද) සම්පාදනය හා RMB යුවාන් මිලියන 120ක වටිනාකමින් යුත් ගෙවීම් රහිත හමුදා සහයෝගය ලබා ගැනීම සම්බන්ධ ගිවිසුම් ද්විත්වයකට එළඹීය.

සංවාදය සඳහා ශ්‍රී ලංකා නියෝජිත පිරිසට ඇතුළත් වූයේ ගුවන් හමුදාධිපති, එයාර් මාර්ෂල් කපිල ජයම්පති, නාවික මාණ්ඩලික ප්‍රධානී රියර් අද්මිරාල් එස්.එස්.රණසිංහ, ශ්‍රී ලංකා ස්වේච්ඡා බලකායේ අණදෙන නිලධාරී මේජර් ජෙනරාල් එච්.සී.පී.. ගුණතිලක, ආරක්ෂක අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (විදේශ කටයුතු) එස්.එස්.ප්‍රේමවර්ධන මහත්මිය හා බීජිංහි ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ ආරක්ෂක උපදේශක යන අයවළුන්ය.



## 4 වන වාර්ෂික ශ්‍රී ලංකා - ඉන්දියා ආරක්ෂක සංවාදය, 2016 නොවැම්බර් 03 වන දින

4 වන වාර්ෂික ආරක්ෂක සංවාදය(ADD) ශ්‍රී ලංකාව-ඉන්දියාව අතර 2016ක් වූ නොවැම්බර් මස 03 වන දින කොළඹ ආරක්ෂක අමාත්‍යාංශයේදී පැවැත්විණි.හමුව සඳහා ශ්‍රී ලංකා නියෝජිත පිරිසෙහි මූලිකත්වය ආරක්ෂක ලේකම් ඉංජි.කරුණාසේන හෙට්ටිආරච්චි මහතා ද ඉන්දියානු නියෝජිත පිරිසෙහි මූලිකත්වය ඉන්දියානු ආරක්ෂක ලේකම් ශ්‍රී ජී මෝහන් කුමාර් මහතා විසින් ද දැරුවේය.වාර්ෂිකව රටවල් ද්විත්වය අතර ආරක්ෂණය

සම්බන්ධ තොරතුරු හා ආරක්ෂක සහයෝගීතාව විචාරයට ලක් කිරීමේ දැක්ම සහිතව මෙම සංවාදය 2012 වර්ෂයේ සිට ආරම්භ කරන ලදී.

ශ්‍රී ලංකාව හා ඉන්දියාව අතර සමස්ත ද්වි පාර්ශවික සහයෝගීතාවෙහි ප්‍රධාන සහ වැදගත් කොටසක් ලෙස ආරක්ෂාව හා සුරක්ෂිතභාවය සැලකිය හැකි බව ආරක්ෂක ලේකම්වරයා ප්‍රකාශ කළ අතර, සහයෝගී ආරක්ෂක උන්නතිය තුළින් ඉන්දියන් සාගරයේ උපායෝජිත සහයෝගයෙහි වැදගත් භාවය අවධාරණය කරන ලදී.එම සන්ධර්භයට අනුව, ආරක්ෂණ සංවාද ක්‍රියාපටිපාටිය මඟින් පවරාගෙන ඇති කාර්යභාරයෙහි වැදගත්කම අවධාරණය කරන ලදී.

ඓතිහාසිකමය, සංස්කෘතිකතාමය, ජනවාර්ගිකමය හා ශිෂ්ටාචාරාත්මක සබඳතා මෙන්ම පුළුල් ලෙස මිනිසුන් අතර පවත්නා අන්තර් සබඳතාව තුළින් ශ්‍රී ලංකාව හා ඉන්දියාව අතර පවත්නා අද්විතීය සබඳතාව තහවුරුකරන බව ඉන්දියානු ආරක්ෂක ලේකම්වරයා සඳහන් කළේය.ඔහු තවදුරටත්, රටවල් ද්විත්වය අතර පවත්නා කාර්යයන් හා උපායශීලී ආරක්ෂණ අභිලාශයන් ඉතා හොඳින් පැහෙන බව ප්‍රකාශ කළ අතර ශක්තිමත් ද්වි පාර්ශවික සබඳතාවක් සඳහා ආරක්ෂණ වැඩපිළිවෙලයන් හි පොදුභාවය අඩිතාලමක් සපයන බව ප්‍රකාශ කළේය.

පුහුණු හා ශක්‍යතා ගොඩනැගීම සම්බන්ධව පුළුල් සාකච්ඡා පැවැත්විණි.එනම්, සන්නද්ධ හමුදා අතර උපායශීලී සාකච්ඡා , හමුදාවකින් හමුදාවකට දක්වන සහයෝගීතාව, සමුද්‍රීය බල මණ්ඩල දැනුවත්භාවය,ජාත්‍යන්තර සමුද්‍රීය දේශසීමා හා සමගාමීව සමුද්‍රීය පැවැත්ම, ආරක්ෂක උපකරණ,ආරක්ෂක ණය ක්‍රම,උපායමාර්ගික ප්‍රජාවන් අතර සංවාදය හා වෙරළාරක්ෂක සහයෝගීතාවය, සහ ආරක්ෂක බුද්ධි මණ්ඩල අතර අන්තර් සබඳතාව යන කරුණු මූලික කරගෙනය.

ඉන්දියන් නියෝජිත පිරිසට ඇතුළත් වූයේ ඉන්දියානු මහකොමසාරිස් එච්.ඊ.වයි.කේ..සිංහ, ඉන්දියානු නියෝජ්‍ය නාවික මාණ්ඩලික ප්‍රධානී වයිස් අද්මිරාල් ජී.අශෝක් කුමාර්, ඉන්දියානු ගුවන් හමුදාවේ එයාර් මාර්ෂල් පී.කේ.එස්..හාදඋරියා, ඉන්දියානු හමුදාවේ ලුතිනන් ජෙනරාල් එස්.කේ.පටියාල්, නියෝජ්‍ය ඉන්දියානු මහකොමසාරිස් අරින්දම් බාචි මහතා, ආරක්ෂක අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ ශ්‍රී ප්‍රදීප් කුමාර්, කොළඹ ඉන්දියානු මහකොමසාරිස් කාර්යාලයේ ආරක්ෂක උපදේශක කපිතාන් ප්‍රකාශ් ගෝපාලන් යන අයයි.

සංවාදය සඳහා ශ්‍රී ලංකා නියෝජිත පිරිස වූයේ, ආරක්ෂක අමාත්‍යාංශ අතිරේක ලේකම්(ආරක්ෂක) එස්. හෙට්ටිආරච්චි මහතා, ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී එයාර් චීෆ් මාර්ෂල් කේ.ඒ.ගුණතිලක, යුධ හමුදාධිපති ඒ.ඩබ්ලිව්.ජේ.සී.. ද සිල්වා, නාවික හමුදාධිපති වයිස් අද්මිරාල් ආර්.සී.. විජේගුණරත්න, ගුවන් හමුදා මාණ්ඩලික ප්‍රධානී එයාර් වයිස් මාර්ෂල් සුමංගල ඩයස්, ශ්‍රී ලංකා වෙරළාරක්ෂක දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජෙනරාල් (විශ්‍රාමික) රියර් අද්මිරාල් ජී.ඩී.ඒ.එස්.විමලතුංග, ජාතික බුද්ධි ප්‍රධානී ඒ.එන්. සිසිර මෙන්ඩිස්, දකුණු ආසියා හා සාක් කලාපයේ අධ්‍යක්ෂ ජෙනරාල් අශෝක ගිරිහගම මහතා, ආරක්ෂක අමාත්‍යාංශ අතිරේක ලේකම්(විදේශ කටයුතු) ශශිකලා ප්‍රේමවර්ධන මහත්මිය සහ දකුණු ආසියා හා සාක් කලාපීය අධ්‍යක්ෂ විදේශ කටයුතු අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ අත්සුල් ජාත් මහත්මිය යන අයයි.

# 10. ආරක්ෂක අමාත්‍යාංශයේ මාධ්‍ය කේන්ද්‍රය

## 10.1 සමාලෝචනය

ස්වාධීන රටක ප්‍රමුඛතම අවශ්‍යතාවයක් වන ජාතික ආරක්ෂාව සුරක්ෂිත කිරීම පිණිස ආරක්ෂාවට සම්බන්ධ තොරතුරු රැස්කිරීම හා ඒවා විශ්ලේෂණය කොට නිවැරදිව, වගකීමකින් යුතුව හා කාර්යක්ෂම ලෙස දේශීය සහ විදේශීය මාධ්‍ය වෙත ලබාදීමත්, විවිධ මාධ්‍ය තුළින් ප්‍රචාරය කරනු ලබන වැරදි හෝ අතිශයෝක්තියෙන් යුතු තොරතුරු නිවැරදි ලෙස හා නිසි අයුරින් දේශීය සහ විදේශීය මාධ්‍ය වෙත ලබාදීමත්, මෙම ආයතනය විසින් සිදුකරනු ලබයි.

### 10.1.1 කාර්යභාර්යයන්

- ජාතික ආරක්ෂාවට අදාල තොරතුරු එක්රැස් කිරීම සහ ඒවා කඩිනමින් මාධ්‍ය වෙත නිකුත් කිරීම.
- ජාතික ආරක්ෂාවට තර්ජනයක් වන තොරතුරු හඳුනා ගැනීම සහ මාධ්‍ය හරහා ඒවා නිශේධනය කිරීම.
- ජාතික ආරක්ෂාවට අදාල තොරතුරු සම්බන්ධයෙන් ආරක්ෂක අමාත්‍යාංශයේ අදාල අංශ සමග සහ සම්බන්ධතාවයෙන් යුතුව කටයුතු කිරීම.
- ආරක්ෂක අමාත්‍යාංශය සහ ඒ යටතේ ඇති ත්‍රිවිධ හමුදාව ඇතුළු අනිකුත් ආයතන සමග ඇති සම්බන්ධතාවන් වැඩිදියුණු කරගැනීම.
- අනාගත අවශ්‍යතාවයකදී පරිශීලනය සඳහා පුවත්පත් දත්ත මූලාශ්‍ර ගබඩාවක් පවත්වාගෙන යාම.
- ආරක්ෂක අමාත්‍යාංශයේ අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා මාධ්‍ය ආයතන සම්බන්ධීකරණය කිරීම.
- අවශ්‍ය අවස්ථාවන් වලදී ලිඛිත සහ මුද්‍රිත ප්‍රකාශ නිකුත් කිරීම සම්බන්ධීකරණය කිරීම.

## 10.2 2016 වර්ෂයේ කාර්යසාධනය

මෙම මාධ්‍ය කේන්ද්‍රය විසින් වර්ෂය තුළ මාධ්‍ය සාකච්ඡා **11**ක් ද මාධ්‍ය නිවේදන **35**ක් ද මාධ්‍ය ආවරණ **53**ක්ද සිදුකර සාර්ථක ප්‍රගතියක් ලබා ඇත.

| මාසය | මාධ්‍ය සාකච්ඡා | මාධ්‍ය නිවේදන | මාධ්‍ය ආවරණ |
|---|---|---|---|
| ජනවාරි | 01 | 01 | 06 |
| පෙබරවාරි | - | 02 | 06 |
| මාර්තු | 01 | 05 | 06 |
| අප්‍රේල් | 01 | 08 | 08 |
| මැයි | 01 | 03 | 04 |
| ජූනි | 01 | 03 | 02 |
| ජූලි | 01 | - | - |
| අගෝස්තු | 01 | 08 | 03 |
| සැප්තැම්බර් | 03 | 01 | 02 |
| ඔක්තෝබර් | - | 01 | 10 |
| නොවැම්බර් | 01 | 02 | 04 |
| දෙසැම්බර් | - | 01 | 02 |
| එකතුව | 11 | 35 | 53 |

10.1 වගුව: මාධ්‍ය සාකච්ඡා, මාධ්‍ය නිවේදන සහ මාධ්‍ය ආවරණ

2008 සිට 2014 වර්ෂය දක්වා මාධ්‍ය කේන්ද්‍රයේ අවශ්‍යතාවන් සඳහා අදාල මූල්‍ය සහ ප්‍රාග්ධන වියදම් සෘජු වැය ශීර්ෂයක් යටතේ ගෙවන ලද නමුත් 2015 වර්ෂයේ සිට මාධ්‍ය කේන්ද්‍රයට අදාල එම වියදම් ආරක්ෂක අමාත්‍යාංශයේ අංක 103-01-06 යටතේ එම අමාත්‍යාංශය වෙත බැරකර ඇති අතර, මාධ්‍ය කේන්ද්‍රයේ අධ්‍යක්ෂගේ ලිඛිත ඉල්ලීමක් මත මූල්‍ය අවශ්‍යතා ආරක්ෂක අමාත්‍යාංශය වෙතින් සළසාදෙනු ලබයි.

රුපියල් පන්දහසක මුදලක් (රු.5000.00) සුළුමුදල් අග්‍රිමය වශයෙන් ආයතනය වෙත ලබාදෙන අතර ඒවා වැය කිරීමෙන් අනතුරුව වියදම් විස්තරය අදාල බිල්පත් සමග ආරක්ෂක අමාත්‍යාංශය වෙත නිරවුල් කරනු ලබයි.

10.1 ප්‍රස්ථාරය: සුළු මුදල් අග්‍රිමය




10.2 ප්‍රස්ථාරය: ජාතික ආරක්ෂාව හා සම්බන්ධ පුවත්පත් විමර්ශන සාරාංශය - 2016




10.3 ප්‍රස්ථාරය : ජාතික ආරක්ෂාව සම්බන්ධ රූපවාහිනී නාලිකා ප්‍රවෘත්ති විමර්ශන සාරාංශය- 2016




10.4 ප්‍රස්ථාරය: ජාතික ආරක්ෂාව හා සම්බන්ධ ගුවන් විදුලි නාලිකා ප්‍රවෘත්ති විමර්ශන සාරාංශය - 2016




10.5 ප්‍රස්ථාරය: ජාතික ආරක්ෂාව හා සම්බන්ධ වෙබ් අඩවි විමර්ශන සාරාංශය




10.6 ප්‍රස්ථාරය: 2016 වර්ෂයේ අපරාධ වාර්තා විමර්ශන සාරාංශය
මූලාශ්‍රය:ශ්‍රී ලංකා පොලීසිය

## 10.3 ගැටළු සහ අභියෝග

මාධ්‍ය ප්‍රචාරණය සහ මහජන සම්බන්ධතාවය වර්තමානයේදී ඉතා වැදගත් කරුණක් වන අතර, මෙම ආයතනයේ අරමුණු සාක්ෂාත් කරගැනිම සඳහා පවතින ගැටළු සහ අභියෝග රැසක් මාධ්‍ය කේන්ද්‍රය විසින් හඳුනාගෙන ඇත. ඒ අනුව ජාතික අවශ්‍යතාවයන් සඳහා සිවිල් සහ හමුදා සම්බන්ධීකරණය වර්ධනය මෙම ආයතනය මගින් සිදුකර ඇත. එමගින් යහපාලනය ඇති කිරිම සඳහා ජාතික ආරක්ෂාවට සම්බන්ධ ආයතන වෙත මහජනතාවගේ සහයෝගය ලබාගැනීමට හැකියාව ලැබෙනු ඇත.

- ආරක්ෂක අමාත්‍යාංශය යටතේ පාලනය වන මෙම මාධ්‍ය කේන්ද්‍රය මහජනතාවට ජාතික ආරක්ෂාව පිළිබඳ ආයතනයක් වශයෙන් කටයුතු කළ ද නිවැරදි තොරතුරු ක්‍රමවත්ව හා ඉතා කඩිනමින් ලබාගැනීමට ඇති හැකියාව සීමාසහිත වීම.
- මාධ්‍ය කේන්ද්‍රය වෙතින් මාධ්‍ය නිවේදන ත්‍රෛභාෂාවන්ගෙන් නිකුත් කළ ද දැනට දමිළ මාධ්‍ය සම්බන්ධීකරණ මාධ්‍යවේදියෙකු පමණක් සිටින නමුත් සිංහල හා ඉංග්‍රීසි මාධ්‍ය සම්බන්ධීකරණ මාධ්‍යවේදීන් ආයතනය තුල නොමැති වීම
- රටෙහි ජාතික ආරක්ෂාව වෙනුවෙන් පළවන ජාත්‍යන්තර මාධ්‍ය විස්තර නිවැරදිව සහ ක්‍රමවත්ව ලබාගැනීම සඳහා ඉංග්‍රීසි නාලිකා, නිරීක්ෂණය සඳහා වෘත්තීමය අයවලුන් නොමැතිවීම.
- මාධ්‍ය අවස්ථා සහ අනෙකුත් මාධ්‍ය කටයුතු වාර්තා කිරීම සහ ඡායාරූපකරණය/වීඩියෝ කැමරා/නිශ්චල කැමරා/හඩ පටිගත කිරීමේ යන්ත්‍ර/නිවේදක හැකියාව

- සහ වාර්තාකරණයේ හැකියාව ඇති අයවළුන් මෙන්ම මාධ්‍ය උපකරණ භාවිතා කිරීමට හැකියාව ඇති අයවලුන් මෙම මාධ්‍ය කේන්ද්‍රය තුල නොමැතිවීම.
- මහජනතාව සහ ආයතන සමග ඇති සහයෝගීතාව ඉතාමත් වැදගත් සහ නෛසර්ගික වන බැවින් මෙම ආයතනයේ කාර්ය මණ්ඩලය සඳහා මාධ්‍යකරණය පිළිබඳව දැනුමක් සහිත අයවලුන් නොමැති හෙයින් ඉහත ආයතන සහ මහජනතාව සමග ඇති සම්බන්ධතාවය සීමා සහිත වී ඇති අතර මාධ්‍ය ප්‍රචාරණය සඳහා ලබාගත හැකි තොරතුරු අවම වීම.

## 10.4 අනාගත අපේක්ෂා

- ජාතික ජනමාධ්‍ය විද්‍යාලය සමග මෙම කේන්ද්‍රයේ කාර්ය මණ්ඩලයට ජන මාධ්‍ය ක්‍රියාකාරකම් පිළිබඳ පුහුණු පාඨමාලා /වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට යෝජනා කිරීම.
- ජාතික සහ ජාත්‍යන්තර ජාතික ආරක්ෂාවට අහිතකර බලපෑම් එල්ලවන ආකාරයෙන් නිකුත්වන මාධ්‍ය ප්‍රකාශන ඉතා වේගවත් හා කාර්යක්ෂම ආකාරයට නිශේධනය කිරීම සඳහා අදාල මාධ්‍ය නිවේදන හා ප්‍රකාශ ක්ෂණිකව මාධ්‍ය තුළින් ප්‍රකාශයට පත්කිරිමට විශේෂ විමර්ශ මණ්ඩලයක් ආයතනය තුළින් ක්‍රියාත්මක කිරීම.
- සියලු විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍යවේදීන් සමග සුහදත්වය/දැනුම/වර්ධනය කර ගැනීම සඳහා සම්මන්ත්‍රණ/වැඩමුළු සංවිධානය කිරීම.
- ත්‍රිවිධ හමුදාව/ශ්‍රී ලංකා පොලිසිය/සිවිල් ආරක්ෂක බලකා මාධ්‍ය ඒකකයන් ඒකරාශි කොට ඔවුන් වෙනුවෙන් පුහුණු වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම සංවිධානය කිරීම.
- රටෙහි ජාතික ආරක්ෂාව හා සම්බන්ධ ගැටළු පැන නගින අවස්ථාවන්හි අදාල ස්ථානයන් වෙත ගොස් නිවැරදි තොරතුරු මාධ්‍යන් වෙත නිකුත් කිරීම සඳහා කැමරාකරුවන්/වාර්තාකරුවන්/බලය ලත් නිලධාරීන් ගෙන් සමන්විත ක්ෂණික විහිදුම් මාධ්‍ය කණ්ඩායම් ස්ථාපිත කිරීමට යෝජනා කිරීම. (ප්‍රවාහන පහසුකම් සහිත)
- රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව හා සම්බන්ධතාවයෙන් මාධ්‍ය කේන්ද්‍රයෙහි කාර්ය මණ්ඩලය වෙත ත්‍රෛභාෂා පුහුණුවක් ලබාදීමට සැලසුම් කිරීම.
- ත්‍රිවිධ හමුදාව/ශ්‍රී ලංකා පොලිසිය/විශේෂ කාර්ය බලකාය/සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව/වෙරළ
- ආරක්ෂක දෙපාර්තමේන්තුව වෙතින් සිදුකරනු ලබන ජාතික ආරක්ෂාව හා සම්බන්ධ ක්‍රියාකාරකම් හා අදාල මාසික හෝ ත්‍රෛයි මාසික සඟරා/පුවත්පත එළි දැක්වීමට යෝජනා කිරීම.
- ජාතික ආරක්ෂාව හා සම්බන්ධ තොරතුරුවල ආරක්ෂාව තරකර ගැනීම සඳහා (සයිබර් ප්‍රහාර) සුදුසු විශේෂඥ දැනුමක් ඇති සම්පත් දායකින් හා දියුණු උපකරණ පිළිබඳව කේන්ද්‍රය වෙත ලබාගැනීමට යෝජනා කිරීම.

# 11. හමුදා සම්බන්ධතා කාර්යාලය

## 11.1 සමාලෝචනය

මෙම අංශයෙහි ප්‍රමුඛතම භූමිකාව වන්නේ අන්‍යෝන්‍ය අවබෝධය සහ සක්‍රිය ක්‍රියාකාරිත්වය තහවුරු කර ගැනීම් වස් ආරක්ෂක අමාත්‍යවරයා වශයෙන් අතිගරු ජනාධිපතිතුමන් හා ආරක්ෂක ලේකම් විසින් නිකුත් කෙරෙන දැනුම් දීම් තීරණ හා නියෝග,ත්‍රිවිධ හමුදා සහ වෙනත් ආයතන අතර සම්බන්ධිකරණයෙන් සංනිවේදනය කරලීමයි.

මීට අමතරව, රජය සහ ආරක්ෂක අමාත්‍යාංශය විසින් නිකුත් කෙරෙන ප්‍රතිපත්තිමය තීරණ ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය සහ අනුමත කාර්ය භාරයන් හා වැඩසටහන් වෙන්කර දී ඇති සම්පත් නොඉක්මවා ක්‍රියාත්මක කිරීමයි.

### 11.1.1 වගකීම්

- රාජ්‍ය උත්සව අවශ්‍යතාවයන්ට සහය වීම හා සම්බන්ධිකරණය.
- විදේශීය නියෝජිත පිරිස්වල සංචාරවලදී සහය වීම හා සම්බන්ධිකරණය.
- ත්‍රිවිධ හමුදාවන්ගේ අවශ්‍යතාවයන් සඳහා රජයේ අමාත්‍යාංශ සමග සහයෝගයෙන් කටයුතු කිරීම.
- ත්‍රිවිධ හමුදාවන්හි විශේෂඥ දැනුම හා සම්පත් භාවිතා කරමින් පෞද්ගලික/වාණිජ ආයතන වල අවශ්‍යතාවයන්ට සහය වීම හා සම්බන්ධිකරණය.
- රාජ්‍යතාන්ත්‍රික අංශයන්හි වැඩ සටහන් සඳහා හමුදාමය සහය ලබා දීම පහසුකරවමින් එකී අංශයන් සමග සහයෝගිකව සම්බන්ධිකරණය වීම.
- සංචාර සීමා කර ඇති ප්‍රදේශ හා හමුදා ආයතන වෙත පැමිණෙන දේශීය හා විදේශීය ජාතිකයන් මෙහෙයවීම හා සම්බන්ධිකරණය.
- ජාතික ආරක්ෂාවට තර්ජනයක් විය හැකි විෂයන් අධ්‍යනය කිරීම.

### 11.1.2 කාර්යභාරයන්

- විදේශීය නියෝජිතයින් හමුදා කඳවුරු හා හමුදාමය ආයතන වෙත පැමිණීම සම්බන්ධිකරණය.
- විදේශීය නාවුක සහ ගුවන් යානා සඳහා (හමුදාමය සහ චර්යානුගත නොවූ සංචලයන් සඳහා) රාජ්‍ය තාන්ත්‍රික නිෂ්කාශණය සැලසීම.
- හමුදාමය ගුවන් ගමන් සඳහා පියාසර අනුමැතිය ලබා දීම.
- ගුවන් යානා/ ගුවන් යානා අමතර කොටස්,බෝට්ටු,OBMS/ IBMS සහ විශේෂ හමුදාමය මෙවලම් ආනයනය/ අපනයන/ භාවිතය/ ප්‍රවාහනය සඳහා නිශ්කාශණය සැලසීම.
- නිගෝපන අයිතමයන් (Camouflage)/ නිළ ඇඳුම් රෙදි නිෂ්පාදනය/ආනයනය/ අපනයනය/ ප්‍රවාහනය සඳහා නිෂ්කාශනය සැලසීම.
- ත්‍රිවිධ හමුදාවට අදාල චාරිත්‍රානුකූල උත්සව සම්බන්ධීකරණය සහ විදේශීය පිරිස්/ රාජ්‍ය තාන්ත්‍රික දූත පිරිස්/ රාජ්‍ය නොවන සංවිධාන වල සහ විදේශීය මාධ්‍ය වල නියෝජිතයින් පැමිණීමේදි සහාය සහ සම්බන්ධීකරණය.
- ත්‍රිවිධ හමුදාවල අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් රජයේ අමාත්‍යාංශ හා සමග ගණුදෙනු කිරිම.
- ත්‍රිවිධ හමුදාවන්හි විශේෂඥ දැනුම හා සම්පත් භාවිතා කරමින් පෞද්ගලික/ වාණිජ ආයතනය වල අවශ්‍යතාවයන්ට සහාය වීම සහ සම්බන්ධීකරණය.
- රාජ්‍ය තාන්ත්‍රික වැඩසටහන් සඳහා හමුදාමය සහාය ලබා දීම පහසු කරවමින් එකී අංශයන් හා සමග සම්බන්ධීකරණය සහ ආරක්ෂක නිළධාරින්ගේ මාසික රැස්වීම.
- ආරක්ෂක අමාත්‍යාංශයේ අනෙකුත් අංශ විසින් ඉල්ලා සිටින විට සහය ලබාදීම.
- සඳහිරු සෑය ඉදිකිරීම් කටයුතු සම්බන්ධිකරණය.
- උසස් රාජ්‍ය නිළධාරින්ගේ හා රජයේ අමාත්‍යවරුන්ගේ ගුවන්/සමුද්‍ර ගමන් සංවිධානය කිරීම සඳහා ශ්‍රී ලංකා ගුවන් හමුදාව/ ශ්‍රී ලංකා නාවික හමුදාව හා සමග සම්බන්ධිකරණය.
- සීමා කර ඇති හමුදාමය මෙවලම් රේගු භාරයෙන් නිදහස් කර ගැනීම සඳහා ශ්‍රී ලංකා රේගුව හා සමග සම්බන්ධිකරණය.
- ආරක්ෂක අමාත්‍යාංශයට හෝ ආරක්ෂක අමාත්‍යාංශය යටතේ ගැනෙන වෙනත් ආයතනවලට හමුදා නිළධාරින් අනුයුක්ත කිරීම සම්බන්ධිකරණය.
- විදේශීය රාජ්‍ය නායකයින්ගේ සංචාර සඳහා කටයුතු සම්පාදනයේදි ජනාධිපති ලේකම් කාර්යාලයේදි සහ විදේශ කටයුතු අමාත්‍යාංශයේදි පැවැත්වෙන මූලික රැස්වීම්වලින් අනතුරුව නිකුත් කෙරෙන උපදෙස් වලට අනුකූලව පහත දැක්වෙන අයුරු සහාය දැක්වීම.
  - උත්සවාකාරයෙන් පිළිගැනීම සනිටුහන් කරමින් ආචාර වෙඩිමුර 19/21 ක් පැවැත්වීම.
  - උත්සවාකාර යතුරු පැදි හා පදින්නන් සැපයීම සම්බන්ධිකරණය.
  - යුධ හමුදාව නාවික හමුදාව ගුවන් හමුදාව සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව හා පොලිසිය විසින් පැවැත්වෙන සංස්කෘතික අංග රග දැක්වීම සම්බන්ධිකරණය.
  - ගෞරවාචාර පෙළපාළිය සම්බන්ධිකරණය.
  - බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළට පැමිණීමේදි හා පිටත්ව යාමේදි මග දෙපස ගෞරවාචාර විධිවිධාන සැලසීම.

- පාර්ලිමේන්තු පරිශ්‍රයේ රණවිරු ස්මරණ ස්තම්භය ඉදිරිපිට මල්වඩම් ස්ථානගත කිරීමේ උත්සවය සම්බන්ධීකරණය.
- ප්‍රභූන් දිවයිනෙහි රැඳී සිටින කාල පරාසය තුළ වෛද්‍ය කණ්ඩායමක් අනුයුක්ත කිරීම.
- ප්‍රභූන් සඳහා අවශ්‍ය වන පරිදි යෝග්‍ය අභ්‍යන්තරික ගුවන් ගමන් සම්බන්ධීකරණය.
- විශේෂ ගුවන් යානා ගොඩ බෑසීමට අවසරය ලබා දීම සහ කටුනායක ශ්‍රී ලංකා ගුවන් හමුදා පරිශ්‍රයේ අදාල ආරක්ෂාව සැලසීම.
- ප්‍රභූන්ගේ ගුවන් යානා පිටත්ව යාමට පෙර පූර්ව ආරක්ෂක සංවිධාන පරික්ෂාව සඳහා අවශ්‍ය කටයුතු සම්බන්ධීකරණය.
- ප්‍රභූන්ගේ ගමන්මලු ප්‍රවාහන හා කළමනාකරණ කටයුතු සම්බන්ධීකරණය.
- රාජ්‍ය උත්සව සඳහා ගාලු මුවදොර පරිශ්‍රය ලබාගැනීම සඳහා වරාය අධිකාරිය හා සමග සම්බන්ධීකරණය.
- අගනුවර විශේෂිත ස්ථාන වල සිනමාපට, වෙළඳ දැන්වීම් හා ටෙලිනාට්‍ය රූපගත කිරීම් කටයුතු සහ වෙනත් ඡායාරූපගත කිරීම් සඳහා අනුමැතිය ලබා දීම.
- ගාලුමුවදොර පරිශ්‍රය හා ප්‍රදීපස්ථම්භයේ දර්ශන රූපගත කිරීම සඳහා අනුමැතිය ලබාදීම.
- උත්සව හා ඉදිකිරීම් කටයුතු සඳහා (වාර්ෂික බුද්ධ රශ්මි වැඩසටහන/වෙසක්/පොසොන් පොහොය වෙනුවෙන් පැවැත්වෙන වැඩසටහන් සඳහා) හමුදාමය විශේෂඥ දැනුම සහ ශ්‍රම සේවාව ලබා දීම.
- ගුවන් ගමන්/ රැස්වීම් හා වෙනත් අවශ්‍යතාවයන් සම්බන්ධීකරණය කරමින් විදේශීය හමුදා ප්‍රභූණු දූත පිරිස්වල පැමිණීම සම්බන්ධීකරණය.
- ආරක්ෂක නිෂ්කාශණ සහතික නිකුත් කිරීම.
- සැමරුම් උත්සව සඳහා සහාය වීම.
- ආරක්ෂක අමාත්‍යාංශයේ ආරක්ෂක විධිවිධාන පරිපාලනය.
- කොළඹ හා තදාසන්න ප්‍රදේශවල ඇවිදින මංතීරු නඩත්තු කටයුතු පිළිබඳ නිරීක්ෂණය කිරීම හා සම්බන්ධීකරණය.
- අතිගරු ජනාධිපතිතුමාගේ අධි සහයක රාජකාරි කටයුතු හා සාමාජීය/ සිවිල් උත්සව වලට සහභාගිවීමට ආරාධනය ලැබ ඇති ත්‍රිවිධ හමුදා නිළධාරීන් හට අනුමැතිය ලබා දීම.
- ත්‍රිවිධ හමුදා තූර්ය වාදක කණ්ඩායම් ලබා දෙමින් උත්සව පැවැත්වීමට සහය වීම.
- රාජ්‍ය උත්සව වලට සහාය දීම හා සම්බන්ධීකරණය.
- අවශ්‍ය පරිදි හට කණ්ඩායම් ලබා දීම.
- ආරාධනා පත්‍ර සැකසීම ආසන පැණවීම සහ සම්බන්ධීකරණය ආදිය (උදා: විජයග්‍රාහී පෙළපාලිය)
- අතිගරු ජනාධිපතිතුමන්/ ආරක්ෂක ලේකම් විසින් පවරන වෙනත් කාර්යභාරයන්.






## 11.2 2016 වර්ෂයේ කාර්යසාධනය

මුලාරම්භයේ සිට හමුදා සම්බන්ධතා කාර්යාලය ඔස්සේ සම්බන්ධීකරණය වූ සඳහිරු සෑය ඉදිකිරීම් කටයුතු වල ප්‍රගතියක් අත්පත් කර ගෙන ඇති බව එකී ව්‍යාපෘති භූමිය පැමිණෙන්නෙකුට පෙනී යන අතර දළ වශයෙන් සඳහිරු සෑය අඩි 47 දක්වා ප්‍රමාණයක වැඩ නිමවා ඇත.

එමෙන්ම 2016 වර්ෂයේ සඳහිරුසෑය භාරය අරමුදලේ රු. 46,708,560.09 ක ශේෂයක් තිබුණ අතර සඳහිරු සෑයේ ඉදිකිරීම් කටයුතු වෙනුවෙන් රු. 30,858,649.01 ක මුදලක් වැය වී ඇත.



2016 වර්ෂයේදී කොළඹ නගර අලංකාර ඒකකය යටතේ ත්‍රිවිධ හමුදාව සහ සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව සක්‍රියව ක්‍රියාත්මක කර ඇති අතර එය යටතේ පහත සඳහන් මංතීරු නඩත්තු කටයුතු මෙම කාර්යාලයීය අධීක්ෂණය යටතේ සිදුවේ.

- පාර්ලිමේන්තු ක්‍රිඩාංගනය සහ මංතීරුව.
- නාවල තෙත් බිම් උද්‍යානය හා මංතීරුව.
- විහාරමහාදේවි උද්‍යානය සහ මංතීරුව.
- දියත උයන සහ ඒ අවට මංතීරුව.
- නිදහස් චතුරශ්‍රය සහ මංතීරුව.
- කිඹුලවල ඇවිදීමේ මංතීරුව.
- චන්ද්‍රිකා කුමාරතුංග ඇවිදීමේ මංතීරුව.

- බේරේ වැව අවට උද්‍යානය හා ඇවිදීමේ මංතීරුව.
- ගාලුමුවදොර පිටිය මංතීරුව.
- පාවෙන වෙළඳ සංකීර්ණය.
- ගොල්ඩ් මාර්කට් වෙළඳ සංකීර්ණය.



විදේශීය ප්‍රභූන් හා දූත පිරිස් දිවයිනට පැමිණෙන අවස්ථාවන්වලදි වගකීම් තීරයෙහි දක්වා ඇති පරිදි ශ්‍රී ලංකා ගුවන් හමුදා හා එක්ව ගුවන් ගමන් සංවිධානය කිරීම හා සම්බන්ධීකරණය හමුදා සම්බන්ධතා නිළධාරි කාර්යාලය විසින් මනාව ඉටුකර ඇත.

ප්‍රභූ පිරිස් සදහා මුහුදු ගමන් සංවිධානය කිරීම ද ශ්‍රී ලංකා නාවික හමුදාව හා සමග සම්බන්ධීකරණයෙන් ඉටු කරන ලදි. දිවයිනට පැමිණෙන විදේශීය දූත පිරිස් වලට යුධ වාතාවරණයක් පැවැති ප්‍රදේශවල සංචාරය සඳහා ද ශ්‍රී ලංකා යුද හමුදාව හා සමග සම්බන්ධීකරණයෙන් පහසුකම් සලස්වා දෙන ලදි. එසේම දිවයිනට පැමිණෙන විදේශීය මාධ්‍ය ආයතන හා එකි පුද්ගලයින්ට රාජ්‍ය අවශ්‍යතාවය පරිදි ඒ හා සමානම පහසුකම් සලස්වා දෙන ලදි.

රාජ්‍ය තාන්ත්‍රික දූත පිරිස්වල වැඩ සටහන් සඳහා හමුදා සහය ලබා දීම හමුදා සම්බන්ධතා කාර්යාලය විසින් සාර්ථකව ඉටු කර ඇත. මාස දෙකකට වරක් පැවැත්වෙන ආරක්ෂක නිළධාරි රැස්වීම සංවිධානය කිරීම ද වර්ෂය පුරා සාර්ථකව ඉටු කරන ලදි.

ත්‍රිවිධ හමුදාවන්ට අවශ්‍ය වන සීමා කරන ලද භාණ්ඩ ශ්‍රී ලංකා වරායට ළගා වූ වහාම රේගු නිෂ්කාශනය සඳහා ශ්‍රී ලංකා රේගුව හා සමග සම්බන්ධීතරණයෙන් කටයුතු සම්පාදනය කරන ලදි.මේ අනුව අන්තරයාකාරි භාණ්ඩ හා ආනයනය කළ නිල ඇඳුම් රේගුවෙන් ඉවත් කර ගැනීම ගුවන් යානා අමතර කොටස් බෝට්ටු OBMS/IBMS සහ විශේෂ හමුදාමය මෙවලම් ආනයනයද සම්බන්ධීකරණය කරන ලදි.

ආයෝජන මණ්ඩලයෙන් අනුමත වෙළද සමාගම් සහ කර්මාන්ත හා වාණිජ අමාත්‍යාංශයෙන් ලැබෙන ඉල්ලීම් මත වෙස් වෙනස් කළ රෙදිපිළි (Camouflage) ආනයනය නිෂ්පාදනය හා ප්‍රවාහනය සඳහා අනුමැතිය ලබා දෙන ලදි.

ඊට අමතරව,පහත කාර්යයන් වසර තුළ සාර්ථකව නිම කරන ලදි.

- 2016 පෙබරවාරි මස 04 වන දින පැවැති ජාතික නිදහස් දින සමරු උත්සවය සාර්ථකව නිම කිරීම සඳහා අවශ්‍ය සහය ලබා දෙන ලදි.
- සදහිරු සෑය ඉදි කිරීම් කටයුතු සඳහා සිවිල් ආරක්ෂක බලකාය සහ ත්‍රිවිධ හමුදාවේ සහය ලබාදෙන ලද අතර අනෙකුත් අමාත්‍යාංශවල සහයෝගයෙන් මෙම කාර්යය අභිමානයෙන් කරගෙන යනු ලැබේ.
- ජාතික විජයග්‍රාහී දින සැමරුම් උත්සවය වෙනුවට "සංහිඳියාවේ පියසටහන්" නමින් සංස්කෘතික සංදර්ශනයක් පැවැත්වීම සඳහා අවශ්‍ය සහය ලබාදෙන ලදි.
- දිවයිනේ සියලුම ප්‍රදේශ ආවරණය වන පරිදි ආගමික සිද්ධස්ථාන හා පාසල් 100කට වැඩි ප්‍රමාණයකට ත්‍රිවිධ හමුදාවේ ශ්‍රම දායකත්වය ලබාදෙන ලදී.
- ආරක්ෂාවට අදාල කටයුතු සම්බන්ධයෙන් අවශ්‍ය වූ අවස්ථාවල දි ඒ ඒ රටවල තානාපති කාර්යාල හා මහා කොමසාරිස් කාර්යාල හා සමග සම්බන්ධීකරණයෙන් අවශ්‍ය සහාය ලබදෙන ලදි. එකි විදේශ රටවල් සමග පවතින ආරක්ෂක බැදීම් වඩාත් තහවුරු කර ගැනීම සඳහා මෙම සම්බන්ධීකරණය මහත් සේ ඉවහල් විය.
- 2016 වසරේදි පහත විස්තර දැක්වෙන පරිදි විදේශීය නාවික යාත්‍රා වලට කොළඹ සහ ත්‍රිකුණාමලය වරාය වලට පිවිසීම සඳහා රාජ්‍යතාන්ත්‍රික නිෂ්කාශනය සළසා දෙන ලදි.





| අනු අංකය | රට | නැව් සංඛ්‍යාව |
|---|---|---|
| 01 | ඉන්දියාව | 7 |
| 02 | පාකිස්ථානය | 2 |
| 03 | තුර්කිය | 1 |
| 04 | ජපානය | 7 |
| 05 | මාලදිවයින | 1 |
| 06 | රුසියාව | 2 |
| 07 | ප්‍රංශය | 1 |
| 08 | චීනය | 5 |
| 09 | ඕමාන් රාජකීය නාවික හමුදා යාත්‍රා | 4 |
| 10 | බංගලාදේශය | 3 |
| 11 | ඕස්ට්‍රේලියාව | 1 |
| 12 | නයිජීරියාව | 1 |
| 13 | කොරියාව | 1 |
| 14 | දකුණු අප්‍රිකාව | 1 |
| 15 | මැලේසියාව | 1 |
| 16 | බ්‍රිතාන්‍ය | 1 |
| 17 | තායිලන්තය | 1 |
| 18 | ඇමරිකා එක්සත් ජනපද නෞකා | 1 |
| 19 | USS නෞකාව | 3 |

11.1 වගුව: පැමිණි විදේශිය නාවික යාත්‍රා සංඛ්‍යාව

- 2016 වර්ෂය තුළ විදේශිය ගුවන් හමුදා ගුවන් යානා 149 කට ගොඩ බැසීම සඳහා රාජ්‍යතාන්ත්‍රික නිෂ්කාශණය ලබා දෙන ලදි.
- ජාතික ආරක්ෂාවට තර්ජනයක් විය හැකි විෂයයන් හා භාණ්ඩ ආනයනය සුපුරුදු පරිදි 2016 වසරේදිද පාලනය කිරිමට මෙම කාර්යාලය මැදිහත් විය. අවශ්‍ය වන පරිදි කලින් කලට මෙකි පාලන හා වැලැක්විමේ ක්‍රියාදාමය ක්‍රියාවට නංවන ලදි.
- ශ්‍රී ලංකා ආධිපත්‍යයට යටත් ගුවන් හා සමුද්‍ර බලප්‍රදේශයන්හි චර්යානුගත නොවූ යාත්‍රා සැරිසැරීම් කලින් කලට වාර්තා වූ වහාම එකී කටයුතු අධික්ෂණය කිරිමට පියවර ගන්නා ලදි.
- එසේම ඉල්ලිමේ හා අවශ්‍යතාවයේ ස්වභාවය සැලකිල්ලට ගෙන හමුදාමය ගුවන් යානා වලට ගුවන්ගත විමේ අනුමැතිය ලබා දෙන ලදි. අවශ්‍ය වූ අවස්ථාවලදි සිතියම්කරණයට හා ගුවන් ඡායාරූපගතකරණයට ද පහසුකම් සලසා දෙන ලදි.
- 2016 වසරේදි ආරක්ෂක අමාත්‍යාංශය යටතේ ගැනෙන ආයතනවල නිළධාරින් සහභාගි වන රැස්විම් ගණනාවක්ම ආරක්ෂක අමාත්‍යාංශයේදි පවත්වන ලද අතර එකී රැස්විම් සංවිධානය හා සම්බන්ධිකරණයට මෙම කාර්යාලයේ සහය ලබා දෙන ලදි.
- 2016 වසරේදි විවිධ රාජකාරි කටයුතු සඳහා බාහිර ආයතන හා වෙනත් රාජ්‍ය ආයතන සමග සම්බන්ධතා ඇති කර ගැනිමට ත්‍රිවිධ හමුදාවන්ට අවශ්‍ය වූ අවස්ථාවලදි මෙම කාර්යාලයේ සම්බන්ධිකරණයෙන් එකී අවශ්‍යතා සාර්ථකව ඉටු කර ගන්නා ලදි.
- වර්ෂය මුලුල්ලේ හමුදා කාර්යාල පරිශ්‍රයන්ට පිවිසිම සඳහා රාජ්‍යතාන්ත්‍රික හා විදේශිය දූත පිරිස් විසින් කරන ලද ඉල්ලිම් සම්බන්ධිකරණය කරමින් අවශ්‍ය සහය ලබා දෙන ලදි.
- බාහිර රාජ්‍ය ආයතනවලට අනුයුක්තව සිටින ත්‍රිවිධ හමුදා නිළධාරින්ගේ පරිපාලන කටයුතු මෙම කාර්යාලය හරහා සිදු විය. අදාල රාජකාරිවලට බාධාවක් නොවන පරිදි එකී නිළධාරින්ගේ ස්ථාන මාරු හා පත්විම් ආදිය සාර්ථකව සම්බන්ධිකරණය කිරිමට මෙම කාර්යාලය සමත් විය.
- ගාලුමුවදොර පරිශ්‍රයේ පැවැති විවිධ උත්සව සඳහා අනුමැතිය වරාය අධිකාරිය හා සම්බන්ධිකරණයෙන් ලබා දෙන ලදි.
- අතිගරු ජනාධිපතිතුමන් සහභාගි වන ආගමික සැමරුම් හා වෙනත් විශේෂ උත්සව වලට හමුදා සහය ලබා දිම සම්බන්ධිකරණය කෙරිණ.

  උදාහරණ : වෙසක්, පොසොන් උත්සවය, රාජ්‍ය අනුග්‍රහය ලත් ආගමික උත්සව, හමුදා සම්බන්ධතා නිළධාරි කාර්යාලයේ සෙසු නිළයන්ගේ වාර්ෂික චාරිකාව නුවරඑළිය ප්‍රදේශයේදී ද සංවිධානය කිරිම.

## 11.3 අනාගත අපේක්ෂා

ඉදිරි වර්ෂයේදි හමුදාමය සම්බන්ධතා අංශයේ වගකිම යටතේ ගැනෙන ක්ෂේත්‍රයන්හි ආරක්ෂාව ආශ්‍රිත විචක්ෂණ ක්‍රියාදාමයන් සහ වර්තමාන රජයේ මුලාරම්භයන් කෙරෙහි දක්වන සහයෝගය අංශයේ උපරිම මට්ටමින් පැවතිය යුතුව ඇත. ජාතික අවශ්‍යතාවයන් පදනම් කොට ගෙන හමුදාමය සම්බන්ධතා අංශයට පැවරෙන විශේෂ ව්‍යාපෘති හා කාර්යභාරයන් ගෙන සම්බන්ධිකරණය කිරිම අත්‍යවශ්‍යය. ඉහත දක්වන ලද කාර්ය භාරයන්ගේ සාර්ථකත්වය උදෙසා ත්‍රිවිධ හමුදාවන්ගේ සක්‍රිය සම්බන්ධිකරණය අව්‍යාජ වෘත්තිමය පදනමක් මත පවත්වා ගෙන යා යුතු වෙයි. සදහිරු සැයේ ඉදි කිරිම් කටයුතු ත්‍රිවිධ හමුදා සිවිල් ආරක්ෂක බලකාය හා පොදු මහජනතාවගේ සම්බන්ධිකරණයෙන් අඛණ්ඩව කරගෙන යාමට අපේක්ෂා කෙරේ.



# 12. ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී කාර්යාලය

## 12.1 සමාලෝචනය

ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානි කාර්යාලයේ ආරම්භය වර්ෂ 1985 දක්වා දිවෙන අතර, ආරම්භයේදී ඒකාබද්ධ මෙහෙයුම් විධානය ලෙස ස්ථාපනය කරනු ලැබුයේ එවකට සිදුකරනු ලැබූ ක්‍රියාන්විතයන්හි දී ත්‍රිවිධ හමුදාවන් සහ පොලිස් සම්බන්ධීකරණ කටයුතු සිදුකිරීම සඳහාය. වර්ෂ 1999 ජනවාරි මස 04 වන දින ඒකාබද්ධ මෙහෙයුම් කාර්යාංශය පිහිටුවනු ලැබුයේ එවකට පැවති ඒකාබද්ධ මෙහෙයුම් විධානය ප්‍රතිස්ථාපනය කරමින් වන අතර, වර්ෂ 2000 දී කෙටිකලක් පැවති ඒකාබද්ධ මෙහෙයුම් කාර්යාලය යළිත් වරක් ස්ථාපනය කරමින් ඒකාබද්ධ මෙහෙයුම් මූලස්ථානය ලෙස පිහිටුවන ලදී. මානුෂික මෙහෙයුම් අවසානයේ ඒකාබද්ධ මෙහෙයුම් මූලස්ථානයේ පුළුල් කරමින් 2009 අංක 35 දරණ ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානි ගැසට් පත්‍රය මගින් පශ්චාත් යුධමය අභියෝගයන්ට සරිලන ආකාරයට වත්මන් ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානි කාර්යාලය වර්ෂ 2009 ජූලි 15 වන දින ස්ථාපනය කරන ලදී.

ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානි තනතුර වර්තමාන ශ්‍රී ලංකා ත්‍රිවිධ හමුදාවන්ගේ උසස්ම නිලධාරී තනතුර වේ. ඒ අනුව ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානි පත්කිරීම අතිගරු ජනාධිපතිතුමා විසින් සිදුකරනු ලබන අතර, අවස්ථානුකූලව යුධ හමුදාධිපතිවරයා, නාවික හමුදාධිපතිවරයා හෝ ගුවන් හමුදාධිපතිවරයා අතරින් එක් නිලධාරියෙකු ඒ සඳහා පත්කරනු ලබයි. ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානි, ආරක්ෂක විෂයභාර අමාත්‍යාංශයේ ලේකම් වරයාගේ විධානය, අධීක්ෂණය සහ පාලනය යටතේ ක්‍රියාකළ යුතුය .

ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානි කාර්යාලයේ පරමාර්ථය වනුයේ ශ්‍රී ලංකා සන්නද්ධ හමුදාවල ක්‍රමෝපාය පිළිබඳ විධාන සැපයීම සහ සන්නද්ධ හමුදාවල ඒකාබද්ධ නියුක්තිය සඳහා වූ න්‍යායන් වර්ධනය කිරීම.

ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානිගේ වගකීම් පහත සඳහන් පරිදි වේ.

- සන්නද්ධ හමුදාවල ක්‍රමෝපාය පිළිබඳ විධානය සැපයීම සහ ඒකාබද්ධ සේවා නියුක්තිය සඳහා වූ න්‍යායන් වර්ධනය කිරීම.
- සන්නද්ධ හමුදා අතර බුද්ධිමය අංශයන්ට අදාල කර්තව්‍යයන් සම්බන්ධ කාරණා සම්බන්ධීකරණය, සන්නද්ධ හමුදා මෙහෙයුම් වල සහ ඒකාබද්ධ සේවා නියුක්තිය සඳහා වූ සැලසුම් සකස් කිරීම සහ ඒවා ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය කිරීම.
- ක්‍රමෝපාය සැලසුම් වලට අදාලව මුදල් වර්ෂයන් සඳහා සන්නද්ධ හමුදාවල වැඩසටහන්, නිර්දේශ හා අයවැය යෝජනා පිළිගත් ප්‍රමුඛ කරුණු වලට කොතෙක් දුරට අනුකූල වන්නේද යන්න පිළිබඳව උපදෙස් දීම.
- මිනිස් බලය උපකරණවලට අදාලව, සන්නද්ධ හමුදාවල මහා පරිමාණ වැඩසටහන් හා ප්‍රතිපත්ති කොතෙක් දුරට ක්‍රමෝපාය සැලසුම් වලට අනුකූල වන්නේ ද යන්න පිළබඳව උපදෙස් දීම.
- සන්නද්ධ හමුදාවල ඒකාබද්ධ පුහුණුවීම් සඳහා ප්‍රතිපත්ති සැලසුම් කිරීම සහ සන්නද්ධ හමුදා විසින් සාම සාධක මෙහෙයුම් සිදුකිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති සකස් කිරීම.
- යෝජිත ආරක්ෂක ප්‍රසම්පාදන සැලසුම් වලට අනුව යුධමය අවශ්‍යතාවයන් තක්සේරු කිරීම.
- ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානි කාර්යාලය ප්‍රධාන ශාඛාවන් 4 කින් සහ අභ්‍යන්තර පාලන කටයුතු සඳහා පාලන ශාඛාවකින් සමන්විතය. මීට අමතරව ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානි ලේකම් කාර්යාලය වෙතින් ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානිගේ සම්බන්ධීකාරක කටයුතු සිදුකරනු ලබයි.



## 12.2 2016 වර්ෂයේ කාර්යසාධනය

ආයතනයේ මුලා ප්‍රගතිය පිළිබඳ විස්තරය මෙයට ඇමුණුම 'අ' වශයෙන් ඉදිරිපත් කර ඇත.

### 12.2.1 මූලධර්ම හා පුහුණු ශාඛාව

103-01-07-2401 වැය ශීර්ෂය මගින් 2016 වර්ෂය සඳහා ත්‍රිවිධ හමුදා පුද්ගලයින්ගේ පුහුණු කටයුතු සඳහා ප්‍රතිපාදන වශයෙන් රු. 2,000,000.00 ක මුදලක් මෙම කාර්යාලය වෙත ලබාදී ඇත.

- ත්‍රිවිධ හමුදා නිලධාරීන් 27 දෙනෙකු සඳහා Intercontinental Institute of Human Resource Management (IIHRM) ආයතනය මගින් Leadership for Unit Commanders - 01/2016 යන නායකත්ව වැඩමුලුව 2016 පෙබරවාරි 15 දින සිට 2016 පෙබරවාරි 19 දින දක්වා පවත්වන ලද අතර, ඒ සඳහා රු. 339,600.00 ක් වැය කරන ලදී.





- ත්‍රිවිධ හමුදා නිලධාරීන් 30 දෙනෙකු සඳහා ශ්‍රී ලංකා පදනම් ආයතනය වෙතින් Capacity Building Session Advance Programme යන වැඩමුලුව පවත්වන ලද අතර, ඒ සඳහා රු. 150,000.00 ක් වැය කරන ලදී.




- බ්‍රිතාන්‍ය මහ කොමසාරිස් කාර්යාලයේ සම්බන්ධීකාරත්වයෙන් බ්‍රිතාන්‍ය ආරක්ෂක විශ්ව විද්‍යාලය මගින් ත්‍රිවිධ හමුදා නිලධාරීන් 33 දෙනෙකු සඳහා ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලයේදී වැඩමුලුවක් පවත්වන ලදී.
- ආරක්ෂක අමාත්‍යාංශ සහ විදේශ කටයුතු අමාත්‍යාංශ නියෝජිතයින් සහ ත්‍රිවිධ හමුදා උසස් නිලධාරින්ගේ සහභාගිත්වයෙන් ඉන්දියානු ත්‍රිවිධ හමුදා උසස් නිලධාරීන් සමග 2nd Strategic Discussion between Armed Forces of India & Sri Lanka සම්මේලනය 2016.07.13 දින සිට 2016.07.15 දින දක්වා මෙම කාර්යාලයේදී පවත්වන ලදී.
- ඩේවිඩ් පීරිස් ආයතනය මගින් පවත්වනු ලැබූ ත්‍රීරෝද රථ හා යතුරු පැදි පාඨමාලාව සඳහා යුධ හමුදා සහ නාවික හමුදා සෙබලුන් 51 ක් දෙනෙකු සහභාගී වූ අතර, එම පාඨමාලාව 2016.03.29 දින සිට 2016.08.10 දින දක්වා පවත්වන ලදී. ඊට අදාල සහතික පත් ප්‍රධානය 2016.08.30 වන දින පවත්වන ලදී.
- ඇමරිකානු නියෝජිත පිරිසක් සමග ශ්‍රී ලංකා ආරක්ෂක හමුදාවන්හි මානව හිමිකම් සුරැකීම (Leahy Vetting) ක්‍රියාදාමය පිළිබඳ සාකච්ඡාවක් පවත්වන ලදී.
- ත්‍රිවිධ හමුදා නිලධාරීන් සහ එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කොමසාරිස් කාර්යාලය වෙතින් පැමිණි Huma Khan මහත්මිය අතර ත්‍රිවිධ හමුදා පුද්ගලයින් විසින් සාම සාධක රාජකාරියේ යෙදවීමට ප්‍රථම මානව හිමිකම් සුරැකීම පිළිබඳව පැනනැගී ඇති ප්‍රශ්න පිළිබඳව 2016.08.10 දින මෙම කාර්යාලයේදී සාකච්ඡාවක් පවත්වන ලදී.
- මෙම වසර අවසානයේ ශ්‍රී ලංකාවේදී පැවැත්වීමට නියමිත Orientation Module For New Defence Attaches and Civil Servants Involved In International Relations සැබැඳිව මෙම කාර්යාලයට පැමිණි ඔස්ට්‍රේලියානු නියෝජිත පිරිස සමග සාකච්ඡාවක් පවත්වන ලදී.
- ත්‍රිවිධ හමුදා නිලධාරීන් 22 දෙනෙකු සඳහා Intercontinental Institute of Human Resource Management (IIHRM) ආයතනය මගින් Leadership for Unit Commanders - 02/2016 යන නායකත්ව වැඩමුලුව 2016. 09. 05 දින සිට 2016. 09. 09 වන දින දක්වා පවත්වන ලදී.






- ත්‍රිවිධ හමුදා නිලධාරීන් 27 දෙනෙකු සඳහා Intercontinental Institute of Human Resource Management (IIHRM) ආයතනය මගින් Leadership for Unit Commanders - 03/2016 යන නායකත්ව වැඩමුලුව 2016. 10. 31 දින සිට 2016. 11. 04 වන දින දක්වා පවත්වන ලද අතර, ඒ සඳහා පාඨමාලා ගාස්තු වශයෙන් රු. 362,880.00 ක්ද, සහභාගීවූ නිලධාරින්ගේ සංග්‍රහ වියදම්

වශයෙන් රු. 43,100.80 ක්ද, දේශන ශාලා ගාස්තු වශයෙන් රු. 25,000.00 ක්ද වැය කරන ලදී.





- දකුණු සහ අග්නිදිග ආසියානු රටවල් වලින් නියෝජිතයන් 13 දෙනෙකුගේ සහ දේශීය නියෝජිතයන් 13 දෙනෙකුගේ සහභාගීත්වයෙන් ස්විස්ටර්ලන්ත GCSP නියෝජිත පිරිස මගින් Defence Attaché Orientation Course වැඩමුළුව 2016.12.05 දින සිට 2016.12.09 වන දින දක්වා කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයේදී පවත්වන ලදී. මේ සඳහා වු සියලු වියදම් GCSP ආයතනය විසින් සිදු කරන ලද අතර, මෙවැනි වැඩසටහන් පැවැත්වීම සඳහා සහයෝගීතා ගිවිසුමක්ද අත්සන් තබන ලදී.





## 12.2.2 ක්‍රියා සහ සැලසුම් ශාඛාව

- 68 වන නිදහස් දිනය යෙදී තිබූ 2016 පෙබරවාරි 04 දින ඊට අදාල කටයුතු නිසි පරිදි සිදුකරගෙන යාමට ආරක්ෂාව ලබාදීම සඳහා වු ආරක්ෂක උපදෙස් ඇතුලත් “ක්‍රියාන්විත සැලැස්මක්” සකසා ත්‍රිවිධ හමුදාව වෙත 2016.02.01 දින ලබාදීමට කටයුතු කරන ලද අතර, ඊට අදාල ආරක්ෂක කටයුතු නිසි පරිදි සිදුකරන ලදී.

- ආරක්ෂක අමාත්‍යාංශය වෙතින් අනුමැතිය ලබාගත යුතු ආනයනික භාණ්ඩ පිළිබඳව සමාලෝචනය කිරීම සඳහා ත්‍රිවිධ හමුදා, පොලිසිය හා රේගු නිලධාරින්ගෙන් සමන්විත මණ්ඩලයක් පත්කර එම මණ්ඩලයේ නිර්දේශ ආරක්ෂක අමාත්‍යාංශය වෙත ලබාදෙන ලදී.
- හදිසි අවස්ථාවකදී රජයේ රෝහල් සඳහා ත්‍රිවිධ හමුදා හට පිරිස් ලබාදීමේදී ක්‍රියා කලයුතු ආකාරය පිලිබද උපදෙස් ඇතුලත් හදිසි ක්‍රියාකාරී සැලැස්මක් සකසා ත්‍රිවිධ හමුදාව වෙත 2016.03.15 දින ලබාදීමට කටයුතු කරන ලදී.
- ආරක්ෂක අමාත්‍යාංශයේ උපදෙස් පරිදි පහත දක්වා ඇති ස්ථානයන් වෙත ත්‍රිවිධ හමුදා ආරක්ෂාව 2016.03.15 දින සිට 2016.10.20 දින දක්වා ලබාදෙන ලද අතර ඒ සබැදි විස්තර OCDS/G/SY/15(17) හා 2016.03.17 දිනැති මෙම කාර්යාලීය ලිපිය මගින් ආරක්ෂක අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලදී.

| අයත් හමුදාව | ග්‍රිඩ් උප පොලවල් සංඛ්‍යාව | විදුලි බලාගාර සංඛ්‍යාව | ප්‍රාථමික ග්‍රිඩ් උප පොලවල් සංඛ්‍යාව | භට පිරිස් සංඛ්‍යාව |
|---|---|---|---|---|
| යුද්ධ හමුදාව | 44 | 15 | 01 | 10 x 625 |
| නාවික හමුදාව | 05 | 03 | 04 | 12 x 83 |
| ගුවන් හමුදාව | 12 | - | - | 00 x 63 |

12.1 වගුව: ත්‍රිවිධ හමුදා ආරක්ෂාව ලබා දුන් ස්ථාන

- 2016 මැයි දිනය වෙනුවෙන් පැවති දේශපාලන රැලි වලදී ඇතිවිය හැකි තත්වයන් සඳහා ආරක්ෂාව ලබාදීම වස් පොලිස්පති තුමාගේ ඉල්ලීම පරිදි ආරක්ෂක කටයුතු සංවිධානය කිරීම සඳහා ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොලිස් නිලධාරීන්ගේ සහාය 2016.05.01 වන දින පහත පරිදි ලබාදෙන ලදී.

| ස්ථානය | සංඛ්‍යාව |
|---|---|
| බොරැල්ල පොලිසිය | 01 x 30 |
| නාරාහේන්පිට පොලිසිය | 01 x 30 |
| කිරුළපන පොලිසිය | 01 x 30 |

12.2 වගුව: මැයි දිනය වෙනුවෙන් ආරක්ෂාව ලබා දීම්

- දිවයිනේ පැවැති අයහපත් කාලගුණික තත්වයෙන් පීඩාවට පත් ජනතාව වෙත සහන කටයුතු සහ ආපදා කලමණාකරණ කටයුතු සම්බන්ධීකරණය කිරීම සඳහා ආරක්ෂක අමාත්‍යාංශයේ උපදෙස් පරිදි ත්‍රිවිධ හමුදා, පොලිස්, වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව, සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ සහ ආපදා කලමණාකරණ නිලධාරීන්ගෙන් සමන්විත ආපදා කලමණාකරන

ක්‍රියාත්මක මැදිරියක් 2016.05.17 වන දින සිට 2016.05.29 වන දින දක්වා ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානි කාර්යාලය යටතේ ස්ථාපනය කර සියලු ආපදා කලමණාකරන කටයුතු /සහන සේවා කටයුතු සමන්ධීකරණය කරන ලදී.

- බස්නාහිර පළාතේ ඩෙංගු රෝගීන් ප්‍රමාණය සීඝ්‍රයෙන් ඉහල යාම හේතුවෙන් මීගමුව දිස්ත්‍රික් මහ රෝහලේ රෝගීන් 200 ක් නේවාසිකව ප්‍රතිකාර ලබාගත් බැවින් ඔවුන් හට අවශ්‍ය සෞඛ්‍ය සේවා ලබාදීමට ප්‍රමාණවත් හෙද කාර්ය මණ්ඩලයක් නොවූ බැවින් ආරක්ෂක අමාත්‍යාංශයේ උපදෙස් පරිදි 2016.07.01 දින සිට 2016.07.07 දින දක්වා පහත සඳහන් පරිදි ත්‍රිවිධ හමුදා හෙද කාර්ය මණ්ඩලයක් ලබාදීමට කටයුතු කරන ලදී.
    - ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - 10
    - ශ්‍රී ලංකා ගුවන් හමුදාව - 05
    - ශ්‍රී ලංකා නාවික හමුදාව - 05
- ශ්‍රී දළදා මාලිගාවේ ඇසල පෙරහැර මංගල්‍ය 2016.08.08 දින සිට දින 10 ක් පුරා මහනුවර නගරයේ වීදි සංචාරය කරන ලද අතර, ඒ සඳහා ශ්‍රී ලංකා යුද්ධ හමුදාව වෙතින් ක්‍රියාත්මක මැදිරියක් පිහිටුවා ආරක්ෂාව ලබාදීම සම්බන්ධීකරණය කරන ලදී.
- 2016 අගෝස්තු මස පැවති අපොස උසස් පෙළ විභාගයේ ආරක්ෂක කටයුතු සම්පාදනය ආරක්ෂක අමාත්‍යාංශයේ උපදෙස් පරිදි මෙම කාර්යාලය වෙතින් සම්බන්ධීකරණය කරන ලදී.
- තිස්සමහාරාම මූලික රෝහලේ සුළු සේවා කාර්ය මණ්ඩලයේ වැඩ වර්ජනය හේතුවෙන් අදාල රෝහල් කටයුතු පවත්වා ගෙන යාම සඳහා යුද්ධ හමුදාව වෙතින් 10 දෙනෙකුගෙන් සමන්විත භට පිරිසක් අදාල රෝහල වෙත ලබාදීමට කටයුතු කිරීම.
- අ.පො.ස (උ.පෙළ) විභාගය, අ.පො.ස (සා.පෙළ) විභාගය සහ 5 ශ්‍රේණිය විභාගය පැවැත්වීම සඳහා ත්‍රිවිධ හමුදාව මගින් ආරක්ෂාව ලබාදීමට කටයුතු කරන ලදී.
- මීගමුව දිස්ත්‍රික් රෝහලේ ඩෙංගු රෝගීන් ප්‍රමාණය සීඝ්‍රයෙන් ඉහළ යාම හේතුවෙන් ඇති වූ හෙද අවශ්‍යතාවය සඳහා ත්‍රිවිධ හමුදා වෙතින් හෙද කාර්ය මණ්ඩලයක් 2016.12.23 දින සිට අදාල රෝහළ වෙත ලබාදීමට කටයුතු කල අතර, ඩෙංගු රෝගීන්ගේ ප්‍රමාණය අවම වන තෙක් එම හෙද කාර්ය මණ්ඩලය රඳවන ලදි.
- 2016.12.01 දින මධ්‍යම රාත්‍රියේ සිට ක්‍රියාත්මක කල පෞද්ගලික බස් රථ වර්ජනයට සහාය නොදෙන එමෙන්ම ධාවනය කිරීමට කැමැත්තක් දක්වන පෞද්ගලික බස් රථ හි සේවාවන් පවත්වාගෙන යාම සඳහා ත්‍රිවිධ හමුදාව වෙතින් ඇවැසි ආරක්ෂාව ලබාදීම සම්බන්ධීකරණය කරන ලදී.
- උතුරු මැද පළාත් ගිලන් රථ රියදුරන්ගේ වර්ජනය හේතුවෙන් අවශ්‍ය සේවාවන් පවත්වාගෙන යාම සඳහා ත්‍රිවිධ හමුදාව වෙතින් රියදුරන් /රිය සහායකයින් ලබාදීම.
- උතුරු මැද පළාත් ගිලන් රථ රියදුරන්ගේ වර්ජනය හේතුවෙන් අදාල සේවාවන් පවත්වාගෙන යාම එම ගිලන් රථ වල ගමන් කිරීමට ත්‍රිවිධ හමුදාව වෙතින් හෙද සහායකයින් ලබාදෙන ලදි.
- ගාළු මුවදොර පිටියේ පැවැත් වූ නත්තල් සැණකෙලිය සඳහා 2016.12.23 දින සිට 2017.01.01 වන දින දක්වා සැණකෙලි භූමියේ ආරක්ෂාව තහවුරු කිරීම පිණිස ත්‍රිවිධ හමුදා පොලිස් භට පිරිස් ආරක්ෂාව ලබාදීම සම්බන්ධීකරණය කරන ලදී.

### 12.2.3 නාවික හා ගුවන් මෙහෙයුම් ශාඛාව

- යුද්ධ හමුදාවේ 9 ශ්‍රීලකාභ සහ 10 ශ්‍රීලකාභ ඒකකයන්ට අයත් භාවිච්චියට නුසුදුසු පතුරම් වෙඩි ද්‍රව්‍ය කි.ග්‍රෑ 37646.25 ක පමණ ප්‍රමාණයක් ගැඹුරු මුහුදේ ගිල්වා දැමීම සඳහා 2016.02.05 දින අනුමැතිය ලබාදෙන ලදී.
- ආපදා කළමණාකරණ මධ්‍යස්ථානයේ ඉල්ලීම පරිදි 2016.03.16 දින පුත්තලම දිස්තික්කයේ රෝහල් පද්ධතිය තුල ඇතිවිය හැකි හදිසි ගිනිගැනීම් වලදී එයට මුහුණ දෙන ආකාරය හා ගතයුතු ක්‍රියා මාර්ගයන් පිලිබඳව රෝහල් කාර්ය මණ්ඩලය වෙත දැනුවත් කිරීමේ වැඩසටහනක් ගුවන් හමුදා ගිනි නිවීම් අංශය මගින් පැවැත්වීම සම්බන්ධීකරණය කරන ලදී.
- 2016.03.03 දින ආපදා කලමණාකරණ මධ්‍යස්ථානයේ ස්ථාපිත ත්‍රිවිධ හමුදා සම්බන්ධීකරණ කාර්යාලයේ රාජකාරී සඳහා ත්‍රිවිධ හමුදාවට අයත් භට පිරිස් ලබාදීම සඳහා කටයුතු සම්බන්ධීකරණය කරන ලදි.
- 2016 මාර්තු මාසය තුලදී කලුතර හා මාතර දිස්ත්‍රික්කයන්හි ඇතිවූ අධික වියලි සහිත කාලගුණය හේතුවෙන් පීඩාවට පත් ජනතාවට පානීය ජලය ලබාදීම සඳහා යුධ හමුදාව සහ නාවික හමුදාවට අයත් ජල බවුසර් යොදවා පානීය ජලය ලබාදීමට කටයුතු කරන ලදි.
- 2016 අප්‍රේල් මාසය තුලදී යුධ හමුදාව වෙතින් යොදවා ඇති සෙවීම් හා මුදවා ගැනීම් කණ්ඩායම් සඳහා ප්‍රථමාධාර, සෙවීම් හා මුදවා ගැනීම් පිලිබඳ සහතික පත්‍ර පාඨමාලාව පැවැත්වීම සඳහා ආපදා කලමණාකරණ මධ්‍යස්ථානය සමග සම්බන්ධීකරණ කටයුතු කරන ලදී.
- 2016.05.16 වන දින සිට දිවයින පුරා ඇති වූ අයහපත් කාලගුණ හේතුවෙන් ගංවතුර සහ නායයෑම් හා හදිසි ආපදා අවස්ථාවන්හිදී පීඩාවට පත්වූවන්ගේ ජීවිත බේරාගැනීම / පීඩාවට පත්

ජනතාව වෙනුවෙන් සහන සැලසීම සඳහා ත්‍රිවිධ හමුදාව පහත සඳහන් පරිදි යොදවන ලදී.

- යුධ හමුදාව :- 14574
- නාවික හමුදාව :- 3031
- යෙදවූ යාත්‍රා සංඛ්‍යාව :- 424
- ගුවන් හමුදාව :- 1174
- ගුවන් ගමන්වාර :- 43



- ලැව්ගිනි සහ සුලු ගංවතුර අවස්ථාවලදී ගලවා ගැනීම් සහ බේරාගැනීමේ මෙහෙයුම් සඳහා ත්‍රිවිධ හමුදා හය පිරිස් ආපදා කලමණාකරණ මධ්‍යස්ථානයේ සහ වෙනත් සිවිල් ආයතනවල සහය සඳහා සම්බන්ධීකරණ කටයුතු සිදුකිරීම.
- 2016.01.01 දින සිට ආමාත්‍යා වෙතින් නියමුවන් රහිත යානා ක්‍රියාකරවීම පිළිබද අනුමැතිය ලබාදීමට අයදුම්කරුවන් 319 දෙනෙකු ඉල්ලුම්කල අතර, එම සියලුම අයදුම්කරුවන් සඳහා අනුමැතිය ලබා දීම.
- ජාතික ඩෙංගු මර්ධන වැඩසටහන සඳහා ත්‍රිවිධ හමුදාව පොලිසිය සහ සිවිල් ආරක්ෂක දෙපාතීමේන්තු හට පිරිස් වල සහය ලබාදීම් සම්බන්ධීකරණය කල අතර, ඒ පිළිබද විස්තර පහත සඳහන් පරිදි වේ.




**ත්‍රිවිධ හමුදාව සහ සිවිල් ආරක්ෂක සාමාජිකයින්ගේ සහභාගිත්වය - 77,864**

12.1 ප්‍රස්ථාරය: ත්‍රිවිධ හමුදාව සහ සිවිල් ආරක්ෂක හමුදා සාමාජිකයින් සහභාගි කරවීම - 2016




**පරීක්ෂා කරන ලද ස්ථාන ප්‍රමාණය - 20,93632**

12.2 ප්‍රස්ථාරය: ඩෙංගු මර්ධන වැඩසටහන - 2016

- ශ්‍රී ලංකාව වටා ඇති මුහුදු තීරයේ මුහුදු ක්ෂීරපායි සතුන් නිරීක්ෂණය කිරීම මුහුද යට ජායාරූප ගැනීම සමුද්‍රීය විද්‍යාත්මකව පරීක්ෂණය හා මුහුදු ජල ක්‍රීඩා යන විවිධ ක්‍රියාවන් නිසිපරිදි ක්‍රියාත්මක කිරීම සඳහා නිසි ප්‍රතිපත්තියක් සකස් කිරීමට ආරක්ෂක අමාත්‍යාංශය විසින් ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානි කාර්යාලය වෙත පවරන ලද අතර, එම කාර්යන් සඳහා ඍජුවම සම්බන්ධ වන ආයතනවල සහභාගීත්වයෙන් 2013 මැයි 13 වන දින මෙම කාර්යාලීය ශ්‍රවණාගාරයේදී සාකච්ඡාවක් පවත්වන ලදී. එහි දෙවන සාකච්ජාව 2016 සැප්තැම්බර් 22 වන දින පැවැත්වූ අතර, එහිදී සාකච්ජා වූ ප්‍රධාන කරුණු අනුව ලංකා නාවික හමුදාව සහ ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව විසින් කරන ලද යෝජනා අනුව කෙටුම්පතක් සකස් කරන ලදී. එම සකසන ලද කෙටුම්පත ඒ සඳහා සහභාගි වූ ආයතන වල කොටස් කරුවන් වෙත 2016 නොවැම්බර් 23 වන දින ලබාදුන් අතර, ඔවුන්ගේ එකගත්වය ලැබීමෙන් පසු නිසි කටයුතු සඳහා ආරක්ෂක අමාත්‍යාංශය වෙත ලබාදීමට සුදානම් කර ඇත.
- බස්නාහිර පළාත තුල ඉදි කිරීමට යෝජිත තට්ටු ගොඩනැගිලි සඳහා එම කොන්ත්‍රාත් සමාගම් විසින් ආරක්ෂක අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරනු ලබන ලිපි මෙම කාර්යාලය වෙත ලබාදීමෙන් පසු ත්‍රිවිධ හමුදාවේ ආරක්ෂක නිෂ්කාශණයන් ලබා ගැනීමෙන් අනතුරුව ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානි කාර්යාලයේ නිර්දේශයන් සමග නිසි කටයුතු සඳහා නැවත ආරක්ෂක අමාත්‍යාංශය වෙත යවනු ලබයි.

## 12.2.4 සම්බන්ධීකරණ ශාඛාව

- 2016 පෙබරවාරි මස 04 වන දින නිදහස් සැමරුම් උත්සවය ත්‍රිවිධ හමුදාව,පොලීසිය,සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව, ජාතික ශිෂ්‍යභට බලකාය සහ අනෙකුත් රාජ්‍ය ආයතන සමග සම්බන්ධීකරණය කර නිසියාකාරව පැවැත්වීමට කටයුතු කරන ලදී.
- රණවිරු සේවා අධිකාරිය සහ ත්‍රිවිධ හමුදාවේ සහභාගිත්වයෙන් පාර්ලිමේන්තු පිටියේදී පවත්වන ලද ජාතික රණවිරු සැමරුම් උළෙලට

අවශ්‍යතාවයන් ලබාදීම සඳහා සම්බන්ධීකරණ කිරීම සිදු කරන ලදි.

- රණජයපුර නිවාස සංකීර්ණයේ පුස්තකාලයේ වහලය සහ පාසල් කාමර 2 ක් අලුත්වැඩියා කටයුතු සඳහා ආරක්ෂක අමාත්‍යාංශ වෙතින් රු 344,150.72 ක මුදලක් ලබාගෙන නාවික හමුදාව වෙත භාරදීමට සම්බන්ධීකරණ කටයුතු සිදු කරන ලදි .
- රණජයපුර නිවාස සංකීර්ණයේ පිහිටි විද්‍යාලයෙහි පංති කාමර 2ක් සහ පුස්තකාලයක් සහිත ගොඩනැගිල්ලක් ඉදිකිරීමට රාජ්‍ය නොවන සංවිධානයක් (Room to Read) මගින් රු. 2,309,455.81 ක මුදලක් කොටස් වශයෙන් ලබා ගැනීමට එම විද්‍යාලයේ විදුහල්පති විසින් ඉදිරිපත් කල ඉල්ලීම ආරක්ෂක අමාත්‍යාංශය සමග සම්බන්ධීකරණය කල අතර, ඒ සඳහා අනුමැතිය ආරක්ෂක අමාත්‍යාංශය විසින් ලබා දෙන ලදී.
- ආරක්ෂක අමාත්‍යාංශයේ අනුමැතිය මත ත්‍රිවිධ හමුදාව සහ සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ සාමාජිකයින්ගේ සහාය මත පහත සඳහන් සම්බන්ධීකරණ කටයුතු කරන ලදී.
    - රාජ්‍ය වෙසක් උත්සව හා අනෙකුත් ආගමික උත්සව සඳහා ත්‍රිවිධ හමුදාව සහ සිවිල් ආරක්ෂක බලකාය සහභාගිත්වය ලබාදීමට සම්බන්ධීකරණ කටයුතු කිරීම.
    - 2016.07.23 වන දින පවත්වන්නට යෙදුන අනුරාධපුර පිච්චමල් පූජාව සඳහා ත්‍රිවිධ හමුදාව සහ සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව වෙතින් සහාය ලබාදීම සඳහා අදාල කටයුතු සම්බන්ධීකරණ කිරීම.
    - ප්‍රධාන පෙළේ පාසැල් වෙතින් සංවිධානය කරනු ලබන අධ්‍යාපනික ප්‍රදර්ශනයන්ට සමගාමීව ත්‍රිවිධ හමුදා ප්‍රදර්ශන කුටි ස්ථාපිත කිරීමට කටයුතු සංවිධානය කිරීම.
    - සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් ත්‍රිවිධ හමුදා සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂකවරුන් සඳහා ඩෙංගු උණ/ ඩෙංගු රක්තපාත සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ වැඩසටහන සඳහා මෙම කාර්යාලය වෙතින් පහසුකම් සපයා දීම.
    - අපවත්වී වදාල සියම් මහ නිකායේ අස්ගිරි පාර්ශවයේ මහා නායක අති පූජ්‍ය ගලගම ශ්‍රී අත්තදස්සි මහ නාහිමියන්ගේ අවසන් කටයුතු 2016.03.13 මහනුවර අස්ගිරිය පොලිස් ක්‍රීඩාංගණයේදී පූර්ණ රාජ්‍ය ගෞරව සහිතව සිදුකිරීමට අවශ්‍ය ත්‍රිවිධ හමුදා සහාය ලබාදීම.
    - 2016.04.02 දින කොළඹ යශෝධරා විද්‍යාලයේ පැවති ලෝක ළමා දින වැඩසටහනක් සඳහා ත්‍රිවිධ හමුදා සහාය ලබාදීම.
    - 2016.04.02 සහ 03 දිනයන්හි ශ්‍රී පාදස්ථානයේ ශ්‍රමදාන වැඩසටහන සඳහා යුද්ධ හමුදාවේ සහාය ලබාදීම.
    - දිවංගත ලලිත් ඇතුලත්මුදලි මහතාගේ 23 වැනි ගුණානුස්මරණය වෙනුවෙන් 2016.04.29 වන දින ලලිත් ඇතුලත්මුදලි පදනම මගින් සංවිධානය කරන ලේ දන්දීමේ වැඩසටහන සඳහා ත්‍රිවිධ හමුදා සහාය ලබාදීම.
    - 2016.04.07 දින බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ පැවති සිරිමාවෝ බණ්ඩාරනායක මැතිණියගේ ජන්ම දිනය සැමරීම සඳහා ත්‍රිවිධ හමුදා සහාය ලබාදීම.
    - අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ නිලධාරින්ගේ සහාය ඇතිව මෙම කාර්යාලයේ නිලධාරීන්, සෙසුනිලයින් සහ සිවිල් සේවක මහතුන් සඳහා ආන්තරායකර ඖෂධ භාවිතයෙන් වැළකීම සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ වැඩසටහනක් පැවැත්වීමට කටයුතු කිරීම.
    - පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ උපාධිධාරීන් විසින් නැගෙනහිර සිට බටහිර වෙරළ තීරය දක්වා සිදුකරන ලද වෙරළ පා ගමන සඳහා ත්‍රිවිධ හමුදා සහය ලබා දීම.
    - 42 වැනි ජාතික මහා ක්‍රීඩා උළෙල - 2016 සමාරම්භක සහ සාමාප්ති උත්සව සඳහා ත්‍රිවිධ හමුදා සංස්කෘතික කණ්ඩායම් වල සේවය ලබාදීම සඳහා කටයුතු සංවිධානය කිරීම.
    - Colours of Courage Trust වෙතින් සංවිධානය කරනු ලබන දෙවුන්දර තුඩුවේ සිට පේදුරුතුඩුව දක්වා දින 28 කින් යුත් පාගමන සඳහා ත්‍රිවිධ හමුදා සහය ලබාදීමට කටයුතු කිරීම.
    - සන්නද්ධ හමුදා පොපි මල් සැමරුම වෙනුවෙන් 2016.09.24 වන දින පවත්වන ලද පා ගමන සඳහා අවශ්‍යතාවයන් සහ සේවාවන් ත්‍රිවිධ හමුදා වෙතින් ලබාදීමට කටයුතු කිරීම.
    - රාගම ශික්ෂණ රෝහලේ නවීකරණ හා ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කිරීම සඳහා ත්‍රිවිධ හමුදාවේ දායකත්වය ලබාදීම.
    - කැළණි විශ්ව විද්‍යාලයේ 25 වෙනි සංවත්සරය වෙනුවෙන් පැවැති වෛද්‍ය ප්‍රදර්ශණය සඳහා ත්‍රිවිධ හමුදාව වෙතින් සේවා අවශ්‍යතා ලබාදීම.
    - අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී 2016.10.27 දින පැවැති වීර ක්‍රියා සම්මාන ප්‍රධාන උත්සවයේ සියලුම කටයුතු සඳහා ත්‍රිවිධ හමුදා හට පිරිස් දායකත්වය ලබාදීම.
    - 2016.11.04 දින 'ආර්යා' පදනම මගින් සංවිධානය කරන ලද කොකාවිල් කෘතිය එළි දැක්වීම සඳහා ත්‍රිවිධ හමුදා හට පිරිස් දායකත්වය ලබාදීම.
    - කෑගල්ල දිස්ත්‍රික් ආපදාවට පත්වූවන් වෙනුවෙන් නව නිවාස ඉදිකිරීම සඳහා ත්‍රිවිධ හමුදා සහ සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ ශ්‍රම දායකත්වය ලබාදීම.
    - 2016.10.07 වන දින සෝමාවතී පූද බිමේදී බෝධි පූජා පිංකම සඳහා ත්‍රිවිධ හමුදා හට පිරිස් සහභාගීත්වය ලබාදීමට සම්බන්ධීකරණ කටයුතු සිදුකිරීම.

- දකුණු ආසියා ජල ශූරතා තරගාවලිය සඳහා යුද්ධ හමුදා සහ නාවික හමුදා සහයෝගය ලබාදීම.
- 2016.10.28 දින රුක්මණී දේවි සැමරුම වෙනුවෙන් ප්‍රසංගය නැරඹීම සඳහා ත්‍රිවිධ හමුදා ආබාධිත රණවිරුවන් සහභාගී කරවීම.
- මියගිය පණ්ඩිත් ඩබ්.ඩී අමරදේවයන්ගේ අවසන් කටයුතු 2016.11.05 වන දින නිදහස් චතුරශ්‍රයේදී පූර්ණ රාජ්‍ය ගෞරව සහිතව සිදුකිරීමට අවශ්‍ය ත්‍රිවිධ හමුදා සහාය ලබාදීම.
- 2016.10.13 දින ජාතික දියවැඩියා දිනය වෙනුවෙන් ත්‍රිවිධ හමුදා සහ සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ සහය ලබාදීම.
- 2017.01.21 ගාල්ල උඩුගම ශ්‍රී ශාසනාලංකාර පුරාණ විහාරස්ථානයේ පෙරහැර සඳහා ත්‍රිවිධ හමුදා සහභාගීත්වය ලබාදීම.
- වනරෝපා වැඩසටහනට පැමිණෙන පිරිසට ආහාරපාන පිසීම සඳහා හමුදා භටපිරිස් වල සහයෝගය ලබාදීම.
- 2017.01.08 දින ජාතික සම්මාන ප්‍රදාන උත්සවය සඳහා ත්‍රිවිධ හමුදා තූර්ය වාදන කණ්ඩායම් ලබාදීම.
- 2017 එක්සත් ජාතීන්ගේ වෙසක් දින උළෙල සහ ජාත්‍යන්තර සමුළුව වෙනුවෙන් ත්‍රිවිධ හමුදාව නියෝජනය වන පරිදි අධීක්ෂණ නිලධාරින් පත්කිරීම.
- 2016.12.04 දින තුරග තරග පිටියේ පැල රෝපණය සඳහා ත්‍රිවිධ හමුදා සහ සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ සහාය ලබාදීම.
- දියගම ත්‍රිවිධ හමුදා කෞතුකාගාරය ඉදිකිරීම සඳහා අක්කර 10 ක භූමි ප්‍රමාණයක් වෙන්කර ගැනීමට කටයුතු සිදුකර ඇති අතර, මෙම ඉදිකිරීම් කටයුතු සඳහා රුපියල් මිලියන 650 ක මුදලක් ඇස්තමේන්තු ගත කර ඇත.
- දියගම කෞතුකාගාරය ඉදිරිකිරීම් කටයුතු සඳහා ආරක්ෂක අමාත්‍යාංශය මගින් මුදල් වෙන් කිරීම සඳහා කැබිනට් අනුමැතිය ලබා ගැනීමට අදාල ව්‍යාපෘති වාර්තාව ආරක්ෂක අමාත්‍යාංශය වෙත ලබා දී ඇත.

### 12.2.5 විදේශීය ප්‍රභූවරුන් සහ රාජ්‍ය අමුත්තන්ගේ පැමිණීම

- ඕස්ට්‍රේලියානු මහකොමසාරිස් Robin Mudie මහත්මිය සහ ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානි අතර හමුව 2016 ජනවාරි මස 11 වන දින පවත්වන ලදි.
- ඉරාන තානාපති Mohammad Zaeri Amirani මහතා සහ ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානි අතර හමුව 2016 පෙබරවාරි මස 18 වන දින පවත්වන ලදි.
- ස්විස්ටර්ලන්ත ආරක්ෂක උපදේශක කර්නල් Christof Gertsch සහ ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානි අතර හමුව 2016 පෙබරවාරි මස 25 වන දින පවත්වන ලදි.



- ඕස්ට්‍රේලියානු මහකොමසාරිස් Bryce Hutchesson මහතා සහ ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානි අතර හමුව 2016 මාර්තු මස 03 වන දින පවත්වන ලදි.
- Christian Buhlmann මහතා ප්‍රමුඛ ආරක්ෂක ප්‍රතිපත්ති සබැදි ජිනීවා මධ්‍යස්ථානයේ දූත පිරිස සහ ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානි අතර හමුව 2016 මාර්තු මස 10 වන දින පවත්වන ලදි.
- සර් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයේ උපකුලපති රියර් අද්මිරාල් ජගත් රණසිංහ සහ ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානි අතර හමුව 2016 මාර්තු මස 15 වන දින පවත්වන ලදි.
- ඇමරිකා එක්සත් ජනපදයේ 07 වන නාවික බලඇණි අණදෙන නිලධාරි වයිස් අද්මිරාල් Aucoin සහ ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානි අතර හමුව 2016 මාර්තු මස 28 වන දින පවත්වන ලදි.
- හිටපු පොලිස්පති එන්කේ ඉලංගකෝන් මහතා සහ ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානි අතර හමුව 2016 අප්‍රේල් මස 08 වන දින පවත්වන ලදි.
- රාජකීය තායි සන්නද්ධ හමුදා ආරක්ෂක ප්‍රධානි ජෙනරල් Sommai Kaotira ඇතුලු 7 දෙනෙකුගෙන් සමන්විත නියෝජිත පිරිස සහ ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානි අතර හමුව 2016 අප්‍රෙල් මස 27 වන දින පවත්වන ලදි.
- ජපන් තානාපති Kenichi Suganuma සහ ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානි අතර හමුව 2016 මැයි මස 16 වන දින පවත්වන ලදි.



- ඊශ්‍රායල් ආරක්ෂක අමාත්‍යාංශයේ ආරක්ෂක කටයුතු පිළිබඳ උපදේශක සහ ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානි අතර හමුව 2016 ජුනි මස 14 වන දින පවත්වන ලදි.
- ජපන් ආරක්ෂක උපදේශක Atsuhiro Morore සහ ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානි අතර හමුව 2016 අගෝස්තු මස 18 වන දින පවත්වන ලදි.

- ඉන්දීය වෙරලාරක්ෂක අධ්‍යක්ෂ ජෙනරාල් Rajendra Singh PTM, TM සහ ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානි අතර හමුව 2016 අගෝස්තු මස 19 වන දින පවත්වන ලදි.



- නේපාල් ජාතික ශිෂ්‍ය හඨ බලකායේ අධ්‍යක්ෂ ජෙනරාල් මේජර් ජෙනරාල් Ramindra Chetri, සහ ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානි අතර හමුව 2016 ඔක්තෝබර් මස 21 වන දින පවත්වන ලදි.
- ස්විස්ටර්ලන්ත තානාපති අතිගරු Heinz Walker Nederkoorn මහතා සහ ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානි අතර හමුව 2016 ඔක්තෝබර් මස 26 වන දින පවත්වන ලදි.
- මාලදිවයිනේ ජාතික ආරක්ෂක බලකා ප්‍රධානි මේජර් ජෙනරාල් Ahemd Shiyam සහ ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානි අතර හමුව 2016 නොවැම්බර් මස 07 වන දින පවත්වන ලදි.
- ෆීජී රජයේ සන්නද්ධ හමුදා ජනරජයේ නියෝජ්‍ය ආඥාපති බ්‍රිගේඩියර් ජෙනරාල් (ආචාර්ය) Aziz Mohammed සහ ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානි අතර හමුව 2016 නොවැම්බර් මස 16 වන දින පවත්වන ලදි.



- ඉන්දීය නාවික හමුදාවේ නාවික මාණ්ඩලික ප්‍රධානි අද්මිරාල් Sunil Lanba සහ ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානි අතර හමුව 2016 නොවැම්බර් මස 29 වන දින පවත්වන ලදි.



- ප්‍රංශ ඒකාබද්ධ හමුදාවේ නාවික මාණ්ඩලික ප්‍රධානි රියර් අද්මිරාල් Didier Platon සහ ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානි අතර හමුව 2016 නොවැම්බර් මස 29 වන දින පවත්වන ලදි.
- පහත සඳහන් කරුණු සඳහා ත්‍රිවිධ හමුදා සාමාජිකයින්ගෙන් සැදුම්ලත් මණ්ඩල පත්කර අවශ්‍ය නිර්දේශ ආරක්ෂක අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කිරීමට කටයුතුකර ඇත.
    - ත්‍රිවිධ හමුදා ස්වේච්ඡා බල සේනාවන්හි පුද්ගලයින් සඳහා ප්‍රසංශනීය සේවා පදක්කම ප්‍රධානය කිරීම සඳහා ක්‍රමවේදයක් සකස්කර ආරක්ෂක අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරන ලදි.
    - ත්‍රිවිධ හමුදා තූර්ය වාදක කණ්ඩායම් හා සංස්කෘතික කණ්ඩායම් වල සේවය ලබාදීමේදී අනුගමනය කලයුතු ප්‍රතිපත්තිමය ක්‍රමවේදයක් පිළියෙල කර ආරක්ෂක අමාත්‍යාංශයේ අනුමැතිය ලබාගත් අතර එම ක්‍රමවේදයන් ක්‍රියාවට නැංවීම සඳහා ත්‍රිවිධ හමුදාව වෙත ඉදිරිපත් කර ඇත.
    - ත්‍රිවිධ හමුදාවන්හි මානව සම්පත ජාතික සංවර්ධනයට යොදා ගැනීම සඳහා අනුගමනය කල යුතු ප්‍රතිපත්තිමය ක්‍රමවේදයක් ත්‍රිවිධ හමුදා ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගෙන් සැදුම්ලත් මණ්ඩලයේ වාර්තාව ආරක්ෂක අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරන ලදි.
    - අධිකාරිලත් සන්නද්ධ හමුදා නිලධාරීන් සඳහා ගෙවනු ලබන විධායක දීමනාව ලබාදීම සම්බන්ධයෙන් වාර්තාවක් ආරක්ෂක අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරන ලදි.
    - ආරක්ෂක ප්‍රතිපත්තියක් සම්පාදන කර ආරක්ෂක අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කිරීමට මූලික සැලසුම් කරන ලදි.
    - විදේශ පශ්චාත් උපාධි ලබාගත් ත්‍රිවිධ හමුදා වෛද්‍ය නිලධාරීන් විශේෂඥවරු ලෙස පිළිගැනීමක් ලබාදීම සඳහා ත්‍රිවිධ හමුදා ජ්‍යෙෂ්ඨ වෛද්‍ය නිලධාරීන්ගෙන් සැදුම්ලත් මණ්ඩල වාර්තාව ආරක්ෂක අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරන ලදි.
    - ත්‍රිවිධ හමුදා ජ්‍යෙෂ්ඨ නිලධාරීන් නියෝජ්‍ය තානාපති (Deputy Ambassador) නියෝජ්‍ය මෙහෙයුම් ප්‍රධානි (Deputy Chief of Missions)

වැනි තනතුරු වල රාජ්‍ය තාන්ත්‍රික රාජකාරි කිරීමෙන් අනතුරුව එම නිළධාරීන් වෙත විදේශ සේවා පදක්කම පිරිනැමීමේ වාර්තාව ආරක්ෂක අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරන ලදි.

- ක්‍රියාන්විතයේදී ත්‍රස්තවාදී ප්‍රහාරවලින් මිය ගිය රණවිරුවන්ගේ යැපෙන්නන්හට අමප/1982/305 (09) හා 1982.07.28 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව වයස අවු 55 දක්වා ගෙවන වැටුප වයස අවු 60 දක්වා ගෙවීමට යෝජිත ගෙවීම් වාර්තාව ආරක්ෂක අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරන ලදී.

- පහත සඳහන් එක් එක් විෂයන් සඳහා මණ්ඩල පත්කිරීම සහ අදහස්/යෝජනා ආරක්ෂක අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කිරීමට නියමිතව ඇත.
  - දියගම කෞතුකාගාරය ඉදිරිකිරීම් කටයුතු සඳහා ත්‍රිවිධ හමුදා ජ්‍යෙෂ්ඨ නිලධාරින්ගෙන් සැදුම්ලත් මණ්ඩලයක් පත් කරන ලදි.
  - ජාතික ආරක්ෂක විශ්ව විද්‍යාලයක් ස්ථාපිත කිරීම සඳහා කරුණු සලකා බැලීමට ත්‍රිවිධ හමුදා මණ්ඩලයක් පත්කරන ලදී.
  - විදේශ සන්නද්ධ හමුදා සාමාජිකයින්ගේ අධ්‍යයන සංචාර පහත සඳහන් පරිදි වන අතර, එම කටයුතු සම්බන්ධීකරණය කිරීමට කටයුතු කරන ලදි.
  - පකිස්තාන් ජාතික ආරක්ෂක විශ්ව විද්‍යාලයේ සාමාජිකයින් 19 දෙනෙකුගෙන් සමන්විත අධ්‍යයන සංචාරය 2016.04.26 දින මෙම කාර්යාලය වෙත පැමිණෙන ලදි.
  - ටැන්සානියා ජාතික ආරක්ෂක විද්‍යාලයේ සාමාජිකයින් 16 දෙනෙකුගෙන් සමන්විත අධ්‍යයන සංචාරය 2016.07.01 දින මෙම කාර්යාලය වෙත පැමිණෙන ලදි.
  - ඉන්දියාව සහ ශ්‍රී ලංකා සන්නද්ධ හමුදාවන් අතර යුද්ධ උපාය සම්බන්ධයෙන් වූ සාකච්ඡාවක් 2016 ජූලි මස 13 වන දින සිට 15 වන දින දක්වා පවත්වන ලදී.
  - මහජන චීන සමූහ ජනරජයේ ආරක්ෂක විශ්ව විද්‍යාලයේ (NDU) අධ්‍යයන සංචාරක දූත පිරිස සහ ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානි අතර හමුව 2016 දෙසැම්බර් මස 08 වන දින පවත්වන ලදි.

## 12.3 ගැටළු හා අභියෝග

- දැනට OCDS BMICH හි 5 කොටසෙහි පවත්වාගෙන යන අතර කාර්යාලීය ඉඩ පහසුකම් ප්‍රමාණවත් නොවීම හා කාර්ය මණ්ඩලය සඳහා නවාතැන් පහසුකම් නොවීම.
- BMICH හි වෙනත් උත්සව ආදිය පැවැත්වෙන බැවින් විදේශීය ප්‍රභූවරුන් සහ රාජ්‍ය අමුත්තන් ජ්‍යෙෂ්ඨ හමුදා සම්බන්ධීකරණ නිලධාරීන් (දේශීය හා විදේශීය) OCDS සමග සම්බන්ධීකරණය හා පුහුණු වැඩසටහන් පැවැත්වීම සීමාවීම.

## 12.4 අනාගත අපේක්ෂා

- නායකත්ව වැඩමුලු ත්‍රිවිධ හමුදා සාමාජිකයින් සඳහා පවත්වාගෙන යාම.
- පහත සඳහන් පුහුණු වැඩමුලු ආරම්භ කිරීම.
  - ශ්‍රී ලංකා සයිබර් සිකියුරිටි වැඩසටහන ත්‍රිවිධ හමුදා නිලධාරීන් 40 ක් සඳහා පැවත්වීම.
  - ත්‍රිවිධ හමුදා කාන්තා නිලධාරීන් 30 දෙනෙකු සඳහා දැනුම් ගම්මානය නමින් විශේෂ වැඩසටහනක් සංවිධානය කිරීම.
  - ආපදා කලමණාකරණ ආයතනය සමග සම්බන්ධතාවයෙන් ත්‍රිවිධ හමුදා නිලධාරීන් 50 දෙනෙකු සඳහා සෞඛ්‍ය ක්ෂේත්‍රයේ ආපදා කලමනාකරණය සඳහා වැඩසටහනක් පැවැත්වීම.
  - Orientation Module for New Defence Attachés and Civil Servants Involed in International Relations මෙම වසර අවසානයේදි පැවැත්වීම.
  - ජාතික/ රාජ්‍ය උත්සව අවස්ථා වලදී අවැසි කටයුතු සම්බන්ධීකරණය කිරීම.
  - ආරක්ෂක අමාත්‍යාංශ අනුමැතිය මත සිවිල් පරිපාලන නීතිය හා සාමය පවත්වාගැනීම සඳහා සහයෝගය ලබාදීම.
  - වැඩ වර්ජන සහ වෙනත් හදිසි අවස්ථාවන් වලදී ඇවැසි මිනිස් බලය විවිධ ආයතනයන් වෙත ලබාදීම.
  - ජාතික ආරක්ෂක කෞතුකාගාරයේ කටයුතු ඉදිරියට පවත්වා ගෙන යාම.
  - විදේශීය ප්‍රභුවරුන් තානාපතිවරුන් සහ විදේශීය හමුදා නියෝජිතයින්ගේ ශ්‍රී ලංකා සංචාරයන් සහ ත්‍රිවිධ හමුදා අතර සාකච්ඡා සම්බන්ධීකරණය කිරීම.
  - ජාතික ඩෙංගු මර්ධන ව්‍යාපාරය සඳහා ත්‍රිවිධ හමුදා සහ සම්බන්ධීකරණය කිරීම.
  - ජාතික ආපදාවන් මැඩපැවැත්වීම සඳහා වැඩසටහන් සංවිධානය කිරීම.
  - වෙනත් රටවල් සමග හමුදා සහයෝගය දියුණු කිරීම සඳහා මාණ්ඩලික සාකච්ඡා පැවැත්වීම

ඇමුණුම 'අ'

වියදම් විස්තර වාර්ථාව - 2016.12.31 දින දක්වා

| වැය ශීර්ෂය (අ) | වැය විස්තරය (ආ) | 2016 ප්‍රතිපාදනය (ඇ) | 2016 අමතර ප්‍රතිපාදනය (ඈ) | මු.රෙ. 66 මාරු කිරීම (ඉ) | මුළු ප්‍රතිපාදනය (ඊ ) = (ඇ) + (ඈ) + (ඉ) | වියදම (2016.08.31) (උ) | වියදම (2016.09.01 දින සිට 2016.12.31 දක්වා) (ඌ) | මුළු වියදම (එ) = (උ) + (ඌ) | ප්‍රතිපාදන ඉතිරිය (ඒ) = (ඊ) + (එ) |
|---|---|---|---|---|---|---|---|---|---|
| පුනරාවර්තන වියදම් | | | | | | | | | |
| ගමන් වියදම් | | | | | | | | | |
| **103-01-07-1102** | ගමන් වියදම් (එතෙර) | 3,000,000.00 | 3,000,000.00 | 1,000,000.00 | 7,000,000.00 | 3,072,426.00 | 1,486,771.00 | 4,559,197.00 | 2,440,803.00 |
| සැපයීම් | | | | | | | | | |
| **103-01-07-1201** | ලිපි ද්‍රව්‍ය හා කාර්යාලීය අවශ්‍යතා | 3,000,000.00 | | (500,000.00) | 2,500,000.00 | 1,269,829.00 | 1,149,585.44 | 2,419,414.44 | 80,585.56 |
| **103-01-07-1202** | ඉන්ධන | 10,000,000.00 | | (1,425,000.00) | 8,575,000.00 | 4,000,000.00 | 3,000,000.00 | 7,000,000.00 | 1,575,000.00 |
| **103-01-07-1205** | වෙනත් | 3,650,000.00 | | 600,000.00 | 4,250,000.00 | 3,010,912.59 | 1,177,753.72 | 4,188,666.31 | 61,333.69 |
| නඩත්තු වියදම් | | | | | | | | | |
| **103-01-07-1301** | වාහන | 6,300,000.00 | | (1,000,000.00) | 5,300,000.00 | 1,717,904.79 | 3,082,095.21 | 4,800,000.00 | 500,000.00 |
| **103-01-07-1302** | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 200,000.00 | | 225,000.00 | 425,000.00 | 68,472.51 | 236,694.50 | 305,167.01 | 119,832.99 |
| **103-01-07-1303** | ගොඩනැගිලි ඉදිකිරීම් හා නඩත්තු | 100,000.00 | | | 100,000.00 | 35,040.00 | 49,255.05 | 84,295.05 | 15,704.95 |
| සේවා වියදම් | | | | | | | | | |
| **103-01-07-1401** | ප්‍රවාහන | 500,000.00 | | 25,000.00 | 525,000.00 | 231,450.00 | 201,130.00 | 432,580.00 | 92,420.00 |
| **103-01-07-1402** | තැපැල් හා විදුලි සන්දේශ | 2,500,000.00 | | | 2,500,000.00 | 1,451,404.14 | 921,766.10 | 2,373,170.24 | 126,829.76 |
| **103-01-07-1403** | ජල/විදුලි | 6,200,000.00 | | (25,000.00) | 6,175,000.00 | 3,704,739.26 | 1,752,871.65 | 5,457,610.91 | 717,389.09 |
| **103-01-07-1404** | ගොඩනැගිලි  කුලී හා පළාත් පාලන ආයතන බදු | 31,200,000.00 | 7,200,000.00 | | 38,400,000.00 | 2,597,900.98 | 35,539,135.82 | 38,137,036.80 | 262,963.20 |
| **103-01-07-1405** | වෙනත් | 500,000.00 | | | 500,000.00 | 377,891.73 | 89,862.76 | 467,754.49 | 32,245.51 |
| පුනරාවර්තන වියදම් | | **40,900,000.00** | **10,200,000.00** | **(1,100,000.00)** | **76,250,000.00** | **21,537,971.00** | **48,686,921.25** | **70,224,892.25** | **6,025,107.75** |
| මූල ධන වියදම් | | | | | | | | | |
| පුනරුත්ථාපන හා වැඩිදියුණු කිරීම් | | | | | | | | | |
| **103-01-07-2002** | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 60,000.00 | | | 60,000.00 | 13,500.00 | 33,200.00 | 46,700.00 | 13,300.00 |
| **103-01-07-2003** | වාහන | 800,000.00 | | | 800,000.00 | 0.00 | 800,000.00 | 800,000.00 | 0.00 |
| මූල ධන වියදම් | | | | | | | | | |
| **103-01-07-2102** | ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ | 500,000.00 | | 1,100,000.00 | 1,600,000.00 | 281,782.50 | 1,312,239.55 | 1,594,022.05 | 5,977.95 |
| **103-01-07-2103** | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 500,000.00 | | | 500,000.00 | 470,404.61 | 23,070.00 | 493,474.61 | 6,525.39 |
| **103-01-07-2401** | මාණ්ඩලික පුහුණු | 2,000,000.00 | | | 2,000,000.00 | 599,599.91 | 1,097,930.71 | 1,697,530.62 | 302,469.38 |
| | මූලධන එකතුව | **3,860,000.00** | **0.00** | **1,100,000.00** | **4,960,000.00** | **1,365,287.02** | **3,266,440.26** | **4,631,727.28** | **328,272.72** |
| | මුළු එකතුව | **44,760,000.00** | **10,200,000.00** | **0.00** | **81,210,000.00** | **22,903,258.02** | **51,953,361.51** | **74,856,619.53** | **6,353,380.47** |

12.3වගුව:2016.12.31දිනටමුල්‍යප්‍රගතිය

# අමාත්‍යාංශයට අනුබද්ධ ආයතනයන්හි ප්‍රගතිය

# 13. වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව

## 13.1 සමාලෝචනය

2009 අංක 41 දරණ වෙරළාරක්ෂක දෙපාර්තමේන්තු පනතට අනුව 2009 ජුලි 19 වන දින වෙරළාරක්ෂක දෙපාර්තමේන්තුව ස්ථාපිත කරන ලද අතර, සාගරයේදී නීතිය බලාත්මක කරන ආයතනයක් ලෙස ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව දිවයිනට අයත් මුහුද ආරක්ෂා කිරීමේ ජාතික වශයෙන් ඉතා වැදගත් කාර්යභාරයක් සිදු කරනු ලබයි. 1979 අංක 15 දරණ අපරාධ විධි විධාන සංග්‍රහ පනත අනුව ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවෙහි සෑම නිලධාරියෙකුම සාම නිලධාරියෙකු වේ. ශ්‍රී ලංකාවට අයත් සමුද්‍රීය කළාප සහ මුහුදු කළාපය, නෞකා හා යාත්‍රා සෝදිසි කිරීම, අත්අඩංගුවට ගැනීම සහ නීති විරෝධී ක්‍රියාවල නිරත වන පුද්ගලයින් අත්අඩංගුවට ගැනීම සඳහා ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව බලාත්මක කර ඇත. එසේම වැරදිකරුවන්ට විරුද්ධව ව්‍යවස්ථානුකූලව හා නීත්‍යානුකූලව ක්‍රියාමාර්ග ගැනීමට මෙම ආයතනයට බලය ඇත.

## 13.2 2016 වර්ෂයේ කාර්යසාධනය

### 13.2.1 සැපයුම් හා සේවා අංශය

වෙරළාරක්ෂක දෙපාර්තමේන්තුව වෙත ලබාදී ඇති ප්‍රාග්ධන සහ පුනරාවර්තන ප්‍රතිපාදන පිළිබඳ විස්තර ඇමුණුම "අ" හි සඳහන්කර ඇත.

### 13.2.2 පුද්ගල හා පරිපාලන අංශය

අධ්‍යක්ෂ පුද්ගල හා පරිපාලන විසින් සිදුකර ඇති කාර්යයන් පිළිබඳ විස්තර ඇමුණුම "ආ" හි සඳහන්කර ඇති අතර, වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ ආයතන විහිදී ඇති ආකාරය ඇමුණුම "ඇ" හි සඳහන් පරිදි වේ.

### 13.2.3 මෙහෙයුම් කටයුතු

#### 13.2.3.1 ජීවිතාරක්ෂක මෙහෙයුම්

2016 වර්ෂය ආරම්භ වන විට වෙරළාරක්ෂක දෙපාර්තමේන්තුව මගින් ස්ථාපිත ජීවිතාරක්ෂක මුර කුටි 11 පැවති අතර, සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ මුල්‍යමය දායකත්වය ඇතිව උණවටුන සහ මොරගොල්ල වෙරළ තීරයන්හි ජීවිතාරක්ෂක මුරකුටි 02 ක් ඉදිකර පිළිවෙලින් 2016 ජුනි මස 24 වන දින සහ ජුලි මස 29 වන දින මෙහෙයුම් කටයුතු ක්‍රියාත්මක කරන ලදි. ඒ අනුව වර්තමානය වන විට වෙරළාරක්ෂක දෙපාර්තමේන්තුව මගින් ජීවිතාරක්ෂක මුර කුටි 13 ක ජීවිතාරක්ෂක මෙහෙයුම් කටයුතු සිදුකරනු ලබයි.

2016 වර්ෂයේ අනතුරට පත් ජීවිත 250 ක් බේරාගනු ලැබූ අතර ඉන් 132 ක් විදේශිකයින් විය. ඒ පිළිබඳ විස්තර ඇමුණුම "ඈ" හි සඳහන් වේ.

#### 13.2.3.2 නීති විරෝධී ක්‍රියා වැළැක්වීම සඳහා සිදුකරනු ලැබූ වෙරළ ආවේක්ෂණ මෙහෙයුම්

දිවයින වටා ඇති ජල තීරයේ සිදුවන සියලුම නීති විරෝධි ක්‍රියාවන් වැළැක්වීම සඳහා ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවෙහි ඇති සියළුම යාත්‍රා යොදවනු ලබන අතර. ඉන් වේග ප්‍රහාරක මුර යාත්‍රා (FPB) සහ වෙරළබඩ මුර යාත්‍රා අටක් උතුර විධානයට අනුයුක්තව මෙහෙයුම් කටයුතු සිදු කරයි. ඉතිරි මුර යාත්‍රා බටහිර සහ දකුණේ තෝරාගත් ධීවර වරායන්වල රාජකාරින්හි යොදවා ඇති අතර, තල්මසුන් නැරඹීමේ කටයුතු සිදුකරන යාත්‍රා නිරීක්ෂණයට ද යොදවනු ලබයි. (මිරිස්ස ධීවර වරාය තුල) දිවයින වටා යාත්‍රා අනුයුක්ත කර ඇති ආකාරය ඇමුණුම 'ඉ' තුල සඳහන් කර ඇත.

#### 13.2.3.3 නීති විරෝධී, අක්‍රමවත්, වාර්ථා නොවන මසුන් මැරීම නිරීක්ෂණය

පහත සඳහන් ධීවර වරායන්හි ඇති ධීවර යාත්‍රා මසුන් ඇල්ලීමේ කටයුතු සඳහා පිටව යාමේදී සහ නැවත වාරයට ඇතුළු වීමේදී එම යාත්‍රාවන් පරීක්ෂාවට ලක්කරනු ලැබේ. එහිදී එම යාත්‍රා පිටත්වීමේදී යම් කිසි නීති විරෝධි ධීවර උපාංග තිබේද යන්න පරීක්ෂා කරන අතර. නැවත වරායට පැමිණීමේදී ඔවුන් විසින් අල්ලාගෙන ඇති මත්ස්‍යයින් පරීක්ෂා කිරීම සිදුකරයි.

- දික්ඕවිට
- බේරුවල
- අම්බලන්ගොඩ
- හික්කඩුව
- මිරිස්ස
- දෙවින්දර
- ගන්දර
- නිල්වැල්ල
- කුඩාවැල්ල
- හම්බන්තොට
- ඔළුවිල්
- ගාල්ල
- තංගල්ල
- කොඩ් බේ (ත්‍රිකුණාමලය)
- මීගමුව

### 13.2.3.4 මහජනතාව දැණුවත් කිරීමේ වැඩ සටහන්

වෙරළ තීරයේ ජීවත්වන ජනතාව දැනුවත් කිරීමේ වැඩ සටහන් වර්ෂය ආරම්භයේ සිට මේ දක්වා ක්‍රමානුකූලව සිදුකරනු ලැබේ. එම වැඩ සටහන් පහත සඳහන් මාතෘකා යටතේ සිදු කරන ලදි.

- මුහුදේදී ජීවිත ආරක්ෂාව
- සමුද්‍ර දූෂණය වැළැක්වීම සහ සමුද්‍රිය පරිසර ආරක්ෂණය
- වෙරළ ආරක්ෂණය
- ජීවිත බේරාගැනීම් සම්බන්ධව
- වෙරළ පිරිසිදු කිරීමේ වැඩසටහන්
- නීති විරෝධීව මසුන් මැරීම වැලැක්වීම සඳහා ධීවර ප්‍රජාව දැනුවත් කිරීම
- වෙරළ ආරක්ෂිත ශාක සිටුවීම

### 13.2.3.5 සෝදිසි සහ බේරාගැනීමේ මෙහෙයුම්

මෙම ආයතනය සතුව ඇති සම්පත් ශ්‍රී ලංකා නාවික හමුදාව සහ පොලීසිය විසින් සිදුකරන සෝදිසි කිරීම් සහ බේරාගැනීම් කටයුතු වලට යොදාගනු ලබයි.

### 13.2.3.6 නීතිය බලාත්මක කිරීමේ මෙහෙයුම්

ශ්‍රී ලංකා ජල තීරය තුල නීතිය බලාත්මක කිරීමේ මෙහෙයුම් සිදු කරනු ලැබු අතර, අනෙකුත් නීතිය බලාත්මක කිරීමේ සංවිධාන සහ රාජ්‍ය ආයතනවලට නීතිය ක්‍රියාත්මක කිරීම සඳහා සහයෝගය ලබාදීම සිදු කරනු ලැබේ. තවද, ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව, නාවික හමුදාව සහ ඉන්දියානු වෙරළ ආරක්ෂක දෙපාර්තමෙන්තුව සමග එක්ව ඉන්දියානු හා ශ්‍රී ලාංකික ධීවරයින් පෙරලා සියරටට යැවීම සහ නැවත සියරටට ගෙන්වා ගැනීමේ මෙහෙයුම් සිදු කරනු ලැබේ. ඒ පිළිබඳ විස්තර පහත සඳහන් පරිදි වේ.

- ඉන්දියානු වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව විසින් මෙරටට එවන ලද ශ්‍රී ලාංකික ධිවරයින් සංඛ්‍යාව – 09
- ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව විසින් ඉන්දියානු වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව වෙත භාර දෙන ලද ඉන්දියානු ධීවරයින් සංඛ්‍යාව – 333 එහි සංඛ්‍යාත්මක විශ්ලේෂණය පහත ප්‍රස්ථාරය මගින් දක්වා ඇත.




13.1.ප්‍රස්ථාරය:සොයාගැනීමේ හා මුදාගැනීමේ මෙහෙයුම්

### 13.2.3.7 සමුද්‍රීය පරිසර ආරක්ෂණය

ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවෙහි තෙල් කාන්දුවීම් ප්‍රතිචාර දක්වන කණ්ඩායම විසින් පහත සඳහන් ස්ථානවල සිදුවූ තෙල් කාන්දුවීම් අවස්ථා සාර්ථකව කළමනාකරණය කරන ලදි.

- අකුරැස්ස නගරයේදි නිල්වලා ගගට සිදුවූ තෙල් කාන්දුව - 2016 ජනවාරි මස 25 වන දින
- මිරිස්ස ධීවර වරාය තුල- 2016 මැයි මස 05 වන දින
- හම්බන්තොට ධීවර වරායතුල - 2016 අගෝස්තු මස 10 වන දින

### 13.2.3.8 ගංවතුරින් විපතට පත් ජනතාව සඳහා උපකාර කිරිම

ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් තුමාගේ උපදෙස් පරිදි 2016 මැයි මස 18,19 හා 20 යන දිනවල පැවති අයහපත් කාලගුණය සහ ගංවතුර හේතුවෙන් විපතට පත් ජනතාව බහුලව සිටි කොළොන්නාව, බියගම, මල්වාන, කැලණිමුල්ල, අංගොඩ යන ප්‍රදේශවල ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක නිළධාරින් සහ නාවිකයින් විසින් ගංවතුරට සිරවී නිවාසවල රැදි සිටි සිවිල් පුද්ගලයින් එම ස්ථාන වලින් ආරක්ෂිත ස්ථාන වෙත රැගෙන යාම නිසා ජීවිත විශාල ගණනක් බේරා ගැනිමට හැකි විය.. තවද, එම පුද්ගලයින් හට ආහාරපාන බෙදා හැරිම ඇතුළු අත්‍යවශ්‍ය සුභසාධන කටයුතු සඳහා සහයෝගය ලබාදෙන ලදි.

### 13.2.3.9 බුද්ධි අංශයේ කාර්යභාරය

වෙරළ ආරක්ෂක බුද්ධි අංශ නිළධාරින් සහ නාවිකයින් සපයන ලද විශ්වාසදායි බුද්ධි තොරතුරු මත ඒ ඒ ප්‍රදේශවල පොලිසිය සහ විශේෂ කාර්යය බලකාය සමග සම්බන්ධව් පහත සදහන් අත් අඩංගුවට ගැනිමට හැකි විය.

| අනු අංකය | දිනය | වර්ගය | ස්ථානය | ගත් ක්‍රියා මාර්ගය |
|---|---|---|---|---|
| 01 | 2016.01.19 | පුද්ගලයින් - 01<br>දේශිය ගංජා - කිලෝ 8.335 | දෙඹරවැව | විශේෂ කාර්යය බලකාය දෙඹරවැව |
| 02 | 2016.03.08 | පුද්ගලයින් - 03 ගංජා - ග්‍රෑම් 05 | දික්ඕවිට වරාය | වත්තල පොලිසියට භාර දිම |
| 03 | 2016.03.28 | පුද්ගලයින් - 01<br>දේශිය ගංජා - ග්‍රෑම් 250 | බේරුවල | කළුතර පොලිසියට භාර දිම |
| 04 | 2016.04.03 | පුද්ගලයින් - 01<br>දේශිය ගංජා - කිලෝ 01 | රන්මිණිතැන්න | දෙඹරවැව පොලිසියට භාර දිම |
| 05 | 2016.04.27 | පුද්ගලයින් - 01<br>සත්ව කොටස් | කතරගම | යාල වනජිවි දෙපාර්තමේන්තුවට භාර දිම |
| 06 | 2016.06.08 | පුද්ගලයන් - 03<br>ගංජාහේන් - 02 (එකක් අක්කර 0.25)<br>ගංජා පැල - 9000 | තණමල්විල | විශේෂ කාර්යය බලකාය කතරගම |
| 07 | 2016.06.10 | පුද්ගලයන් - 03<br>කේරළ ගංජා -කිලෝ 02 | කොළඹ | කොළඹ මත්ද්‍රව්‍ය කාර්යාංශය වෙත භාර දිම |
| 08 | 2016.06.14 | පුද්ගලයන් - 03<br>දේශිය ගංජා - කිලෝ ග්‍රෑම් 9. 65 | වැල්ලවාය | විශේෂ කාර්යය බලකාය කතරගම |
| 09 | 2016.07.04 | පුද්ගලයන් - 02<br>ගංජා හේන් - 01<br>ගංජා පැල - 300 | තණමල්විල | හම්බේගමුව පොලිස් ස්ථානයට භාර දිම |
| 10 | 2016.07.21 | පුද්ගලයින් - 01<br>ප්‍රගැබලින් - මිලිග්‍රෑම් 75<br>ඖෂධ කරල් - 11 | වැලිගම | මාතර ඖෂධ හා ආහාර පරික්ෂක වෙත භර දිම |
| 11 | 2016.07.26 | පුද්ගලයන් - 03<br>කේරළ ගංජා - කිලෝ 04 | කොළඹ | විශේෂ කාර්යය බලකාය ගෝණහේන |
| 12 | 2016.08.03 | පුද්ගලයන් - 01<br>කේරළ ගංජා - ග්‍රෑම් 500 | මාතර | මාතර පොලිස් ස්ථානයට භාර දිම |
| 13 | 2016.08.05 | පුද්ගලයින් - 01<br>අගිල් - කිලෝ 915 | දෙඹරවැව | වනසංරක්ෂණ දෙපාර්තමේන්තුව ලුණුගම්වෙහෙර වෙත භාර දිම |
| 14 | 2016.08.28 | පුද්ගලයින් - 01<br>කේරළ ගංජා - ග්‍රෑම් 50 | අහුංගල්ල | අහුංගල්ල පොලිස් ස්ථානයට භාර දිම |
| 15 | 2016.09.19 | ටොප්මවින්ටන් දූම්වැටි ගණනින් - 960<br>ප්‍රසඩ් ගණනින් -200 | බේරුවල | විශේෂ කාර්යය බලකාය වැලිපැන්න |
| 16 | 2016.09.29 | පුද්ගලයින් - 01<br>දේශිය ගංජා - කිලෝ 2.5 | හුංගම | හුංගම පොලිස් ස්ථානයට භාර දිම |
| 17 | 2016.10.03 | පුද්ගලයින් - 01<br>දේශිය ගංජා - කිලෝ 04 | තණමල්විල | තණමල්විල පොලිස් ස්ථානයට භාර දිම |
| 18 | 2016.10.04 | පුද්ගලයින් - 01<br>දේශිය ගංජා - කිලෝ 02 | බලහරුව | කොස්ලන්ද පොලිස් ස්ථානයට භාර දිම |
| 19 | 2016.10.09 | පුද්ගලයින් - 01<br>දේශිය ගංජා - කිලෝ 03 | ඌව කුඩාඔය | තණමල්විල පොලිස් ස්ථානයට භාර දිම |
| 20 | 2016.10.25 | පුද්ගලයින් - 02<br>මුව මස් - කිලෝ 101 | තණමල්විල | වනජිවි දෙපාර්තමේන්තුව (තණමල්විල) වෙත භාර දිම |

| | | | | |
|---|---|---|---|---|
| 21 | 2016.11.02 | පුද්ගලයින් - 01<br>ටොප් මවින්ටන් සිගරට් බණ්ඩල් - 06 | බෙරුවල | විශේෂ කාර්යය බලකාය වැලිපැන්න |
| 22 | 2016.11.11 | පුද්ගලයින් - 01<br>ටොප් මවින්ටන් සිගරට් - බණ්ඩල් 07<br>ඩිළුන් සිගරට් - පැකට් 07 | බෙරුවල | විශේෂ කාර්යය බලකාය අළුත්ගම |
| 23 | 2016.11.19 | පුද්ගලයින් - 01<br>බණුගර් - මිලිග්‍රෑම් 3520<br>කේරළ ගංජා - මිලිග්‍රෑම් 300<br>ට්‍රැමඩෝල් පෙති - 30 | තිස්සමහාරාම | විශේෂ කාර්යය බලකාය කතරගම |
| 24 | 2016.12.30 | පුද්ගලයින් - 01<br>දේශීය ගංජා - ග්‍රෑම් 05 | වත්තල | වත්තල පොලිසියට භාර දිම |
| **ගිනි අවි(2) පුපුපුපුරණ ද්‍රව්‍ය අත්අඩංගුවට ගැනිම්** | | | | |
| 25 | 2016.03.04 | ලියාපදිංචි නොකළ සම්පූර්ණ ඩිංගි යාත්‍රා - 01<br>වෙඩි බෙහෙත් - ග්‍රෑම් 800<br>වාජර් - ග්‍රෑම් 680<br>මාළු කිලෝ - 11.04 | **අහුංගල්ල** | **ධිවර පරික්ෂක අහුංගල්ල** |
| 26 | 2016.05.16 | පුද්ගලයෝ - 01<br>කොටන තුවක්කු - 01 | කිරින්ද | කතරගම පොලිස් විශේෂ කර්යය බලකායට භාර දිම |

13.1 වගුව: තහනම් මත්ද්‍රව්‍ය සහ වෙනත් දෑ අත්අඩංගුවට ගැනිම්

| අනු අංකය | දිනය | පුද්ගලයන් හා වර්ගය | ස්ථානය | ගත් ක්‍රියා මාර්ගය |
|---|---|---|---|---|
| 01 | 2016.02.29 | පුද්ගලයින් -01<br>පොකිරිස්සෝ - ගැමි 300 | මාතර | ධිවර පරික්ෂක (මාතර) වෙත භාර දී ඇත |
| 02 | 2016.04.01 | පුද්ගලයෝ - 05<br>මෝර මාළු - කිලෝ 100 | මිරිස්ස | ධිවර පරික්ෂක (මිරිස්ස) වෙත භාර දී ඇත |
| 03 | 2016.04.20 | පුද්ගලයෝ - 06<br>මෝර කරවල - කිලෝ 12 | දික්ඕවිට | ධිවරපරික්ෂක (දික්ඕවිට) වෙත භාර දී ඇත |
| 04 | 2016.04.25 | මෝර මාළු - 52 | දික්ඕවිට | ධිවර පරික්ෂක (දික්ඕවිට) වෙත භාර දී ඇත |
| 05 | 2016.05.01 | පුද්ගලයින් - 08<br>කිමිදුම් උපකරණ සමග අල්ලන ලද පොකිරිස්සන් ගණනින් - 59 | යාල | තිස්සමහාරාම පොලිසියට භාර දිම |
| 06 | 2016.06.01 | ධිවරයින් - 02<br>මාළු දැල් - 08 | පේදුරු තුඩුව | සහාකාර ධිවර අධ්‍යක්ෂක (යාපනය) වෙත භාර දී ඇත |
| 07 | 2016.06.09 | ධිවරයින් - 01<br>මාළු දැල් - 02 | තොන්ඩමනාරු | සහාකාර ධිවර අධ්‍යක්ෂක (යාපනය) වෙත භාර දී ඇත |
| 08 | 2016.06.14 | ධිවරයින් - 02<br>මාළු දැල් - 02 | මුනේයි | සහාකාර ධිවර අධ්‍යක්ෂක (යාපනය) වෙත භාර දී ඇත |
| 09 | 2016.06.22 | ධිවරයින් - 01<br>මාළු දැල් - 02 | තොන්ඩමනරු | සහාකාර ධිවර අධ්‍යක්ෂක (යාපනය) වෙත භාර දී ඇත |
| 10 | 2016.07.06 | මෝරවරල් - ග්‍රෑම් 500 | දික්ඕවිට | ධිවර පරික්ෂක (දික්ඕවිට) වෙත භාර දී ඇත |
| 11 | 2016.07.14 | පුද්ගලය - 01<br>මෝර කරවල - කිලෝ 03 | දික්ඕවිට | ධිවර පරික්ෂක (දික්ඕවිට) වෙත භාර දී ඇත |
| 12 | 2016.07.15 | ධිවරයින් - 02<br>මාළු දැල් - 03 | පේදුරුතුඩුව | සහාකාර ධිවර අධ්‍යක්ෂක (යාපනය) වෙත භාර දී ඇත |
| 13 | 2016.07.19 | පුද්ගලයෝ - 01<br>මෝර වරල් - කිලෝ 1.5 | දික්ඕවිට | ධිවර පරික්ෂක(දික්ඕවිට) වෙත භාර දී ඇත |
| 14 | 2016.08.04 | පුද්ගලයෝ - 06 | දික්ඕවිට | ධිවර පරික්ෂක (දික්ඕවිට) වෙත භාර |

| | | | | |
|---|---|---|---|---|
| | | කසමෝරා කරවල - කිලෝ 54 | | දී ඇත |
| 15 | 2016.09.11 | පුද්ගලයෝ - 06<br>මෝර කරවල කිලෝ - 50.2 | දික්ඕවිට | ධිවර පරික්ෂක (දික්ඕවිට) වෙත භාර දී ඇත |
| 16 | 2016.09.22 | පුද්ගලයෝ - 06<br>මෝර කරවල - කිලෝ 03<br>මොර වරල් - ග්‍රෑම් 700 | දික්ඕවිට | ධිවර පරික්ෂක (දික්ඕවිට) වෙත භාර දී ඇත |
| 17 | 2016.10.19 | පුද්ගලයින් -01<br>පොකිරිස්සෝ - 1.9 ගෑම් | බලපිටිය | ධිවර පරික්ෂක (ගාල්ල) වෙත භාර දී ඇත |
| 18 | 2016.10.27 | පුද්ගලයින් - 01<br>පොකිරිස්සෝකිලෝ 02 | මිරිස්ස | ධිවර පරික්ෂක (වැලිගම්බෙ) වෙත භාර දී ඇත |
| 19 | 2016.10.30 | පුද්ගලයෝ - 06<br>මෝර කරවල කිලෝ -57.08 | දික්ඕවිට | ධිවර පරික්ෂක (දික්ඕවිට) වෙත භාර දී ඇත |
| 20 | 2016.10.31 | පුද්ගලයෝ - 06<br>ඕංගි යාත්‍රා - 02<br>මාළු නෙටි - 02<br>පොකිරිස්සෝ - කිලෝ 150 | යාල | ධිවර පරික්ෂක (කිරින්ද) වෙත භාර දී ඇත |
| 21 | 2016.11.02 | පුද්ගලයින් -04<br>පොකිරිස්සෝබිත්තර සහිත - 62 | බුන්දල | ධිවර පරික්ෂක (හම්බන්තොට) වෙත භාර දී ඇත |
| 22 | 2016.11.05 | පුද්ගලයෝ - 01<br>මෝර කරවල - කිලෝ 56.03 | දික්ඕවිට | ධිවර පරික්ෂක (දික්ඕවිට) වෙත භාර දී ඇත |
| 23 | 2016.11.05 | පුද්ගලයෝ - 06<br>මෝරකරවල - කිලෝ 39.04 | දික්ඕවිට | ධිවර පරික්ෂක (දික්ඕවිට) වෙත භාර දී ඇත |
| 24 | 2016.11.14 | පුද්ගලයෝ - 01<br>මෝර කරවල - කිලෝ 1.45 | දික්ඕවිට | ධිවරපරික්ෂක (දික්ඕවිට) වෙත භාර දී ඇත |
| 25 | 2016.11.19 | පුද්ගලයෝ - 07<br>මෝර කරවල - කිලෝ 68.45<br>වරල් - කිලෝ 4.250 | දික්ඕවිට | ධිවර පරික්ෂක (දික්ඕවිට) වෙත භාර දී ඇත |
| 26 | 2016.11.21 | පුද්ගලයෝ - 7<br>මෝර කරවල - කිලෝ 38<br>වරල් - කිලෝ 1.460 | දික්ඕවිට | ධිවර පරික්ෂක (දික්ඕවිට) වෙත භාර දී ඇත |
| 27 | 2016.12.13 | පුද්ගලයෝ - 6<br>මෝර කරවල - කිලෝ 73.7<br>වරල් - කිලෝ 03 | දික්ඕවිට | ධිවර පරික්ෂක (දික්ඕවිට) වෙත භාර දී ඇත |

13.2 වගුව: තහනම් ධිවර කර්මාන්තයේදි අත්අඩංගුවට ගන්නා ලද ද්‍රව්‍යයන්

### 13.2.3.10 විදේශ නියෝජිතයින් සමග සබදතා

ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව මගින් ලෝකය පුරා ඇති ප්‍රධාන වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තු සහ ආයතන සමග එනම්, ඔස්ට්‍රේලියානු දේශ සීමා ආරක්ෂක බලකාය, ඉන්දියානු වෙරළ ආරක්ෂක, ජපන් වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව, ඇමරිකානු වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව වැනි විදේශිය ආයතන සමග ධනාත්මක සබදතා පවත්වා ගනු ලැබේ. එම නිසා විදේශ සම්බන්ධතා තුලින් ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවට කළාපීය සහ ගෝලීය සමුද්‍ර සහයෝගිතා විවිධ ආකාරයෙන් වැඩිදියුණු කරගැනීමට අවස්ථා ලැබී ඇත.

- ශ්‍රී ලංකාව තුල සිදුවන තෙල් කන්දුවිම් පාලනය කිරිම සදහා අංග සම්පූර්ණ තෙල් විසිරිම සදහා ප්‍රතිචාර දැක්විමේ කණ්ඩායමක් බිහිකිරිම සදහා ජපාන වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ විසින් සහයෝගය ලබා දෙන ලදි.
- ජපාන වෙරළාරක්ෂක දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් වන වයිස් අද්මිරාල් හිරෝයුකි නකානෝ නිල සංචාරයක් සදහා 2016 ජනවාරි මස 26 වන දින වෙරළාරක්ෂක මුළස්ථානයට පැමිණෙන ලදි.
- ඉන්දීය වෙරළ ආරක්ෂක බළකායේ අධ්‍යක්ෂ ජනරාල් වන රාජේන්ද්‍ර සිං 2016 අගෝස්තු මස 16 සිට 20 වන දින දක්වා කාලය තුල ශ්‍රී ලංකාවේ නිල සංචාරයක් සිදුකරන ලදි. එම කාලය තුලදි ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක මුලස්ථානයට පැමිණි එහි ඉදිකර තිබු ප්‍රධාන මෙහෙයුම් මැදිරිය සහ දුරකථන හා දත්ත හුවමාරු මධ්‍යස්ථානය විවෘත කරන ලදි. තවද, මහෙයුම් මැදිරියට අවශ්‍ය උපකරණ ලබාදිමට ද ඔහුගේ ඇති කැමැත්ත ප්‍රකාශ කරන ලදි.
- ඉන්දියානු වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ අණදෙන නිළධාරි, නියෝජ්‍ය පරික්ෂක ජනරාල් අනාන්ඩ් ප්‍රකාෂ් බැඩෝලා නිළ සංචාරයක් සදහා "අයිසිජිඑස් සමරත්" නැමති ඉන්දිය නෞකාවෙන් මෙරටට පැමිණි අතර, 2016 අගෝස්තු මස 18 වන දින වෙරළාරක්ෂක මුළස්ථානයට පැමිණෙන ලදි.

- බංගලාදේශ වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂක ජනරාල් කොමදෝරු යහ්යා ෂෙඩ් සහ එරට වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ නෞකා දෙකක් වන බිසිජීඑස් "ෂේඩි නෂ්රුල්" සහ බිසිජීඑස් "තහජුධින්" යන නෞකා දෙකේ අණදෙන නිළධාරීන් වන කපිතාන් මොහොමඩ් සලේහුදීන් හා කපිතාන් මොහොමඩ් හසාන් තරිකියුත් සමග මෙරටට පැමිණි අතර, 2016 ඔක්තෝම්බර් මස 25 වන දින වෙරළාරක්ෂක මුළස්ථානයට පැමිණෙන ලදි.
- සෝමාලියා කාර්යසාධක විමර්ශණ කණ්ඩායමේ සහ ජපන් සමුද්‍රිය ආත්මාරක්ෂක බලකායේ නායක කොමාණ්ඩර් මසානෝ නකනිසි එරට සමුද්‍රිය ආත්මාරක්ෂක බලකායට අයත් "කිරිසාමි" නැමති නෞකාවෙන් නිළ සංචාරයක් සඳහා දිවයිනට පැමිණි අතර, 2016 දෙසැම්බර් මස 5 වන දින වෙරළාරක්ෂක මුළස්ථානයට පැමිණෙන ලදි.
- ඉන්දිය වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ අධ්‍යාපන හා පුහුණු අංශයේ අධ්‍යක්ෂක කපිතාන් ඉගුවි 2016 දෙසැම්බර් මස 06 වන දින නිළ සංචාරයක් සඳහා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවට පැමිණෙන ලදි. තවද, එරටදී ලබාදෙන උසස් උපාධිදාරි පාඨමාලාවන් (Master Degree Programme) ලබාදීමේ ක්‍රමවේදයන් පිළිබද සාකච්ඡා කරන ලදි.

## 13.2.4 පුහුණු වැඩසටහන්

- ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක පුද්ගලයින්ගේ වෘත්තිය දැනුම, තාක්ෂණික දැණුම හා හැකියාවන් වර්ධනය කිරීමේ අරමුණින් මෙම කාල පරිච්ජේදය තුල පුහුණු පාඨමාලාවන් රැසක් සිදුකරන ලදි. තවද, සැලකියයුතු නිළධාරීන් ප්‍රමාණයක් මිතුරු විදේශ රටවලින් ලබාදුන් පාඨමාලාවන් සඳහාද යොමු කිරීමට හැකිවිය.
- විදේශ වෙරළ ආරක්ෂක හා නිතිය බලාත්මක කරනු ලබන ආයතන විසින් ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ උපදේශකයින් කළාපිය පුහුණු පාඨමාලාවන් පැවැත්වීම සඳහා තෝරාගෙන ඇත.
- උසස් පුහුණු මධ්‍යස්ථානය සහ ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව අනෙකුත් ආරක්ෂක අංශ හා සිවිල් පුද්ගලයින් සඳහා ජීවිතාරක්ෂක පාඨමාලාවන් පැවැත්වීම සිදුකරන ලදි.

පුහුණු පාඨමාලාවන්ගේ විස්තර ඇමුණුම "ඊ" ලෙස ඉදිරිපත්කර ඇත.

## 13.2.5 ඉංජිනේරු අංශය

ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු අංශයද 2016 වර්ෂය අවසන් වන විට පහත සඳහන් ව්‍යාපෘති සාර්ථකව නිම කිරීමට සමත්විය.

| ක්‍රියාකාරකම | ප්‍රගතිය |
|---|---|
| උණවටුන සහ මොරගොල්ල ජීවිතාරක්ෂක කුටි ඉදිකිරීම | අදාල ව්‍යාපෘතිය සාර්ථකව නිම කර ඇති අතර, වැයවූ මුදල රුපියල් මිලියන 04 කි. ඒ සඳහා සමුද්‍රිය පරිසර ආරක්ෂණ අධිකාරිය විසින් පූර්ණ අනුග්‍රහය ලබා දෙන ලදි |
| ශ්‍රීලංවෙආ රෝහණ ආයතනයේ මළ අපද්‍රව්‍ය අපවහන කළමණාකරණ පද්ධතිය ඉදිකිරීම | අදාල ව්‍යාපෘතිය සාර්ථකව නිම කර ඇති අතර, වැයවූ මුදල රුපියල් මිලියන 8.5 කි. |
| ශ්‍රීලංවෙආ රෝහණ ආයතනයේ මීටර 40 ක සන්නිවේදන කුළුණක් ඉදිකිරීම. | අදාල ව්‍යාපෘතිය සාර්ථකව නිම කර ඇති අතර, වැයවූ මුදල රුපියල් මිලියන 6.5 කි. |
| ශ්‍රීලංවෙආ රෝහණ ආයතනයේ ක්‍රියාකාරී මැදිරිය ඉදිකිරීම | අදාල ව්‍යාපෘතිය සාර්ථකව නිම කර ඇති අතර, වැයවූ මුදල රුපියල් මිලියන 4.2 කි. |
| ශ්‍රීලංකා වෙරළ ආරක්ෂක රෝහණ ආයතනයේ නිලධාරී නිවාසයේ නාන කාමරය අලුත්වැඩියා කටයුතු සිදුකිරිම | අදාල ව්‍යාපෘතිය සාර්ථකව නිම කර ඇති අතර, වැයවූ මුදල රුපියල් මිලියන 1 කි. |

13.3 වගුව:ඉදිකිරීම් ව්‍යාපෘති ප්‍රගතිය



ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක රෝහණ ආයතනයේ ඉදිකර ඇති මීටර 40 ක කුළුණ





උණවටුන, මොරගොල්ල ජීවිතාරක්ෂක මුරකුටි ඉදිකිරීම



ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක රෝහණ ආයතනයේ මළ අපද්‍රව්‍ය මෙහෙයුම් අපවහන ව්‍යාපෘතිය



ශ්‍රීලංකා වෙරළ ආරක්ෂක රෝහණ මැදිරිය

### 13.2.6 වෙනත්

ඉහත සදහන් කරන ලද අත්පත්කර ගැනිම් වලට අමතරව පහත සදහන් සමාජීය වගකිම් සදහා ද උරදි ඇත.

- වැල්ලවත්ත, දෙහිවල, ගල්කිස්ස, බලපිටිය සහ මිරිස්ස යන ස්ථානවල ඇති වෙරළ ප්‍රදේශයන් පිරිසිදු කිරිම හා අලංකාර කිරිම.
- බම්බලපිටිය, අම්බලන්ගොඩ යන ප්‍රදේශවල වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමණාකරන දෙපාර්මේන්තුව සමග රුක් රෝපන වැඩසටහන් පැවැත්වීම.
- රාජ්‍ය ආයතන සමග සම්බන්ධවි ඩෙංගු මර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- ධීවර ප්‍රජාව දැනුවත් කිරිමේ වැඩසටහන් පවත්වා ඔවුන්ට අදාල නිතිමය කටයුතු පිළිබදව සහ මුහුදේදි ආරක්ෂා විය යුතු ආකාරය පිළිබදව දැණුවත් කිරීම.
- ජිවිත බේරා ගැනිම සදහා ජිවිතාරක්ෂක මෙවලම් පරිහරණය සම්බන්ධව පාසල් ළමුන් සහ සිවිල් ප්‍රජාව දැනුවත් කිරීම.

## 13.3 ඉදිරි වසර සඳහා කල් තබන ලද කාර්යයන්

- මිටර් 25-30 පමණ වන වේග මුර සංචාරක බෝට්ටු දෙකක් මිලදි ගැනිම.
- වෙරළබඩ මුර යාත්‍රා 02 ක්, 02 No's of Rigid – Hulled Inflatable Boats (RHIB), 03 No's of Rubber Floating Boats (RFD) with Out Boat Motors (OBM) 04 No's of jetski මිළදි ගැනිම.
- නාවික යාත්‍රාවන්ගේ යාත්‍රා කිරිම් නිරික්ෂණ පද්ධතියන් මිළදි ගැනීම.
- අත්‍යවශ්‍ය කාර්යයන් සදහා හෝ ප්‍රමාණවත් වන පරිදි වාහන මිලදි ගැනිම.
- ජෙනරේටර් යන්ත්‍ර දෙකක් මිලදි ගැනිම.
- ඉලෙක්ට්‍රිකල් සහ ඉලෙක්ට්‍රොනික් විෂයයන් සහ වායුසමිකරණ පද්ධතින්ට අදාල විෂයයන් මිළදි ගැනිම.

- ඉලෙක්ට්‍රිකල් සහ ඉලෙක්ට්‍රොනික් විෂයයන් සහ වායුසමිකරණ පද්ධතින්ට අදාල විෂයයන් මිළදි ගැනිම.

## 13.4 අනාගත අපේක්ෂා

- වෙරළාරක්ෂක දෙපාර්තමේන්තුවේ සාමාජිකයින්ගේ සංඛ්‍යාව 1500 දක්වා වැඩිකර ගැනිම.
- ශ්‍රී ලංකා නාවික හමුදාව සතු වෙරළබඩ මුර යාත්‍රා 02 ලබා ගැනිම.
- ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක රෝහණ ආයතනයේ කණිෂ්ඨ නාවිකයින් සදහා නේවාසික ගොඩනැගිල්ලක් ඉදිකිරිම.
- ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක රෝහණ ආයතනයේ උසස් පුහුණු පාසල සදහා පරිපාලන ගොඩනැගිල්ලක් ඉදිකිරීම.
- ප්‍රසිද්ධ වෙරළ තිරයන්හි ජිවිතාරක්ෂක මුරකුටි ඉදිකිරිම.
- ඉතිරි ධීවර වරායන්හි ධිවර පිරික්සුම් මධ්‍යස්ථාන ස්ථාපිත කිරිම.
- මිරිස්ස සහ බලපිටිය යන පුහුණු මධ්‍යස්ථානවල ඇති පහසුකම් වැඩිකිරිම තුලින් පුහුණු කටයුතු වැඩි දියුණු කිරිම.
- මෙම දෙපාර්තමේන්තුවේ සිටින විසිරිගිය තෙල් එකතු කිරිමේ කණ්ඩායමේ හැකියාවන් සහ දරාගැනිමේ හැකියාවන් වැඩි කිරිම.
- හලාවත, තෝඩුවාව, මාඔය මෝය, පානදුර, බලපිටිය සහ කිරින්ද යන ප්‍රදේශවල දැනට වෙරළාරක්ෂක පුද්ගලයින් රැදි සිටියද එම ඉඩම් මෙතෙක් පවරා ගෙන නොමැති බැවින්, ඒවා පවරා ගැනිම.
- වෙරළාරක්ෂක අනුබණ්ඩයක් ස්ථාපිත කිරිම සදහා කල්පිටිය ප්‍රදේශයේ ඉඩමක් පවරා ගැනිම.
- ඉහත කාර්යයන්ට අමතරව ඇමුණුම "උ" හි සදහන් ස්ථානයන්හි වෙරළ ආරක්ෂක ස්ථාන ස්ථාපිත කිරිම.

| මුදල් සාරාංශය - පුනරාවර්තන ප්‍රතිපාදන 2016 දෙසැම්බර් මස 31 වන දිනට | | | | |
|---|---|---|---|---|
| වැය විෂය | වැය ශීර්ෂය | 2016 වෙන්කල ප්‍රතිපාදන (රු) | සත්‍ය වශයෙන් වැය වූ ප්‍රතිපාදන මුදල (රු) | ඉතිරි ප්‍රතිපාදන මුදල (රු) |
| වැටුප් හා වේතන | 1001 | 150,000.00 | 106,946.00 | 43,054.00 |
| දේශීය ගමන් වියදම් | 1101 | 220,000.00 | 220,000.00 | - |
| විදේශීය ගමන් වියදම් | 1102 | - | - | - |
| ලිපි ද්‍රව්‍ය හා කාර්යාලීය උපකරණ | 1201 | 2,300,000.00 | 2,289,112.30 | 10,887.70 |
| ඉන්ධන | 1202 | 2,180,000.00 | 1,737,401.83 | 442,598.17 |
| ආහාරපාන හා නිළ ඇඳුම් | 1203 | 11,000,000.00 | 10,996,080.37 | 3,919.63 |
| වෛද්‍ය උපකරණ | 1204 | - | - | - |
| වෙනත් | 1205 | 3,500,000.00 | 3,494,932.22 | 5,067.78 |
| වාහන නඩත්තු වියදම් | 1301 | 4,620,000.00 | 4,194,827.22 | 425,172.78 |
| යන්ත්‍ර සහ යන්ත්‍ර උපකරණ නඩත්තු | 1302 | 500,000.00 | 484,811.85 | 15,188.15 |
| ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 1303 | 800,000.00 | 731,920.78 | 68,079.22 |
| තැපැල් සහ සන්නිවේදන | 1402 | 2,000,000.00 | 1,787,823.84 | 212,176.16 |
| විදුලිය සහ ජලය | 1403 | 9,800,000.00 | 9,799,330.79 | 669.21 |
| බදු කුලී | 1404 | 200,000.00 | 153,971.56 | 46,028.44 |
| වෙනත් | 1405 | 2,000,000.00 | 1,974,149.98 | 25,850.02 |
| **එකතුව (රු.)** | | **39,270,000.00** | **37,971,308.74** | **1,298,691.26** |

13.4 වගුව: මුදල් සාරාංශය - පුනරාවර්තන වියදම්




13.2 ප්‍රස්ථාරය: මුදල් සාරාංශය - ප්‍රාග්ධන වියදම්

**මුදල් සාරාංශය - ප්‍රාග්ධන ප්‍රතිපාදන**

**2016 දෙසැම්බර් මස 31 වන දිනට**

| වැය විෂය | වැය ශීර්ෂය | 2016 වෙන්කළ ප්‍රතිපාදන (රු) | සත්‍ය වශයෙන් වැය වූ ප්‍රතිපාදන මුදල (රු) | ඉතිරි ප්‍රතිපාදන මුදල (රු) |
|---|---|---|---|---|
| ගොඩනැගිලි හා සැකසුම් | 2001 | 2,000,000.00 | 1,745.221.23 | 254,778.77 |
| යන්ත්‍ර සහ යන්ත්‍ර උපකරණ | 2002 | 4,767,000.00 | 4,687,000.50 | 79,999.50 |
| වාහන | 2003 | 2,500,000.00 | 1,962,273.87 | 537,726.13 |
| ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ | 2102 | 2,500,000.00 | 2,458,836.61 | 41,163.39 |
| යන්ත්‍ර සහ යන්ත්‍ර උපකරණ | 2103 | 9,000,000.00 | 8,943,099.12 | 56,900.88 |
| ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 2104 | 16,000,000.00 | 15,983,642.06 | 16,357.94 |
| පුහුණු කිරීම් හා හැකියාවන් වර්ධනය | 2401 | 1,000,000.00 | 939,597.90 | 60,402.10 |
| එකතුව (රු.) | | 37,767,000.00 | 36,719,671.29 | 1,047,328.71 |

13.5 වගුව: මුදල් සාරාංශය - ප්‍රාග්ධන ප්‍රතිපාදන




13.3 ප්‍රස්ථාරය: ප්‍රාග්ධන ප්‍රතිපාදන

## වාර්ෂික ප්‍රගති සමාලෝචන වාර්තාව ඉදිරිපත් කිරීම 2016
## අධ්‍යක්ෂ පුද්ගල හා පරිපාලන දෙපාර්තමේන්තුව

1. අධ්‍යක්ෂ පුද්ගල හා පරිපාලන දෙපාර්තමේන්තුව මගින් 2016 වසර තුල සිදු කරන ලද කාර්යභාරයන් පහත සඳහන් පරිදි වේ.
   - ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවට අනුයුක්ත වෙරළ ආරක්ෂක පුද්ගලයින්ගේ අවශ්‍යතාවයන් පරිදි මෙම දෙපාර්තමේන්තුව ඇතුලත මාරු කිරීම.
   - ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක පුද්ගලයින්ගේ දුක්ගැනවිලි හා අභියාචනා සම්බන්දයෙන් කටයුතු කර විසඳුම් ලබා දීම.
   - වෙරළ ආරක්ෂක පුද්ගලයින් සඳහා වෙරළ ආරක්ෂක හැඳුනුම්පත් නිකුත් කිරීම.
   - වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව වෙත ඉඩම් අත්පත් කර ගැනීමට හා පවරා ගැනීමට අවශ්‍ය කටයුතු කිරීම.

| අනු අංකය | විස්තරය |
|---|---|
| 01. | 2016 වර්ෂය සඳහා ශ්‍රී ලංකා නාවික හමුදාවෙන් මෙම දෙපාර්තමේන්තුව වෙත අනුයුක්ත කරන ලද නිලධාරීන් සංඛ්‍යාව - 41 යි |
| 02. | 2016 වර්ෂය සඳහා ශ්‍රී ලංකා නාවික හමුදාවෙන් මෙම දෙපාර්තමේන්තුව වෙත අනුයුක්ත කරන ලද නාවිකයින් සංඛ්‍යාව - 437 යි |
| 03. | නාවිකයින්ගේ දුක්ගැනවිලි හා අභියාචනා සම්බන්දයෙන් සිදු කරන ලද මාරුකිරීම් සහ සේවා දිගු ලබා දීම - 119 |
| 04. | දැනට ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක වරුණ ආයතනය පිහිටුවා ඇති හරිත උයනට අයත් ඉඩමේ හෙක්ටයාර 0.3868 ප්‍රමාණයක් තිබිරිගසයාය ප්‍රාදේශීය ලේකම් විසින් 2016 මාර්තු මස 04 වන දින භුක්තිය පවරා දෙන ලදි. |
| 05. | ජනපති දෙවර්ෂ පදවි ප්‍රාප්තිය නිමිතිකොට ගෙන ලේ දන් දීමේ පිංකමක් 2016 දෙසැම්බර් මස 28 වන දින වැල්ලවත්ත, ශ්‍රීලංවෙආ වරුණ ආයතනය තුලදී සිදුකරන ලදි. |
| 06. | වැලිගම නගරය අවට වෙරළ තීරයේ පිරිසිදු කිරීමේ වැඩ සටහනක් 2016 අගෝස්තු මස 30 වන දින සිදු කරන ලදි. |
| 07. | 2016 සැප්තැම්බර් මස 17 වන දින මට්ටක්කුලිය, කාක දූපතේදී පැවති ජාතික වෙරළ හා සමුද්‍රීය සම්පත් සුරකීමේ සතියට සමගාමීව පවත්වන ලද ආරම්භක උත්සවය සඳහා වෙරළ ආරක්ෂක පුද්ගලයින් සහභාගි කර වීම. |
| 08. | ජාතික වෙරළ සුරකීමේ දිනයට සමගාමීව ගාල්ල ප්‍රදේශයේ වෙරළ තීරය පිරිසිදු කිරීම සඳහා 2016 සැප්තම්බර් මස 23 වන දින වෙරළ ආරක්ෂක පුද්ගලයින් සහභාගි කර වීම. |
| 09. | ජාතික වන රෝපණ වැඩ සටහනට අනුව වෙරළ ආරක්ෂක දෙපාරතමේන්තුවේ රුක් රෝපණ වැඩ සටහනක් 2016 ඔක්තෝබර් මස 31 වන දින ශ්‍රී ලංකාවෙරළ ආරක්ෂක අණුබණ්ඩය දික්ඕවිටදී පැවැත්වීම |

13.6 වගුව: වාර්ෂික ප්‍රගති සමාලෝචන වාර්ථාව ඉදිරිපත් කිරීම 2016


වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ විහිදීම
උතුරු ප්‍රදේශය
ශ්‍රීලංවෙආ මූලස්ථානය
පසු මූලස්ථානය
ප්‍රාදේශීය මූලස්ථානය
ශ්‍රීලංවෙආ කඳවුර
ශ්‍රීලංවෙආ ස්ථානය
උප ස්ථානය
ජීවිතාරක්ෂක මුර කුටි
ජීවිතාරක්ෂක රාජකාරි ස්ථාන
ධීවර කටයුතු අධීක්ෂණ ස්ථාන
කන්කසන්තුරය
පේදුරුතුඩුව
තිලාවේලි
කොඩ් බේ
නැගෙනහිර ප්‍රදේශය
කල්පිටිය
හලාවත
තොඩුවාව
මාඕය මෝය
බටහිර ප්‍රදේශය
මීගමුව
දික්ඕවිට
ගාලු මුවදොර
වැල්ලවත්ත
දෙහිවල/ගල්කිස්ස
පානදුර
බේරුවල
මොරගොල්ල
අලුත්ගම
බෙන්තොට
බලපිටිය
අම්බලන්ගොඩ
හික්කඩුව
ගාල්ල
උණවටුන
පොල්හේන
මිරිස්ස
දෙවුන්දර
ගන්දර
කුඩාවැල්ල
තිල්වැල්ල
තංගල්ල
හම්බන්තොට
කිරින්ද
ඔලුවිල්
දකුණු ප්‍රදේශය




13.4 ප්‍රස්ථාරය: ස්ථානය අනුව ජීවිත බේරාගත් ප්‍රමාණය (ඇමුණුම ඇ)




13.5 ප්‍රස්ථාරය: මාසයන් අනුව ජීවිත බේරාගත් ප්‍රමාණය

### ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව සතු යාත්‍රා යොදවා ඇති ආකාරය



**FPC** – PAST PATROL CRAFT

**IPC**- INSHORE PATROL CRAFT

**ප්‍රාදේශීය අධ්‍යක්ෂ උතුරු පළාත වෙත අනුයුක්ත කර ඇති යාත්‍රා**

**කන්කසන්තුරේ FPC**
සීජී 42
සීජී 43
සීජී 44
සීජී 45
සීජී 47
සීජී 48

**ත්‍රිකුණාමලය FPC**
සීජී 40
සීජී 41
සීජී 46
සීජී 49

උතුරු පළාතට අයත් **IPC**
සීජී 15
සීජී 16

තම්මැන්නා **IPC**
සීජී 17

**ප්‍රාදේශීය අධ්‍යක්ෂ බටහිර පළාත වෙත අනුයුක්ත කර ඇති යාත්‍රා**

**දික්ඕවිට ධීවර වරාය**

සීජී 14

කොළඹ වරායට අනුයුක්ත කර ඇති කුඩා යාත්‍රා

සීජී 20
සීජී 21

**ප්‍රාදේශීය අධ්‍යක්ෂ දකුණු පළාත වෙත අනුයුක්ත කර ඇති යාත්‍රා**

ගාල්ල වරාය
IPC - සීජී 12
IPC - සීජී 18

මිරිස්ස වරාය
IPC - සීජී 19

| අනු අංකය | පාඨමාලාව | පාඨමාලා ප්‍රමාණය | සහභාගී වූ ප්‍රමාණය | රට |
|---|---|---|---|---|
| 1 | ප්‍රාදේශීය සමුද්‍රීය යාත්‍රා පරීක්ෂා කිරීමේ පාඨමාලාව | 01 | 02 | ඕස්ට්‍රේලියාව |
| 2 | සෝදිසි කිරීම් හා මුදවා ගැනීම හා සම්බන්ධතාවය පිලිබඳ වැඩසටහන | 01 | 05 | ඉන්දියාව |
| 3 | සමුද්‍රය නීති බලාත්මක කිරීමේ වැඩ සටහන | 01 | 01 | ජපානය |
| 4 | සමුද්‍රීය කටයුතු පිළිබඳ විද්‍යාපති උපාධිය | 01 | 01 | ස්වීඩනය |
| 5 | එක්සත් ජනපද ජාත්‍යන්තර වෙරළ ආරක්ෂක සමුද්‍රීය නිලධාරී පාඨමාලාව | 01 | 02 | ඇ.එ.ජ |
| 6 | ජාත්‍යන්තර ඒකාබද්ධ සුරක්ෂිතාව හා ආරක්ෂාව පිලිබඳ වැඩසටහන හා අභ්‍යාසය | 01 | 01 | රුසියාව |
| 7 | ඉන්දියානු සාගර කථිකාව | 01 | 01 | ඉන්දුනිසියාව |
| 8 | ආසියානු වෙරළ ආරක්ෂක ප්‍රධානින්ගේ රැස්වීම | 01 | 01 | ඉන්දුනිසියාව |
| 9 | බෙන්ගාල බොක්කේ හා අන්දමන් මුහුදු ප්‍රදේශයේ සමුද්‍රිය හා සංක්‍රමණික ආරක්ෂාව | 01 | 01 | ඉන්දුනිසියාව |
| 10 | සමුද්‍ර ආරක්ෂක පාලන ශක්‍යතා වර්ධනය කිරිමෙ වැඩමුළුව | 01 | 02 | කොරියාව |

13.7 වගුව: විදේශ පුහුණු පාඨමාලා හා සංචාර

| අනු අංකය | දේශිය පාඨමාලා | පාඨමාලා ප්‍රමාණය | සහභාගී වූ ප්‍රමාණය | වෙනත් කරුණු |
|---|---|---|---|---|
| 1 | වෙරළ ආරක්ෂක හඳුන්වාදීමේ පාඨමාලාව | 04 | 157 | |
| 2 | නැව් ආශ්‍රිත නිලධාරී පාඨමාලාව | 03 | 87 | එක්සත් ජනපද වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ ජංගම පුහුණු කණ්ඩායම හා ඒකාබද්ධ කාර්ය බලකාය (බටහිර) |
| 3 | තෙල් කාන්දුවීම් පිලිබඳ දැනුවත්කිරීම් හා ප්‍රතික්‍රියා මාර්ග පිළිබඳ පාඨමාලාව | 03 | 120 | ජපාන වෙරළ ආරක්ෂක දෙපාර්තුමේන්තුවේ ආපදා මර්ධන බළකාය හා 71ශ්‍රී ලංවෙඅ |
| 4 | RFD යාත්‍රා හැසිරවීම සහ ජලතරණ පාඨමාලාව | 01 | 10 | |
| 5 | සිද්ධි විධාන පද්ධතිය පිළිබඳ පාඨමාලාව | 02 | 17 | |
| 6 | ආපදා මර්ධනය හා පරිසරය සුරැකීමේ පාඨමාලාව | 02 | 27 | |
| 7 | සෝදිසි කිරීම්, මුදවා ගැනිම හා සම්බන්දතාවය පිලිබඳ පාඨමාලාව | 01 | 6 | |
| 8 | මුලික ජීවිතාරක්ෂක හා බේරාගැනීම් පාඨමාලාව | 07 | ශ්‍රී වෙ ආදෙ - 72<br>ශ්‍රී ලං නා හ - 26<br>ශ්‍රී ලං ගු හ - 10<br>සිවිල් - 22 | |
| 9 | ජීවිතාරක්ෂක අන්තර් මාධ්‍ය පාඨමාලාව | 03 | ශ්‍රී වෙ ආදෙ - 52<br>ශ්‍රී ලං නා හ - 04 | |
| **10** | ජීවිතාරක්ෂක ලෝකඩ පදක්කම් පාඨමාලාව | 01 | ශ්‍රී ලං නා හ - 04 | |
| **11** | කුඩා යාත්‍රා පැදවීම සහ ජලය මතුපිට පුහුණුව | 01 | ශ්‍රී වෙ ආදෙ - 21<br>ශ්‍රී ලං නා හ - 10<br>ශ්‍රී ලං යු හ - 10<br>පොලිසිය - 02<br>සිවිල් - 11 | ඕස්ට්‍රේලියානු වික්ටෝරියා ජීවිත ආරක්ෂක සංගමය හා ශ්‍රී ලංකා ජීවිතාරක්ෂක සංගමය |

13.8 වගුව:දේශිය පුහුණු පාඨමාලා

13.9 වගුව: ස්ථාපිත කිරීමට නියමිත කදවුරු

| අනු අංකය | ආයතනය | අනුබන්ධ / උප අනුබන්ධ | කදවුර ස්ථාපිත කිරීමට අපේක්ෂිත ස්ථානය | කදවුරේ ඇති වැදගත් කම |
|---|---|---|---|---|
| 01 | හලාවත (අධිකාරියට පත් කිරීම) | | නීති විරෝධි වාර්තා නොවන හා අවිධිමත් ධිවර කටයුතු වැලැක්වීම් ඇතුලුව මෙම ප්‍රදේශය තුළ සිදුවන සියලුම නීති විරෝධි ක්‍රියා වැලැක්වීම සඳහා කටයුතු කිරීම. | උප අනුබන්ධ වන තොඩුවාව, මා ඔය මෝය, මීගමුව හා කල්පිටිය, හලාවත ආයතනය යටතේ පාලනය වීමට නියමිතය |
| 02 | කිරින්ද | කලවැටිය සුදුවැල්ල | | කලමැටිය සහ සුදුවැල්ල යන උප අනුබන්ධ අළුතින් ස්ථාපිත කිරීමට නියමිතය. එම උප අනුබණ්ඩ දෙකත් සමග උප අනුබන්ධ වන තංගල්ල, හම්බන්තොට හා කුඩාවැල්ල කිරින්ද ආයතනය යටතේ පාලනය වීමට නියමිතය |
| 03 | ඔළුවිල් | වාලච්චේන | | ඔළුවිල් ආයතනය ස්ථාපිත කිරීම හරහා වාලච්චේන උප අනුබන්ධය ස්ථාපිත කොට මෙම ආයතනය යටතේ පාලනය වීමට නියමිතය. |
| 04 | ත්‍රිකුණාමලය | මුලතිව් ඉලංගතුරෙයි පොඩුවකට්ටු | | ඉඩමක් අත්පත් කර ගැනීමෙන් පසු ත්‍රිකුණාමලය ආයතනය ඉදිකිරීමට නියමිත අතර මෙම ආයතනය යටතේ නව උප අනුබන්ධ වන මුලතිව්,ඉලංගතුරෙයි සහ පොඩුවකට්ටු ඉදිකර පාලනය වීමට නියමිතය තවද දැනට ස්ථාපිත කොට ඇති උප අනුබන්ධ වන නිලාවේලි සහ කොඩ්ඩෙබ් අනුබන්ධය මෙම කදවුර යටතේ පාලනය වීමට නියමිතය |
| 05 | පේදුරුතුඩුව | ගුරුනගර්, ඩෙල්ෆ්, වලෙයි | | පේදුරුතුඩුව ආයතනය ස්ථාපිත කොට ඒ යටතේ අනුබන්ධ ඩෙල්ෆ් , උප අනුබන්ධ, ගුරුනගර් සහ වලෙයි අළුතින් ඉදිකොට පාලනය කිරීම |
| 06 | තලෙයිමන්නාරම | සිලාවතුර, පේසාලේ | | සිලාවතුර සහ පේසාලේ උප අනුබන්ධ ස්ථාපිත කිරීමෙන් අනතුරුව තලෙයිමන්නාරම ආයතනය යටතේ පාලනය වීමට නියමිතය |

# 14. ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය

## 14.1 සමාලෝචනය

ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විද්‍යාලය (කොආවි) 1981 අංක 68 දරණ ශ්‍රීමත් ජෝන් කොතලාවල රාජ්‍ය ආරක්ෂක අභ්‍යාස ආයතන පනත යටතේ ස්ථාපිත කරන ලද අතර පසුව සිදු කරන ලද සංශෝධන කීපයක් මගින් එහි මෙහෙයුම් විෂය පථය පුළුල් කර ඇත. 1988 අංක 27 දරන (සංශෝධන) පනත මගින් අභ්‍යාස ආයතනය විශ්ව විද්‍යාලයක තත්ත්වයට උසස් කරන ලද අතර 2007 අංක 50 දරන සංශෝධන පනතින් එය ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය ලෙස නැවත නම් කරන ලදී. එම විශ්ව විද්‍යාලය විසින් පිරිනමන උපාධි ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලය ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගන්නා අතර කොආවි පොදුරාජ්‍ය මණ්ඩලීය විශ්ව විද්‍යාල සංගමයේ (එක්සත් රාජධානිය) සහ ජාත්‍යන්තර විශ්ව විද්‍යාල සංගමයේ සාමාජිකයෙකුද වේ.

මෙම විශ්ව විද්‍යාලය ආරක්ෂක අමාත්‍යාංශය යටතේ කළමනාකරණ මණ්ඩලයක් මගින් පාලනය වන ස්වාධීන ආයතනයක් ලෙස ක්‍රියා කරන රජයේ විශ්ව විද්‍යාලයක් වන අතර, එය ත්‍රිවිධ සේවා පුද්ගලයන්ට, රටේ සුදුසුකම් ලත් තරුණ ප්‍රජාවට, විදේශීය සිසුන් සහ පුද්ගලික සහ රාජ්‍ය අංශයේ පුද්ගලයන්ට අදාළ විෂය ක්ෂේත්‍රවලින් ප්‍රථම උපාධි සහ පශ්චාත් උපාධි මට්ටමේ උසස් අධ්‍යාපන අවස්ථා පිරිනමයි.

## 14.2 2016 වර්ෂයේ කාර්යසාධනය

### 14.2.1 මූල්‍ය ප්‍රගතිය

මහා භාණ්ඩාගාරය ජාතික අයවැය හරහා කොආවි විශ්ව විද්‍යාලයේ ප්‍රාග්ධන හා පුනරාවර්තන අවශ්‍යතාව සඳහා මුදල් වෙන් කිරීම් සිදු කරයි. ඒ අනුව, 2008 සිට 2016 දක්වා ලැබුණු අයවැය වෙන් කිරීම් සාරාංශය පහත දැක්වේ.

| වර්ෂය | රජයේ දායකත්වය ලංකා රුපියල් මිලියන | | |
|---|---|---|---|
| | පුනරාවර්තන | ප්‍රාග්ධන | එකතුව |
| 2008 | 186 | 11 | 197 |
| 2009 | 208 | 33 | 241 |
| 2010 | 222 | 136 | 358 |
| 2011 | 310 | 387 | 697 |
| 2012 | 342 | 421 | 763 |
| 2013 | 377 | 451 | 828 |
| 2014 | 649 | 519 | 1168 |
| 2015 | 981 | 537 | 1518 |
| 2016 | 1030 | 122 | 1152 |

14.1 වගුව:2008- 2016 අයවැය වෙන් කිරීම්




14.1 ප්‍රස්ථාරය : අයවැය වෙන් කිරීම්

තවද, විශ්ව විද්‍යාල රෝහල ඉදිකිරීම 2013 වසරේ දී ආරම්භ කරන ලදී. රෝහල ඉදි කිරීම සහ වෛද්‍ය උපකරණ පිරිවැය සඳහා එක්සත් ජනපද ඩොලර් 201.629ක කාලීන ණය පහසුකම් ජාතික ඉතිරි කිරීමේ බැංකුව විසින් ලබා දෙන ලදී. 2014-2016 පොළී වාරික ගෙවීම සඳහා ප්‍රතිපාදන අයවැය මගින් වෙන් කරන ලදී.

| වර්ෂය | රජයේ දායකත්වය රු. මිලියන |
|---|---|
| 2014 | 940 |
| 2015 | 1541 |
| 2016 | 2077 |

14.2 වගුව: පොළී වාරික ගෙවීම සඳහා ප්‍රතිපාදන වෙන් කිරීම්

නිර්මිත පරිසරය හා අවකාශ විද්‍යා පීඨය හා පරිගණක පීඨය ස්ථාපනය කිරීම සඳහා 2014 වසරේ මුල් කාලයේ දී දක්ෂිණ මණ්ඩපයේ ඉදි කිරීම් කටයුතු ආරම්භ කරන ලදී. මෙම ව්‍යාපෘතියේ පළමු අදියර සඳහා ශ්‍රී ලංකා රුපියල් මිලියන 1,000 ක් වැය වන බවට තක්සේරු කර තිබෙන අතර ඉදි කිරීම ආරම්භ කිරීම සඳහා 2014 දී විශේෂ සංවර්ධන මූලාරම්භ අරමුදලෙන් ශ්‍රී ලංකා රුපියල් මිලියන 600ක මුළු මුදලක් ලබා දී තිබේ. තවද 2015 දී විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවෙන් රුපියල් මිලියන 250 ක් ලබා දෙන ලදී. ගොඩනැගිලි හා යටිතල පහසුකම් ඉදි කිරීම ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් ද අභ්‍යන්තර මාර්ග ජාලය ඉදි කිරීම ශ්‍රී ලංකා යුද්ධ හමුදා විසින් ද කඩිනමින් සිදු කරමින් පවතී.

### 14.2.2 ප්‍රධාන ප්‍රාග්ධන ව්‍යාපෘතිවල භෞතික ප්‍රගතිය

කොආවි විසින් සිදු කරන ප්‍රධාන ප්‍රාග්ධන ව්‍යාපෘති ලෙස හඳුනා ගත හැකි ව්‍යාපෘති තුනකි. ඒවා නම්;

- වෛද්‍ය පීඨ ගොඩනැගිල්ල ඉදි කිරීම.
- ඉංජිනේරු පීඨ ගොඩනැගිල්ල ඉදි කිරීම.
- විශ්ව විද්‍යාල රෝහල ඉදි කිරීම.
- සූරියවැව දක්ෂිණ මණ්ඩපය පිහිටුවීම.

### 14.2.2.1 වෛද්‍ය පීඨ ගොඩනැගිල්ල ඉදි කිරීම

මෙම ව්‍යාපෘතිය 2010 වර්ෂයේදී ආරම්භ කළ අතර ව්‍යාපෘතිය සඳහා වැය වන ඇස්තමේන්තුගත මුදල ශ්‍රී ලංකා රුපියල් මිලියන 1,477 ක් විය. මෙම ව්‍යාපෘතියේ පළමු හා දෙවන අදියර 2012 සහ 2013 යන වසරවල දී අවසන් කරන ලදී. වෛද්‍ය පීඨ ගොඩනැගිලි සංකීර්ණයේ තෙවැනි අදියර වන්නේ විශ්ව විද්‍යාලය සඳහා නිසි උපකරණවලින් සමන්විත නවීන ශ්‍රවණාගාරයක් ඉදිකිරීමය. වෛද්‍ය පීඨ ගොඩනැගිලි සංකීර්ණයේ ශ්‍රවණාගාරය සහ අනෙකුත් යටිතල පහසුකම් සංවර්ධනය ඉක්මනින් සම්පූර්ණ කිරීමට අපේක්ෂා කෙරේ. කෙසේ වුව ද අයවැය වෙන් කිරීමේ සීමා හේතුවෙන් ව්‍යාපෘතිය අවසන් කිරීමේ කාලය 2017 දක්වා දීර්ඝ කිරීමට සිදු විය.

2015.12.31 වන විට ඉදි කිරීම් කටයුතු සඳහා මුළු රුපියල් මිලියන 948.5 ක් වැය වී තිබිණි. 2015.12.31 වන විට ඉදි කිරීම්වල භෞතික ප්‍රගතිය ප්‍රතිශතය සියයට 65 ක් විය.

### 14.2.2.2 ඉංජිනේරු පීඨ ගොඩනැගිල්ල ඉදි කිරීම

ඉංජිනේරු පීඨය සඳහා රුපියල් මිලියන 500ක වියදමින් නව ගොඩනැගිල්ලක් ඉදි කිරීම 2013 දී ආරම්භ වූ අතර ඉදි කිරීම සඳහා අයවැය වෙන් කිරීම් වාර්ෂිකව ලබා දී ඇත. 2015 මාර්තුවලදී ගොඩනැගිල්ලේ I වන අදියර අවසන් කරන ලද අතර II වන අදියරේ ඉදි කිරීම් කටයුතු 2016 වසර තුළ අඛණ්ඩව සිදු කළ අතර අයවැය වෙන් කිරීම්වල සීමිත බව නිසා 2017 වසර දක්වා එය දිගු වනු ඇත. අනාගතයේ දී ශිෂ්‍ය බලය වැඩි වීමත් සමග ඔවුන්ට ඉඩ පහසුකම් සැපයීම සඳහා ඉංජිනේරු පීඨයට නව ගොඩනැගිල්ල පරිසර හිතකාමී බව, පිරිමැසුම්දායක බව, බලශක්තිය, පාරිසරික තිරසාර භාවය හා ධාරිතාව වැඩි දියුණු කිරීම ළඟා කර ගැනීමෙන් දායක වනු ඇත.

2015.12.31 වන විට ඉදි කිරීම් කටයුතු සඳහා රුපියල් මිලියන 252ක් වැය කරන ලදී.

### 14.2.2.3 විශ්ව විද්‍යාල රෝහල ඉදි කිරීම.



විශ්ව විද්‍යාල වෛද්‍ය පීඨයේ සායනික ඉගැන්වීම සඳහා පහසුකම් සැපයීම සඳහා එක්සත් ජනපද ඩොලර් මිලියන 201,629 ක වියදමින් පිළියන්දල වේරහැර විශ්ව විද්‍යාල රෝහලේ ඉදි කිරීම කටයුතු දැනටමත් ආරම්භ කර ඇත. ඇඳන් 704 ක්, ප්‍රභූ කාමර 50 ක් සහ මහාචාර්ය අධ්‍යයන ඒකක පහක් සහිත වූ අංග සම්පූර්ණ ශික්ෂණ රෝහල 2017 අගෝස්තු වන විට සිය මෙහෙයුම් ආරම්භ කරනු ඇත.

රෝහලේ ඉදි කිරීම් කටයුතු සම්පූර්ණ කිරීම සඳහාත් රෝහලට වෛද්‍ය හා වෙනත් උපකරණ සැපයීම සඳහාත් ජාතික ඉතිරි කිරීමේ බැංකුව (NSB) විසින් එක්සත් ජනපද ඩොලර් මිලියන 201,629 ක කාලීන ණය පහසුකමක් ලබා දෙන ලදී. ණය පොළිය සහ ප්‍රාග්ධන වාරික ආපසු ගෙවීම ආදී ණය පහසුකම් සේවා මහා භාණ්ඩාගාරය විසින් ගෙවනු ඇත.

විශ්වවිද්‍යාල රෝහලේ ඉදිකිරීම් කටයුතු කඩිනමින් සිදු කරමින් පවතින අතර එය විදේශ කොන්ත්‍රාත්කරු විසින් සිදු කරනු ලැබේ. මුළු වියදම එක්සත් ජනපද ඩොලර් මිලියන 162 කි.

2015 වසර අවසානය වන විට, ජාතික ඉතිරි කිරීමේ බැංකුව විසින් ඉදි කිරීම් කටයුතු සඳහා එක්සත් ජනපද ඩොලර් 128.3ක මුදලක් වැය කර ඇති අතර එක්සත් ජනපද ඩොලර් මිලියන 95ක් කොන්ත්‍රාත්කරු වෙත ලබා දී ඇත.

ඉදි කිරීම් කටයුතුවලින් සියයට 58 කට වඩා වැඩි ප්‍රමාණයක් 2015 අවසන් වන විට නිම කරන අතර 2017 මාර්තු වන විට ක්‍රියාත්මක වනු ඇත.

### 14.2.2.4 සූරියවැව දක්ෂිණ මණ්ඩපය පිහිටුවීම

ඉදි කිරීම් කටයුතු සඳහා ශ්‍රී ලංකා නාවික හමුදාවේ සහ මාර්ග ජාලය සඳහා ශ්‍රී ලංකා යුද හමුදාවේ දායකත්වය ඇතිව දක්ෂිණ මණ්ඩපය පිහිටුවීමේ කටයුතු සිදු කරන ලදී. 2015 අවසානය වන විට පළමු අදියරේ ඉදි කිරීම් කටයුතු අවසන් කරන ලදී (90%කට වඩා). නිර්මිත පරිසරය සහ අවකාශ විද්‍යා පීඨයේ සහ පරිගණක විද්‍යා පීඨයේ අධ්‍යයන කටයුතු 2015 පෙබරවාරි මස ආරම්භ කරන ලද අතර අතිගරු ජනාධිපතිතුමා විසින් 2015 මැයි 05වන දින මණ්ඩපය උත්සවාකාරයෙන් විවෘත කරන ලදී.

## 14.2.3 ස්වයං උත්පාදිත ආදායමෙන් අරමුදල්කරණය කරන ලද ප්‍රධාන ප්‍රාග්ධන ව්‍යාපෘති වල භෞතික ප්‍රගතිය

2012 වසරට පෙර, සියලුම ප්‍රාග්ධන ව්‍යාපෘති සඳහා රජය විසින් මුදල් ලබා දෙන ලදී. සියලු ප්‍රාග්ධන ව්‍යාපෘති සඳහා වාර්ෂික අයවැය වෙන් කිරීම් ලබා දෙන ලදී. විශ්වවිද්‍යාලයේ වර්තමාන කළමනාකාරීත්වය විසින් විදේශ ශිෂ්‍යයන් ඇතුළු දෛනික විද්‍යාර්ථීන්ට උසස් අධ්‍යාපන සුදුසුකම් අත් කර ගැනීම පිණිස විශ්වවිද්‍යාලයේ දොරටු විවර කිරීමට තීරණය කිරීමත්

සමඟ, ස්වයං-උත්පාදිත ආදායම් ක්‍රමයෙන් වැඩි වෙමින් ඇත. ඒ අනුව, 2012 වසරේ සිට ප්‍රාග්ධන ව්‍යාපෘති සඳහා අරමුදල් සැපයීමට ස්වයං-උත්පාදිත ආදායම උපයෝගී කර ගනු ලැබේ. පහත ව්‍යාපෘති සඳහා ස්වයං උත්පාදිත ආදායමෙන් අරමුදල් සපයා ඇත.

- සැරයන් හා සුළු නිලධාරී භෝජනාගාරය සහ නවාතැන් පහසුකම් සඳහා රුපියල් මිලියන 85 ක් වටිනා සය මහල් ගොඩනැගිල්ල.
- බැංකු ශාඛාව හා නවාතැන් පහසුකම් සඳහා වූ තෙමහල් ගොඩනැගිල්ල සඳහා රුපියල් මිලියන 28කට වඩා වියදම් කරන ලදී.
- පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය සඳහා ගොඩනැගිලි සංකීර්ණයක් ඉදි කිරීම.
- සිසුන් සඳහා නවාතැන් පහසුකම් වැඩි දියුණු කිරීම සහ කාර්ය මණ්ඩලය සඳහා මහල් නිවාස 20ක් ඇති කිරීම.



අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන් සඳහා නවාතැන් පහසුකම් සැපයීම පිණිස මහල් නිවාස 20ක් සහිත මහල් හයකින් යුත් ගොඩනැගිල්ලක් සහ නවාතැන් පහසුකම් අවශ්‍ය ශිෂ්‍යයන් සඳහා මහල් හයකින් යුත් ගොඩනැගිලි සංකීර්ණයක් සෑදීමට කොආවි අපේක්ෂා කරයි. මෙම ව්‍යාපෘතිය 2014 සිට ක්‍රියාත්මක විය.

මෙම ව්‍යාපෘතිය සඳහා රුපියල් මිලියන 460ක කාලීන ණය පහසුකමක් ලබා දීමට සම්පත් පීඑල්සී බැංකුව එකඟ විය. වසර 15ක කාල පරිච්ඡේදයක් පුරා ස්වයං-උත්පාදනය කරන අරමුදල්වලින් ණය සේවාව සිදු කළ අතර ස්වයං-උත්පාදනය කරන අරමුදල්වලින් ණය පියවීමට අපේක්ෂා කෙරේ.

අමාත්‍ය මණ්ඩල අනුමැතිය සහ ණය පහසුකම් ඇතුළුව සියලු කටයුතු සම්පූර්ණ කර ඇත. මේ අතර, ඉදි කිරීමේ කණු සිටු වීමේ වැඩකටයුතු දැනටමත් සම්පූර්ණ කර ඇති අතර ශිෂ්‍ය නිවාස ගොඩනැගිල්ලේ ඉදි කිරීම් කටයුතු ප්‍රකට ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවෙකුට පිරිනමා ඇති අතර මහල් නිවාස සෑදීමේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය අවසාන කරමින් පවතී.

## 14.2.4 කාර්ය මණ්ඩලයේ ශක්‍යතා වර්ධනය

### 14.2.4.1 කාර්ය මණ්ඩල සුභසාධනය

- සේවය ඇගයීම
  - හොඳම සිවිල් සේවකයින් ලෙස සේවකයින් සඳහා සහතික පත්‍ර පිරිනමන ලදී
- දීර්ඝ කාලීන සේවා සම්මානය
  - වසර 30ක සේවා කාලයක් සම්පූර්ණ කළ සේවකයන් සඳහා රිදී පදක්කම් සහ මුදල් වවුචර පිරිනමන ලදී.
  - වසර 25ක සේවා කාලයක් සම්පූර්ණ කළ සේවකයන් සඳහා සහතික පත්‍ර, මුදල් වවුචර, ලෝකඩ පදක්කම් පිරිනමන ලද අතර ඉතිරි සේවකයින් සඳහා සහතික පත්‍ර පිරිනමන ලදී.
  - වසර 20ක සේවා කාලයක් සම්පූර්ණ කළ සේවකයන් සඳහා සහතික පත්‍ර හා මුදල් වවුචර පිරිනමන ලදී.
- කොආවි කාර්ය මණ්ඩලය සඳහා ප්‍රදානය කළ ණය
  - සේවකයින් 156 දෙනෙක් සඳහා ආපදා ණය ලෙස රු. 17,701,267.32.
  - සේවකයින් 83 දෙනෙක් සඳහා ස්වයං-මූල්‍ය අරමුදල් ණය ලෙස රු. 6,078,535.00.
  - සේවකයින් 166 දෙනෙක් සඳහා ස්ථිර සිවිල් කාර්ය මණ්ඩල සුභසාධන අරමුදලින් ණය ලෙස රු. 2,808,000.00.
- කොආවි සේවකයින් සඳහා රු. 5000.00 තෑගි වවුචර පිරිනමන ලදී.

## 14.2.5 ස්ථිර කාර්ය මණ්ඩල සිවිල් සුභසාධන අරමුදලින් සිදු කළ කාර්යයන්

- 2016.06.29 - "මෙත්මල් පොසොන් බැති ගී සරණිය" ඉදිරිපත් කිරීම.
- 2016.11.05 - වාර්ෂික රැස්වීම පැවැත්වීම.
- 2016.12.04- නත්තල් ගී ප්‍රසංගය පැවැත්වීම
- "මහරජ ගැමුණු" චිත්‍රපටය ප්‍රදර්ශනය කිරීම
- සාමාජිකයන් 130 දෙනෙක් අලුතින් බඳවා ගැනීම.
- කොආවි හි සේවය කළ මියගිය ඩබ්ලිව්.ඒ.වීරරත්න මහතාගේ වැන්දඹු බිරිඳ හා දරුවන් වෙත නිවසක් ත්‍යාගයක් ලෙස ලබාදීම.(මුළු පිරිවැය රු.1,268,000.00
- කොආවි සේවකයින් තිදෙනෙකුගේ පහ වසර ශිෂ්‍යත්ව විභාගය සමත් වූ දරුවන් දෙදෙනෙක් සඳහා රු. 5000.00ක ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම හා අ.පො.ස. සාමාන්‍ය පෙළ සමත් වූ ශිෂ්‍යයෙක් සඳහා රු. 7,500.00ක ශිෂ්‍යත්වයක් ප්‍රදානය කිරීම.

- විශ්‍රාමගත් සේවකයින් 5 දෙනෙක් සඳහා රු. 220,000/-ක මුදල් ත්‍යාග පිරිනමන ලදී.

## 14.3 ඉදිරි වසර සඳහා කල් තබන ලද කාර්යයන්

- වෛද්‍ය පීඨ සංකීර්ණය ඉදි කිරීමේ ව්‍යාපෘතියේ තෙවන අදියර (ශ්‍රවණාගාරය)
- කොආවි රෝහල ඉදි කිරීම.
- ඉංජිනේරු පීඨය ඉදි කිරීමේ ව්‍යාපෘතියේ II අදියර.
- දක්ෂිණ මණ්ඩපයේ අදියර II සහ III.

## 14.4 ගැටළු සහ අභියෝග

- ශිෂ්‍ය භට නිලධාරීන්ට නේවාසික පහසුකම් සපයන ලද නමුත් දෛනික සිසුන් සඳහා නවාතැන් පහසුකම් සැපයීම දුෂ්කර වීම.
- නිලධාරි ශිෂ්‍යභටයන්ට විශ්වවිද්‍යාලය සමග බැඳුම්කරයක්, එනම් උපාධිය අවසන් කිරීමෙන් පසුව වසර 12ක බැඳුම්කරයක් අත්සන් කිරීමට සිදු වන නිසා කොආවි සමග එක් වීමට සමහර තරුණයන් පසුබට වීම.
- කොආවි ගැන පොදු ජනතාවගේ දැනුවත් බව සීමිත වීම.
- අපේක්ෂිත සැලසුම් කළ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වියදම සමග අයවැය ප්‍රතිපාදන නොගැළපීම.
- අනෙකුත් විශ්වවිද්‍යාලවලට ශිෂ්‍යයන් එම විශ්වවිද්‍යාලවල බැඳුම්කර නොපැවතීම සහ යම් විශේෂිත විෂය ක්ෂේත්‍ර පිළිබඳව ඒවායේ පවතින නම් දැරීම නිසා ආකර්ෂණය වීම.
- හොඳම විද්‍යාර්ථීන් අන්තර්ග්‍රහණය සහ බඳවා ගැනීම සඳහා වන තරඟය.
- කොආවි පිළිබඳව උසස් අධ්‍යාපන තරඟකරුවන් සහ හමුදා විරෝධී සංවිධානවල සෘණාත්මක ආකල්පය සහ ප්‍රචාරය.
- සිවිල් ශිෂ්‍යයන් විනය නීති සහිත පරිසරයක් යටතේ අධ්‍යාපනය ලැබීමට පසුබට වීම.

## 14.5 අනාගත අපේක්ෂා

- හම්බන්තොට සූරියවැව ප්‍රදේශයේ කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ දක්ෂිණ මණ්ඩපය අදියර 11 සහ 111 අවසන් කිරීම
- උතුරු පළාතේ කොආවි පිහිටුවීම
- කොආවි සේවක සංඛ්‍යා තනතුරු සංශෝධනය
- ෙවෛද්‍ය පීඨය සඳහා විශ්වවිද්‍යාල රෝහල පිහිටුවීම
- කොආවි උපාධි හැදෑරීමට අ.පො.ස. උසස් පෙළ විභාගයෙන් ඉහළ ප්‍රතිඵල ලබා ගත් සිසුන්හට ශිෂ්‍යත්ව ලබා දීම
- නව කොආවි පනත නීතිගත කිරීම
- අභ්‍යන්තර විගණන අංශය පුළුල් කිරීම
- අර්ධකාලීන උපාධි පාඨමාලා හඳුන්වා දීම
- ආරක්ෂක හා ක්‍රමෝපාය අධ්‍යයන සඳහා සංසදයක් පිහිටුවීම
- ඉංජිනේරුමය උපදේශන සේවා සැපයීම සඳහා මධ්‍යස්ථානයක් පිහිටුවීම
- ඉංජිනේරු පීඨයේ ජෛව වෛද්‍ය ඉංජිනේරු ශිල්පය සඳහා නව අධ්‍යයනාංශයක් පිහිටුවීම
- කර්මාන්ත පුහුණු ඒකක සහ වෘත්තීය මාර්ගෝපදේශ ඒකකයක් පිහිටුවීම
- සෞඛ්‍ය විද්‍යා පිළිබඳ පශ්චාත් උපාධි ආයතනයක් පිහිටුවීම
- කළමනාකරණය, සමාජ විද්‍යා සහ මානව ශාස්ත්‍ර සඳහා සමානයන් සමාලෝචිත ජර්නලයක් හඳුන්වා දීම
- දක්ෂිණ මණ්ඩපයේ ජල විද්‍යාත්මක මැනුම් ඒකකයක් පිහිටුවීම
- භූමිතික විද්‍යාගාරයක් පිහිටුවීම
- සැලසුම් සහ උපදේශන සේවා සඳහා මධ්‍යස්ථානයක් පිහිටුවීම
- මැනුම් විද්‍යා සඳහා ක්‍රමාංකන පාදමක් පිහිටුවීම
- සැලසුම් චිත්‍රාගාරයක් සහ වාස්තු විද්‍යාත්මක වැඩපොළක් පිහිටුවීම
- ශ්‍රව්‍ය දෘශ්‍ය විද්‍යාගාරයක් පිහිටුවීම
- විවෘත එළිමහන් රංග ශාලාවක් පිහිටුවීම
- FOC සඳහා අනුකාරක ඉන්කියුබේටරයක් පිහිටුවීම
- දක්ෂිණ මණ්ඩපයෙහි CCNA විද්‍යාගාරයක් විවෘත කිරීම
- HUAWAI විද්‍යාගාරයක් පිහිටුවීම
- උත්තෝලක විද්‍යාගාරයක් පිහිටුවීම
- කළමනාකරණ සහ මූල්‍ය දෙපාර්තමේන්තුව ප්‍රතිව්‍යුහගත කිරීම
- ත්‍රිවිධ සේවාවල සහ ජාතික අවශ්‍යතාවලට සුදුසුකම්ලත් වෘත්තිකයන් සැපයීමට නව අධ්‍යයන පාඨමාලා හඳුන්වා දීම
- කොආවි වැඩසටහන් සඳහා ජාත්‍යන්තර අනුබද්ධ, සහයෝගීතා, සහතිකකරණ සහ හවුල්කාරත්ව පිහිටුවීම සහ ජාත්‍යන්තර මාර්ග නිර්ණායක සහ කඩඉම් සඳහා අයදුම් කිරීම.
- ජාතික ආයතන සමග සබඳතා, සහයෝගීතා, සහතිකකරණ, සහ හවුල්කාරත්ව ඇති කර ගැනීම
- ගුණාත්මක බවින් යුතු ඉගැන්වීම, පර්යේෂණ සහ සමාන ක්‍රියා සහතික කර ගැනීමට කොආවි පීඨ සහ අධ්‍යනාංශ සඳහා නවීන පහසුකම් සැපයීම
- කාර්ය මණ්ඩලය සහ ශිෂ්‍යයන්සඳහා ප්‍රමාණවත් තරම් නවාතැන් පහසුකම් සහ භෝජනාගාර පහසුකම් සැපයීම

- උසස් තත්ත්වයේ ක්‍රීඩා සහ පුහුණු පහසුකම් සැපයීම
- විශ්වවිද්‍යාලය තුළ උසස් තත්ත්වයේ, ආරක්ෂිත සහ පිරිසිදු පරිසරයක් පවත්වා ගැනීම
- කාර්යක්ෂමතාව වැඩි කිරීමට වෙනත් සේවා සහ පහසුකම් සැපයීම
- කැපවීම සහ කැපකිරීම සඳහා කාර්ය මණ්ඩලය අභිප්‍රේරණය කිරීම
- කොආවි කාර්ය මණ්ඩලය සඳහා වෘත්තීය වර්ධන අවස්ථා ලබා දීම
- ආරක්ෂාව සම්බන්ධ නව අධ්‍යයන පාඨමාලා හඳුන්වා දීම
- ආරක්ෂක අධ්‍යයන පිළිබඳ පර්යේෂණ සඳහා කලාපය තුළ මනාව පිළිගත් ආයතනයක් ලෙස කොආවි ස්ථාපිත කිරීම
- උපාධි අපේක්ෂකයන්ට විෂය බාහිර සහ විෂය සමගාමී ක්‍රියාකාරකම් සඳහා අවස්ථා ලබා දීම දිවිය පුරා පවතින ඉගෙනුම් ක්‍රියාවලියක් සඳහා ශිෂ්‍යාන්හට ස්ව-අභිප්‍රේරණය ඇති කිරීමෙන් බලගැන්වීම

# 15.රාජ්‍ය බුද්ධි සේවය

## 15.1 සමාලෝචනය

පොලිස් දෙපාර්තමේන්තුවෙහි පැරණිම බුද්ධි අංශය අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට උරුමය කරමින් එහි විශේෂ ශාඛාව ලෙස ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම බුද්ධි ආයතනය රාජ්‍ය බුද්ධි සේවාව (රාබුසේ) වේ. මෙම රාජ්‍ය බුද්ධි සේවාවේ ඉලක්කයන් පහසුවෙන් ආවරණය කිරීමට හැකිවන පරිදි කොට්ඨාශ 05 පළාත් ඒකක 13 සහ දිස්ත්‍රික් බුද්ධි කාර්යාංශ 93 (දි.බු.සේ) යටතේ බෙදා දක්වා ඇත.මෙම පළාත් ඒකක හා දි.බු.සේ මගින් තොරතුරු රැස්කරන අතර, රටේ දේශපාලන සමාජ හා ආර්ථික ස්ථාවරත්වයට වන ඕනෑම තර්ජනයක් සම්බන්ධයෙන් ක්‍රියාත්මක වීම සඳහා මෙම අංශ පිහිටුවා

ඇත.එමෙන්ම රාජ්‍ය බුද්ධි සේවාව ලෝකය පුරා ප්‍රධාන විදේශ බුද්ධි ආයතන සමග වඩාත් සමීප සහයෝගයන් පවත්වා ගනිමින් විදේශ අගනුවර වල බුද්ධි අංශ ස්ථාපිත කර ඒකක හරහා බාහිර තර්ජන අධීක්ෂණය කරයි.වර්තමානයේ ජාතික ආරක්ෂාව සහතික කරන

බුද්ධි අංශයක් ලෙස රාජ්‍ය බුද්ධි සේවාව ඉහල නැංවීමට වෘත්තීමය මට්ටමින් වගකීම් ඉටු කිරීමට උත්සුක වන විනය ගරුක සේවක මණ්ඩලය බව වියතුන්ගේ අදහස වේ.

### 15.1.1 වටිනාකම්

- **විශිෂ්ටතා** - ඉහළ වෘත්තීය පරිමිතිය හා අඛණ්ඩතාවය තිබිම.
- **නිදහස** - පිටස්තර ඇඟිලි ගැසීම්වලින් තොරව ආයතනයේ සම්මතයට හා ප්‍රමිතියට අනුව රාජකාරි කිරිම
- **කණ්ඩායම් හැඟීම** - රාජ්‍ය බුද්ධි සේවාව කණ්ඩායමක් ලෙස කටයුතු කර කීර්තියක් ඇති අතර, එහි සියලු වැඩ කණ්ඩායම් හැඟිමෙන් සිදු කරයි.
- **විශ්වාසවන්තභාවය හා විනයගරුක බව -** රාජ බුද්ධි සේවාවේ මූලික පදනම අන්නෝන්‍ය විශ්වාසය හාඅවබෝධය වේ. එයද පොලිස් තනතුරු මෙන්ම සිවිල් ඇදුමෙන් සැරසි වැඩ කරන මනා ශික්ෂණයකින් යුතු අපගේ කාර්ය මණ්ඩලය සතුව පවති.
- **පිළිගැනිම -** රට තුල ඇති ප්‍රමුඛතම බුද්ධි අංශය වීම නිසා රාජ්‍ය බුද්ධි සේවාව දේශීය හා ජාත්‍යන්තර වශයෙන් ඉහළ පිළිගැනිමක් ඇත. එම නිසා රාජ්‍ය බුද්ධි සේවාවේ කාර්ය මණ්ඩලය තම ආයතනය පිළිබඳ ආඩම්බර වේ.
- **ප්‍රදානයන්** - පුහුණු කාර්ය මණ්ඩල සාමාජිකයින් පිළිගත් ඇගයීමකට ලක් වේ.
- **ඵලදායික පරිසරය** - ඕනෑම කෙනකුට වැඩ කිරීම සඳහා රාජ්‍ය බුද්ධි සේවාව තුල දිරිගැන්වීමක් ඇති පරිසරයක් ඇත.
- **නවීනත්වය** - රාජ්‍ය බුද්ධි සේවාව සෑම විටම සංවර්ධනය සඳහා නව අදහස් හා ව්‍යාපෘති පිළි ගැනීමට සූදානම්ය.
- **වගකීම හා වගවීම** - වගකීම හා වගවීම ඉහලම අර්ථයෙන් රාජ්‍ය බුද්ධි සේවාව ක්‍රියාත්මක කරයි

| අනු අං | වැඩසටහනේ නම | අපේක්ෂිත නිමැවුම | ප්‍රතිපාදන රු.(මිලි) | වියදම රු. (මිලි) | භෞතික ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | | මිනුම් ඒකකය | ඉලක් කය | සාක්ෂාත් කර ගැනීමේ ප්‍රතිශතය |
| 1 | වායු සමීකරණ යන්ත්‍ර 10 ක් මිලදී ගැනීම | සුව පහසු කාර්යාල පරිසරයක් පවත්වාගෙන යාමට | 1 | 0.744 | ඒකක 10 | 80% | 100% |
| 2 | පරිඝණක යන්ත්‍ර 30 ක්, යූ.පී.එස් ඒකක 30 ක් ,තිත් න්‍යාස මුද්‍රක 05 ක් , ලේසර් මුද්‍රණ 05 ක් මිලදී ගැනීම | රා.බු.සේ සහ ඒකක සඳහා තොරතුරු ජාලය පුළුල් කිරීම | 3 | 3.05 | ඒකක 70 | 85% | 100% |
| 3 | රූපවාහිනි යන්ත්‍ර 20 ක් මිලදී ගැනීම | විනෝදාංශයක් වශයෙන් සහ කාලීන තොරතුරු පිළිබඳ දැනුවත් වීම | 0.8 | 0.87 | ඒකක 20 | 80% | 100% |
| 4 | රාජ්‍ය බුද්ධි සේවාවේ අංක 34 කාර්යාලය සඳහා සන්නිවේදන ඇමතුම් පද්ධතියක් ස්ථාපිත කිරීම | සන්නිවේදන කාර්යය වඩාත් පහසු කිරීම සඳහා | 1 | 0.63 | ඒකක 01 | මිලදී ගැනීමට කටයුතු සකස් කර ඇත. | |
| 5 | රාජ්‍ය බුද්ධි සේවා ප්‍රධාන කාර්යාලයේ වායු සමීකරණ පද්ධතියේ විලර් යන්ත්‍රය අලුත්වැඩියා කිරීම. | සුව පහසු කාර්යාල පරිසරයක් පවත්වාගෙන යාමට | 2.36 | 2.36 | ඒකක 01 | ස්ථාපිත කිරීමට කටයුතු සකස් කර ඇත. | |
| 6 | IBM AS/ 400 පද්ධතිය නඩත්තුව සහ අළුත් වැඩියා කිරිමේ ගිවිසුම | මනා නඩත්තු කිරීමක් සඳහා | 0.4 | 0.38 | | 80% | 80% |
| 7 | fire wall & Spam filtering පද්ධතිය නඩත්තුව හා අළුත්වැඩියා ගිවිසුම | මනා නඩත්තු කිරීමක් සඳහා | 0.099 | 0.103 | | 80% | 80% |
| 8 | Licence Subcription of virus Guard නඩත්තුව සහ අළුත්වැඩියා ගිවිසුම | දත්ත ගබඩාව ආරක්ෂා කිරීමට | 0.099 | 0.1 | | 80% | 80% |
| 9 | විදුලි සෝපානය නඩත්තුව සහ අළුත්වැඩියා ගිවිසුම | මනා නඩත්තු කිරීමක් සඳහා | 0.3 | 0.3 | | 80% | 80% |
| 10 | ප්‍රධාන වායු සමීකරණ පද්ධතිය නඩත්තුව සහ අළුත්වැඩියා ගිවිසුම | මනා නඩත්තු කිරීමක් සඳහා | 3.52 | 3.49 | | 80% | 80% |
| 12 | අංක 34 කාර්යාලයේ දුරකථන පුවරුව නඩත්තුව සහ අළුත්වැඩියා ගිවිසුම | දුරකථන පුවරුව නිසි ක්‍රියාකාරිත්වයේ පවත්වා ගැනීමට | 0.12 | 0.12 | | 80% | 80% |

15.1 වගුව: 2016.01.01 සිට 2016.12.31 දක්වා වාර්ෂික වැඩසටහන්වල ප්‍රගතිය

| අනු අංකය | පාඨමාලා | සහභාගිත්වය | | | | | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| | | රාජ්‍ය නිවේදිත | ප්‍ර.පො.ප /පො.ප /උ.පො.ප සහ කා.ප්‍ර.පො.ප/කා. පො.ප/කා. උ.පො.ප | පො.සැ /පො.කො සහ කා.පො.සැ /කා.පො.කො | පර්යේෂණ නිලධාරීන් | හමුදා බුද්ධි නිලධාරීන් | |
| 1 | විදේශීය පුහුණු පාඨමාලා සහ සංචාර | 10 | 11 | 2 | | | 23 |
| 2 | විදේශීය පුහුණු පාඨමාලා (ශ්‍රී ලංකාව තුල) | 12 | 45 | 2 | | 8 | 67 |
| 3 | දේශීය බුද්ධි පුහුණු පාඨමාලා | 37 | 184 | 494 | 1 | | 716 |
| 4 | භාෂා පුහුණු පාඨමාලා (ඉංග්‍රීසි) | | 57 | 115 | | | 172 |
| 5 | භාෂා පුහුණු පාඨමාලා (දෙමළ) | | 3 | 127 | | | 130 |
| එකතුව | | 59 | 300 | 740 | 1 | 8 | 1108 |

15.2 වගුව: පුහුණු පාඨමාලා සාරාංශය

| ව්‍යාපෘතියේ නම | ස්ථානය | ව්‍යාපෘතිය සිදු කරන ආයතනය | මුදල් ලැබෙන මූලාශය | කාලය | අපේක්ෂිත මුදල | වෙන් කිරීම් 2016 දෙසැම්බර් දක්වා | වියදම් | ඉලක්කය | කාර්යය සාධනය |
|---|---|---|---|---|---|---|---|---|---|
| දත්ත ස්වයංක්‍රීයකරණ ව්‍යාපෘතිය | රාජ්‍ය බුද්ධි සේවාව | සන්ජේ ලංකා පුද්ගලික සමාගම | ශ්‍රී ලංකා රජය | අවු. 2 | 264.6 | 200 | 72 | දායාංග ස්ථාපනය සහ මෘදුකාංග නවීකරණය | ව්‍යාපෘතිය ආරම්භ කිරීම |

15.3 වගුව: දත්ත ස්වයංක්‍රීයකරණ ව්‍යාපෘතිය

# 16. පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය

## 16.1 සමාලෝචනය

පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ පරමාර්ථය වනුයේ නවීන තාක්ෂණයෙන් යුත් උපකරණයන් නිර්මාණය කිරීම, සංවර්ධනය කිරීම හා රාජ්‍ය ආරක්ෂක අංශ සහ රාජ්‍ය ආයතනයන් වෙත අවශ්‍ය නව සොයා ගැනීම් සිදුකිරීම මඟින් ජාත්‍යන්තරය සමග තරග කළ හැකි නවීන තාක්ෂණයෙන් යුතු සොයා ගැනීම් සිදුකරනු ලබන දේශීය ආයතනයක් බිහි කිරීමයි.

### 16.1.1කාර්යභාරයන්

- ආරක්ෂක අංශ වෙත අවශ්‍ය වන නවීන තාක්ෂණයෙන් යුතු උපකරණයන් සොයා ගැනීම හා නිෂ්පාදනය කිරීම.
- ආරක්ෂක හමුදාවන් වෙනුවෙන් අවශ්‍යවන උසස් තාක්ෂණයෙන් යුත් අවි ආයුධ පද්ධති හා නව තාක්ෂණික උපකරණයන් මෙරටදීම නිෂ්පාදනය කිරීම.
- ශ්‍රීලංකාව තුළ ආරක්ෂක හමුදාවන්ට අවශ්‍ය වන උපකරණ නිෂ්පාදනය කිරීම සඳහා පර්යේෂණ කටයුතු සිදුකිරීම හා එම උපකරණයන්හි රහස්‍යභාවය ආරක්ෂා කර ගැනීම.
- රාජ්‍ය ආරක්ෂාවට හා රටේ සංවර්ධනයට අවශ්‍ය වන තාක්ෂණික සහය ලබාදීම හා ඒ සඳහා අවශය උපකරණ මෙරට නිෂ්පාදන කිරීම හා වැඩිදියුණු කිරීම.

## 16.2 2016 වර්ෂයේ කාර්ය සාධනය

### 16.2.1 භෞතික හා මූල්‍ය ප්‍රගතිය

මෙම මධ්‍යස්ථානය ආරම්භයේ රෙම ශ්‍රීලංසංබ - පනාගොඩ කඳවුරෙහි ස්ථාන ගතවී සිටි අතර, ඉන් පසුව අංශ කිහිපයක් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයෙහි හා තවත් අංශ කිහිපයක් බණ්ඩාරණායක අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාවේ කුලී ගෙවීමේ පදනම මත ස්ථාන ගතව රාජකාරී කිරීමෙන් අනතුරුව 2015 වර්ෂයේ ස්ථිරව කාර්යාල සංකීර්ණ ගොඩනැගිල්ල ඉදිකර පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය මොරගහහේන පාර, පිටිපන ලිපිනයෙහි ස්ථිර වශයෙන් ස්ථානගතව රාජකාරී ආරම්භ කරන ලදී. ඉන්පසු පාලන කටයුතු සහ සෙසු නිළ නවාතැන් පහසුකම් සඳහා දෙමහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීමෙන් පසු තුන්වන අධියර යටතේ මෙම මධ්‍යස්ථානයේ පර්යේෂණ කටයුතු වල නියැලී සිටින නිළධාරීන්ගේ නේවාසික පහසුකම් සඳහා දෙමහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීමට කටයුතු කළ අතර, එම ගොඩනැගිල්ල ඉදිකිරීම් කටයුතු සාර්ථකව අවසන් කර 2017.01.20 වන දින ආරක්ෂක ලේකම් තුමාගේ ප්‍රධානත්වයෙන් විවෘත කිරීමට කටයුතු කරන ලදී.







| අනු අංකය | ව්‍යාපෘතියේ නම | ඇස්තමේන්තු ගත මුදල (රු) | ව්‍යාපෘතිය සඳහා වැයවූ මුදල (රු) | දේශීය/විදේශීය වෙළඳ පොල වටිනාකම | | ව්‍යාපෘතිය වෙතින් ඉතිරි වූ සම්පූර්ණ මුදල (රු.) |
|---|---|---|---|---|---|---|
| | | | | විදේශීය (රු.) | දේශීය (රු.) | |
| 1 | Small Arms Firing Simulator | 1,600,000.00 | 2,000,000.00 | 8,000,000.00 (Approx) | | 6,000,000.00 |
| 2 | K-8 Simulator Project phase I | 3,240,000.00 | 3,240,000.00 | 1,368,000,000.00 USD 8 Mn | | 1,364,760,000.00 |
| 3 | Field Artillery System Project | 4,500,000.00 | 4,500,000.00 | 150,000,000.00 USD 1 Mn | | 145,500,000.00 |
| 4 | Quad Copter Project | 250,000.00 | 143,000.00 | 280,000.00 | | 137,000.00 |
| 5 | Regimental Account Software | 250,000.00 | 250,000.00 | 2,000,000.00 | | 1,750,000.00 |
| 6 | Hi-Tech soldier web application | 380,000.00 | 380,000.00 | 140,000,000.00 | | 139,620,000.00 |
| Total | | 10,220,000.00 | 1,678,370,000.00 | 1,668,000,000.00 | | 1,657,630,000.00 |

16.1 වගුව : මෙම මධ්‍යස්ථානය වෙතින් සාර්ථකව අවසන් කර ත්‍රිවිධ හමුදාව වෙත භාර දෙන ලද ව්‍යාපෘති

| අනු අංකය | ක්‍රියාකාරකම්/ව්‍යාපෘතිය | ව්‍යාපෘතියේ වැදගත්කම |
|---|---|---|
| 1 | Driving Simulator<br>සැහැල්ලු සහ බරවාහන පුහුණු කිරීම සඳහා පරිගණක මෘදුකාංගයක් (Driving Simulator) නිෂ්පාදනය කිරීම. | ත්‍රිවිධ හමුදාවන්ට අයත් රියදුරු පුහුණු කිරීමේ පාසල් සඳහා රියදුරන් පුහුණු කිරීමේ කටයුතු සාර්ථකව කර ගැනීම සඳහා ඉවහල් වේ. |
| 2 | Brain Controlled Interface for Artificial Limbs (BCI)<br>මිනිස් මොළයේ තරංග මගින් පාලනය කරනු ලබන කෘතිම බාහුවක් නිර්මාණය කිරීම | ආබාධිත පුද්ගලයින් හට ආධාරකයක් වශයෙන් භාවිතා කිරීමට අපේක්ෂා කරයි. |
| 3 | Development of Hexa copter<br>Quod copter ව්‍යාපෘතියේ ඉදිරි පියවරක් වශයෙන් වැඩිදියුණු කිරීම සඳහා පෙති හයක නියමුවන් රහිත යානයක් නිර්මාණය කිරීම. | වැඩි බරක් , වැඩි පියාසර කාලයක් හා වැඩි කාර්යක්ෂමතාවයකින් යුතු නියමුවන් රහිත යානයක් වැඩිදියුණු කිරීම. |
| 4 | Ship Data Monitoring System (SDMS)<br>නෞකාවේ විවිධ ක්‍රියාකාරී පද්ධතින්හි තත්කාලීන තොරතුරු අදාල නිළධාරීන් හට නිරීක්ෂණය කිරීම හා එහි නිරවද්‍යතාවය පවත්වාගෙන යෑම | මෙමගින් විශාල මුදලක් ඉතිරි කර ගත හැකි අතර, අවශ්‍ය තාක්ෂණය මෙන්ම එහි නඩත්තු කටයුතු අප රට තුලම සිදුකර ගැනීමට අවස්ථාව ලැබී ඇත. |
| 5 | Development of Anti - Befouling and Anti corrosive paint using Nano Technology<br>නැව්බඳෙහි මළබැඳීම සහ සමුද්‍රජීවීන් බෝවීම අවමකර ගැනීම සඳහා අවශ්‍ය මතුපිට ආලේපනයක් සකස්කර ගැනීම . එය ශ්‍රී ලංකාව වටා ඇති සමුද්‍ර පද්ධතියේ මත රඳා | මෙමගින් ශ්‍රීලංකාවට ආවේනික නිෂ්පාදනයක් සකස් කර ගැනීම |

| | | |
|---|---|---|
| | පවතින බැවින් එය දේශීයව නිෂ්පාදනය කිරීම ඉතා වැදගත්වේ. | |
| 6 | Customizable Fire Control Solution With Stabilize Platform<br>විවිධ අවශ්‍යතාවයන්ට ගැලපෙන පරිදි වෙනස් කල හැකි පොදු හරයක් මත නිර්මාණය වුනු අවි හැසිරවීමේ පද්ධතියක් නිර්මාණය කිරීම. | මෙමගින් ත්‍රිවිධ හමුදාවන් සඳහා අවශ්‍ය වන විවිධ වු අවි හැසැරවීමේ පද්ධති සඳහා අවශ්‍ය මුලික අංගනයන්ගෙන් සමන්විතවුත් එය අදාල භාවිතයේ ලක්ෂණ අනුව වෙනස් කර වැඩි දියුණුකර ගැනීම හා විවිධ අවශ්‍යතාවයන්ට අනුව සරිලන අවි හැසිරවීමේ පොදු පද්ධතිය ගොඩනැගීමට හැකියාව ඇත. එමගින් විවිධ පද්ධති නිෂ්පාදනය සඳහා අවශ්‍ය තාක්ෂණය හා මුදල් ඉතිරිකර ගත හැකිවේ. |
| 7 | Training Simulator for K-8 Aircraft - Phase II<br>ගුවන් නියමුවන් පුහුණු කිරීම සඳහා යොදා ගනු ලබන පුහුණු ගුවන් යානයක ආකෘතියකි. මෙවැනි පුහුණු ආකෘතියක් විදේශ රටකින් මිළදී ගැනීමේදී විශාල මුදලක් ඒ සඳහා දැරීමට සිදුවන අතර, ගුවන් යානයක් මගින් එම කාර්යය සිදුකිරීමේදී විශාල මුදලක් වැයවේ. මේ සඳහා විසඳුමක් වශයෙන් දේශීය ඉංජිනේරුවන්ගේ සහාය ලබාගෙන මෙම පුහුණු ආකෘතිය නිර්මාණය කර ඇත. | දැනට මෙම ව්‍යපෘතියේ පළමු අධියර අවසන් කර ඇති අතර, මෙවැනි පුහුණු කිරීම් ආදර්ශකයක් මිළදී ගැනීම සඳහා විශාල මුදල් ප්‍රමාණයක් වැයවන අතර, අනාගත පුහුණු අවශ්‍යතාවයන් සඳහා විවිධ වෙනස් වීම් සිදුකිරීම අපහසු වේ. නමුත් මෙම මෘදුකාංගය පුහුණු අවශ්‍යතාවයන් පරිදි වෙනස් කිරීමට හැකියාව ඇති අතර, දැනට මෙම ව්‍යාපෘතියේ දෙවන අදියර සිදුකරමින් පවතී. |
| 8 | Training Simulator for Air Traffic Controllers<br>මුල්‍ය සහ තාක්ෂණික පිරිවැය අඩු කිරීමේ අරමුණින් ගුවන් ගමන් පාලන මධ්‍යස්ථානය අන්තර් පුහුණුවීම් කටයුතු සිදුකිරීම සඳහා සමාකෘතියක් නිර්මාණය කිරීම | මෙවැනි පුහුණු කිරීම් ආදර්ශකයක් මිළදී ගැනීම සඳහා රුපියල් මිලියන 20 ක් පමණ වැයවන බවට ගණන් බලා ඇත. එය මෙරට නිෂ්පාදනය කිරීම තුළින් විශාල විදේශ විනිමය ප්‍රමාණයක් ඉතිරි කරගත හැක. |
| 9 | Guided Rocket and Missile System Development Project<br>ශ්‍රී ලංකාව තුල මිසයිල හා රොකට් තාක්ෂණය ඇති කිරීම සහ ඊට අවශ්‍ය පහසුකම් වැඩිදියුණු කිරීම | ශ්‍රී ලංකාව තුල මිසයිල හා රොකට් තාක්ෂණය ඇති කිරීම. රටේ ආරක්ෂාව සඳහා අවශ්‍ය අධිතාක්ෂණික මෙවලම් නිෂ්පාදනය කිරීමට ආරම්භ කිරීම.මෙමගින් අධික විදේශ මුදල් ප්‍රමාණයක් ඉතිරි කිරීම. |
| 10 | Development of Hydrogen Fuel Cell for Quod Copters and UAVS<br>නියමුවන් රහිත ගුවන් යානා සඳහා අවශ්‍ය ජීවකාලය වැඩි විද්‍යුත් කෝෂ (බැටරි) නිෂ්පාදනය කිරීම | මෙවැනි කෝෂ ඉතා අධික මුදලක් වන අතර, එය නඩත්තු කිරීම සඳහා අවශ්‍ය තාක්ෂණය තිබිය යුතුය. එම තාක්ෂණය ලබාගැනීම මෙම ව්‍යාපෘතියෙහි ප්‍රධාන අරමුණ වේ. |
| 11 | Development and Renovation of Targets and Shooter's Evaluation System for Electronics Range<br>දැනට යුද්ධ හමුදා පනාගොඩ කඳවුරෙහි පවතින ඉලෙක්ට්‍රොනික් වෙඩි පිටිය අධිතාක්ෂණික මෙවලම් භාවිතයෙන් නවීකරණය කිරීම හා නිරවද්‍ය පුහුණු පද්ධතියක් ස්ථාපිත කිරීම | මෙවැනි පද්ධතියක් නිර්මාණය කිරීම සඳහා අධික පිරිවැයක් දැරීමට සිදුවන අතර, දැනටමත් අවශ්‍ය තාක්ෂණය මෙම මධ්‍යස්ථානය සතුව පවතින බැවින්, එම පද්ධතිය සකස් කර ගැනීමට අවම පිරිවැයක් යොදා ගැනීම . |
| 12 | Armor Tank Simulator System Development<br>යුධ ටැංකි වෙඩිතැබීම් හා ක්‍රියාන්විතයේදී භාවිතා කිරීමට අවශ්‍ය පුහුණු පද්ධතියක් සකස් කිරීම. | මෙමගින් යුධ ටැංකි භාවිතය, හැසිරවීම, වෙඩිතැබීම, ක්‍රියාන්විත රාජකාරියෙහි යෙදවීම හා යුධ ටැංකි පෙළ සහිත ක්‍රියාන්විත රාජකාරීයේ යෙදවීම් පිළිබඳ ආකෘතිය මෙමගින් නිෂ්පාදනය කර එමගින් පුහුණු කටයුතු සිදුකිරීම. |
| 13 | Development of virtual reality parachute jumper and skydiver training Simulator<br><br>ත්‍රිවිධ හමුදා රාජකාරි නියතු පැරිෂුට් පුහුණුවන්නන් සඳහා පුහුණු ආකෘතියක් නිර්මාණය කිරීම මෙම ව්‍යාපෘතියේ අරමුණ වේ. මේ තුළින් පැරෂුටය තුළින් පැනීමේ සිට බිම පතිත වන තෙක් සජීවීව ඇති වන සියලුම ක්‍රමවේදයන් හා බලපෑම ඒ අකාරයෙන් පුහුණු වන්නන් හට ලබාගැනීමත් ඒ පිළිබඳ උපදේශකයින් හට නිරීක්ෂණ කිරීමට හැකියාව ලැබී ඇත. දියුණු රටවල ක්‍රියාත්මක මෙම සාමාකෘති නිර්මාණය සඳහා විශාල මුදලක් වැය වන අතර. මේ තුළින් ඒ සඳහා අඩු පිරිවැයකින් සිදුකිරීමට හැකියාව ලැබී ඇත. | පැරෂුට් පුහුණු වන්නන්ගේ හිස පැලදි පථය (Head Tracking) , සංවේදක සුසුර කිරිම්,(Sensor Calibration) දර්ශණ තලය සකස් කිරීම (View Splitting) කටයුතු සිදුකරමින් පවතී. මෙය 2017 වසර අවසන් වීමට පෙර පුහුණුව සඳහා ලබාදීමට නියමිතව ඇත. |
| 14 | Braille to Sinhala Converter<br>අන්ධ පුද්ගලයින් සඳහා පවත්වනු ලබන විභාගයන්හි ප්‍රථිපල මෙම පද්ධතිය භාවිතයෙන් පහසුවෙන් හා ඉක්මනින් ලබාගත හැකිවීම | ඇස් පෙනීම දුර්වල සහ අන්ධ පුද්ගලයන්ට ඔවුන්ගේ අධ්‍යාපන කටයුතු ක්‍රමවත්ව සිදුකර ගැනීම සඳහා නිර්මාණය කරන ලද මෙම ම ව්‍යාපෘති තාක්ෂණික පියවර අවසන් කර අන්ධ විද්‍යාලය වෙත අත්හදා බැලීමේ කටයුතු සඳහා භාරදීමට කටයුත කර ඇත. |

| | | |
|---|---|---|
| 15 | Under Water Surveillance & Detection System<br><br>නාවික හමුදා මෙහෙයුම් සඳහා උපකාරී වන ව්‍යාපෘතියකි. | මුහුද අභ්‍යන්තරයේ සිදුවන ක්‍රියාකරකම් අනාවරණය කර ගැනීම සඳහා යෙදාගත හැකි උපකරණයකි. මෙහි අත්හදා බැලීමේ කටයුතු සාර්ථකව සිදුකර ඇත. දත්ත එක්රැස් කිරීම මේ වන විට සිදුකරමින් පවතී. |
| 16 | Geo -information System for Chronic Kidney Disease<br>මෙම ව්‍යාපෘතිය තුළින් නිදන්ගත වකුගඩු රෝගීන්පිළිබඳ තොරතුරු ඇතුළත් තොරතුරු පද්ධතියක් නිර්මාණය කිරීම සිදුකරයි. | වකුගඩු රෝගීන් පිළිබඳ දත්තයන් හා විශ්ලේෂණයන් කඩිනමින් කල හැකි පරිගණක මෙවලමක් සේ නිෂ්පාදනය කිරීමට සැලසුම් කර ඇත. |
| 17 | Design & Development of HF/VHF & UHF Radio Transceiver<br>දේශීය අනන්‍යතාවය සහිත රහස්‍ය පණිවිඩ හුවමාරුව සඳහා ආරක්ෂිත ගුවන් විදුලි යන්ත්‍රයක් නිර්මාණය කිරීම | මෙය සාදා නිමකර ඇති අතර, දැනට පර්යේෂණ මට්ටමේ පවතී. |

16.2 වගුව: 2016 වර්ෂයේදී ආරම්භ කරන ලද 2017 වර්ෂය සඳහා අවිච්ඡේද වන ව්‍යාපෘති

| අ අ | ක්‍රියාකාරකම්/ ව්‍යාපෘතිය | ව්‍යාපෘතියේ වැදගත්කම |
|---|---|---|
| 1 | Train Tracking System.<br>ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තුමේන්තුවේ දුම්රිය ධාවනය වන ගමන් පථයන් GPS තාක්ෂණය මගින් පාලන මැදිරියට හා මගීන්ට දුම්රියේ පැමිණීම හා ස්ථානය සනාථකර ගැනීමට හැකි ක්‍රමයකි. මෙහි අත්හදා බැලීමේ කටයුතු සිදුකරමින් ඇත. නිම කිරීම ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ මූල්‍ය මැදිහත් වීම මත සිදුකරනු ලබයි. | **මේ සඳහා කැබිනට් මණ්ඩල අනුමැතිය ලැබී ඇති අතර, ඉදිරියේදී සියලුම දුම්රිය ආවරණ වන පරිදි මෙම පද්ධතිය ක්‍රියාත්මක කිරීමට නියමිතය.** |
| 2 | Integration Effection Intelligence preparation of the Battlefield (IPB) and Development of Training Simulator for DSCSC<br>ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලයේ පුහුණු නිළධාරින් IPB විෂය යටතේ GIS තාක්ෂණය භාවිතා කරමින් War Game නමින් පරිගණක මෘදුකාංගයක් නිර්මාණය කිරීම | ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලයේ පුහුණු කටයුතු සඳහා 2017 වර්ෂයේදී නිමකර භාරදීමට නියමිතව ඇත. |
| 3 | Rehabilitation of Kelani valley Railway line<br>ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශ යටතේ ක්‍රියාත්මක කරන Colombo Suburban Railway Project (CSRP) ව්‍යාපෘතිය යටතේ කැළණි වැලි දුම්රිය මාර්ගය නවීකරණය කිරීමේ කටයුතු ආරම්භ කිරීම සඳහා මෙම මධ්‍යස්ථානය මගින් නිෂ්පාදනය කර ඇති Quod copter හා සැහැල්ලු ගුවන් යානා යොදාගෙන අදාල ගුවන් ඡායාරූප ගැනීමට හා ගුවන් පෙනුම සහිත වීඩියෝ පට ලබාගැනීම. | කැළණි වැලි දුම්රිය මාර්ගය නවීකරණය කිරීමේ කටයුතු ආරම්භ කිරීම සඳහා අවශ්‍ය ගුවන් ඡායාරූප ගැනීමට හා ගුවන් පෙනුම සහිත වීඩියෝ පට ලබාගැනීම. |
| 4 | Civil Security Department<br><br>ආරක්ෂක අමාත්‍යාංශය යටතේ ස්ථාපිත සිවිල් ආරක්ෂක අංශය වෙත දත්ත පද්ධතියක් නිර්මාණය කිරීම මෙහි මූලික අරමුණ වේ සිවිල් ආරක්ෂන අංශය වාර්ෂිකව සිදුකරනු ලබන වෙඩි ද්‍රව්‍ය ආශ්‍රිත දත්තයන් එක්රැස් කිරීම හා එවා යාවත්කාලීන කිරීම සඳහා මෙම දත්ත පද්ධතිය නිර්මාණය කර ඇත. | ආරක්ෂක අමාත්‍යාංශය යටතේ ස්ථාපිත සිවිල් ආරක්ෂක අංශයෙහි තොරතුරු යාවත්කාලීන කිරීම සඳහා නිපදවා ඇති පරිගණක මෙවලම නුදුරේදී ලබාදීමට නියමිතය. |

16.3වගුව: 2016 වර්ෂයේදී ආරම්භ කර 2017 වර්ෂයේදී භාරදීමට නියමිත රජයේ වෙනත් ආයතන සඳහා සිදුකරනු ලබන ව්‍යාපෘති

### 16.2.2 වෙනත් ආයතන සඳහා සිදුකරනු ලැබූ පුහුණුවීම්

- GIS තාක්ෂණ විෂයන්ට අදාල ත්‍රිවිධ හමුදාවේ ,පොලිසිය , විශේෂ කාර්ය බලකාය, අපරාධ පරික්ෂණ දෙපාර්තමේන්තුව, සහ රාජ්‍ය බුද්ධි අංශයේ නිළධාරින්/නිළධාරිනියන් 40 ක් පමණ ප්‍රමාණයක් පුහුණු කිරීම .
- යුධ හමුදාවට හඳුන්වාදුන් යුධ හමුදා රෙජිමේන්තු ගිණුම් තැබීමේ මෘදුකාංගය සම්බන්ධව නිළධාරින් 600 ක ප්‍රමාණයකුත් සෙසුනිළයින් 2500 ක ප්‍රමාණයකුත් පුහුණු කිරීම
- ආරක්ෂක අමාත්‍යාංශය වෙත හඳුන්වාදුන් ලිපි කළමණාකරණය කිරීමේ (Mail Management System) මෘදුකාංගය හඳුන්වාදීම සහ ඒ සඳහා පුහුණු කටයුතු සිදුකිරීම.







### 16.2.3 ලබාගන්නා ලද සම්මාන/ ප්‍රදාන

මෙම මධ්‍යස්ථානය මගින් ඉදිරිපත් කරනු ලැබූ ව්‍යාපෘති වෙනුවෙන් පහත සඳහන් සම්මානයන්ගෙන් 2016 වසරේදී පිදුම් ලබන ලදී.

- National Best Quality ICT Awards – 2016 "SILVER - Epidemic Survey and Tracking System.
- 2016 වර්ෂයේ National Best Quality ICT Awards (NBQS) සම්මාන උළෙලේදී SILVER සම්මානය ලබාගන්නා ලද Epidemic Survey and Tracking System ව්‍යාපෘතිය 2016 වර්ෂයේ තායිවානයේ පැවැති The Asia Pacific ICT Alliance Awards (APICTA Awards) සම්මාන ප්‍රදානෝත්සවය සඳහා ශ්‍රී ලංකාව නියෝජනය කරමින් ඉදිරිපත් කරන ලද එකම ව්‍යාපෘතිය බවට පත්වීම.




### 16.3 ගැටළු හා අභියෝග

- මධ්‍යස්ථානය මගින් සිදුකරනු ලබන නව නිපැයුම් හා නිෂ්පාදනය කටයුතු වලට අවශ්‍ය අවශ්‍යතාවයන් මිළදි ගැනීමේදී ටෙන්ඩර් පටිපාටිය යටතේ ආරක්ෂක අමාත්‍යාංශයෙහි ලියාපදිංචි සැපයුම්කරුවන් වෙතින් මිළගණන් පත් කැඳවා මිළදීගැනීමට කටයුතු කරන අතර, එහිදි අන්තර්ජාලය තුළින් ඉතා අඩු මිළට ගත හැකි බොහොමයක් නවීන ඉලෙක්ට්‍රොනික් උපකරණයන් සඳහාද විශාල මුදලක් ගෙවා ඉහත සැපයුම්කරුවන් වෙතින් මිළදීගැනීමට සිදුවනු ඇත. එබැවින් ටෙන්ඩර් පටිපාටියට අනුව එම උපකරණ මිළදී ගැනීම තුළින් සිදුකරනු ලබන ව්‍යාපෘතින්හී අවසාන නිෂ්පාදනය සඳහා වැයවූ පිරිවැය සැසදීමේදී එම උපකරණයන්හි මිල ඉතා අධික වන බැවින් එය මගහරවා ගැනීම සඳහා අන්තර්ජාල මාර්ගයෙන් මිළදිගැනීම සඳහා රාජ්‍ය ආයතනයන් වෙත හඳුන්වාදී ඇති පෙර ගෙවුම් කාඩ්පත් (Bank pre-paid ) කාඩ්පත් ක්‍රමය සඳහා මෙම මධ්‍යස්ථානය වෙත අවශ්‍ය අනුමැතිය නොමැති බැවින් ව්‍යාපෘති වලට අවශ්‍යතා මිළදී ගැනීමේදී විවිධ දුෂ්කරතා වලට මුහුණ දීමට සිදුවේ
- මධ්‍යස්ථානය දැනට පුළුල් ලෙස පර්යේෂණ කටයුතු සිදුකරමින් ත්‍රිවිධ හමුදාවට සහ රජයේ වෙනත් ආයතන වලට අවශ්‍ය නවීන තාක්ෂයෙන් යුත් උපකරණ හා පරිගණක මෙවලම් නිපදවන ආයතනයක් වන අතර, දැනට ඒ සඳහා අවශ්‍ය ඉඩපහසුකම් නොමැති බැවින් අපහසුතාවයන්ට ලක්ව ඇත.

## 16.4 අනාගත අපේක්ෂා

- පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය විශාල කාර්යභාරයක් ඉටුකරන ආයතනයක් බැවින් ඒ සඳහා අවශ්‍ය නවීන විද්‍යාගාර පහසුකම් වලින් සමන්විත මහල් 06 කින් ද සමන්විත විද්‍යාගාර ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා වැඩ ආරම්භ කිරීම. එමගින් දැනට පවතින පර්යේෂණාගාර අඩුපාඩුකම් මගහරවා ගෙන මෙම මධ්‍යස්ථානයේ තිබියයුතු සියළුම අංශ ක්‍රියාවට නංවා පරිපූර්ණ පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයක් පිහිටුවීම.
- පර්යේෂණ කටයුතු සඳහා අවශ්‍ය විශේෂ හැකියාවක් ඇති නිළධාරීන් ඉදුරාම පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය වෙත බඳවා ගැනීමට අවශ්‍ය ඉදිරි කටයුතු සිදුකිරීම.
- පර්යේෂණ කටයුතු වල නිරත වී සිටින නිළධාරීන් හට ව්‍යාපෘති අවසානයේ පර්යේෂණ දීමනා හිමිගැන්වීමට අවශ්‍ය කටයුතු කිරීම.
- අවට විශ්ව විද්‍යාල වල අවසන් වසරේ සිසුන් වෘත්තිමය පුහුණුවීම් යටතේ මෙම මධ්‍යස්ථානයේ ව්‍යාපෘති සඳහා යොදවා ගැනීම හා ඒ සඳහා ගෙවීම් සිදුකිරීමට අවශ්‍ය කටයුතු සිදුකිරීම.
- දැනට අවසන් කරන ලද ව්‍යාපෘති ලංකා ලොජිස්ටික්ස් ආයතනය හරහා දේශීය හා විදේශීයව අළෙවි කිරීම සඳහා සුදුසු යාන්ත්‍රණයක් සැකසීම.
- මධ්‍යම දුර නියමුවන් සහිත ගුවන් යානය (MRUAV) වැඩිදියුණු කර ව්‍යාපෘති කටයුතු අවසන් කිරීමෙන් පසු දිවයිනේ නොයෙකුත් අවශ්‍යතාවයන් සඳහා ක්‍රියාත්මක කිරීම උදා: ආරක්ෂක කටයුතු සහ ආපදාකළමණාකරණ කටයුතු.
- Train Tracking System තුළින් දුම්රිය ධාවනය පහසුකරවීම සඳහා හඳුන්වාදී ඇති මෘදුකාංගය ශ්‍රී ලංකාව තුළ දැනට ධාවනය වන සියලු කරන දුම්රියන් ආවරණය වන පරිදි ස්ථාපන කිරීම.
- පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය ස්වාධීන ආයතනයක් වශයෙන් ස්ථාපනය කිරීම සඳහා අවශ්‍ය ඉදිරි කටයුතු සිදුකිරීම.

# 17. ඒකාබද්ධ සේවා භාෂා පුහුණු ආයතනය

## 17.1 සමාලෝචනය

1986 වර්ෂයේදී ආරක්ෂක අමාත්‍යාංශය යටතේ මෙම පුහුණු පාසල භාෂා පුහුණු මධ්‍යස්ථානය වශයෙන් ආරම්භ කෙරෙණු අතර, ආරක්ෂක අංශ නිළයන්ගේ දෙමළ භාෂා දැනම වර්ධනය කර කියවීම, ලිවීම හා කථනය වැඩි දියුණු කිරීම ප්‍රධාන අරමුණ විය. මේ වන විට පාඨමාලා 93ක් සාර්ථකව යුධ,නාවික, ගුවන් හමුදා පොලිස් විශේෂ කාර්‍ය බලකායේ සාමාජිකයින් වෙත පවත්වා ඇති අතර, නිළධාරීන් 119ක් හා සෙසු නිලයින් 8052 දෙනෙකු එම පාඨමාලාවන් හදාරා ඇත.

## 17.2 2016 වර්ෂයේ කාර්යසාධනය

- 2016 වර්ෂය සඳහා දෙමළ භාෂා පුහුණු පාඨමාලා තුනක් පැවැත්වූ අතර, ඒ සඳහා ත්‍රිවිධ හමුදා සහ පොලිස් සාමාජිකයින් 395 දෙනෙකු සහභාගී විය.




- සෙබලුන්ගේ සුභසාධනය වෙන්වෙන් නව සුභසාධක වෙළඳසැලක් ඉදිකිරීම. වියදම රු. 850,007.00 කි.
- නව කරණවෑම් හලක් ස්ථාපනය කිරීම - වියදම රු. 18,345.00කි.
- පාඨමාලා සිසුන් වෙනුවෙන් නව වැසිකිළි පද්ධතියක් ඉදිකිරීම - වියදම රු. 369,095.00 කි.
- නිලධාරී නිවස්නයට ඇතුලුවන මාර්ගය සහ එහි මිදුල තාරදමා කාපට් ඇතිරීම.
- මෙම පුහුණු ආයතනයේ අවශ්‍යතාවය සඳහා නව අධිශීතකරණයක් මිලදී ගැනීම - වියදම රු.55,999.00 කි.
- දේශණ ශාලාවට අඩුපාඩුවක්ව පැවති දේශණ ආධාරකයක් මිලදී ගැනීම - වියදම රු.11,500.00 කි.
- පරිඝණක අංශය සහ දුරකථන හුවමාරු පද්ධතියේ ආරක්ෂාව වෙනුවෙන් නව වායුසමන යන්ත්‍රයක් සවි කිරීම - වියදම රු. 299,553.30කි.
- කඳවුරේ අලංකාරය පවත්වා ගැනීම සඳහා අඩුපාඩුවක්ව පැවති තණකොළ කපන යන්ත්‍රයක් මිලදී ගැනීම - වියදම රු. 42,500කි.




17.1 ප්‍රස්ථාරය :2016 වර්ෂයේ ආයතනය වෙතින් පවත්වන ලද පාඨමාලාවන් සඳහා සහභාගී වූ ත්‍රිවිධ හමුදා සහ පොලිස් විශේෂ කාර්ය බළකා සාමාජිකයින්

## 17.3 ගැටළු හා අභියෝග

- ආයතනයේ නිත්‍ය කාර්‍ය මණ්ඩලයට සහ පාඨමාලා ශිෂ්‍ය ශිෂ්‍යාවන් සඳහා ප්‍රමාණවත් පරිදි නවාතැන් පහසුකම් නොතිබීම.
- ආයතනයේ පාලන කටයුතු සිදු කිරීම සඳහා සැහැල්ලු වාහනයක් නොතිබීම.
- යුධ හමුදාව වෙතින් නවතමයෙන් හඳුන්වා දෙනු ලැබූ ඉන්ධන ප්‍රතිපත්තිය හේතුකොටගෙන පාලන කටයුතු සිදු කිරීමේදී ලබාදෙනු ලබන ඉන්ධන ප්‍රමාණවත් නොවීම
- ආරක්ෂක අමාත්‍යාංශය වෙතින් අනුයුක්ත කර ඇති සිවිල් සේවකයන් සේවයට වාර්තා කිරීම අසතුටුදායක තත්ත්වයක පැවතීම.

## 17.4 අනාගත අපේක්ෂා

- ඉංග්‍රීසි භාෂා පාඨමාලාව ආරම්භ කිරීම
- නව කාර්යාල ගොඩනැගිල්ලක් ඉදිකිරීම
- නිලධාරී / බනි/ සැරයනි නේවාසිකාගාරයක් ඉදිකිරීම
- ප්‍රධාන දොරටුව ඉදිකිරීම
- ශිෂ්‍ය නිලධාරීන් නවාතැන් ගෙන සිටින නේවාසිකාගාරය අලුත් වැඩියා කටයුතු සිදු කිරීම

| පාඨමාලා අංකය | ජන | පෙබ | මාර්.තු | අප්‍රේල් | මැයි | ජුනි | ජුලි | අගෝ | සැප් | ඔක් | නොවැ | දෙසැ |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 91 | → | 22 | | | | | | | | | | |
| 92 | | | 16 | | | | | 26 | | | | |
| 93 | | | | | | | | | 05 | | | → |

17.1 වගුව: 2016 වර්ෂයේ පවත්වන ලද පාඨමාලා

# 18. සී/ස ලංකා ලොජිස්ටික් ඇන්ඩ් ටෙක්නොලජීස් සමාගම

## 18.1 සමාලෝචනය

සීමාසහිත ලංකා ලොජිස්ටික්ස් ඇන්ඩ් ටෙක්නොලොජීස් සමාගම සිය ආරම්භයේ සිට පසුගිය කාල වකවානුව පුරා සිදුකළ පරිදි වෘත්තීමය අකාරයෙන් හා සාකල්‍යභාවයෙන් යුතුව සීමාන්විත හමුදාමය යුද්ධෝපකරණ ශ්‍රී ලංකා ආරක්ෂක හමුදා වෙත සැපයිම සඳහා ප්‍රසම්පාදන පහසුකම් සැපයීම සාර්ථකව සිදුකර ඇත. පසුව, ලං.ලො.ටෙ. සමාගම අනෙකුත් ක්ෂෙත්‍ර කරා සිය ක්‍රියාකාරකම් විවිධාංගීකරණය කර ඇති අතර රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය හා රජයේ ඇතැම් ආයතන යටතේ පවතින ජාතික ආරක්ෂාව කෙරෙහි බලපාන අතිශයන් වැදගත් ව්‍යාපෘති කිහිපයක් සඳහා ව්‍යාපෘති කළමනාකරුවකු, උපදේශකයකු හා විසඳුම් සපයන්නෙකු ලෙස වත්මනෙහි කටයුතු කරයි. දැනට ක්‍රියාත්මක කඩිනම් විවිධාංගීරණ ව්‍යාපෘතියේ කොටසක් ලෙස නිසි ප්‍රවීණත්වයෙන් යුතු පාර්ශවකරුවන් හා සහයෝගීතාවයෙන් ශ්‍රී ලංකා ආරක්ෂක හමුදා සඳහා දේශීය ආරක්ෂක කර්මාන්තයක් ස්ථාපිත කිරීමට ලං.ලො.ටෙ. සමාගම අදහස් කරයි.

## 18.2 2016 වසරේ කාර්යසාධනය

- ආරක්ෂක හමුදා සහ පොලීසිය සඳහා ප්‍රසම්පාදන පහසුකාරකයකු ලෙස ලං.ලො.ටෙ. සමාගම වසර තුල පැවැති ඉල්ලීම් සපුරාලන ලදී. නව තාක්ෂණවේද හඳුන්වාදීම පිණිස අන්ත පරිශීලකයන් සඳහා ඉදිරිපත් කිරීම් කිහිපයක් සිදුකරන ලදී.
- 2016 වර්ෂය තුලදී, මාලිහි සේවයේ යෙදවීමට නියමිතව තිබූ ශ්‍රී ලංකා යුධ හමුදා බල ඇණි සඳහා අවශ්‍ය හමුදා යුද්ධෝපකරණ කඩිනම් ප්‍රසම්පාදන වැඩසටහන සඳහා පහසුකම් සැපයීමේදී ලං.ලො.ටෙ. සමාගම ප්‍රමුඛ කාර්යභාරයක් ඉටුකරන ලදී. මෙම ප්‍රසම්පාදන විවිධ ආකාරයේ හමුදා අයිතමවලින් සමන්විත විය.
- දේශීය ආරක්ෂක කර්මාන්තය සහ අනෙකුත් රාජ්‍ය ආයතන සඳහා තොරතුරු සන්නිවේදන තාක්ෂණය සහ තොරතුරු ආරක්ෂාව හා රාජ්‍ය ආරක්ෂක යටිතල පහසුකම් ආශ්‍රිත ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම ලං.ලො.ටෙ.සමාගමේ ව්‍යාපෘති අංශයේ වගකීම වේ. රජයට අයත් සමාගම් සහ රාජ්‍ය ආයතන වෙත ව්‍යාපෘති කළමනාකරණ හා උපදේශන සේවා සැපයීම කෙරෙහි මෙම අංශය සිය ක්‍රියාකාරකම් ව්‍යාප්ත කර අවධානය යොමු කර තිබේ.

| විස්තරය | 2011/12 | 2012/13 | 2013/14 | 2014/15 | 2015/16 | 2016/17 මාස නවයක ප්‍රතිඵල (විගණනය නොකරන ලද) |
|---|---|---|---|---|---|---|
| | රු.මි | රු.මි | රු.මි | රු.මි | රු.මි | රු.මි |
| ආදායම හා ආශ්‍රිත කාර්යසාධනය | | | | | | |
| ආදායම | 69.97 | 130.62 | 95.17 | 92.74 | 127.90 | 59.73 |
| දළ ලාභය | 69.46 | 99.68 | 81.50 | 84.67 | 122.70 | 57.11 |
| පොළී හා බදුවලට පෙර මෙහෙයුම් ලාභය | 4.28 | 13.81 | 8.46 | 7.85 | 58.43 | 15.85 |
| බදු පෙර ලාභය | 7.62 | 17.38 | 14.49 | 12.05 | 61.84 | 23.10 |
| බදු | 2.91 | 3.23 | 4.70 | 3.31 | 8.54 | |
| බදුවලින් පසු ලාභය | 4.71 | 14.15 | 10.88 | 7.42 | 53.30 | |
| වත්කම් හා බැරකම් තත්ත්වය | | | | | | |
| ජංගම නොවන වත්කම් | 15.48 | 12.53 | 8.56 | 10.76 | 5.63 | 3.6 |
| ජංගම වත්කම් | 194.46 | 159.09 | 157.02 | 149.73 | 215.51 | 207.36 |
| මුළු වත්කම් | 209.94 | 171.62 | 165.75 | 160.49 | 221.14 | 210.96 |
| මුළු ස්කන්ධ | 106.97 | 107.32 | 109.22 | 110.39 | 162.98 | 180.72 |
| ජංගම නොවන බැරකම් | 19.30 | 4.08 | 4.04 | 7.32 | 5.47 | 5.46 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| ජංගම බැරකම් | 83.67 | 48.14 | 52.50 | 42.77 | 52.70 | 24.77 |
| ශුද්ධ වත්කම් | 106.97 | 119.39 | 109.22 | 110.39 | 162.98 | 180.72 |
| ප්‍රකාශිත ලාභාංශ | - | 1.05 | 1.20 | 1.20 | 5.4 | |
| **අනුපාත විශ්ලේෂණය** | | | | | | |
| කොටසක් සඳහා ඉපැයුම් (රු) | 22,974 | 69,003 | 1.36 | 0.93 | 6.72 | |
| කොටසක් සඳහා ශුද්ධ වත්කම් (රු) | 521,818 | 582,400 | 14.00 | 13.8 | 20.37 | |
| ස්කන්ධ මත ලාභය % | 4.40 | 11.85 | 9.97 | 6.72 | 32.71 | |
| මුළු වත්කම් මත ලාභය % | 2.24 | 8.24 | 6.57 | 4.62 | 24.10 | |
| දළ ලාභ අනුපාතිකය % | 99.28 | 76.31 | 85.63 | 91.30 | 99.68 | |
| මෙහෙයුම් ලාභ අනුපාතිකය % | 6.12 | 13.31 | 16.36 | 11.57 | 47.44 | |
| ශුද්ධ ලාභ අනුපාතිකය % | 6.73 | 10.58 | 8.89 | 8.47 | 43.30 | |
| ජංගම වත්කම් අනුපාතිකය (වාර) | 2.32 | 3.30 | 2.99 | 3.50 | 4.0 | |

18.1 වගුව : පසුගිය වසර පහ තුළ ලං.ලො.ටෙ.සමාගමේ මූල්‍ය ප්‍රගතිය




18.1 ප්‍රස්ථාරය : ආදායම හා ආශ්‍රිත කාර්යසාධනය




18.2 ප්‍රස්ථාරය : වත්කම් හා බැරකම් තත්ත්වය




18.3 ප්‍රස්ථාරය : අනුපාත විශ්ලේෂණය

- ප්‍රසම්පාදන පහසුකම් අංශය විසින් 2016 වසර තුළදී මධ්‍යම හා මහා පරිමාණ ප්‍රසම්පාදන පහසුකම් වැඩසටහන් (කොන්ත්‍රාත්) අසූ නවයක (89) වැඩකටයුතු අවසන් කරන ලදී.

| ව්‍යාපෘතිය | ලං.ලො.ටෙ.ස. කාර්යභාරය | විස්තරය | 2016දී සම්පූර්ණ කරන ලද |
|---|---|---|---|
| **රාජ්‍ය බුද්ධි සේවා සඳහා පද්ධති ස්වයංක්‍රියකරණ ව්‍යාපෘතිය** | ව්‍යාපෘති කළමනාකරු | රාජ්‍ය බුද්ධි අංශ සතුව පවතින ලේඛන පාදක සංවේදී තොරතුරු සංඛ්‍යාංකනය මෙම ව්‍යාපෘතියට ඇතුළත් වේ. මෙම ව්‍යාපෘතියේ ව්‍යාපෘති කළමනාකරු වන්නේ ලං.ලො.ටෙ. සමාගමයි.<br><br>දෘඩාංග: දෘඩාංග වේදිකාව සහ ජාල යටිතල පහසුකම්<br>යෙදුම් මෘදුකාංග: ලේඛන පාදක තොරතුරු කාර්ය ප්‍රවාහ මඟින් | සංරචක දෙකටම අදාළ සියලු ටෙන්ඩර් සම්පූර්ණ කර ප්‍රදානය කරන ලදී. දෘඩාංගවල ප්‍රධාන කොටස 2016 අවසන් විට සපයා තිබුණි.<br><br>ප්‍රගතිය:<br>දෘඩාංග: 60%<br>යෙදුම් මෘදුකාංග : 30% |

| | | | |
|---|---|---|---|
| | | සංඛ්‍යාකනය කිරීම | |
| **උපායමාර්ගික ආරක්ෂක සන්නිවේදන ජාල (උ.ආ.ස.ජා.) ව්‍යාපෘතිය** | ප්‍රසම්පාදන පහසුකාරක | උ.ආ.ස.ජා. ව්‍යාපෘතිය ටෙන්ඩර් පහකින් සමන්විත වේ.<br><br>ටෙන්ඩරය I: යෝජිත ස්වයංධාරක සිව්පාද සන්නිවේදක කුළුණු ඉදිකිරීම සඳහා හඳුනාගත් ස්ථාන එකොළහෙහි මිහිවිද්‍යාත්මක මගින් පාංශු පරීක්ෂණ සිදුකිරීම සහ පාංශු පරීක්ෂණ වාර්තා ඉදිරිපත් කිරීම<br><br>ටෙන්ඩරයII: ආවරණය සහිත ධ්වනිවාරක විදුලිජනක යන්ත්‍ර ඒකක විසි දෙකක් (22) සැපයීම, ගෙනවිත් බාරදීම, සවිකිරීම සහ ක්‍රියාත්මක කිරීම.<br><br>ටෙන්ඩරයIII: උපකරණ කුටි සහිත ස්වයංධාරක සන්නිවේදන කුළුණු පහක් (05) සැපයීම, ගෙනවිත් බාරදීම, ඉදිකිරීම සවිකිරීම සහ ක්‍රියාත්මක කිරීමේ ප්‍රසම්පාදනය.<br><br>ටෙන්ඩරයIV: උපකරණ කුටි සහිත ස්වයංධාරක සන්නිවේදන කුළුණු හයක් (06) සැපයීම, ගෙනවිත් බාරදීම, ඉදිකිරීම සවිකිරීම සහ ක්‍රියාත්මක කිරීමේ ප්‍රසම්පාදනය.<br><br>ටෙන්ඩරයV: සූක්ෂම තරංග ගුවන්විදුලි සන්නිවේදන පද්ධති සැපයීම, ගෙනවිත් බාරදීම, සවිකිරීම සහ ක්‍රියාත්මක කිරීම. | ටෙන්ඩරය I හා II ආශ්‍රිත සියලු ක්‍රියාකාරකම් 2015 දී සම්පූර්ණ කරන ලදී. ටෙන්ඩර III, IV සහV 2016 වසරේදී අනුමත කරන ලදී. රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය මෙම ටෙන්ඩර් තුන සඳහා ලංසු කැඳවන ලද අතර ඒවා ඇගයීමේ ක්‍රියාදාමය පසුගිය මාස කිහිපය පුරා සිදුකරමින් පැවතුණි.<br>ව්‍යාපෘති ප්‍රගතිය: ලං.ලො.ටෙ.සමාගමට පවරන ලද ප්‍රසම්පාදන පහසුකමට අදාළව ටෙන්ඩර III, IV, V සඳහා 80%. |
| **සුළු ආයුධ නිෂ්පාදන කර්මාන්ත ශාලාවක් ස්ථාපිත කිරීම** | ව්‍යාපෘති කළමනාකරු | 7.62 x39 මිමි නිෂ්පාදන කර්මාන්ත ශාලාවක් ස්ථාපිත කිරීම | පිළිගත් නිෂ්පාදකයන්ගෙන් ලබා ගත් තාක්ෂණික හා අයවැය යෝජනා ශ්‍රී ලංකා යුධ හමුදාවට බාරදෙන ලදී. මූලික සැලසුම් සිදුකරමින් පවතී. |
| **අතිරික්ත හමුදාමය උපකරණ විකිණීම** | ප්‍රසම්පාදන පහසුකාරක | අතිරික්ත හමුදාමය උපකරණ හා යුද්ධෝපකරණ බැහැර කිරීම. | අතිරික්ත තොග බැහැර කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමතිය ලබාගන්නා ලදී. මෙහෙයුම් කමටුවක් හා තක්සේරු කමිටුවක් පත් කර තිබේ. ලං.ලො.ටෙ. සමාගම ටෙන්ඩර් ලේඛන පිළියෙල කරන ලද අතර භාණ්ඩ විකිණීම සඳහා රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය සීමිත ටෙන්ඩර් පරිපාටිය හරහා මිල ගණන් කැඳවන ලදී<br>ලං.ලො.ටෙ. සමාගම විසින් ද තවදුරටත් සෘජු මිල ගණන් ලබාගන්නා ලදී.<br>තෝරාගත් අයිතම විකිණීම සඳහා සාකච්ඡා පැවැත්වෙමින් තිබේ. |
| **සමුද්‍රීය ආවේක්ෂණ පද්ධති ව්‍යාපෘතිය** | ව්‍යාපෘති කළමනාකරු | පෘථුල ඒකාබද්ධ සමුද්‍රීය ආවේක්ෂණ පද්ධතියක් ස්ථාපිත කිරීම. | ලං.ලො.ටෙ. සමාගම මූලික ඇගයීම නිමාකර ව්‍යාපෘති යෝජනාව අනුමතිය සඳහා ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරන ලදී. දෙපාර්තමේන්තුව මේ වන විට එය අනුමත කර මූල්‍ය සාධ්‍යතාව සඳහා විදේශ සම්පත් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබේ. |
| **සමුද්‍රීය අනතුරු ආරක්ෂක සම්බන්ධීකරණ මධ්‍යස්ථාන ව්‍යාපෘතිය** | ව්‍යාපෘති කළමනාකරු | සමුද්‍රීය සෝදිසි හා අනතුරු ආරක්ෂක මෙහෙයුම් පද්ධතියක් ස්ථාපිත කිරීම | ලං.ලො.ටෙ. සමාගම විසින් ඉදිරිපත් කරන ලද ව්‍යාපෘති යෝජනාව අදියර වශයෙන් ක්‍රියාත්මක කිරීමට ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව අනුමතිය |

| | | | |
|---|---|---|---|
| | | | ලබා දී තිබේ.<br>ලං.ලො.ටෙ. සමාගම විසින් සකස් කරන ලද අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කිරීමට නියමිතය. |
| **හමුදාමය ශ්‍රේණි පාවහන් නිෂ්පාදන කර්මාන්ත ශාලාවක් පිහිටුවීම** | ව්‍යාපෘති කළමනාකරු | ආරක්ෂක හමුදා සඳහා හමුදාමය ශ්‍රේණි පාවහන් නිෂ්පාදන කර්මාන්ත ශාලාවක් පිහිටුවීම | ව්‍යාපෘති ශක්‍යතා අධ්‍යයනය සම්පූර්ණ කරන ලදී. අනුමතිය සඳහා ව්‍යාපෘති යෝජනාවක් සකස් කිරීම පිණිස ලං.ලො.ටෙ. සමාගම දේශීය මෙන්ම විදේශීය පාර්ශව සමග සාකච්ඡා පවත්වමින් සිටී. |
| **හමුදා සතු ආයතන සඳහා සූර්ය බලශක්ති උත්පාදන යන්ත්‍රාගාර ස්ථාපිත කිරීම** | ව්‍යාපෘති කළමනාකරු | ආරක්ෂක හමුදාවන්ට සූර්ය බලශක්තිය හඳුන්වාදීම පිණිස වූ නියාමන ව්‍යාපෘතියක් ලං.ලො.ටෙ. සමාගම 2012 වසරේදී ආරම්භ කරන ලදී. චීනයේ සීටෙක් ඉන්ටනැෂනල්හි සහාය ඇතිව එකක් කිලෝ වොට් 20 කින් යුතු සූර්යබල පිරියත නියාමන ව්‍යාපෘති තුනක් ලං.ලො.ටෙ. සමාගම 2014 වසරේදී සාර්ථකව ස්ථාපනය කරන ලදී.<br><br>2016 වසරේ සිදුකරන ලද සමීක්ෂණයකදී, ආරක්ෂක හමුදාවන් තුනම මෙම බලශක්ති පිරියතවල සතුටුදායක කාර්යසාධනයක් වාර්තා කල බැවින් ආරක්ෂක ලේකම්, ආරක්ෂක කාර්ය මණ්ඩල ප්‍රධානී සහ ත්‍රිවිධ හමුදාපතිවරුන්ගේ නිල නිවාස ඇතුළුව හමුදාව සතු ඉතිරි ආයතනවලට ද සූර්ය බප ශක්තිය හඳුන්වා දීමට රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය තීරණය කරන ලදී. | මෙම ව්‍යාපෘතියේ තාක්ෂණික හා මූල්‍ය සහයෝගීතාව සඳහා රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය චීනයේ සීටෙක් ඉන්ටනැෂනල් සමග 2016 වසරේදී අවබෝධතා ගිවිසුමක් අත්සන් තබන ලදී.<br><br>මූලික තාක්ෂණික අධ්‍යයන සිදුකරමින් පවතී. |
| **වෙඩි උණ්ඩ කොටස් ගැලවීමේ පිරියතක් මිලයට ගැනීම** | ප්‍රසම්පාදන පහසුකාරක | කල් ඉකුත්වූ වෙඩි උණ්ඩ සුරක්ෂිතව බැහැර කිරීම සඳහා ජංගම වර්ගයේ වෙඩි උණ්ඩ කොටස් ගැලවීමේ පිරියතක් මිලයට ගන්නා ලෙස රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයට උපදෙස් දී තිබේ. | වෙඩි උණ්ඩ කොටස් ගැලවීම පිළිබඳව පවතින තාක්ෂණය හා එවැනි පිරියත නිෂ්පාදකයන් පිළිබඳ මූලික අධ්‍යයනයක් රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය වෙනුවෙන් ලං.ලො.ටෙ. සමාගම සිදුකරන ලදී. මෙම වාර්තාව පදනම් කරගනිමින්, සුදුසු වෙළෙඳුන්ගෙන් තාක්ෂණික හා මූල්‍ය යෝජනා කැඳවීම පිණිස අදාළ ලේඛන සකස් කිරීම සඳහා ලං.ලො.ටෙ. සමාගමට අනුමතිය ලබාදෙන ලදී.<br><br>යෝජනාව සඳහා ඉල්ලීම ලං.ලො.ටෙ. සමාගම රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් වෙත 2017 ජනවාරි මාසයේදී ඉදිරිපත් කරන ලදී. |

| | | | |
|---|---|---|---|
| **මහනුවර මහනගර සභාව සඳහා ස්වයංක්‍රීයකරණ ව්‍යාපෘති** | විසඳුම් සපයන්නා | මහජනතාවට සේවය කිරීමේදී කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීමේ උත්සාහයක් ලෙස තම ක්‍රියාදාම ස්වයංක්‍රීය කිරීම පිණිස ව්‍යාපෘතියක් මහනුවර මහනගර සභාව ආරම්භ කර තිබේ.<br><br>ජාල ව්‍යාපෘතිය: පරිගණක 130 ක් එකිනෙක හා සම්බන්ධ කිරීම පිණිස සේවාදායකය පාදක පරිගණක ජාලයක් හඳුන්වා දෙන ලදී.<br><br>යෙදුම් මෘදුකාංග ව්‍යාපෘතිය: වරිපනම් බදු, අනෙකුත් විවිධ බදු, සැපයුම්, ජල ගාස්තු ගිණුම් සහ අවසාන ගිණුම් වැනි ක්ෂෙත්‍ර සඳහා යෙදුම් මෘදුකාංග හඳුන්වා දීම | මෙම ව්‍යාපෘති දෙකම සිදුකිරීම ලං.ලො.ටෙ. සමාගම බාරගෙන තිබේ.<br>ප්‍රගතිය:<br>ජාල ගත කිරීම හා දෘඩාංග ස්ථාපිත කර තිබේ.<br>මෘදුකාංග සකස් කරමින් පවතින අතර එක් මොඩියුලයක් දැනටමත් ස්ථාපිත කොට ඇත. |
| **පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය සමග සහයෝගීතාව** | ප්‍රසම්පාදන පහසුකාරක | රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය ආරක්ෂක හමුදා සඳහා ආරක්ෂාව හා සම්බන්ධ නිපැයුම් නිෂ්පාදනය කර තිබේ.<br><br>මෙම නිපැයුම් ගෝලීයව අලෙවිකිරීම සඳහා පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය සමග හවුල්කාරිත්වයෙන් කටයුතු කරයි. | ආරක්ෂාව ආශ්‍රිත නිෂ්පාදන විකිණීමේ නිරතව සිටින වෙළඳුන් කිහිප දෙනෙකු සමග ලං.ලො.ටෙ. සමාගම සම්බන්ධ වී ඇති අතර ඔවුන්ගේ ප්‍රතිචාර අපේක්ෂාවෙන් පසුවේ. |
| **ශ්‍රී ලංකා නැනෝ තාක්ෂණ ආයතනය සමග සහයෝගීතාව** | ප්‍රසම්පාදන පහසුකාරක | ශ්‍රී ලංකා නැනෝ තාක්ෂණ ආයතනය නැනෝ තාක්ෂණයට අදාළ පර්යේෂණ ව්‍යාපෘති කිහිපයක් සිදුකර තිබේ. මෙම පර්යේෂණ ක්ෂේත්‍රයන්හි ප්‍රතිඵලය ශ්‍රී ලංකා ආරක්ෂක හමුදාවන්ට භාවිතයට ගත හැක. | තම භාවිතය සඳහා යෝග්‍ය නිපැයුම් හඳුනාගැනීම පිණිස ශ්‍රී ලංකා නැනෝ තාක්ෂණ ආයතනය සමග එක්ව ලං.ලො.ටෙ. සමාගම ආරක්ෂක හමුදා සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වා තිබේ. |
| **වෙබ් අඩවි සංවර්ධනය** | විසඳුම් සපයන්නා | තම විවිධාංගීකරණ වැඩසටහනේ කොටසක් වශයෙන්, විසඳුම් සපයන්නෙකු ලෙස ලං.ලො.ටෙ. සමාගම තොරතුරු තාක්ෂණ අංශය වෙත ප්‍රවිශ්ය වී තිබේ. එහි ආරම්භක අදියර වනුයේ රාජ්‍ය සහ රාජ්‍ය නොවන සංවිධානවලට ආරක්ෂාව සහිත වෙබ් අඩවි සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීමයි. | අධිකරණ අමාත්‍යාංශය සඳහා ලෝ නෙට්, ශ්‍රී ලංකා නිර්වින්දක හා දැඩි සත්කාර ඒකක වෛද්‍යවරුන්ගේ සංගමය සඳහා SAARCAA 2017. |

18. 3 වගුව : ප්‍රසම්පාදන පහසුකම් වැඩසටහන්

| ව්‍යාපෘතිය | විස්තරය |
|---|---|
| ජාතික පුද්ගල ලේඛනාගාර (ජා.පු.ලේ.) ව්‍යාපෘතිය | මෙම ව්‍යාපෘතියේ දෙවන අදියරට අදාළ ප්‍රසම්පාදන පහසුකම ලං.ලො.ටෙ. සමාගම නිමා කර අදාළ ලේඛන රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය හරහා අභ්‍යන්තර කටයුතු පිළිබඳ අමාත්‍යාංශයට බාර දෙන ලදී.<br><br>මෙම කාර්යය සඳහා ගෙවීම් පුද්ගලයන් ලියාපදිංචිකිරීමේ දෙපාර්තමේන්තුව විසින් ලං.ලො.ටෙ. සමාගම වෙත ගෙවන ලදී. |
| පොලිස් තොරතුරු සහ සන්නිවේදන පද්ධතිය | ව්‍යාපෘති සැලසුම්කරණය හා ප්‍රසම්පාදනයට අදාළ සියලු ලේඛන නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය වෙත බාරදෙන ලදී. |
| නාගරික සංවර්ධන අධිකාරිය සඳහා ව්‍යවසාය සම්පත් සැලසුම්කරණ විසඳුම | අවසන් තාක්ෂණික ඇගයීම් වාර්තාව නාගරික සංවර්ධන අධිකාරිය වෙත බාරදෙන ලදී. |
| හිස් කාලතුවක්කු උණ්ඩ පිත්තල කොපු විකිණීම | අනුමතිය සඳහා අමාත්‍ය මණ්ඩල සංදේශය රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය මගින් ඉදිරිපත් කර0න ලදී. |

18. 4 වගුව : ලං.ලො.ටෙ. විසින් 2016 වසරේදී අවසන් වූ ව්‍යාපෘති

- **ධාරිතා සංවර්ධනය:** සංවිධානමය සංවර්ධනය සහ සාර්ථකත්වය සඳහා කාර්ය මණ්ඩල පුහුණුව අතිශයින් වැදගත්බව ලං.ලො.ටෙ. සමාගම සලකයි. සේවකයකු හොඳින් පුහුණු කළහොත් ඔහු වඩා කාර්යක්ෂම හා ඵලදායී වනු ඇත. තම රැකියාවේ වගකීම් පිළිබඳ වඩා ශක්තිමත් අවබෝධයක් සේවකයා සතු බැවින් පුහුණුව මගින් සේවකයාගේ විශ්වාසය ද ගොඩ නැංවෙනු ඇත. මෙම විශ්වාසය නිසා වඩාත් හොඳින් රාජකාරි ඉටුකිරීමට හා තමන්ගේ දක්ෂතා පෙන්නුම් කිරීමට උපකාරක වන නව අදහස් පිළිබඳව සිතීමට ඔහුට පෙළඹවීමක් ඇතිවනු ඇත. එසේම අඛණ්ඩ පුහුණුව සීඝ්‍රයෙන් වෙනස්වන ව්‍යාපාරික පරිසරයේ නවතම වර්ධනයන් පිළිබඳව සේවකයන් දැනුවත් කරනු ඇත. නිපුණ සහ වෙනස්වන ව්‍යාපාරික පරිසරයේ ඉහළින්ම සිටින නිසි පරිදි පුහුණු කරන ලද සේවකයන්, ව්‍යාපාරික චක්‍රය තුල නායකයෙකු හා ශක්තිමත් තරඟකරුවෙකු ලෙස තම තත්වය පවත්වා ගැනීමට නිසැකවම ලං.ලො.ටෙ. සමාගමට අත්වැලක් වනු ඇත.

ඒ අනුව, සැළකිල්ලට ගත් කාල සීමාව තුළ කාර්ය මණ්ඩල සාමාජිකයන් 09 දෙනෙකුට ප්‍රධාන ක්ෂේත්‍ර 07 ක පුහුණුවක් ලං.ලො.ටෙ. සමාගම ලබාදෙන ලදි.

## 18.3 ඉදිරි වසර සඳහා කල් තබන ලද කාර්යයන්

- වසර 2017 තුලදී සහ ඉන් ඉදිරියට සම්පූර්ණ කිරීම සඳහා ප්‍රසම්පාදන පහසුකම් වැඩසටහන් අසූ දෙකක් (82) වත්මනෙහි ඉටුකරමින් පවතී.
- රාජ්‍ය බුද්ධි සේවා ව්‍යාපෘතිය
- උපාය මාර්ගික ආරක්ෂක සන්නිවේදන ජාල ව්‍යාපෘතිය
- සුළු ආයුධ නිෂ්පාදන කර්මාන්ත ශාලාවක් ස්ථාපිත කිරීම
- අතිරික්ත හමුදාමය උපකරණ විකිණීම
- සමුද්‍රීය ආවේක්ෂණ පද්ධති ව්‍යාපෘතිය
- සමුද්‍රීය අනතුරු ආරක්ෂක සම්බන්ධීකරණ මධ්‍යස්ථාන ව්‍යාපෘතිය
- හමුදා සතු ආයතන සඳහා සූර්ය බලශක්ති උත්පාදන යන්ත්‍රාගාර ස්ථාපිත කිරීම
- වෙඩි උණ්ඩ කොටස් ගැලවීමේ පිරියතක් මිලයට ගැනීම
- මහනුවර මහනගර සභාව සඳහා ස්වයංක්‍රීයකරණ ව්‍යාපෘති
- පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය සමග සහයෝගීතාව
- ශ්‍රී ලංකා නැනෝ තාක්ෂණ ආයතනය සමග සහයෝගීතාව
- වෙබ් අඩවි සංවර්ධනය

## 18.4 ගැටළු සහ අභියෝග

- ආරක්ෂක හමුදාවන්ට සපයන ලද සේවාවන් වෙනුවෙන් ලැබිය යුතු මුදල් ලබාගැනීමේ අභියෝගයට ලං.ලො.ටෙ.සමාගම දිගින් දිගටම මුහුණ දුනි.
- රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශ විෂය පථය යටතේ ඇති ප්‍රධාන ව්‍යාපෘති ගණනාවක් ආරම්භ කිරීමේදී ලබාදුන් සේවා සඳහා දරන ලද වියදම් ප්‍රතිපූරණයේදී සිදුවූ අනවශ්‍ය ප්‍රමාදවීම්
- සීමා පනවන ලද භාණ්ඩ සඳහා විදේශීය සැපයුම්කරුවන්ගේ දේශීය නියෝජිතයන් බිහිවීම
- සීමා පනවන ලද හමුදාමය භාණ්ඩ සැපයුමේදී රජයේ ඇතැම් සීමාකිරීම් සහ ජාත්‍යන්තර රෙගුලාසි
- සීඝ්‍රයෙන් දියුණුවන තාක්ෂණය නිසාවෙන් කාර්ය මණ්ඩලයේ නිපුණතා අඛණ්ඩව උත්ශ්‍රේණි කිරීමට අවශ්‍ය වීම.
- රාජ්‍ය ආරක්ෂාවට අදාළ දේශීය කර්මාන්ත ආරම්භ කිරීම හා සංවර්ධනය කිරීම
- රජයේ අනෙකුත් ආයතන සඳහා ප්‍රසම්පාදන පහසුකම් ක්‍රියාකාරකම් ව්‍යාප්තිය
- රජයේ ආයතන සඳහා තො.ස.තා. ව්‍යාපෘති හඳුන්වාදීම

## 18.5 අනාගත අපේක්ෂා

ශක්තිමත් හා ස්ථාවර ඉපැයුම්, මුදල් ප්‍රවාහ සහ අගය එකතු කිරීම ජනනය කිරීමේ අභිලාෂය හා සම්බන්ධ විවිධාංගීකෘත ආයතනයක් ලෙස ලං.ලො.ටෙ.සමාගම ස්ථානගත වෙමින් තිබේ. විවිධ වර්ධන අවස්ථා ග්‍රහණය කර ගැනීමට අතරම වෙනස්වන සුලු පරිසරයක සමාගමේ ස්ථාවරභාවය ඉහළ නංවා ගැනීමට මෙම විවිධාංගීකරණය ලං.ලො.ටෙ.සමාගමට හැකියාව ලබා දෙයි. සුපුරුදු ප්‍රසම්පාදන පහසුකම් සැපයීමේ ක්‍රියාකාරකම් හැරුණු විට, ලං.ලො.ටෙ. සමාගම රාජ්‍ය ආරක්ෂාව ආශ්‍රිත තො.ස.තා. යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම ඉලක්ක කරගත් සංවර්ධන ව්‍යාපෘති මෙන්ම ජාතික වැදගත්කමක් ඇති ව්‍යාපෘති ඉටුකිරීමෙහි නිරතවෙයි. ඒවා අතුරින් ඇතැම් සුවිශේෂී ව්‍යාපෘති වනුයේ:

- ජාතික සමුද්‍රීය හැකියා වර්ධනය කිරීමේ පද්ධති හඳුන්වා දීම
- රාජ්‍ය ආරක්ෂාව හා මහජන සුරක්ෂිතතාව සඳහා සන්නිවේදන යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම
- ජාතික තොරතුරු පද්ධති වැඩි දියුණු කිරීම
- ක්‍රියාවලි යළි සැලසුම්කිරීම ආශ්‍රිත ව්‍යාපෘති ආරම්භ කිරීම හා අභ්‍යන්තර රාජ්‍ය ආරක්ෂක අවශ්‍යතා සඳහා විසඳුම් නව්‍යකරණය
- කුඩා විෂ්කම්භය සහිත උණ්ඩ නිපදවීමේ පිරියත වැනි රාජ්‍ය ආරක්ෂාවට අදාළ දේශීය කර්මාන්ත ආරම්භකිරීම හා සංවර්ධනය

# 19. ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක අධ්‍යයන ආයතනය

## 19.1 සමාලෝචනය

ජාතික ආරක්ෂක අධ්‍යන ආයතනය (Institute of National Security Studies – INSSSL) අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා විසින් ශ්‍රී ලංකා ආරක්ෂක අමාත්‍යාංශයට අනුබද්ධ ජාතික ආරක්ෂක පර්යේෂණ තටාකය ලෙස 2016 වර්ෂයේ අගෝස්තු මස පිහිටුවිය. මෙම අධ්‍යයන ආයතනය ජාතික ආරක්ෂාව රැකගැනීමේ අරමුණ ඉලක්ක කරගනිමින් ආරක්ෂක වටපිටාව පිළිබඳ හොඳ අවබෝධයක් ලබා ගැනීමට සහ ශ්‍රී ලංකා ආණ්ඩුව සමඟ ප්‍රතිපත්තිමය හා ක්‍රමෝපායන් හරහා විවාද, සාකච්ඡා, පර්යේෂණ හා විශේෂඥ දැනුම සම්බන්ධව ක්‍රියා කිරීමට නිර්මාණය කරනු ලැබීය.මෙහි අධ්‍යක්ෂ ජෙනරාල් අසංග අබේගුණසේකර මහතා විසින් පළමුව මෙම ආයතනය තාවකාලික කාර්යය මණ්ඩලයක් සහිතව ආරම්භ කරන ලද අතර 2017 වර්ෂයේ ජනවාරි 2වන දින පැවති නිළ වශයෙන් ආයතනය පිහිටුවීමේ උත්සවයෙන් පසුව වර්තමානයේ අධ්‍යක්ෂවරු දෙදෙනෙකු, එක් පර්යේෂණ විශ්ලේෂකයෙකු පර්යේෂණ සහකාරවරුන් තිදෙනෙකුගෙන් සමන්විත ස්ථිර සේවක මඬුල්ලක් සහ පුහුණු නිලධාරීන් කිහිප කිහිපදෙනෙකුගෙන් සමන්විත වේ.

### 19.1.1 දැක්ම

- උසස් ප්‍රමිතියේ පර්යේෂණ සහ විශ්ලේෂණයන් තුළින් ප්‍රතිපත්ති සහ තීරණ ගැනීමේ ශක්‍යතාව වැඩිදියුණු කිරීම.

### 19.1.2 මෙහෙවර

- ඉහළ ප්‍රමිතියේ පර්යේෂණ හරහා රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ මෙහෙවර වන , ආරක්ෂිත භෞමික අඛණ්ඩතාවයෙන් හෙබි ස්වෛරී රාජ්‍යයක් වෙනුවෙන් උපාය මාර්ගික සැළසුම් හා ප්‍රතිපත්ති සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීමට නිරන්තරව සහය දැක්වීම.

### 19.1.3 ආයතයේ අරමුණු

- ශ්‍රීලංකාව අභ්‍යන්තර හා බාහිර තර්ජන වලින් ආරක්ෂා කිරීමට, ජාතික ආරක්ෂාව පිළිබඳ පැතිකඩයන් හා තක්සේරුකරණයන් කාලෝචිත ප්‍රමිතියකින් යුතුව සැපයීම.
- ශ්‍රී ලංකා රජය සිවිල් සමාජය හා පුද්ගලික අංශය සඳහා සහයෝගයෙන් යුතුව ශ්‍රී ලංකාවේ ආරක්ෂාව හා ස්ථායීතාවයට බලගපාන ගැටළු පිළිබඳ විවාදයට හා සාකච්ඡාවට වේදිකාවක් ලෙස කටයුතු කිරීම හා සැළසුම්කරුවන්ගේ සහ චින්තකයන්ගේ අදහස්වලින් සමන්විත වර්ණාවලියක් සකස් කිරීම.
- ජාතික ආරක්ෂක පැතිකඩයන් පිළිබඳ පර්යේෂණ ආයතනයන් ශක්තිමත් කිරීම සඳහා සාකච්ඡාවේ කේන්ද්‍රයන් ලෙස හා ශක්‍යතා ගොඩනගන්නෙක් ලෙස ක්‍රියාකිරීම.
- ජාතික එකමුතු බව හා සමගිය වෙනුවෙන් කැපවෙන වෘත්තිකයන් හා විද්වතුන් වෙනුවෙන් දැනුම සපිරි දත්ත ගබඩාවක් ලෙස ක්‍රියා කිරීම.
-

## 19.2 2016 වර්ෂයේ කාර්යසාධනය

### 19.2.1 වටමේස සාකච්ඡා

**INSSSL ආරක්ෂක මැදිරිය (Security Salon)**

INSSSL ආරක්ෂක මැදිරිය (Security Salon) යනු, තොරාගත් සම්භාවනීය සාකච්ඡා මණ්ඩලයක් වටමේස අනුරුවට පවත්වන්නාවූ සාකච්ඡාවකි. මෙහි ඉලක්කය වනුයේ ජාතික කලාපීය අන්තර් ජාතික වශයෙන් වැදගත් වූ අදාල වූ කාලෝචිත වූ මාතෘකාවක් පිළිබඳ සාකච්ඡාවක් ජනනය කිරීමයි.




- පළමු ආරක්ෂක මැදිරි සැසිය 2016 ඔක්තෝබර් මස 5 වන දින ආරක්ෂක අමාත්‍යාංශ පරිශ්‍රයේදී සාර්ථකව පැවතිණි. මෙම සාකච්ඡාවේදී තෝරාගත් සාකච්ඡා මණ්ඩපයක විශේෂ මාතෘකාවක් පිළිබඳව බුද්ධිමය රාජතාන්ත්‍රික හා දේශපාලනමය විවාදයකට ඉඩහසර නිර්මාණය විය. මෙහිදී ආරාධිත දේශනය ඉන්දු පාකිස්ථාන තත්වය පිළිබඳ ඉන්දියාවේ නව දිල්ලියේ ආරක්ෂක අධ්‍යානයන් හා විශලේෂන ආයතනයේ (Institute of Defence Studies and Analyses – IDSA) සම්භාවනීය මහාචාර්යවරයෙකු වන එස්.ඩී. මුනි (S. D. Mini) මහතා විසින් සිදු කරනු ලැබීය. කොළඹ පැවති පළමු සැසියෙහි මුලසුන ශ්‍රී ලංකා රාජ්‍ය ආරක්ෂක ලේකම් ඉංජංනේරු කරුණාසේන හෙට්ටිආරච්චි මහතා විසින් හෙබවූ අතර, විද්වතුන්, රාජ්‍ය තාන්ත්‍රික ක්ෂේත්‍රයේ ප්‍රජාව සහ ත්‍රිවිධ හමුදා නිළධාරීන්ද මෙයට සහභාගි විය.
- දෙවන ආරක්ෂක මැදිරි සැසිය 2016 ඔක්තෝබර් 28 වන දින රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශ පරිශ්‍රයේදීම පවත්වන ලදි. උපාය මාර්ගික අධ්‍යයනයන් පිළිබඳ කලාපීය සංවිධානයෙහි ( Regional Center of

Strategic Studies – RCSS) විධායක අධ්‍යක්ෂ ආචාර්ය ඉම්තියාස් අහමඩ් (Imtiaz Ahmed) විසින් " ගෝලීයකරණ සියවසෙහි ආරක්ෂාව" යන මැයෙන් ආරාධිත දේශනය පවත්වන ලදි. මෙම සැසියේදී රාජ්‍ය ආරක්ෂක ලේකම් ඉංජිනේරු කරුණාසේන හෙට්ටිආරච්චි මහතා විසින් මුලසුන දැරූ අතර INSSSL ආයතනයේ අධ්‍යක්ෂක ජනරාල් අසංග අබේගුණසේකර මහතා විසින් ආරම්භක දේශනය පවත්වන ලදි. ආචාර්ය අහමඩ් මහතා විසින් පවත්වනු ලැබූ දේශනය ඉතාම කාලෝචිත එක්ක වූ අතර, එය වත්මන් භූ දේශපාලනයේ රාජ්‍ය හා රාජ්‍ය නොවන පාර්ශවයන්ගේ අවධානයට යොමුවූ මාතෘකාවක් විය.

- INSSSL ආයතනය තෙවැනි ආරක්ෂිත මැදිරි සැසිය 2016 වර්ෂයේ නොවැම්බර් මස 18 වන දින රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශ පරිශ්‍රයේදී සාර්ථකව පැවැත්විය. මෙහි ආරාධිත දේශනය විද්‍යාව හා තාක්ෂණවේදය පිළිබඳ නෝර්වේජියානු අධ්‍යාපන ආයතනයේ ( Norwaygian Institute of Science and Technology) දේශපාලන විද්‍යාව පිළිබඳ මහාචාර්යවරයකු වන මහාචාර්ය ඉන්ද්‍රා ද සොයිසා (Indra De Soysa) විසින් "ප්‍රචණ්ඩකාරී ගැටුම : ශ්‍රී ලංකාවේ ආරක්ෂක ප්‍රතිපත්තිය පිළිබඳ න්‍යායාත්මක යොමුව " යන මැයෙන් සිදු කළේය. මෙම දෙසුම පැමිණ සිටි විද්වතුන්, වෘත්තිකයන්, රාජ්‍ය තාන්ත්‍රිකයන් හා ජ්‍යෙෂ්ඨ මිලිටරි නිළධාරීන් විසින් බොහෝ අගය කළ අතර, එය ශ්‍රී ලංකාවේ ආරක්ෂක වපසරියට අදාල හා ඉතාම වැදගත් මාතෘකාවක් ලෙස හඳුනාගනු ලැබීය

## 19.2.2 ප්‍රකාශන

### INSSSL ආරක්ෂක කාර්තුමය ප්‍රකාශනය

INSSSL ආරක්ෂක කාර්තුමය ප්‍රකාශනය සෑම මාස 3කට වරක් අධ්‍යයන ආයතන විසින් සිදු කරන ලද විවිධ වූ වැඩසටහන් සහ ක්‍රියාකාරකම් පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරන පුවත් සඟරාවකි. මෙහි අන්තර්ගතය අධ්‍යයන ආයතනය විසින් පවත්වනු ලැබූ වැඩසටහන් ක්‍රියාකාරකම් මෑත කාලීන ප්‍රකාශන හා අධ්‍යක්ෂ ජනරාල්තුමා සහ සේවක මණ්ඩලය විසින් සහභාගි වූ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ආදියෙන් සමන්විත වේ. මෙම ලුහුඩු සඟරාව දේශීය හා ජාත්‍යන්තර ශාස්ත්‍රඥයින්, බුද්ධිමතුන්, පර්යේෂණ ආයතන රාජ්‍ය ආයතන හා වෙනත් උනන්දුවක් දක්වන පිරිස් අතර බෙදා හරිනු ලබයි.

INSSSL ආරක්ෂක සමාලෝචන 2017 ආරක්ෂක අධ්‍යයනයන් සඳහා පර්යේෂණ වේදිකාවක් සැකසීමෙන් ජාතික කලාපීය ජාත්‍යන්තර ආරක්ෂාව සහ භූ දේශපාලනය පිළිබඳ අවබෝධය වැඩි දියුණු කිරීමෙන් ඉලක්කයෙන් යුතුව ප්‍රකාශයට පත් විය. මෙම සමාලෝචනය මඟින් ප්‍රකාශයට පත් වූ ලිපි ජාතික කලාපීය සහ ජාත්‍යන්තර ආරක්ෂක සන්දර්භයන්හි මෑත කාලීන සංසිද්ධීන් පිළිබඳව විද්වතුන් විසින් රචනා කරන ලද ලිපි පෙළක් ලෙස හඳුනා ගත හැකි වන්නේය. එම ලිපි පෙළ ඉන්දීය හමුදා කලාපයේ කලාපීය මහා බලවතුන්, ඇෆ්ගනිස්ථානයේ නොනවතින ගැටුම, ගැටුම පිළිබඳ න්‍යායන් හා ශ්‍රී ලංකාවේ සන්දර්භය තුළ එහි අදාළත්වය, ගල්ෆ් කලාපයේ ආරක්ෂාව, නව ලෝක පර්යාය තුළ ඉන්දියාව- තායිවාන් සමුද්‍ර සන්ධිය තුළ ආරක්ෂාව හා බල තුලන දෘෂ්ටීන්, කලාපය තුළ ගුවන් බලය දැක්ම, ඉන්දියානු සාගර කලාපය තුළ චීන- ශ්‍රී ලංකා සබඳතා හා ශ්‍රී ලංකාව සම්බන්ධ කැරලි මර්ධන උපායමාර්ගික සැලසුම් යනාදී විවිධ මාතෘකා ඔස්සේ ලියවී ඇත. බොහෝ තොරතුරුවලින් පොහොසත් මෙම ලිපි පෙළ අධ්‍යයන ආරක්ෂක හා උපායමාර්ගික අධ්‍යනයේ නිරත වන්නා වූ හා ඒ සම්බන්ධ උනන්දුවක් ඇති අයගේ අවබෝධය සඳහා උපයෝගී වනු ඇත.

## 19.2.3 සහයෝගීතා ජාල

දකුණු ආසියානු බුද්ධි පරීක්ෂණ මධ්‍යස්ථාන වල මූලායාතනය (Consortium of South Asian Think Talents – COSATT) සහ INSSSL අතර සහයෝගීතාවයෙන් පැවැති සාකච්චා වටය "කලාපීය ආරක්ෂක දෘෂ්ටීන්" යන මැයෙන් රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශ පරිශ්‍රයේදී 2016 අගෝස්තු මස 26 වන දින පවත්වනු ලැබූ අතර එහි මුලසුන රාජ්‍ය ආරක්ෂක ලේකම් ඉංජිනේරු කරුණාසේන හෙට්ටිආරච්චි මහතා විසින් හොබවනු ලැබීය.මේ සඳහා කලාපීය සම්භාවනීය විද්වතුන් 15කට අධික සංඛ්‍යාවක් සහභාගී විය.

## 19.2.4 නිල චාරිකා

- INSSSL හි අධ්‍යක්ෂක ජනරාල්තුමා ජපානයේ ටෝකියෝ හි 1952 වර්ෂයේ ආරම්භ කරන ලද ආරක්ෂක අධ්‍යනයන් පිළිබඳ ජාතික අධ්‍යයන ආයතනයට සංචාරය කරන ලද අතර එය මෙරට ආරක්ෂක පර්යේෂක ක්ෂේත්‍රයේ සාමාජිකයෙකු එම ආයතනය සඳහා ගිය පළමු සංචාරයද වන්නේය.
  මෙහි ප්‍රතිඵලයක් වශයෙන් NIDS හි Ms. Marie Yoshioka Izuyama සහ ආර්ථික සංවර්ධන ආයතනයේ (Institute of Developing Economics) Ms. Arai Etsuyo අප ආයතනයට 2016 දෙසැම්බර් මාසයේදී නිල වශයෙන් සංචාරයක යෙදුනි.



- ඉන්දියා සමුද්‍ර සමුළුව (Indian Ocean Conference ) සඳහා ලැබුණු ආරාධනයකට අනුව අප අධ්‍යක්ෂක ජනරාල්තුමා 2016 සැප්තැම්බර් මස 02 දින සිංගප්පූරුවේ Shangri – La හෝටලයේ පැවැති සමුළුවට සහභාගී විය.මෙහි ආරම්භක දේශනය ශ්‍රී ලංකා අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතා විසින් සිදු කල අතර,ශ්‍රී ලංකා රජය නියෝජනය කරමින් නියෝජිතයින්, කලාපීය පර්යේෂණ ආයතනයන්හී සාමාජිකයින්, සම්භාවනීය මිලිටරි සාමාජිකයින් හිටපු රාජ්‍ය තාන්ත්‍රිකයන් හා විද්වතුන්ද සහභාගී විය.
- INSSSL හි පර්යේෂණ සාමාජිකයකු වන රම්ලා වහබ් සල්මාන් (Ramla- Wahab- Salman) මහත්මිය 2016 නොවැම්බර් මස චීනයේ බීජිං නොමැල් විශ්ව විද්‍යාලය (Normal University) හා නිශාන් ලෝක ශිෂ්ටාචාර මණ්ඩපය (Nishan World Civilization Forum) විසින් සංවිධානය කළ නැගෙනහිර ආසියානු ශිෂ්ටාචාර මණ්ඩපය පිළිබඳ ජාත්‍යන්තර සම්මන්ත්‍රණයට සහභාගි විය. මෙහිදී Ramla මහත්මියගේ දේශනය “ඉන්දියානු සමුද්‍රය තුළින් ශ්‍රී ලංකාව හා චීනය අතර සබඳතා හි ඓතිහාසික පැතිකඩයන් “ (Historical Aspects to Sino- Sri Lanka Contacts Through the Indian Ocean ) යන මාතෘකාව යටතේ විය. මෙහිදී සිලික් හා කුළුබඩු මුහුදු මාර්ග හරහා සිදු වූ ආගමික බුද්ධිමය හා සංස්කෘතිමය හුවමාරු හා සබඳතා පිළිබඳ අවධානය යොමුවිය.




- INSSSL හි පර්යේෂණ විශ්ලේෂක ගයාත්‍රි ද සොයිසා මහත්මිය 2016 නොවැම්බර් 07,08 දෙදින චීනයේ බීජින් හි පැවැත්වූ පළමු ජාතික විද්‍යා හා පර්යේෂණ සමුළුවට සයභාගී විය. මෙහිදී ඇය විසින් INSSSL හි පර්යේෂක ගනිඳු නිරසිංහ සමඟ රචනා කරන ලද “ශ්‍රී ලංකාවේ තිරසාර සංවර්ධනය දෙසට “ (Towards Sustainable Development in Sri Lanka ) යන ලිපිය ද ඉදිරිපත් කරන ලදි.
- COSATT ආයතනය තම ඉදිරි සැළසුම් සම්බන්ධයෙන් පැවති සැසිය දකුණු ආසියානු පර්යේෂණ තටාකයන් හි ප්‍රධානීන්ගේ ප්‍රධානත්වයෙන් 2016 නොවැම්බර් මස 28 වන දින තායිලන්තයේ බැංකොක් හි දි පැවැත්විය. මේ සඳහා අධ්‍යක්ෂක ජනරාල් සහභාගි විය. එමෙන්ම ඔහුට Horasis Asia රැස්වීම සඳහා සම්භාවනීය විද්වත් කමිටු සාමාජිකයකු ලෙස සහභාගී වීමට ද ආරාධනා ලැබිණි.
- අධ්‍යක්ෂ ජනරාල්තුමන් විසින් “මෝඩි ධර්මතාවය : ඉන්දියානු විදේශ ප්‍රතිපත්තියේ නව රටාවන් “(The Modi Doctrine: New Paradigms in India’s Foreign Policy ) යන කෘතියෙහි පරිච්ඡේදයකට තම දායකත්වය ලබා දුන් අතර 2016 අගෝස්තු මස 13 වන දින ඔහු එම කෘතියේ එළිදැක්වීමටද සහභාගී විය.

## 19.3 ගැටළු හා අභියෝග

මෙම ආයතනය ආරම්භයේ සිට මේ දක්වා මාස පහක් (05) වැනි කෙටි කාලයක් තුල අප විසින් සිදු කරන ලද කාර්යය හා අප ලැබුවාවූ ප්‍රගතිය සම්බන්ධයෙන් අප සෑහීමට පත්වන්නෙමු.ආයතන ව්‍යුහය,ක්‍රියාවලිය හා ප්‍රතිඵල සම්බන්ධයෙන් විශාල ප්‍රගතියක් අත්පත් කරගෙන ඇත.

2016 වර්ෂයේ අගෝස්තු මස සිට INSSSL ආයතනය තම ආයතනික ඉලක්ක හා අරමුණු කරා ළඟාවීමට උත්සාහ කලේ ඉතාම සීමිත සම්පත් ලෙස, ස්වේච්ඡාවෙන් සේවයේ නියුතු වූ තාවකාලික සහ ආධුනික සේවක මණ්ඩලයකගේ දායකත්වයෙනි.

කෙසේ වුවත් මූලික දුෂ්කරතා තිබියදීත් INSSSL ආයතනයට 2016 වර්ෂයට ඉලක්ක ගත කරන ලද සියලු කාර්යයන් හා අරමුණු කරා ළඟා වීමට හැකියාව ලැබුණි.වටමේස සාකච්ඡාවන් කිහිපයක් පැවැත්වීම, වාර්ෂික සඟරාව ජාතික හා කලාපීය විශේෂඥයින්ගේ දැනුම උපයෝගී කරගෙන ප්‍රකාශයට පත් කිරීමට හැකිවීම, කාර්තුමය පුවත් සඟරාව නිකුත් කිරීම කීර්තිමත් විද්වතුන් හා වෘත්තිකයන්ගේ සමන්විත ආරක්ෂක ගැටළු සම්බන්ධයෙන් විශේෂඥ දැනුම සහිත සම්පත් දායක මණ්ඩලයක් නිර්මාණය කිරීම හා 2017 ජනවාරි මස නිළ වෙබ් අඩවිය එළිදැක්වීම මේ අතරින් සුවිශේෂී වේ.මෙම ආයතනය දැනට භෞතිකමය වශයෙන් ඉතාම සුළු සම්පත් හා මූල්‍යමය පහසුකම් සහිතව තම වැඩකටයුතු කරගනිමින් සිටියි.මීට පෙර රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශ පරිශ්‍රයේ පිහිටුවා තිබුණු මෙමINSSSL ආයතනයෙහි නව කාර්යාලය 2017 ජනවාරි 02 වන දින සිට බත්තරමුල්ල සුහුරුපාය ගොඩනැගිල්ලෙහි 08 වන මහලෙහි ස්ථාපිත කරන ලදී.

## 19.4 අනාගත අපේක්ෂා

| ක්‍රියාකාරකම | 2017 | 2018 | 2019 | 2020 |
|---|---|---|---|---|
| ආරක්ෂක මැදිරි | මාසිකව (12) | මාසිකව (12) | මාසිකව (12) | මාසිකව (12) |
| Threat lens | මාසිකව (12) | මාසිකව (12) | මාසිකව (12) | මාසිකව (12) |
| මහජන දේශන | කාර්තුවකට 1 බැගින් (4) | කාර්තුවකට 2 බැගින් (8) | කාර්තුවකට 2 බැගින් (8) | කාර්තුවකට 2 බැගින් (8) |
| ඒකාබද්ධ උත්සව/ සම්මන්ත්‍රණ | 1 | 2 | 3 | 3 |
| කලාපීය සමුළු | 1 | 2 | 2 | 3 |
| ත්‍රෛමාසික ආරක්ෂාව | කාර්තුවකට 1 බැගින් (4) | කාර්තුවකට 1 බැගින් (4) | කාර්තුවකට 1 බැගින් (4) | කාර්තුවකට 1 බැගින් (4) |
| ආරක්ෂක සමාලෝචනය | 1 | 1 | 1 | 1 |
| වටමේස සාකච්ඡා | 6 | 6 | 6 | 6 |

19.1 වගුව: උපාය මාර්ගික සැළසුම් 2017- 2020

# 20. ජාතික ශිෂ්‍යභට බලකාය

## 20.1 සමාලෝචනය

ශ්‍රී ලංකාවේ පළාත් 09 ආවරණය වන පරිදි දිවයින පුරා ස්ථාපිත කර ඇති බලඇණි 38 ක් මඟින් ශිෂ්‍යභට බණ්ඩ බාලක/බාලිකා 1873 ක් පුහුණුවීම් කටයුතු සිදුකරනු ලබයි. ඒ හරහා වාර්ෂිකව ශිෂ්‍යභටයින් 46825 ක් ශිෂ්‍යභට බලකායේ නිලධාරින් විසින් පුහුණුවීම් කටයුතු සිදුකරනු ලබයි.
ජාතික ශිෂ්‍යභට බලකායේ පහත සඳහන් පරිදි සංවිධානය වී ඇත.

### අ.ජාශිබ මූලස්ථානය

ජාතික ශිෂ්‍යභට බලකායේ මූලස්ථානය අංක 15, දුටුගැමුණු වීදිය , පාමංකඩ, දෙහිවල යන ස්ථානයේ ස්ථාපිත කර ඇති අතර එහි නිලධාරින් 35 දෙනෙකු ,සෙසු නිලයින් 21 දෙනෙකු හා සිවිල් සේවකයින් 34 දෙනෙකු සේවය කරනු ලබයි. ආරක්ෂක රාජ්‍ය අමාත්‍යාංශයේ මඟපෙන්වීම මත පාලන , භටකාර්ය සම්පාදන කාර්යයන් මත ශිෂ්‍යභට පුහුණුවීම් වල ගුණාත්මක භාවය වැඩිදියුණු කිරීම සඳහා කටයුතු කරනු ලබයි.

### ආ.පුහුණු මධ්‍යස්ථානය - රන්ටැඹේ

ජාතික ශිෂ්‍යභට බලකාය සතු එකම පුහුණු මධ්‍යස්ථානය රන්ටැඹේ ස්ථාපිත කර ඇත. එහි නිලධාරින් 24 දෙනෙකු, සෙසු නිලයන් 54 ක් සහ සිවිල් සේවකයින් 56 දෙනෙකු සේවය කරනු ලබයි.

### ඇ.පළාත් මූලස්ථාන

පළාත් 9 ආවරණය වන පරිදි පළාත් මූලස්ථාන 9 ක් ස්ථාපිත කර ඇති අතර නිලධාරින් 7 දෙනෙකු ,සෙසු නිලයින් 8 දෙනෙකු සහ සිවිල් සේවකයින් 7 දෙනෙකු සේවය කරනු ලබයි.

### ඉ.බලඇණි මූලස්ථාන

මුළු දිවයිනම ආවරණය වන පරිදි බලඇණි 38ක් ස්ථාපිත කර ඇත.ප්‍රධාන පරමාර්ථය වන්නේ පාසල් වල ශිෂ්‍යභට බණ්ඩ පුහුණුවීම් කටයුතු සිදු කිරීම වන අතර ඒ මගින් ශිෂ්‍යභටයින් හර්මන්ලූස් කුසලාන කඳවුර හා ද සොයිසා කුසලාන කඳවුර සඳහා සුදුසුකම් ලැබීමට පුහුණුවීම් කටයුතු සිදු කරනු ලබයි. නිලධාරින් 104 දෙනෙකු, සෙසු නිලයින් 138 ක් හා සිවිල් සේවකයින් 56 දෙනෙකු බලඇණි වල රාජකාරි සිදුකරනු ලබයි.



1. ජාශිබ - ගාල්ල
2. ජාශිබ - නුවර
3. ජාශිබ - කොළඹ
4. ජාශිබ - කුරුණෑගල
5. ජාශිබ - අනුරාධපුර
6. ජාශිබ - බදුල්ල
7. ජාශිබ - ගම්පහ
8. ජාශිබ - රත්නපුර
9. ජාශිබ - කෑගල්ල
10. ජාශිබ - තංගල්ල
11. ජාශිබ - පොළොන්නරුව
12. ජාශිබ - කළුතර
13. ජාශිබ - මාතලේ
14. ජාශිබ - කුලියාපිටිය
15. ජාශිබ - මොනරාගල
16. ජාශිබ - මාතර
17. ජාශිබ - අම්පාර
18. ජාශිබ - නුවරඑළිය
19. ජාශිබ - පන්නිපිටිය
20. ජාශිබ - යාපනය
21. ජාශිබ - ත්‍රිකුණාමලය
22. ජාශිබ - වව්නියාව
23. ජාශිබ - සෙංකඩගල
24. ජාශිබ - හම්බන්තොට
25. ජාශිබ(ගැ) - වයඹ
26. ජාශිබ(ගැ) - බස්නාහිර
27. ජාශිබ(ගැ) - දකුණ
28. ජාශිබ(ගැ) - මධ්‍යම
29. ජාශිබ(ගැ) - සබරගමුව
30. ජාශිබ(ගැ) - උතුර
31. ජාශිබ(ගැ) - නැගෙනහිර
32. ජාශිබ(ගැ) - උතුරුමැද
33. ජාශිබ(ගැ) - ඌව
34. ජාශිබ - මුලතිව්
35. ජාශිබ - පුත්තලම
36. ජාශිබ - කිලිනොච්චිය
37. ජාශිබ - මන්නාරම
38. ජාශිබ - මඩකලපුව




20.1 පින්තූරය:බලඇණි ව්‍යාප්තිය

## 20.1.1 මෙහෙවර

සැලසුම් කරන ලද පුහුණු පාඨමාලාවක් තුළින් ශිෂ්‍යභටයින් තුළ චරිතවත් බව, චිත්ත ධෛර්යය, ක්‍රීඩාශීලී බව ,ආත්ම විශ්වාසය ,ස්වයං විනය ,ප්‍රජා හැඟීම් ,වික්‍රමාන්විත හැඟීම් , වගකීම් දැරීම ,සුහදශීලීත්වය යන ගුණාංග වර්ධනය කර ජාතියේ සේවය සඳහා යෙදවිය හැකි ඕනෑම ජීවන පැවැත්මක නායකත්වය දැරිය හැකි පිරිපුන් තරුණ පරපුරක් බිහි කිරීම.

## 20.1.2 පරමාර්ථ

- කණ්ඩායම් හැඟීම් , නායකත්ව ගුණාංග සහ තැනට සුදුසු නුවණ ඇති කිරීම.
- රටට වැඩදායී තරුණ පරපුරක් බිහිකිරීම.
- කණ්ඩායමක් ලෙස වැඩ කිරීමේ හැකියාව වර්ධනය කිරීම තුළින් අනාගත නායකත්වයට ශිෂ්‍යභටයන් හුරුකිරීම.
- වගකීම් දැරීම හා සමාජානුයෝජනය ඇති කිරීම තුළින් යහපත් දරු පරපුරක් බිහිකිරීම.
- කායික,මානසික හා බුද්ධි වර්ධනය සඳහා ශිෂ්‍යභටයන්ට අවස්ථාව සැළසීම.

## 20.1.3 ශිෂ්‍යභට බලකායේ පුහුණු අවස්ථා

### 20.1.3.1 පාසල් ශිෂ්‍යභට බණ්ඩ පුහුණුව

- පාසල් ශිෂ්‍යභට බණ්ඩ 1873 ක් සඳහා පහත පුහුණු අවස්ථා සලසා ඇත.
- යුධ බාලක ඇගයීම් කඳවුරු - පුහුණු මධ්‍යස්ථානය , රන්ටැඹේ
- යුධ බාලිකා ඇගයීම් කඳවුරු - පුහුණු මධ්‍යස්ථානය , රන්ටැඹේ
- නාවික ,ගුවන්, පොලිස්,බාලක / බාලිකා ඇගයීම් කඳවුරු
- පාසල් මට්ටමේ පුහුණුවීම් කටයුතු
- බලඇණි මට්ටමේ පුහුණුවීම්
  - එක්දින පුහුණු කඳවුරු
  - දෙදින පුහුණු කඳවුරු
- පළාත් මට්ටමේ පුහුණුවීම්
  - එක්දින පුහුණු කඳවුරු
  - දෙදින පුහුණු කඳවුරු

### 20.1.3.2 නිලධාරී පුහුණුව

- ආධුනික නිලධාරී පුහුණු පාඨමාලාව
- නිලධාරී පුහුණු පාඨමාලාව
- තූර්යවාදන නිලධාරී

### 20.1.3.3 ජාතික මට්ටමේ ක්‍රියාකාරකම්

- හර්මන්ලූස් කුසලාන කඳවුර
- ද සොයිසා කුසලාන කඳවුර
- සමස්ත ලංකා පෙරදිග/අපරදිග (බාලක/බාලිකා) ඇගයීම් කඳවුර
- ජාතික නිදහස් දින උත්සව පෙළපාලිය

### 20.1.3.4 විශේෂ කඳවුරු

- ශිෂ්‍යභට උසස් පාඨමලාව (ජොයකොනොනින් සඳහා)
- කණිෂ්ට නායකත්ව පාඨමාලාව
- තූර්යවාදන කොනොනි පාඨමාලාව

## 20.2 2016 වර්ෂයේ කාර්යසාධනය

| අනු අංකය | පුහුණු පාඨමාලාව | පුහුණු කඳවුරු | | පුහුණුව ලැබූ සංඛ්‍යාව |
|---|---|---|---|---|
| | | A කඳවුරු | B කඳවුරු | |
| 01. | කනිෂ්ඨ නායකත්ව පුහුණු පාඨමාලාව | √ | | 396 |
| 02. | තූර්යවාදන කොනොනි හා බන්ඩ භාර නිලධාරී පාඨමාලාව | √ | | 254 |
| 03. | ඇගයීම් කඳවුරු අංක 01 (බාලක) | √ | | 1222 |
| 04. | ඇගයීම් කඳවුරු අංක 02 (බාලක) | √ | | 1193 |
| 05. | ඇගයීම් කඳවුරු අංක 03 (බාලක) | √ | | 1086 |
| 06. | ගුවන් ඇගයීම් කඳවුරු අංක 01 (බාලක) | | √ | 655 |
| 07. | ඇගයීම් කඳවුරු අංක 04 (බාලක) | √ | | 1097 |
| 08. | ගුවන් ඇගයීම් කඳවුරු අංක 01 (බාලිකා) | | √ | 578 |
| 09. | ඇගයීම් කඳවුරු අංක 05 (බාලක) | √ | | 1215 |
| 10. | ඇගයීම් කඳවුරු අංක 06 (බාලක) | √ | | 1092 |
| 11. | ගුවන් ඇගයීම් කඳවුරු අංක 02 (බාලක) | | √ | 641 |
| 12. | ඇගයීම් කඳවුරු අංක 07 (බාලක) | √ | | 1130 |
| 13. | ගුවන් ඇගයීම් කඳවුරු අංක 02 (බාලිකා) | | √ | 361 |
| 14. | ඇගයීම් කඳවුරු අංක 01 (බාලිකා) | √ | | 722 |
| 15. | ඇගයීම් කඳවුරු අංක 02 (බාලිකා) | √ | | 931 |
| 16. | ඇගයීම් කඳවුරු අංක 08 (බාලක) | √ | | 1295 |
| 17. | පොලිස් කඳවුරු අංක 01(බාලක) | | √ | 636 |
| 18. | ඇගයීම් කඳවුරු අංක 09 (බාලක) | √ | | 1248 |
| 19. | පොලිස් ඇගයීම් කඳවුරු (බාලක) | | √ | 534 |

| | | | | |
|---|---|---|---|---|
| 20. | ඇගයීම් කඳවුරු අංක 10 (බාලක) | √ | | 1261 |
| 21. | නාවික ඇගයීම් කඳවුරු අංක 01 (බාලක) | | √ | 646 |
| 22. | ඇගයීම් කඳවුරු අංක 11 (බාලක) | √ | | 1076 |
| 23. | නාවික ඇගයීම් කඳවුරු අංක 01 (බාලිකා) | | √ | 559 |
| 24. | ආධුනික නිලධාරී පාඨමාලා අංක 37 | √ | | 80 |
| 25. | නිලධාරී පුහුණු පාඨමාලා | √ | | 116 |
| 26. | ඇගයීම් කඳවුරු අංක 12 (බාලක) | √ | | 1171 |
| 27. | නාවික ඇගයීම් කඳවුරු අංක 02 (බාලක) | | √ | 671 |
| 28. | සමස්ත ලංකා අපරදිග තූර්යවාදන කඳවුර (බාලක/බාලිකා) | √ | | 1030 |
| 29. | නාවික ඇගයීම් කඳවුරු අංක 02 (බාලිකා) | | √ | 652 |
| 30. | සමස්ත ලංකා පෙරදිග තූර්යවාදන කඳවුර (බාලක/බාලිකා) | √ | | 1090 |
| 31. | ද සොයිසා කුසලාන කඳවුර | √ | | 796 |
| 32. | හර්මන්ලූස් කුසලාන කඳවුර | √ | | 1584 |
| 33. | ශිෂ්‍යභට උසස් පාඨමාලාව | √ | | 383 |
| 34. | නිදහස් දින උත්සව පෙළපාලිය | | | 525 |
| | | | | 27926 |

20.1 වගුව : 2016 වර්ෂයේ පුහුණු මධ්‍යස්ථානය, රන්ටැඹේ හි පවත්වන ලද කඳවුරු.

දශක 03 කට පසුව ජාතික ශිෂ්‍යභට බලකාය 2017 සිට කණිෂ්ඨ ශිෂ්‍යභට බණ්ඩ පුහුණුව නැවත ආරම්භ කරන ලදී. මෙහි නියමු ව්‍යාපෘතිය ලෙස මොණරාගල හා ත්‍රිකුණාමල දිස්ත්‍රික්ක කේන්ද්‍ර කරගෙන ආරම්භ කරන ලද අතර 2016 සැප්තැම්බර් මස සිට කනිෂ්ඨ ශිෂ්‍යභටයින් 400 දෙනෙකු සමාරම්භක විසිරයාමේ පෙළපාලියට සහභාගී විය.

## 20.4 ගැටළු සහ අභියෝග

- රන්ටැඹේ පුහුණු මධ්‍යස්ථානයේ යටිතල පහසුකම් , වැසිකිළි පහසුකම්, ශිෂ්‍යභටයින්ගේ නවාතැන් පහසුකම් සහ ශිෂ්‍යභටයින් හට ස්නානය කිරීම සඳහා පහසුකම් වැඩිදියුණු කළ යුතුව ඇත.
- බලකාය සතුව ඇති වාහන ඉතා අබලන් තත්වයේ පවතින හෙයින් ප්‍රවාහන පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා අලුතින් වාහන ලබාගැනීමේ අවශ්‍යතාවයක් පවතී.
- කාර්යක්ෂම සේවයක් රටට ලබාදීම සඳහා බලකාය ප්‍රතිව්‍යුහගත කිරීම හා ප්‍රතිසංවිධානය කළ යුතුව ඇත.

## 20.5 අනාගත අපේක්ෂා

- මෙතෙක් ශිෂ්‍යභට බණ්ඩ ආරම්භ කර නොමැති සියලු ජාතික පාසල් ,මධ්‍ය මහා විද්‍යාල හා මහා විද්‍යාලවල නව ශිෂ්‍යභට බණ්ඩ 500 ආරම්භ කිරීම.
- 2017 වර්ෂයේ කණිෂ්ඨ ශිෂ්‍යභට බණ්ඩ ආරම්භ කිරීම.
- රන්ටැඹේ පුහුණු මධ්‍යස්ථානයේ වාර්ෂික පුහුණුව ලබන ශිෂ්‍යභට සංඛ්‍යාව 27000 සිට 40000 දක්වා වැඩිදියුණු කිරීම.
- පානීය ජල ව්‍යාපෘතිය ස්ථාපිත කිරීම.
- ශිෂ්‍යභටයින් සඳහා නවාතැන් පහසුකම් වැසිකිළි පහසුකම් හා ස්නානය කිරීම සඳහා ස්ථාන වැඩිදියුණු කළ යුතුව ඇත.
- ජාශිබ මුලස්ථානයේ වැසිකිළි පද්ධතිය ප්‍රතිසංස්කරණය කිරීම.
- ජාශිබ මුලස්ථානයේ රාජකාරී කරනු ලබන සෙසු නිලයින් සඳහා 80” X 20” ගොඩනැගිල්ලක් ඉදි කළ යුතුව ඇත.
- ජාශිබ මුලස්ථානයේ ඉදිකර ඇති තෙමහල් ගොඩනැගිල්ලේ බිම්මහලේ වැඩ කටයුතු සම්පූර්ණ කිරීම.
- රන්ටැඹේ පුහුණු මධ්‍යස්ථානයේ සේවය කරන සෙසු නිලයින් සඳහා වැසිකිළි පද්ධති 10ක් ඉදිකිරීම.
- ජාශිබ මුලස්ථානයේ අමුත්තන් සඳහා 12” X 06” ප්‍රමාණයේ වැසිකිළියක් ඉදිකිරීම.
- ජාශිබ මුලස්ථානයේ අපද්‍රව්‍ය බැහැරකිරීම සඳහා පූථික ටැංකියක් (septic tank) ඉදිකිරීම.

# 21. රණවිරු සේවා අධිකාරිය

## 21.1 සමාලෝචනය

### 21.1.1 දැක්ම

රණවිරු නාමයට ජාතියේ කෘතගුණ දැක්වීම

### 21.1.2 මෙහෙවර

ශ්‍රී ලංකාවේ ඒකීය භාවය සුරක්ෂිත කරනු පිණිස ජීවිත පුද කළා වූ, අතුරුදහන් වූ හා ආබාධිත වූ රණවිරුවන් සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන්ගේ මානසික හා සාමාජීය ස්ථාවරභාවයක් ඇති කිරිම මෙන් ම සේවයේ නියුතු රණවිරුවන් සහ එම පවුල් වල මානසික ප්‍රබෝධයක් ඇති වන අයුරින් ක්‍රියා කිරිම.

### 21.1.3 කාර්යභාරය

(1999 අංක 54 දරන රණවිරු සේවා අධිකාරි පනතට අනුව )

- ක්‍රියාන්විතයේ දී ආබාධිත බවට පත් ව සිටින සන්නද්ධ හමුදාවල සහ පොලිස් හමුදාවේ සාමාජිකයන්ගේ පසු උවටැන සහ, ඔවුන් පුනරුත්ථාපනය කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම.
- ක්‍රියාන්විතයේ දී ආබාධිත බවට පත්ව සිටින සන්නද්ධ හමුදාවල හා පොලිස් හමුදාවේ සාමාජිකයන්ට සහ ක්‍රියාන්විතයේ දී මිය ගිය හෝ සොයා ගත නොහැකි ව සිටින සන්නද්ධ හමුදාවල සහ පොලිස් හමුදාවේ සාමාජිකයන්ගෙන් යැපෙන්නන්ට නිවාස සැපයීම සහ එහි ලා සහාය වීම
- ක්‍රියාන්විතයේ දී ආබාධිත බවට පත් ව සිටින සන්නද්ධ හමුදාවල පොලිස් හමුදාවේ සාමාජිකයන්ට සහ ක්‍රියාන්විතයේ දී මියගිය හෝ සොයා ගත නොහැකි ව සිටින සන්නද්ධ හමුදාවල සහ පොලිස් හමුදාවේ සාමාජිකයන්ගෙන් යැපෙන්නන්ට වෛද්‍ය පහසුකම් සැපයීම සහ එහි ලා සහායවීම
- ක්‍රියාන්විතයේ දී ආබාධිත බවට පත් ව සිටින සන්නද්ධ හමුදාවල සහ පොලිස් හමුදාවේ සාමාජිකයන්ට සහ ක්‍රියාන්විතයේ දී මියගිය හෝ සොයා ගත නොහැකි ව සිටින සන්නද්ධ හමුදාවල සහ පොලිස් හමුදාවේ සාමාජිකයන්ගෙන් යැපෙන්නන්ට ශිෂ්‍යත්ව සහ වෙනත් ආකාරයේ උපකාර ලබා දීමෙන් අධ්‍යාපනය සඳහා ප්‍රවේශය සලසා දීම
- ක්‍රියාන්විතයේ දී ආබාධිත බවට පත් ව සිටින සන්නද්ධ හමුදාවල සහ ක්‍රියාන්විතයේ දී මියගිය හෝ සොයා ගත නොහැකි ව සිටින සන්නද්ධ හමුදාවල සහ පොලිස් හමුදාවේ සාමාජිකයන්ගෙන් යැපෙන්නන්ට සඵලදායී සේවා නියුක්තියක් සුරක්ෂිත කිරීමෙහි ලා සහායවීම
- ක්‍රියාන්විතයේ දී ආබාධිත බවට පත් ව සිටින සන්නද්ධ හමුදාවල සහ පොලිස් හමුදාවේ සාමාජිකයන්ට සේවා නියුක්තිය සැලසීමේ අරමුණු ඇති ව කාර්මික, කෘෂි කාර්මික හෝ වානිජ ව්‍යවසායයන් පිහිටුවීම සහ අධිකාරියේ කාර්යභාරයන් සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය හෝ හිතකර සියලු ක්‍රියා හා කටයුතු ක්‍රියාත්මක කිරීම.

## 21.2 2016 වසරේ කාර්යසාධනය

| විස්තරය | 2016 වර්ෂය සඳහා ඇස්තමේන්තුව (රු.මිලි) | ප්‍රගතිය 2016-12-31 දක්වා (රු.මිලි) | % |
|---|---|---|---|
| ප්‍රාග්ධන වියදම (2016-01-01 සිට 2016-12-31 දක්වා) | 490.79 | 475.39 | 96.86% |
| පුනරාවර්තන වියදම (2016-01-01 සිට 2016-12-31 දක්වා) | 73.31 | 67.83 | 92.52% |

21.1 වගුව : මූල්‍ය ප්‍රගතිය

## 21.2.1 ක්‍රියාන්විතයේදී ආබාධිත බවට පත්ව සිටින සාමාජිකයන් පුනරුත්ථාපනය කිරීම.

ආබාධිත රණවිරුවන්ගේ ආබාධිත තත්ත්වයන් හේතුවෙන් ඔවුන් මුහුණ පාන අපහසුතා මගහරවාලීම සඳහා ඔවුන්ට අවශ්‍ය ආබාධිත උපකරණ වන කෘතිම පාද, මුත්‍රා බෑග්,රෝද පුටු,අත්වාරු ආදී උපකරණ මෙරට හා විදේශ ගතව සිටින ශ්‍රී ලාංකික පරිත්‍යාග මඟින් සහ රණවිරු සේවා අධිකාරියේ ප්‍රතිපාදන මගින් ලබා දීම හා විවිධ ආබාධයන්ට ලක්වූ රණවිරුවන් එදිනෙදා මුහුණපාන සනීපාරක්ෂක ගැටලු නිරාකරණය කර ගැනීමේදී මුහුණපාන අපහසුතාවයන් මඟහරවාලීම සඳහා සනීපාරක්ෂක පහසුකම් සංවර්ධනය කර දීම මෙමගින් අපේක්ෂිතය.

| ක්‍රියාකාරකම | වාර්ෂික ඉලක්කය | 2016 වර්ෂය සඳහා වෙන් කිරීම | 2016-12-31 දක්වා ළඟා කර ගැනීම | 2016-12-31 දක්වා වියදම |
|---|---|---|---|---|
| ආබාධිත උපකරණ කෘතිම පාද, මුත්‍රා බෑග් | 352 | 9.15 | 474 | 9.15 |
| සනීපාරක්ෂක පහසුකම්-නව | 63 | 5.72 | 78 | 5.71 |
| සනීපාරක්ෂක පහසුකම්-පැරණි | 97 | | 97 | |

21.2 වගුව :සනීපාරක්ෂක ද්‍රව්‍ය බෙදාදීම සඳහා ප්‍රතිපාදන වෙන් කිරීම




## 21.2.2 නිවාස සැපයීම සහ එහි ලා සහාය වීම

ක්‍රියාන්විතයේදී ආබාධිත රණවිරුවන් සඳහා සහ මියගිය හෝ සොයාගත නොහැකි රණවිරුවන්ගේ යැපෙන්නන්ට නිවාස සැපයීම හා එහිලා සහාය වීම සඳහා ඉඩම් නොමැති රණවිරු පවුල් වෙත රජයේ ඉඩම් ලබා දීම, මූල්‍ය ආධාර , සහන ණය හා තාක්ෂණික ඥාණය ලබා දීම,නිවාස ඉදිකර ගැනීම සඳහා සහාය වීම රණවිරු සේවා අධිකාරිය මගින් සිදු කරන අතර හදිසි ආපදාවකදී ඔවුන්ගේ නිවාස හා දේපළ වලට සිදු වන හානි රැසක් කරගැනීම සඳහා සහාය වීම මේ යටතේ සිදු කරනු ලැබේ.

| ක්‍රියාකාරකම | වාර්ෂික ඉලක්කය | 2016 වර්ෂය සඳහා වෙන්කිරීම (රු.මි) | 2016-12-31 දක්වා ළඟා කර ගැනීම | 2016-12-31 දක්වා වැයවූ මුදල (රු.මි) |
|---|---|---|---|---|
| ණය මත නව නිවාස ඉදිකිරීම | 133 | 54.10 | 183 | 52.02 |
| හදිසි ආපදා ආධාර | 171 | 5.35 | 194 | 5.30 |
| ආධාර මත නව නිවාස ඉදිකිරීම | 25 | 5.00 | 23 | 4.58 |
| ආධාර මත නිවාස ඉදිකිරීම-පැරණි | 76 | | 76 | |
| ඉඩම් ලබා දීම හා යටිතල පහසුකම් සංවර්ධනය කර දීම | 400 | 0.28 | 319 | 0.009 |
| ඉඩම් හඳුනාගැනීම හා ඉඩම් පවරා ගැනීම | 6 | 0.5 | 8 | 0.18 |

21.3 වගුව : නිවාස ඉදිකාරීම් සඳහා ප්‍රතිපාදන වෙන් කිරීම

## 21.2.3 වෛද්‍ය පහසුකම් සැපයීම සහ එහිලා සහාය වීම

ආබාධිත රණවිරුවන්, ඔවුන්ගේ පවුල් වල ළඟම ඥාතීන් හා දිවි පිදූ, අතුරුදහන් රණවිරුවන්ගේ ළඟම ඥාතීන් කායික හා මානසික වශයෙන් සවිබල ගැන්වීම සඳහා වෛද්‍ය සායන පැවැත්වීම, හදිසි සැත්කම් සඳහා ණය මුදලක් ලබා දීම, ආධාර මුදල් ලබා දීම හා මානසික වශයෙන් ශක්තිමත් කිරීම සඳහා විවිධ වැඩමුළු, වැඩසටහන් පැවැත්වීම මෙමගින් සිදු කරනු ලැබේ.




| ක්‍රියාකාරකම | වාර්ෂික ඉලක්කය | වර්ෂය සඳහා වෙන් කිරීම් (රු.මි ලි) | 2016-12-31 දක්වා ළඟා කර ගැනීම් | 2016-12-31 දක්වා වියදම (රු.මිලි) |
|---|---|---|---|---|
| සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩමුළු | 7 | 0.91 | 11 | 0.90 |
| වෛද්‍ය ණය | 20 | 0.50 | 2 | 0.20 |
| වෛද්‍ය ආධාර-නව | 80 | 3.28 | 70 | 3.09 |
| වෛද්‍ය ආධාර-පැරණි | 480 | | 446 | |
| මනෝ විද්‍යාත්මකව බලගැන්වීමේ පුහුණු වැඩමුළු | 3 | 0.12 | 2 | 0.11 |
| ප්‍රථමාධාර පුහුණු වැඩමුළු | 2 | 0.60 | 4 | 0.44 |
| යාකබැද්ද රණවිරු වැඩිහිටි නිවාසය හා සම්පත් මධ්‍යස්ථානය ස්ථාපනය | 1 | 3.75 | ප්‍රථම අදියරින් 85% ක් දක්වා සම්පූර්ණ කර ඇත. | 3.57 |

21.4 වගුව : වෛද්‍ය පහසුකම් ලබා දීම

### 21.2.4 ශිෂ්‍යත්ව සහ වෙනත් ආකාරයේ උපකාර ලබා දීමෙන් ඔවුන්ට අධ්‍යාපනයට හා උසස් අධ්‍යාපනයට ප්‍රවේශය ලබා ගැනීමට අවස්ථාව සලසා දීම.

6 වසරේ සිට අ.පො.ස සා/පෙළ දක්වා අධ්‍යාපනය ලබන දරුවන්ට ,විශ්වවිද්‍යාල, විද්‍යාපීඨ හා වෙනත් උසස් අධ්‍යාපන ආයතන වෙත තේරී පත් වන රණවිරු දරුවන්ට ශිෂ්‍යත්ව ක්‍රියාත්මක කිරීම, 5 වසර ශිෂ්‍යත්ව විභාගය සමත් වන දරුවන් ඇගයීම හා පුද්ගලික ආර්ථික අපහසුතා ඇති දරු දැරියන් හට අධ්‍යාපන ශිෂ්‍යත්ව ආධාර මාසිකව ලබා දීම මෙමගින් සිදු කරනු ලැබේ.

| ක්‍රියාකාරකම | වාර්ෂික ඉලක්කය | 2016 වර්ෂය සඳහා වෙන්කිරීම (රු.මි) | 2016-12-31 දක්වා ළඟා කර ගැනීම | 2016-12-31 දක්වා වියදමුදල |
|---|---|---|---|---|
| රණවිරු දූදරු ඉතුරුම් ආයෝජන නව ශිෂ්‍යත්ව | 700 | 22.42 | 821 | 22.25 |
| -පැරණි ගෙවීම් | 1338 | | 560 | |
| අපොස සා/පෙළ /උපෙළ නව ශිෂ්‍යත්ව | 350 | | 253 | |
| -පැරණි ගෙවීම් | 638 | | 389 | |
| විශ්වවිද්‍යාල අධ්‍යාපනය ලබන දරුවන් සඳහා නව ශිෂ්‍යාධාර | 50 | | 58 | |
| -පැරණි ගෙවීම් | 158 | | 139 | |
| මා පිය කැපකරු ශිෂ්‍යත්ව නව ආධාර | 700 | | 700 | |
| -පැරණි ගෙවීම් | 144 | | 189 | |
| විශේෂ අධ්‍යාපන කුසලතා සඳහා මූල්‍ය ආධාර ලබා දීම. | 30 | 1.90 | 41 | 1.88 |

21.5 වගුව : ශිෂ්‍යත්ව ලබා දීම





### 21.2.5 ඵලදායී සේවානියුක්තියක් සුරක්ෂිත කිරීමෙහි ලා සහාය වීම.

රණවිරුවන්ගේ ආර්ථික අපහසුතා මඟහරවා ගැනීම සඳහා මාසිකව මුදලක් ලබා දීම හා විශේෂ ආර්ථික අපහසුතා ඇති රණවිරු මව්පියවරුන් සඳහා විශේෂ මූල්‍ය ආධාර මාසිකව සිදු කිරීම, ශ්‍රම බලකාය තුල සිටින රණවිරු ඥාතීන් ඵලදායී ලෙස කාර්යයක නියුක්ත කිරීම සඳහා ක්‍රීඩා,කලා හා විවිධ කුසලතා සංවර්ධනය හා ස්වයං රැකියා සඳහා යොමු කිරීම මෙමගින් සිදු කරනු ලැබේ.

| ක්‍රියාකාරකම | වාර්ෂික ඉලක්කය | 2016 වර්ෂය සඳහා වෙන්කිරීම් (රු.මිලි) | 2016-12-31 දක්වා ළඟා කර ගැනීම | 2016-12-31 දක්වා වැයවූ මුදල (රු.මිලි) |
|---|---|---|---|---|
| රණවිරු මාපිය සුරැකුම- පැරණි | 1416 | 32.06 | 1420 | 31.56 |
| රණවිරු මාපිය සුරැකුම - නව | 84 | | 36 | |
| රණවිරු මාපිය රැකවරණ ප්‍රතිලාභ | 35,000 | 283.5 | 34,717 | 291.91 |
| ස්වයං රැකියා ආධාර | 15 | 3.00 | 16 | 2.64 |
| කාන්තා පවුර වැඩසටහන් | 282 | 3.83 | 279 | 1.34 |
| රණවිරු තරුණ කඳවුරු | 4 | 1.44 | 1 | 1.44 |
| සංසද ආශ්‍රිත ක්‍රීඩා සමාජ ගොඩනැංවීම | 20 | | 10 | |
| විරු ප්‍රතිභා කලා උත්සව සංවිධානය | 1 | 1.16 | 1 | 1.05 |

21.6වගුව: විශේෂ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම






### 21.2.6 සේවා නියුක්තිය සැලසීමේ අරමුණ ඇතිව කාර්මික, කෘෂිකාර්මික හෝ වාණිජ ව්‍යවසායන් පිහිටුවීම. අධිකාරියේ කර්තව්‍යන් සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය හෝ හිතකර සියලු දෑ කිරීම.

ඒ අනුව රණවිරු ප්‍රජාව ස්වාධීනව නැඟී සිටීම සඳහා අවශ්‍ය දැනුම, අවබෝධය හා ශක්තිය ලබාදෙමින් ආත්ම විශ්වාසය ගොඩනැගීම සඳහා කාලීනව අවශ්‍ය උඩතයන් ඔස්සේ පුහුණු වැඩමුළු සංවිධානය කිරීම, විරෝධාර රණවිරුවන්ගේ නාමය සමාජය තුළ අභිමානවත්ව පවත්වාගෙන යාම හා ගෞරවනීය බවට පත්කිරීම සඳහා වාර්ෂිකව ජාතික හා පළාත් රණවිරු සැමරුම සංවිධානය කොට පැවැත්වීම මෙමගින් අපේක්ෂිතය.

| ක්‍රියාකාරකම | වාර්ෂික ඉලක්කය | 2016 වර්ෂය සඳහා වෙන්කිරීම් (රු.මිලි) | 2016-12-31 දක්වා ළඟා කර ගැනීම | 2016-12-31 දක්වා වැයවූ මුදල (රු.මිලි) |
|---|---|---|---|---|
| නිළධාරී පුහුණු වැඩමුළු පැවැත්වීම | 8 | 2.40 | 19 | 0.28 |
| සංසද පොකුරු සම්බන්ධතා ගොඩනැංවීම | 30 | 1.00 | 33 | 0.96 |
| රණවිරු අනුස්මරණය | 8 | 7.28 | 8 | 7.24 |
| මයිලපිටිය අනුස්මරණ උද්‍යාන සංවර්ධනය | 3 | 1.95 | 3 | 1.88 |
| කාර්යාලය සඳහා ස්ථාවර වත්කම් සැපයීම | 9 | 1.3 | මිලදී ගැනීම සම්පූර්ණයි. | 1.30 |

21.7 වගුව : පුහුණු වාඩමළු සංවිධානය








21.1 ප්‍රස්ථාරය :අධිකාරියේ ව්‍යාපෘති වල ප්‍රගතිය

## 21.3 අනාගත අපේක්ෂා

රණවිරු සේවා අධිකාරිය විසින් රණවිරු ප්‍රජාව වෙනුවෙන් දියත් කර ඇති සුභසාධන සේවාවන් කාලීන අවශ්‍යතාවකට පරිවර්තනය කිරීම නව පාලනය විසින් 2015/2016 වර්ෂයන්හි දී සිදු කරන ලදී. ඒ අනුව සකස් කරන ලද ව්‍යවස්ථාව හා වැඩසටහන් දියත් කිරීමට 2017 වර්ෂයේදී අපේක්ෂා කරන අතර ඒ යටතේ පහත සඳහන් ඉලක්කයන් කරා රණවිරු සේවා අධිකාරිය ක්‍රියාත්මක වීමට අපේක්ෂිතය.

- රාජ්‍ය හා පෞද්ගලික ආයතන සහ ත්‍රිවිධ හමුදා, පොලිස්, හා සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව සහයෝගයෙන් රණවිරු නිවාස අවශ්‍යතාවය අවසන් කරලීම සඳහා නව ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක ‘විරුසුමිතුරු’ නිවාස ව්‍යාපෘතිය මඟින් නිවාස 3,650 ක් වර්ෂ 5 ක් තුළ දී ඉදිකර අවසන් කිරීම.
- විරුසර වරප්‍රසාද කාඩ්පත මඟින් තවදුරටත් රණවිරුවා වෙත වරප්‍රසාද රැසක් සඳහා අවස්ථාව සලසාදීම.
- 1999 අංක 54 දරණ රණවිරු සේවා අධිකාරි පනත සංශෝධනය මඟින් ඉලක්කගත කණ්ඩායම හා ප්‍රතිලාභ තවදුරටත් පුළුල් කිරීමට කටයුතු කිරීම.
- රණවිරුවාගේ හා රණවිරු පවුලේ ජීවන ශෛලයයට සරිලන රෝද 4ක වාහනයක් ඉදිරියේ දී ලබා දීම සඳහා කටයුතු සළසාදීම.
- යාකාබැද්ද වැඩිහිටි නිවාසය හා සම්පත් මධ්‍යස්ථානයේ ප්‍රථම අදියරේ ඉදි කිරීම් සම්පූර්ණ කිරීම හා දෙවන අදියරේ වැඩකටයුතු ආරම්භ කිරීම.
- රණවිරු ප්‍රජාව මූල්‍ය කළමනාකරණය ඇතිකර ලැබෙන මුදල සකසුරුවම් ආකාරයට වියපැහැදම් කිරීමට හුරුකරවීම.
- රණවිරු පවුල, යැපෙන්නන් තත්ත්වයෙන් මුදවීම සඳහා රණවිරු කාන්තාව ආර්ථික,සමාජයීය හා සංස්කෘතික ලෙස සවිබල ගැන්වීම වෙනුවෙන් ක්‍රියාත්මක වීම.
- රණවිරු ප්‍රජාව ව්‍යවසායකත්වය සඳහා යොමු කරවීමෙන් ජාතික ආර්ථිකයට දායක කර ගැනීම.

# 22.ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලය

## 22.1 සමාලෝචනය

ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලය (ආසේඅමාවි) ත්‍රිවිධ හමුදාවේ මධ්‍යම පන්තියේ නිලධාරීන් හට අධ්‍යාපනය සලසන ආයතනයකි. ආසේමාවි එම නිලධාරීන් හට ඒකාබද්ධ හමුදා ක්‍රියාන්විතය පිළිබඳව මුල් අධ්‍යයන කටයුතු සඳහා ඉඩ සලසා දෙනු ලැබේ. 2016 වර්ෂය අධ්‍යයන හා පරිපාලන යන දෙඅංශයෙන්ම සාර්ථක වසරකි. ආසේඅමාවි දකුණු ආසියාවේ ප්‍රමුඛතම හමුදා අධ්‍යයන ආයතනයක් වශයෙන් ලබා ඇති කීර්තිය තහවුරු වන අන්දමින් 2016 වර්ෂය තුළ ක්‍රියාත්මක වී ඇත.

ආසේඅමාවි පාලක මණ්ඩලයක් මගින් පාලනය කරනු ලැබ. එහි කාර්ය මණ්ඩලයේ ත්‍රිවිධ හමුදා අයවලුන් මෙන්ම ආරක්ෂක අමාත්‍යාංශය යටතේ බඳවා ගෙන ඇති සිවිල් අයවලුන් ද සේවය කරයි. ආසේඅමාවි හි ප්‍රධාන විධායක නිලධාරී සේනාවිධායක වේ.

2016 වර්ෂය තුළදී ආසේඅමාවි විසින් පාඨමාලා අංක 10 පවත්වනු ලැබු අතර එම පාඨමාලාව 2016 ජනවාරි 03 දින ආරම්භ වී 2016 දෙසැම්බර් 12 වන දින නිමා විය.

2016 වර්ෂය තුළ බොහෝ සංකල්පනාත්මක නිර්මාණයක් හඳුන්වා දෙන ලදි. විද්‍යාලයීය හර පද්ධතිය නිසි පරිදි ක්‍රියාවට නැඟීමට හැකි වූ අතර එම හර පද්ධතියට අනුගතවීම තුළින් කෙනෙකුගේ පුද්ගල සංවර්ධනයට මහ පාදනු ලැබේ. එමගින් ඔහුගේ ආයතනයේ ප්‍රවර්ධනයට දායකත්වය ලබා ගැනීම අපේක්ෂිතය. එම හර පද්ධතිය :ඉගෙනුම, අභිමානය, ගරුත්වය,සදාචාරය,උත්කෘෂ්ඨත්වය,නව යෙදීම,වගකීම,වෘත්තියත්වය,සාධනීය විධානය,මනරම් වටපිටාව,මහ පෙන්වීමේ ධර්මතාවය ,අවස්ථානෝචිත නුවණ වේ.

## 22.2 2016 වර්ෂයේ කාර්යසාධනය

2016 වර්ෂය තුළ පහත සඳහන් ව්‍යාපෘතීන් වෙනුවෙන් මහා භාණ්ඩාගාරය වෙතින් ප්‍රතිපාදන වෙන් කරන ලදි.

- දෙමහල් පහසුකම් මධ්‍යස්ථානය
- අධිතාක්ෂණික යුධ පුහුණු මධ්‍යස්ථානය
- තොරතුරු තාක්ෂණ ව්‍යාපෘතීන්

ඉහත ව්‍යාපෘතීන් සියල්ලම අවසන් කර ඇති අතර දෙමහල් පහසුකම් මධ්‍යස්ථානයක් වෙනුවෙන් රුපියල් මිලියන 17 ක් ද අධිතාක්ෂණික පුහුණු මධ්‍යස්ථානය සඳහා රුපියල් මිලියන 30.8 ක් ද අනෙකුත් තොරතුරු තාක්ෂණ ව්‍යාපෘතීන් වෙනුවෙන් රුපියල් මිලියන 13 ක මුදලක් ද වැය දරා ඇත.

ඉලක්කගත ප්‍රතිඵල සඳහා අධ්‍යයන වැඩසටහන් නිසි ලෙස ක්‍රියාත්මක වී ඇත. අධ්‍යන කාලසටහනේ වෙනසක් සිදු වී නොමැති අතර ඉගැන්වීමේ ක්‍රමවේදයන් වඩාත් දියුණු කරන ලදි.

ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලය වෙත 2016 වසර සඳහා මහා භාණ්ඩාගාරය වෙතින් පුනරාවර්ථන වියදම් වෙනුවෙන් රු.මි. 128.5 ක් හා ප්‍රාග්ධන වියදම් සඳහා රු. මි. 115.4 ක් ලබා දී ඇත.

පුනරාවර්ථන වියදම් සඳහා ලබා දුන් ප්‍රතිපාදන ප්‍රමාණය පසුගිය වසර හා සාපේක්ෂව බලන විට රු.මි. 3.0 ක පමණ අඩුවීමක් සිදුවී ඇත. මෙම වසර තුළ විද්‍යාලයේ පුරප්පාඩුව පැවති සිවිල් සේවක තනතුරු සඳහා නව සේවකයින් බඳවා ගැනීමට කටයුතු කිරීම සඳහා වැටුප් සඳහා වන වියදම් පසුගිය වසරට සාපේක්ෂව ඉහළ යාමක් සිදුවන තත්ත්වයන් තුළ පුනරාවර්ථන වියදම් කළමනාකරණය කර ගැනීම සඳහා විශාල පරිශ්‍රමයක් දැරීමට සිදුවිය. ඒ අනුව විද්‍යාලය විසින් ක්‍රියාත්මක කරන ලද විදුලිය හා ජලය පිරිමැසීමේ ක්‍රියාදාමය වඩාත් ඵලදායක වූ අතර, ඒ මගින් පුනරාවර්ථන වියදම් ප්‍රමාණය නියමිත රාමුව තුළ කළමනාකරණය කර ගැනීමට හැකි විය.

ප්‍රාග්ධන වියදම් සඳහා ලබා දුන් රු.මි. 115.4 ක මුදල 2016 වසරේ අගෝස්තු මාසය වනවිට වියදම් කර අවසන් කිරීමට සැලසුම් සකස් කර තිබූ අතර, එම ප්‍රාග්ධන ප්‍රතිපාදන තුළින් සිදු කිරීමට නියමිතව තිබූ සියලුම ව්‍යාපෘතීන් ප්‍රාග්ධන මිලදී ගැනීම හා ස්ථාවර වත්කම පුනරුත්ථාපනය කිරීමේ කටයුතු සැලසුම් ගත ආකාරයටම නිම කිරීමට මෙම වසර තුළ හැකිවීම විශේෂ කරුණක් වශයෙන් දැක්විය හැකිය.

ප්‍රාග්ධන වියදම් තුළින් සැලසුම් කර තිබූ පහසුකම් මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා රු.මි. 17.0 ක් වැය වූ අතර, ඒ තුළින් විද්‍යාලයේ ඉගෙනුම ලබන දේශීය හා විදේශීය ශිෂ්‍ය නිලධාරීන්ට හා ඔවුන්ගේ පවුල් වල සාමජිකයින් සඳහා සාධනීය මට්ටමේ සේවාවන් සැපයීමට හැකිවිය. එමගින් විශේෂයෙන්ම විදේශීය ශිෂ්‍ය නිලධාරීන්ගේ අවශ්‍යතාවයන් සපුරාලීම තුළින් මෙම විද්‍යාලය පිළිබඳ යහපත් ආකල්ප විදේශයන්හි ප්‍රචලිත කිරීමට හැකිවීමේ ප්‍රතිපලයක් වශයෙන් විදේශීය ශිෂ්‍ය නිලධාරීන් වැඩිපුර ගෙන්වා ගැනීමට රුකුලක් වනු ඇත.

එමෙන්ම රු.මි. 43.4 ක වියදමක් දරා සිදුකරන ලද තොරතුරු තාක්ෂණ ව්‍යාපෘතීන් අතුරින්, පරිගණක ගත යුධ අභ්‍යාස මෙහෙයුම් මධ්‍යස්ථානය සුවිශේෂ වේ. නවීන ලෝකය තුළ ශ්‍රී ලංකා ආරක්ෂක හමුදාවන්ට හිමි සාධනීය මට්ටම තව දුරටත් ඉහළ නංවා ගැනීමට හැකිවන අයුරින් නවීන යුධ තාක්ෂණික ක්‍රම පරිගණක ආශිතව සාම්ප්‍රදායික ක්‍රමයන් හා සම්මිශ්‍රණය කිරීම

තුළින් නව පුහුණු ක්‍රමෝපායන් පිළිබඳව ශිෂ්‍ය නිලධාරීන් සන්නද්ධ කිරීමට හැකි විය. ඒ තුළින් වෘත්තිය හමුදාවක් තුළ පරිපූර්ණ සෙබලුන් බිහි කිරීම විද්‍යාලයේ අපේක්ෂාව වන අතර ඒ සඳහා මෙම ව්‍යාපෘතිය නියමු ව්‍යාපෘතියක් වශයෙන් ක්‍රියාත්මක කළ හැකිය.තවද ශිෂ්‍ය නිලධාරීන් සඳහා අවශ්‍ය පුස්තකාල පහසුකම් වැඩි දියුණු කරමින් විද්‍යුත් පුස්ථකාල පහසුකම් ඇති කිරීම සඳහා මූලික අඩිතාලමක් ඇති කිරීමටද මේ යටතේ හැකි විය.ලොකයේ නවීන කාර්යාල ක්‍රම භාවිතය තුළ කඩදාසි අවම කිරීමේ සංකල්ප මත පදනම්ව විද්‍යුත් තැපැල සහ පරිගණක ගත කාර්යාල පරිසරයක් තුළ සිය රාජකාරීන් ඉටු කිරීමට කාර්ය මණ්ඩලය යොමු කිරීමට ද විද්‍යාලයට හැකි විය.

ඉහත ව්‍යාපෘති වලට අමතරව රු.මි. 38.5 ක වියදමක් දරමින් මෙම විද්‍යාලයේ ගොඩනැගිලි නවීකරණය කිරීමට කටයුතු කළ අතර ඒ මගින් ගොඩනැගිලි 17 ක් නැවත දීර්ඝ කාලයක් භාවිතයට ගත හැකි මට්ටමට පත් කිරීමට හැකිවී ඇත. මෙම ගොඩනැගිලි සියල්ලම අවුරුදු 50 කට වඩා පැරණි ඒවා වූ අතර දීර්ඝ කාලයක් විවිධ ආයතන විසින් භාවිතා කිරීම මෙන්ම නිසි පරිදි නඩත්තු කටයුතු සිදු නොකිරීම නිසා දැඩි ලෙස අබලන් තත්ත්වයට පත්ව තිබූ ඒවා විය. මහා භාණ්ඩාගරයෙන් ඒ සඳහා ලබා දුන් මුදල් මගින් ගොඩනැගිලි නවීකරණය සිදුකිරීම කළ අතර මේ වන විට එම ගොඩනැගිලි සියලු පහසුකම් සහිත කාර්යාල වශයෙන් හා නේවාසිකාගාර වශයෙන් භාවිතා කරනු ලැබේ. මේවා තවත් දීර්ඝ කාලයක් සඳහා භාවිතා කිරීමට හැකිවීම තුළින් නව ගොඩනැගිලි ඉදිකිරීම සඳහා යන විශාල මුදල් ප්‍රමාණයක් ඉතිරි කැ ගැනීමට හැකි වී ඇත. එමෙන්ම රු.මි. 31.9 ක වියදමකින් ප්‍රාග්ධන භාණ්ඩ මිලදී ගැනීමට කටයුතු කරන ලදි. මෙම මිලදී ගැනීම් ක්ෂය ප්‍රතිසම්පාදන සඳහා මෙන්ම විද්‍යාලයීය අවශ්‍යතාවයන් වෙනුවෙන් ද යොදවා ගැනීම සඳහා ද වේ.

සැලසුම් ගත ආකාරයෙන්ම ප්‍රාග්ධන ව්‍යාපෘතීන් අගෝස්තු මාසය තුළ නිම කිරීමට හැකි වීම නිසා 2017 වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබූ ව්‍යාපෘතීන් ද 2016 වසරේ ඉතිරි මාස කිහිපය තුළ ක්‍රියාත්මක කිරීමට හැකියාවක් පැවති බැවින් ඒ සඳහා අමතර ප්‍රතිපාදන ආරක්ෂක අමාත්‍යාංශය වැය විෂයන් තුළින් ලබා ගෙන ක්‍රියාත්මක කිරීමට හැකිවීම සතුටට කරුණකි. ඒ සඳහා අමතර ප්‍රතිපාදන වශයෙන් වැය ශිර්ෂ අතර ප්‍රතිපාදන මාරු කිරීම මගින් රු.මි. 10 ක් ලබා දීමට ආරක්ෂක අමාත්‍යාංශය කටයුතු කර තිබිණි. එම ප්‍රතිපාදන තුළින් ද ඉතිරිව පවත්නා අබලන් ගොඩනැගිලි නවීකරණය කිරීමේ කටයුතු සිදු කිරීම අපේක්ෂා කර ඇත.

| අනු අංකය | වැය ශීර්ෂය | අනු වැය ශීර්ෂය | මුදල රු. මි. | මුලු මුදල රු. මි |
|---|---|---|---|---|
| 1. | ප්‍රාග්ධන | ස්ථාවරවත්කම් පුනුරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම. | 38.5 | |
| | | ස්ථාවර වත්කම් අත්කර ගැනීම. | 31.9 | |
| | | අනෙකුත් ප්‍රාග්ධන වියදම් | 60.4 | 130.8 |
| 2. | පුනරාවර්ථන | වැටුප් වේතන හා දීමනා | 44.8 | |
| | | සැපයුම් | 30.7 | |
| | | නඩත්තු | 8.9 | |
| | | ගිවිසුම්ගත සේවා | 46.6 | 131.0 |
| 3. | එකතුව | | | **261.8** |

22.1 වගුව: මූල්‍ය ප්‍රගතිය

**අධ්‍යාපන:** 2016 වර්ෂයේ පවත්වන ලද අංක 10 පාඨමාලාවේ ශිෂ්‍ය නිලධාරීන් 126 ක් විය. එනම් යුධ හමුදාවේ 63 ක් නාවික හමුදාවේ 27 ක් ද ගුවන් හමුදාවේ 24 ක් ද එක් පරිපාලන නිලධාරියකු සහ රටවල 12 ක් නියෝජනය වන නිලධාරීන් ප්‍රමාණයක් පාඨමාලාව සමත් වූ අතර 62% ප්‍රමාණයක් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය මගින් පිරිනමන ශාස්ත්‍රපති උපාධි ප්‍රධානෝත්සවය 2016 දෙසැම්බර් 12 වන දින පැවැත්වේ.

**යටිතල පහසුකම්** : විද්‍යාලය තුළ යටිතල පහසුකම් විෂයගත කාල පරාසය තුළ ගොඩනැගිලි උචිත මට්ටමක නඩත්තු කිරීම සඳහා රුපියල් මිලියන 38.5 ක ප්‍රමාණයක් වැය කර ඇත. තවද රුපියල් මිලියන 17 ක වියදමක් දරා දෙමහල් පහසුකම් මධ්‍යස්ථානයක් ඉදි කිරීමට හැකි විය.

**කාර්ය මණ්ඩලය කුසලතා වර්ධනය** : "ඉගෙනගැනීම" නැමැති සංකල්පය යටතේ වන ආයතනයක් වශයෙන් මෙම විද්‍යාලයේ කාර්ය කුසලතා සංවර්ධනය සඳහා කාර්ය මණ්ඩලයේ (අධ්‍යයන/ පරිපාලන) සාමාජිකයෙක්ම අධ්‍යයන හා පුහුණු වැඩසටහනකට ඇතුළත් කරන ලදි. විද්‍යාලය වෙතින් වාර්ෂිකව පවත්වනු ලබන විදේශීය අධ්‍යයන සංචාරයට සියලුම අධ්‍යයන කාර්යමණ්ඩලයේ සාමාජිකයින් එක්කරන ලදි. 2016 වර්ෂයේ දි රටවල් 8 ක් මෙම සංචාරයට ඇතුළත් විය. අධ්‍යයන කාර්යමණ්ඩලයට වඩාත් පුලුල් දැනුමක් ලබා දීම සඳහා අන්‍යොන්‍ය හුවමාරු වැඩමුලු

වැඩසටහනක් යටතේ බංගලාදේශය ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩල විද්‍යාලයේ අධ්‍යයන කාර්යමණ්ඩල සාමාජිකයින් මෙම විද්‍යාලයට පැමිණ වැඩමුලුවක් පවත්වන ලදි.මෙම විද්‍යාලයේ අධ්‍යයන කාර්යමණ්ඩල නියෝජිතයන් ද බංගලාදේශ මාණ්ඩලික විද්‍යාලයේ දී එවැනිම වැඩමුලුවක් පවත්වන ලදි. පකිස්ථාන මාණ්ඩලික විද්‍යාලයේ හා මැලේසියානු මාණ්ඩලික විද්‍යාලයෙන් එවායේ අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජික දෙදෙනා බැගින් මෙම විද්‍යාලයේ අධ්‍යන කටයුතු සඳහා සහභාගී කරවා ඇත.ඉන්දියානු ආරක්ෂක හමුදාව වෙතින් පැමිණි උපදේශකයන් විසින් හමුදා තාක්ෂණික වැඩමුළුවක් පවත්වා ඇත.අධ්‍යයන කාර්යමණ්ඩල සඳහා වැඩමුලු හා දේශන ඇතුළත් වූ අභ්‍යන්තර පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත.සමහරක් පුහුණු සැසි හා වැඩමුළු සඳහා පිටතින් දේශකයින් ගෙන්වනු ලැබූ අතර සමහර අවස්ථා වලදී පිටත ආයතන වෙත අධ්‍යයන චාරිකා පවත්වා ඇත.

## 22.3 ගැටළු සහ අභියෝග

නිසිලෙස සැලසුම් කරන ලද පාරදෘශ්‍ය මිලදී ගැනීමේ සැලැස්මක් මගින් සාර්ථක මූල්‍ය පාලනයක් ඇති කිරීමට විද්‍යාලය සමත්ව ඇත. සියලු ව්‍යාපෘති සඳහා අනුමත මුදල, වැයවන මුදල හා ඉතිරි මුදල වැනි කරුණු පිලිබඳ අවධානයෙන් යුතුව ප්‍රතිපාදන හැසිරවීමට නිලධාරීන් දිරිගන්වන ලදි. එමගින් මූල්‍ය නම්‍යශීලිත්වයට මඟ පැදීමෙන් කාර්යක්ෂමතාව හා ප්‍රතිලාභය ඉහල ගොස් ඇත.

සමස්තයක් වශයෙන් 2016 වසර තුළ මූල්‍යමය කටයුතු සිදු කිරීමේදී සැළකිය යුතු ගැටලු සහගත තත්ත්වයක් පැන නොගැනු අතර 2016 වර්ෂයට අදාලව මහා භාණ්ඩාගාරයෙන් ද්‍රවශීල මුදල් ලබාදීමේදී රුපියල් මිලියන 5.9 ක් අඩුවෙන් ලබා දීම නිසා මෙම වසර තුළ එම ප්‍රමාණයක් බිල්පත් නිරවුල් කිරීමට නොහැකිවීම හේතුවෙන් 2017 වර්ෂය සඳහා ගෙන යාමට සිදුවිය.

## 22.4 අනාගත අපේක්ෂා

සංවිධානාත්මක බව : ශිෂ්‍ය නිලධාරීන්ගේ පර්යේෂණ පත්‍රිකාවක් සඳහා අවශ්‍ය වන පහසුකම් විධිමත් ලෙස සැලසීමට විද්‍යාලයට අවශ්‍ය වී ඇත. පර්යේෂණ හා සංවර්ධන කටයුතු සඳහා වෙන් වූ අධ්‍යයන අංශයක් සම්බන්ධීකරණ අංශය යටතේ පිහිටුවීම විද්‍යාලයේ අභිලාෂය වී ඇත. ඒ සඳහා වන පුරප්පාඩු පිරවීම සඳහා විශේෂයෙන් ත්‍රිවිධ හමුදාවන් වෙතින් පැමිණෙන කාර්ය මණ්ඩලයක් මේ සඳහා අවශ්‍ය වේ. එමෙන්ම පුහුණු ආධාරක කටයුතු සඳහාම යෙදවිය හැකි භට කණ්ඩායමක්ද විද්‍යාලයේ අවශ්‍යතාවයකි. මෙම අවශ්‍යතාවයන් දෙකම සපුරා ගැනීමට අමතර ප්‍රතිපාදන අවශ්‍ය නොවේ.

ප්‍රාග්ධන: මධ්‍යකාලීන සැලැස්මේ ප්‍රමුඛතාවයන්ගෙන් යටිතල පහසුකම් සංවර්ධන ප්‍රධාන වේ. ආසේවමාවිහි පාඨමාලාව නේවාසික පාඨමාලාවක් වන බැවින් ශිෂ්‍ය නිලධාරීන් හට විවාහක නිවාස හා අනෙකුත් පහසුකම් පාඨමාලා කාලසීමාව සඳහා සැපයීමට හැකි විය යුතු වේ. එම වැඩ පිළිවෙල සඳහා ඉදිරි අවුරුදු තුනක කාලය සඳහා රුපියල් මිලියන 120 ක මුදලක් ලබා ගැනීමට අපේක්ෂා කෙරේ. අවුරුදු තුනක කාලයකට පසු අවම වශයෙන් සියයට 40 ක ශිෂ්‍ය නිලධාරී ප්‍රමාණයට විවාහක නිවාස සැපයීම අපේක්ෂා කෙරේ. පුස්තකාල හා විභාගශාලා ගොඩනැගිල්ලක්ද සැලසුම් වලට අයත්ව ඇත. එහි වියදම රුපියල් මිලියන 127 ක් වශයෙන් ඇස්තමේන්තු කර ඇත. තවත් මධ්‍ය කාලීන ව්‍යාපෘතියක් වන්නේ විද්‍යාලයීය ප්‍රවාහන අංශය සවිමත් කිරීමයි. එයට අයත් සමහර වාහන අබලන් වෙමින් පවතින අතර ඒවා වෙනුවට නව වාහන අවශ්‍ය වී ඇත.

# 23. ආරක්ෂක සේවා විද්‍යාලය

## 23.1 සමාලෝචනය

ත්‍රිවිධ හමුදා හා පොලිස් දෙපාර්තමේන්තු සාමාජිකයින්ගේ දරු දැරියන්හට ජනප්‍රිය පාසල් ලබාදීම පිළිබඳ පැනනැඟී ඇති අසීරුතාවයන් මඟහරවා ගැනීම හා ඔවුන් සඳහා උසස් තත්ත්වයේ අධ්‍යාපනික අවස්ථාවක් ලබා දීම අරමුණු කරගෙන 2007 ජනවාරි 17 දින මැලේ වීදිය, කොළඹ 02 හි කොළඹ ආරක්ෂක සේවා විද්‍යාලය ආරම්භ කර ඇත. මෙම විද්‍යාලයෙහි අධ්‍යාපනයට අදාළ සියලුම වගකීම් හා පාලනය අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ද, පරිපාලනය හා යටිතල පහසුකම් සංවර්ධනයේ අදාළ වගකීම් ආරක්ෂක අමාත්‍යාංශය විසින් ද දරනු ලැබේ.

තවද ආරක්ෂක සේවා පාසල් සංකල්පයට අනුව දිවයිනේ සියළුම පළාත් ආවරණය වන පරිදි ආරක්ෂක සේවා විද්‍යාල පද්ධතියක් ලෙස සංවර්ධනය කර පවත්වාගෙන යාම පිළිබඳව ලබා ඇති අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත මේ වනවිට කොළඹ ආරක්ෂක විද්‍යාලය හා කුරුණෑගල ආරක්ෂක සේවා විද්‍යාලය ආරම්භ කර පවත්වාගෙන යනු ලැබේ.

### 23.1.1 දැක්ම

- ආරක්ෂක සේවා සහ පොලිස් සාමාජිකයින් දරුවන් සඳහාම වෙන් වූ මෙම විද්‍යහල 2020 වසර වන විට ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ පාසල් අතරට එක් කිරීම සහ අනාගතයේදී එම පාසල් අතර ඉදිරියෙන් සිටීම.

### 23.1.2 මෙහෙවර

- අධ්‍යාපන අමාත්‍යාංශයීය විශේෂඥ දැනුම සහ අධ්‍යාපන ක්‍රමවේදයක් සමඟ ආරක්ෂක අමාත්‍යාංශයේ සහ ත්‍රිවිධ හමුදාව සහ පොලිස් දෙපාර්තමේන්තුවේ පරිපාලන හැකියාවන් සහ දක්ෂතාවයන් මෙන්ම ඔවුන් සතු පහසුකම් ද සංකලනය කරමින් විනයානුකූල පරිසරයක් තුළ, අනාගත තරගකාරී ලෝකයේ අභියෝගයන්ට ආත්ම විශ්වාසයකින් සහ නිර්භීතව මුහුණ දීමට හැකියාව ඇති දරු පරපුරක් බිහිකිරීමයි.

### 23.1.3 ආරක්ෂක සේවා විද්‍යාලය පිහිටුවීමේ අරමුණු

- දිවයිනේ ජනප්‍රිය පාසල්වලට වර්තමාන කාලය තුළ දරුවන් ඇතුළත් කිරීමේදී ත්‍රිවිධ හමුදාවේ සහ පොලීසියේ සාමාජිකයන් මුහුණපාන ගැටළු වලට පිළියමක් යෙදීම.
- උසස් මට්ටමේ, ගුණාත්මක අධ්‍යාපනයක් දරුවන්ට ලබාදීමට රජය ගන්නා උත්සාහයට පිළියමක් වශයෙන් විනය ගරුක පරිසරයක් තුළ සැළසුම් සහිත නව පාලන ක්‍රමයක් අත්හදා බැලීම.
- ත්‍රිවිධ හමුදාවේ සහ පොලීසිය සතු මනා කළමනාකරණ හැකියාව සහ අනෙකුත් සම්පත් ප්‍රයෝජනයට ගෙන පරිඝණක අධ්‍යාපනය, විෂය මූලික ක්‍රියාකාරකම්, භාෂා නිපුණත්වය, කියවීමේ පළපුරුද්ද, ක්‍රීඩා ක්‍රියාකාරකම් ආදී නව අධ්‍යාපන අවශ්‍යතා දියුණු කිරීම.
- අධ්‍යාපන අමාත්‍යාංශය සතු වෘත්තීය හා පළපුරුදු අධ්‍යාපන කාර්ය මණ්ඩලයේ සහාය ලබාගෙන උසස් මට්ටමේ අධ්‍යාපනයක් සිසු දරු දැරියන්ට ලබාදීම.
- ඉතා කඩිනමින් දියුණුව කරා යන ලෝකයේ පවතින අභියෝගයන්ට ආත්ම විශ්වාසය ඇතිව මුහුණදීම සඳහා සිසුන්ට අවශ්‍ය උසස් මට්ටමේ ඉංග්‍රීසි අධ්‍යාපනයක් ලබාදීමට විශේෂ කැපවීමකින් ක්‍රියා කිරීම.

### 23.1.4 ආරක්ෂක සේවා විද්‍යාලය - කොළඹ

2007 ජනවාරි මස 17 වන දින ආරම්භ කරන ලද කොළඹ ආරක්ෂක සේවා විද්‍යාලය රජයේ ජාතික පාසලක් ලෙස උසස් කර මිශ්‍ර පාසලක් වශයෙන් පවත්වා ගෙන යනු ලැබේ. මේ වනවිට විද්‍යාලයේ 11 වන ශ්‍රේණිය දක්වා සිසු සිසුවියන් 2864 ක් පමණ අධ්‍යාපනය හදාරනු ලබන අතර ඉදිරියේ දී අපොස (උ:පෙළ) පන්ති ආරම්භ කිරීමට නියමිතය. තවද මෙම විද්‍යාලය සිසු සිසුවියන්ගේ අධ්‍යයන කටයුතු වලට අමතරව බාහිර ක්‍රියාකාරකම් හා දක්ෂතාවයන් ඉහළ නැංවීම පිළිබඳව විශේෂ අවධානයක් යොමු කරමින් අධ්‍යාපන අමාත්‍යාංශය හා ආරක්ෂක අමාත්‍යාංශයෙහි මඟපෙන්වීම යටතෙහි පවත්වා ගෙන යනු ලැබේ.



## 23.1.5 ආරක්ෂක සේවා විද්‍යාලය - කුරුණෑගල

2009 ජනවාරි මස 29 වන දින ආරම්භ කරන ලද කුරුණෑගල ආරක්ෂක සේවා විද්‍යාලය වයඹ පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ මිශ්‍ර පාසලක් වශයෙන් පවත්වාගෙන යනු ලබන අතර මේ වනවිට 9 වන ශ්‍රේණිය දක්වා සිසු සිසුවියන් 1023 ක ගෙන් යුතුව පවත්වාගෙන යනු ලැබේ.







## 23.2 2016 වර්ෂයේ කාර්යසාධනය

### 23.2.1 මූල්‍ය ප්‍රගතිය

| අනු අංකය | විස්තරය | මුදල් ප්‍රතිපාදන (රු. මිලියන) | 2016.12.31 වන දිනට ප්‍රගතිය (රු. මිලියන) |
|---|---|---|---|
| **01** | ප්‍රාග්ධන වියදම් | 202.8 | 192.55 (94.95%) |
| **02** | පුනරාවර්ථන වියදම් | - | - |
| **03** | එකතුව | 202.8 | 192.55 (94.95%) |

23.1 වගුව:2016 වර්ෂය සඳහා වෙන්කර ඇති මුදල් ප්‍රතිපාදන

### 23.2.2 නේවාසිකාගාර ගොඩනැඟිලි ඉදිකිරීම්

#### කොළඹ ආරක්ෂක සේවා විද්‍යාලය

කොළඹ ආරක්ෂක සේවා විද්‍යාලය වෙත දුර බැහැර ප්‍රදේශවලින් පැමිණ අධ්‍යාපන කටයුතු සිදු කරනු ලබන සිසු දරු දැරියන්හට වඩාත් ආරක්ෂාකාරී නේවාසිකාගාර පහසුකම් සපයාදීම අරමුණු කරගෙන මෙම නේවාසිකාගාර ගොඩනැගිල්ල ඉදිකිරීම් ව්‍යාපෘතිය ආරම්භ කර ඇත. අදාල ව්‍යාපෘතියෙහි මුලික ඉදිකිරීම් කටයුතු 2015 වර්ෂයේ අග භාගයෙහි ආරම්භ කර රු. මිලියන 16ක පමණ වැඩ කටයුතු 2015 වර්ෂය අවසන් වනවිට නිම කර තිබුණි. ඒ අනුව 2016 වර්ෂය තුළ ඉහත ව්‍යාපෘතියෙහි ඉදිකිරීම් කටයුතු රු. මිලියන 140.95 ක මුදලක් වියදම් කර සිදු කරන ලදී.

| ව්‍යාපෘතිය/විස්තරය | වර්ෂය තුළ ලබාගත් ජයග්‍රහණයන් | | | | වෙනත් |
|---|---|---|---|---|---|
| | භෞතික ප්‍රගතිය | | මූල්‍යමය ප්‍රගතිය | | |
| | විස්තරය | ප්‍රගතිය | අපේක්ෂිත වියදම | සත්‍ය වියදම | |
| යෝජිත සිව් මහල් නේවාසිකාගාර ගොඩනැඟිල්ල ඉදිකිරීම | නේවාසිකාගාර ගොඩනැඟිල්ලෙහි සිව් වන මහල දක්වා කොන්ක්‍රීට් සැකිල්ල නිම කර සියලුම මහල් වෙනුවෙන් කොන්ක්‍රීට් ආස්තරණයන් සම්පූර්ණ කර ඇත.<br><br>වට තාප්පය 90% දක්වා නිම කිරීම. | (2016 වර්ෂය තුළ අපේක්ෂිත කාර්යයන්ගෙන් 95%ක් පමණ නිම කර ඇත). | රු. මිලියන 148.6 | රු. මිලියන 140.95<br><br>94.85% | |

23.2 වගුව: 2016 වර්ෂය තුළ ලබාගත් ජයග්‍රහණයන්


2016 ජනවාරි මස 01 දිනට ප්‍රගතිය


2016.08.18 වන දින ගරු ආරක්ෂක රාජ්‍ය අමාත්‍ය තුමාගේ නිරීක්ෂණ සංචාරය


2016 දෙසැම්බර් මස 31ද දිනට ප්‍රගතිය

### 23.2.3 අනෙකුත් සංවර්ධන ව්‍යාපෘති හා උපකරණ මිල දී ගැනීම

කොළඹ ආරක්ෂක සේවා විද්‍යාලයීය ගොඩනැඟිලි සංකීර්ණයට අදාලව පහසුකම් වැඩි දියුණු කිරීම හා කොළඹ හා කුරුණෑගල ආරක්ෂක සේවා විද්‍යාලයන්හි අධ්‍යාපනයට අදාල පහසුකම් සංවර්ධනය කිරීම වෙනුවෙන් අවශ්‍ය උපකරණ මිල දී ගැනීම සිදු කරන ලදී. එමෙන්ම කුරුණෑගල ආරක්ෂක සේවා විද්‍යාලය වෙනුවෙන් රු. මිලි. 215 ක වියදමින් ඉදිකරනු ලබන පංති කාමර ගොඩනැඟිල්ලෙහි ඉදිකිරීම් කටයුතු ශ්‍රී ලංකා නාවික හමුදාව වෙතින් සිදුකරනු ලැබූ අතර එම ව්‍යාපෘතීන්ට සමගාමීව පහතින් දක්වා ඇති සංවර්ධන කටයුතු නිම කර ඇත.

| ව්‍යාපෘතිය/විස්තරය | වර්ෂය තුළ ලබාගත් ජයග්‍රහණයන් | | | |
|---|---|---|---|---|
| | භෞතික ප්‍රගතිය | | මූල්‍යමය ප්‍රගතිය | |
| | විස්තරය | ප්‍රගතිය | අපේක්ෂිත වියදම(රු.මි.) | සත්‍ය වියදම(රු.මි.) |
| **කොළඹ ආරක්ෂක සේවා විද්‍යාලීය ගොඩනැඟිලි සංකීර්ණයේ පහසුකම් වැඩි දියුණු කිරීම හා කොළඹ හා කුරුණෑගල ආරක්ෂක සේවා විද්‍යාලයන් වෙනුවෙන් අවශ්‍ය උපකරණ මිල දී ගැනීම.** | විද්‍යාලයීය ප්‍රාථමික අංශ ගොඩනැඟිල්ලෙහි ගිනි ආරක්ෂණ පද්ධති සවි කර නිම කිරීම.<br><br>විද්‍යාලයීය ගොඩනැඟිලි සංකීරණයෙහි ජල කාන්දු වීම වැලැක්වීම සඳහා කොන්ක්‍රීට් ආස්තරණයන් යෙදීම.<br><br>ප්‍රාථමික අංශ සහ පරිපාලන අංශ ගොඩනැඟිල්ලෙහි ඇලුමිනියම් සවි කිරීම.<br><br>කොළඹ හා කුරුණෑගල ආරක්ෂක සේවා විද්‍යාලයීය පරිගණක විද්‍යාගාරයන් හා අනෙකුත් අංශ සඳහා අවශ්‍ය උපකරණ මිල දී ගැනීම. | ඇලුමිනියම් සවිකිරීම් හැර ඉතිරි කාර්යයන් නිම කර ඇත.<br><br>ඇලුමිනියම් සවිකිරීම මීට අදාලව 2016 වර්ෂය තුල අපේක්ෂිත කාර්යයන්ගෙන් 75%ක් පමණ නිම කර ඇත. | 29.3 | 28.4<br><br>96.93% |
| **කුරුණෑගල ආරක්ෂක සේවා විද්‍යාලීය සංවර්ධන කටයුතු.** | කුරුණෑගල ආරක්ෂක සේවා විද්‍යාලය වෙනුවෙන් ඉදිකරනු ලබන නව ගොඩනැඟිල්ලෙහි වැඩ නිම කිරීම.<br><br>විද්‍යාලය වටා තාප්පය හා පිවිසුම් ගේට්ටු ඉදිකිරීම.<br><br>අභ්‍යන්තර මාර්ග ඉදිකිරීම හා භූමි අලංකරණ කටයුතු නිම කිරීම.<br><br>ක්‍රීඩා පිටිය ඉදිකිරීම.<br><br>නව ජල ව්‍යාපෘතිය. | (2016 වර්ෂය තුළ අපේක්ෂිත කාර්යයන්ගෙන් 98%ක් නිම කර ඇත). | 24.9 | 23.2<br><br>93.17% |

23.3 ආරක්ෂක සේවා විද්‍යාලයන්හි සංවර්ධන කටයුතු


නව ගොඩනැගිල්ල


ප්‍රධාන දොරටුව


ක්‍රීඩා පිටිය


නව ජල ව්‍යාපෘතිය


පරිගණක විද්‍යාගාරය


විද්‍යාලයීය වට තාප්පය

### 23.2.4 කාර්යමණ්ඩලයන්හි ගුණාත්මකභාවය හා වෘත්තීය හැකියාවන් වැඩිදියුණු කිරීම වෙනුවෙන් සිදුකරන ලද ක්‍රියාකාරකම් - 2016

| ක්‍රියාකාරකම් | සම්පත් දායකත්වය / සිදුකරන ලද ආයතනය | ඉලක්කගත කණ්ඩායම |
|---|---|---|
| බලශක්ති සංරක්ෂණය හා ඵලදායී අයුරින් භාවිතාකිරීම පිළිබඳ කාර්යය මණ්ඩල දැනුවත් කිරීමේ වැඩමුළුව. | සුනිත්‍ය බලශක්ති අධිකාරිය | පරිපාලන අංශ කාර්ය මණ්ඩලය |
| මාර්ග විනය හා නීතිරීති පිළිබඳ වැඩමුළුව | පොලිස් දෙපාර්තමේන්තු රථවාහන පොලිස් අංශය | විද්‍යාලයීය පරිපාලන අංශයට අයත් රියදුරන් හා ප්‍රවාහන අංශ කාර්ය මණ්ඩලය |
| සතිපතා පුහුණු වැඩසටහන් | ආරාධිත දේශකයින්/ආයතන කාර්ය මණ්ඩලය | පරිපාලනඅංශ කාර්ය මණ්ඩලය |

23.5 වගුව: කාර්යමණ්ඩලයන්හි ගුණාත්මකභාවය හා වෘත්තීය හැකියාවන් වැඩිදියුණු කිරීම වෙනුවෙන් සිදුකරන ලද ක්රියාකාරකම්

## 23.3. ඉදිරි වසර සඳහා කල් තබන ලද කාර්යයන්

පහත දැක්වෙන සංවර්ධන ව්‍යාපෘතීන් සඳහා 2016 වර්ෂයට අදාලව ලබා දෙන ලද ප්‍රතිපාදනයන් හා කාලසීමාව ප්‍රමාණවත් නොවීම හේතුවෙන් 2017 වර්ෂය තුළ අදාල කාර්යයන් නිම කිරීමට අපේක්ෂිතය.

| අනු අංකය | විස්තරය | 2017 වර්ෂය වෙනුවෙන් අපේක්ෂිත ප්‍රතිපාදන(රු.මි.) | කොන්ත්‍රාත්කරු / ආයතනය | වෙනත් |
|---|---|---|---|---|
| 01 | නේවාසිකාගාර ගොඩනැගිල්ලෙහි ඉතිරි වැඩකටයුතු නිම කිරීම. | 91.9 | 6 (සෙව්) ඉංජිනේරු සේවා රෙජිමේන්තුව. | 2017 වර්ෂය වෙනුවෙන් ලැබීමට නියමිත රු. මිලියන 115ක ප්‍රතිපාදන යොදවා මෙම සංවර්ධන ව්‍යාපෘතීන් සිදු කිරීමට නියමිතය. |
| 02 | කොළඹ ආරක්ෂක සේවා විද්‍යාලීය පරිපාලන අංශ හා ප්‍රාථමික අංශ ගොඩනැගිල්ලෙහි ඇලුමිනියම් සවි කිරීම නිම කිරීම හා උසස් පෙළ පන්ති වෙනුවෙන් දැව භාණ්ඩ මිල දී ගැනීම. | 16.9 | ලංකා ඇලුමිනියම් (පුද්ගලික) සමාගම. | |
| 03 | කුරුණෑගල ආරක්ෂක සේවා විද්‍යාලීය වට තාප්පය හා නව ජල ව්‍යාපාතියෙහි ඉතිරි වැඩ නිම කිරීම. | 6.2 | ශ්‍රී ලංකා නාවික හමුදාව. ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය | |
| 04 | කොළඹ ආරක්ෂක සේවා විද්‍යාලය සඳහා සූර්ය බල විදුලි පද්ධතියක් සවි කිරීම. | 30 | කොන්ත්‍රාත් ආයතනය තෝරාගෙන නොමැත. | අධ්‍යාපන අමාත්‍යාංශය වෙතින් මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් මුදල් ප්‍රතිපාදන ඉල්ලුම් කර ඇත. |

23.6 වගුව: 2017 වර්ෂය වෙනුවෙන් කල්දමන ලද ව්‍යාපෘතීන්

## 23.4 ගැටළු සහ අභියෝග

කොළඹ ආරක්ෂක සේවා විද්‍යාලය වෙත ලබාදි ඇති උසස් තත්ත්වයේ පහසුකම් පවත්වාගෙන යාම හා නඩත්තුව වෙනුවෙන් මුදල් ප්‍රතිපාදනයන් ලබාදී නොමැති අතර, ඒ වෙනුවෙන් මුදල් වියදම් කරනු ලබන්නේ ආරක්ෂක සේවා විද්‍යාලයීය ගිණුමෙන් වේ. එම ගිණුම සඳහා 2016 වර්ෂයට අදාළව වියදම් වලට අනුකූලව ආදායම ප්‍රමාණවත් නොවීම හේතුවෙන් මෙම පහසුකම් නියමිත පරිදි පවත්වාගෙන යාම අසිරුව ඇත. ඒ අනුව අදාළ ගිණුම වෙත මුදල් ප්‍රතිපාදනයන් ලබාගැනිම පිළිබඳව ස්ථිර ක්‍රියාපිළිවෙතක් සකසා ගැනීම අත්‍යාවශ්‍යයව පවතී.

## 23.5 අනාගත අපේක්ෂා

| ක්‍රියාකාරකම | අපේක්ෂිත වියදම | ප්‍රතිලාභ |
|---|---|---|
| කොළඹ ආරක්ෂක සේවා විද්‍යාලය වෙනුවෙන් ක්‍රීඩා පිටිය ඉදිකිරීම | | සිසු දරු දැරියන් සඳහා ක්‍රීඩා සහ බාහිර ක්‍රියාකාරකම් සඳහා පහසුකම් වැඩි දියුණු කිරීම. |
| කුරුණෑගල ආරක්ෂක සේවා විද්‍යාලය වෙනුවෙන් පොදු පහසුකම් ගොඩනැගිල්ලක් ඉදිකිරීම. | දළ ඇස්තමේන්තුව රු. මිලියන 126 (ශ්‍රම කුලී සහ බදු රහිතව) | කුරුණෑගල ආරක්ෂක සේවා විද්‍යාලය සඳහා අවශ්‍ය පරිඝණක විද්‍යාගාර , විද්‍යාගාර හා කාර්යාල පහසුකම් ඇතුළු අනෙකුත් පොදු පහසුකම් ලබා දීම. |

23.7 වගුව: 2018 – 2020 මධ්‍ය කාලීන රාමුවට අදාළව සේවා වැඩිදියුණු කිරීම පිළිබඳව යෝජනා